# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :
- ගරු ගාමිණී පෙරේරා පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ශාස්ත්‍රපති ගරු එස්. අනුයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ප්‍රදීප් කුමාර ප්‍රනාන්දු පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** :

ආචාර්ය ගරු ජෙරාඩ් රොසයිරෝ නි.ම.නි. පියතුමා
කථිකාචාර්ය දේවධර්ම නිකේතනය,
කොළඹ 08.

ශාස්ත්‍රපති ඒ.ආර්.එම්.ආර්.ඉමල්ඩා මිය, නියෝජ්‍ය විදුහල්පති,
සාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය,
වන්කාලේ, මන්නාරම.

ශාස්ත්‍රපති ෆ්‍රැන්සිස්කා රාජයෝගිනී මෙවිය, ගුරු සේවය,
සියලු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලය,
කොළඹ 08.

අයි.එන්.ජේ.එස්. කෲස් මිය, ගුරු සේවය,
සාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය,
වන්කාලේ, මන්නාරම.

ගරු ජේ. රමේෂ් නි.ම.නි. පියතුමා
''තොඩර්වහම්'' යාපනය.

ටී.අයි.රංගනායගම් මහතා, ගුරු සේවය,
සාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලය,
කොළඹ 03.

සුනීතා වෙනාසියුස් මිය, ගුරු සේවය,
සාන්ත ජේම්ස් බාලිකා මහා විද්‍යාලය,
යාපනය.

එම්. සුරේන්දිනී මිය, ගුරු සේවය,
සාන්ත ජෝශප් ජාතික පාසල, ත්‍රිකුණාමලය.

**කතෝලික උපදේශක මණ්ඩලය**

- අතිඋතුම් දේවධර්මාචාර්ය මැක්ස්වෙල් සිල්වා රදගුරු හිමිපාණෝ
  සභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිඋතුම් දේවධර්මාචාර්ය ජෝශප් පොන්නයියා රදගුරු හිමිපාණෝ
  උපසභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිගරු අයිවන් පෙරේරා නාහිමිපාණෝ, කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- මහාචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා, අංශ ප්‍රධාන, බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය
- ආචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ, ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව, කැලණිය විශ්වවිද්‍යාලය.
- ආචාර්ය ජයලත් බලගල්ල (ඩොමිනිකන් නිකාය) මීරිගම
- ගරු එබනේෂර් ජෝශප් දේවගැතිතුමා, මහලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, කොළඹ 07.
- ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් දේවගැතිතුමා, විදුහල්පති, සාන්ත තෝමස් විදුහල,බණ්ඩාරවෙල.
- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා, සහකාර අධ්‍යක්ෂ, ආගමික අංශය,
  අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය.
- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා, ජාතික අධ්‍යක්ෂ, බයිබල් හා ධර්මෝපදේශ අපෝස්තලික සේවා

**පරිගණක වදන් සැකසුම**

- මංගලිකා විජේරත්න, ජාතික අධ්‍යාපන ආයතනය.

**විවිධ සහාය කාර්යාලීය කටයුතු**

- තයානා මෝසස් මෙනවිය, බොරැල්ල.
- එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය.
- ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය තුළින් ආවේදන නොවරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළපොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කතෝලික ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ පෙරාතුව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විද්‍යුත්පති මගින් ද, විෂය භාර ගුරුභවතා පංති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ව්‍යාපෘති නායක (කතෝලික ධර්මය)**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-137 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය නමැති මෙම විෂයමාලාව තුළ ක්‍රිස්තියානි සංස්කෘතිය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, එහි බිහිවීම, වර්ධනය හා භාවිතය පිළිබඳ කරුණු අඩංගු වී ඇත. ඉපැරණි ශිෂ්ටාචාරයන්හි බිහිවීමට මුල් වූ ජුදා ශිෂ්ටාචාරය, දේව විශ්වාසය තම මූලික පදනම කරගෙන කාලයාගේ ඇවෑමෙන් බටහිර ශිෂ්ටාචාරයන්ගේ බලපෑමත් සමඟ ම, ස්වාධීන වූ ගුණාංග සහිත ව වර්ධන විය. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ජුදා ශිෂ්ටාචාරය පදනම් කරගනිමින් බිහිවූවකි. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිතය, ඔවුන් වහන්සේ ගේ ඉගැන්වීම් ආදිය පදනම් වී ඇත. මෙම පදනම යටතේ ඔවුන් වහන්සේ ගේ මරණය හා උත්ථානය සම්බන්ධව ශ්‍රාවකයින් සතු වූ විශ්වාසයන් පිළිබඳ චින්තනයන්, ඉගැන්වීම් හා ජීවිත පැවැත්ම ආදිය ස්ථම්භයන් ලෙස පැවතුණි.

ඓතිහාසික ගමන් මඟෙහි ක්‍රිස්තියානිය, ග්‍රීක-රෝම පාලන සීමාවන් තුල පැතිර වර්ධනය වන විට එම සංස්කෘතීන් හා බැඳිනි. ඒවායේ ගුණාංග බොහෝමයක් තමන් සතුකර ගනිමින් වර්ධනය විය. ක්‍රිස්තියානි ප්‍රතිපත්ති තුළින් බිහි වූ චින්තනයන්, ආගමික ප්‍රතිසංස්කරණ චින්තනයන් ආදිය සමග සංකලනය වී බහුවිධ ස්වභාවයන්ගෙන් යුක්ත ව වර්ධනය විය. තවදුරටත් පුනරුද සමයේ නවීන චින්තනයන්ගේ බලපෑම් සමග කිතුනු කලාව තුළින් මූර්ති, චිත්‍ර හා සාහිත්‍ය වශයෙන් විවිධ සංස්කෘතික සම්පත් විශ්වයට දායාද කොට ඇත. අධ්‍යාපනය, මිනිස් සමාජ යහපත, සමාජ ඒකත්වය, සමාජ සංහිඳියාව හා සාමය ආදිය කෙරෙහි දායකත්වය දක්වන අතර, බහු ආගමික පරිසරයක් තුල සංයමයෙන් යුතු ව අන්‍යොන්‍ය සබඳතාවයක් සහිත ව ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙවන් විවෘත ස්වභාවයකින් යුක්ත ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, උසස් පෙළ පන්තිවල සිසුන් පහසුවෙන් උගෙන, දැනුමින් පෝෂණය වී, ඉගෙනීමේ ඵලය නෙලා ගත හැකි අයුරින් නිපුනතා මට්ටම් දසයක් සහිත විෂය මාලාවක් ලෙස මෙය සකසා ඇත. සංස්කෘතියේ හා ශිෂ්ටාචාරයේ ස්වභාවයන්, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වූ ශිෂ්ටාචාර, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පැවැත්ම, ඉගැන්වීම්, අපොස්තුලුවරුන්ගේ ඉගැන්වීම්, මුල් කිතුනුවන්ගේ ජීවිත ක්‍රමය ආදිය පිළිබඳ ව මුල් නිපුනතා මට්ටම් පහ තුළින් විස්තර කෙරෙන අතර, එය 12 ශ්‍රේණියේ දී උගත හැක.

අනෙකුත් නිපුනතා මට්ටම් පහ තුළින් ම ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට දායක වූ පෙර- අපර දිග තාපස නිකායන්, ක්‍රිස්තියානි ප්‍රතිපත්ති සහිත චින්තකයින්, මධ්‍යම යුගයේ දී ක්‍රිස්තියානි සභාව ලද අඳුරු යුගයේ අත්දැකීම්, ක්‍රිස්තියානියේ පුනරුදයට මුල් පුරෝගාමී වූවන්, ක්‍රිස්තියානි අධ්‍යාපනය, කලාව යනාදියට දායකත්වය දැක් වූ කිතුනු චින්තකයින්, ආසියානු රටවල කිතු දහම පැතිර යාම, වර්තමාන පරිසරය තුළ කිතුනු සභා ඒකත්වය෴ බහු ආගමික සංවාදයක අවශ්‍යතාවය හා සමාරයේ උන්නතියට කිතුනු ආයතනවල දායකත්වය ආදිය පිළිබඳ කරුණු 13 ශ්‍රේණයේ දී උගත හැකි ය.

මේවා ඉගෙනීම තුළින් සිසුවා තම කිතුනු ජීවිතයට අර්ථයක් ලබාදීම සඳහා තමා ජීවත්වන පරිසරය ගොඩනගයි එසේත් නොමැතිනම් ගොඩනැගීමට දායකත්වය දක්වනු ඇතැයි බලාපොරොත්තු වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** — සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

# විෂයට අදාළ නිපුනතා

1.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැගීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි.

2.0 පලස්තීනයේ භූගෝලීය ඉතිහාසයේ පසුබිම වටහා ගෙන තම ජීවිතය සකසා ගනියි

3.0 ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

4.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි.

5.0 ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලු තුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධවූ සභාවේ වර්ධනයට සහය දක්වයි.

6.0 මුල් යුගයේ ශුද්ධවූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධවූ සභාවට දායකත්වය ලබාදුන් චින්තකයින් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත්වීමට උනන්දු වෙයි.

7.0 බටහිර යුරෝපා රටවල කිතු දහම පැතිරුණු ආකාරය දැනගෙන ශුද්ධවූ සභාවේ වර්ධනයට දායක වෙයි

8.0 සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන, කිතුනු වගකීම් ඉටුකරයි.

9.0 ආසියාතික රටවල කිතුදහම් ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම තුළින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි.

10.0 නව ශිෂ්ටාචාරයක් බිහිකිරීමේ කිතුනු සේවාවට සහභාගිවෙයි.

**විෂය නිර්දේශය**

**12 වන ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැගීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි. | 1.1 සංස්කෘතිය තුළ හා ශිෂ්ටාචාරය තුළ ඇති ගුණාංග අවබෝධ කර ගනියි. | • සමස්ත විෂය හැඳින්වීම<br>• ශිෂ්ටාචාරය පිළිබඳ නිර්වචන<br>• සංස්කෘතිය පිළිබඳ නිර්වචන<br>• ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමානකම් හා අසමානකම් | • ශිෂ්ටාචාරය හා සංස්කෘතිය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ගංගා නිම්න ආශ්‍රිත ව ශිෂ්ටාචාර ගොඩනැගී වර්ධනය වූ බව පිළිගනියි.<br>• ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමානකම් හා අසමානකම් වෙන්කර දක්වයි.<br>• තම සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගනියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |
| | 1.2 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් ට ගරු කරයි. | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කළ ශිෂ්ටාචාරයන් පිළිබඳ හැඳින්වීම<br>• ජුදා ශිෂ්ටාචාරයේ ආරම්භය<br>- මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (යුප්‍රටීස්, ටයිග්‍රීස් නිම්න)<br>- ඊජිප්තු ශිෂ්ටාචාරය (නයිල් නිම්න) | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කළ සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය බිහිවීමෙහි ලා පෙරදිග ශිෂ්ටාචාරයන් හි දායකත්වයක් වූ බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පෙරදිග සංස්කෘතීන්හි ගුණාංග හඳුනා ගෙන ඒවාට ගරු කිරීමට පුරුදු වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 36 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 1.3 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන බටහිර ශිෂ්ටාචාරයන්ට ගරු කරයි. | • ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය<br>- ග්‍රීක ශිෂ්ටාචාරය<br>- රෝම ශිෂ්ටාචාරය | • ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට බටහිර ශිෂ්ටාරයන් දායකත්වය ලබා දී ඇති බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ග්‍රීක - රෝම ශිෂ්ටාචාරවල සංස්කෘතික ගුණාංග චරිතායනය කර ගනියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 14 |
| 2.0 පලස්තීනයේ භූගෝලීය ඉතිහාසයේ පසුබිම වටහා ගෙන තම ජීවිතය සකසා ගනියි. | 2.1 පලස්තීනයේ භූගෝලීය පසුබිම වටහා ගනියි. | • පලස්තීනයේ භූගෝලීය පසුබිම<br>• වෙරළ තීරය (මධ්‍ය ධරණී)<br>• බටහිර කඳු හා නිම්න<br>• නැගෙනහිර කඳු හා කාන්තාර<br>• ප්‍රධාන භූමි ප්‍රදේශ හා නගර | • පලස්තීනයේ භූගෝලීය පසුබිම පිළිබඳ කරුණු රැස්කරයි.<br>• පලස්තීනය ශුද්ධවූ දේශය බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ලංකාවේ පොදු වන්දනා ස්ථානයන්හි ශුද්ධත්වය රැකෙන ආකාරයට කටයුතු කරයි.<br>• මීසමේ දේවස්ථානයේ ශුද්ධත්වය රැකීමට මීසම් ජනතාව හා එක් ව කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ජුදා ඓතිහාසික පසුබිම හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි. | • පුරාණ ඉශ්‍රායෙල් ඉතිහාසයේ ප්‍රධාන අංශ<br>• ඊජිප්තුවේ වහල් බව<br>• නික්මයාම සහ ගිවිසුම<br>• වීරවරුන්ගේ සමය<br>• රජ සමය<br>• දෙකඩ වූ ඉශ්‍රායෙල් රාජ්‍යය<br>• බැබිලෝනියානු විප්‍රවාසය<br>• නැවත දේශයට පැමිණීම<br>- ජුදා ආගමික, සාමාජයීය හා සංස්කෘතික පුනරුදය<br>• එස්රා, නෙහෙමියා<br>• ග්‍රීක පාලනය | • ජුදා ඉතිහාසය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ දේව ප්‍රකාශනය සිදුවී ඇති බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එදිනෙදා ජීවිත සිදුවීම් තුළ දෙවියන් වහන්සේ ව අත්දකියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 40 |
| 3.0 ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි. | 3.1 මුල් සියවසේ පලස්තීනයේ දේශපාලන පසුබිම වටහා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • රෝමයේ රාජ්‍ය පාලනය<br>• මහරජු<br>• ආණ්ඩුකාරවරු<br>• යුවරජවරු<br>• අයකැමියා<br>• හේවායෝ<br>• උත්තම පූජකවරු | • ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ දේශපාලන පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• කිතු දහම බිහිවීමට මෙම කරුණු පදනම් වූ බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• රජයේ නීතිරීතිවල ට කීකරුවෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන සමාජය තුළ සිටින සියල්ලන්ට ගරු කරමින් ජීවත් වීමට උගනියි. | • පලස්තීන ජුදයින්<br>  • කුලවත්<br>  • මධ්‍යම<br>  • කුලහීන<br>    • දිළින්ඳන්<br>    • වහලුන්<br>    • කාන්තාවන්<br>    • සමාරිතානුවන්<br>• විසිරී ගිය ජුදෙව්වන්<br>• අන්‍ය ජාතිකයින් | • පලස්තීනයේ වූ සමාජ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ජුදා සමාජයේ කුලහීන ජනතාවට ජේසුස් වහන්සේ ගරු කළ බව පිළිගනියි.<br>• ජුදා සමාජයේ එක් එක් කණ්ඩායම පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• සමාජයේ වෙසෙන පහත් මට්ටමේ ජනතාවට ආදරය කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 12 |
| | 3.3 මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන ආගමික ස්ථාන වලට හා ආගමික නායකයින්ට ගරු කරයි. | • ආගමික ආයතන<br>  • ජෙරුසලම් දේව මාළිගාව<br>  • ජුදා මන්ත්‍රණ සභාව<br>  • ධර්මශාලා<br>• ජුදා ආගමික කණ්ඩායම්<br>  • සද්දුසිවරු<br>  • පරිසිවරු<br>  • ධර්මධරයින්<br>  • එසේනිවරු<br>  • සෙලට්වරු | • පලස්තීනයේ ජේසුස් වහන්සේ ගේ කාලයේ ආගමික පසුබිම පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• ජුදයින් ජෙරුසලෙම් දේවස්ථානයට ප්‍රධාන තැනක් දුන් බව පිළිගනියි.<br>• ජුදා ආගමික ස්ථාන හා කණ්ඩායම් පිළිබඳ නිර්මාණාත්මක කරුණු ඉදිරිපත් කරයි.<br>• ආගමික ස්ථානවල ශුද්ධත්වය රැකෙන ක්‍රියාකාරකම් වල නිරත වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල සහයෝගයෙන් කටයුතු කරයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන සමාජය තුළ සිටින සියල්ලන්ට ගරු කරමින් ජීවත් වීමට උගනියි. | • පලස්තීන ජුදයින්<br>  • කුලවත්<br>  • මධ්‍යම<br>  • කුලහීන<br>    • දිළින්ඳන්<br>    • වහලුන්<br>    • කාන්තාවන්<br>    • සමාරිතානුවන්<br>• විසිරී ගිය ජුදෙව්වන්<br>• අන්‍ය ජාතිකයින් | • පලස්තීනයේ වූ සමාජ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ජුදා සමාජයේ කුලහීන ජනතාවට ජේසුස් වහන්සේ ගරු කළ බව පිළිගනියි.<br>• ජුදා සමාජයේ එක් එක් කණ්ඩායම පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• සමාජයේ වෙසෙන පහත් මට්ටමේ ජනතාවට ආදරය කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 12 |
| | 3.3 මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන ආගමික ස්ථාන වලට හා ආගමික නායකයින්ට ගරු කරයි. | • ආගමික ආයතන<br>  • ජෙරුසලම් දේව මාළිගාව<br>  • ජුදා මන්ත්‍රණ සභාව<br>  • ධර්මශාලා<br>• ජුදා ආගමික කණ්ඩායම්<br>  • සද්දුසිවරු<br>  • පරිසිවරු<br>  • ධර්මධරයින්<br>  • එසේනිවරු<br>  • සෙලට්වරු | • පලස්තීනයේ ජේසුස් වහන්සේ ගේ කාලයේ ආගමික පසුබිම පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• ජුදයින් ජෙරුසලෙම් දේවස්ථානයට ප්‍රධාන තැනක් දුන් බව පිළිගනියි.<br>• ජුදා ආගමික ස්ථාන හා කණ්ඩායම් පිළිබඳ නිර්මාණාත්මක කරුණු ඉදිරිපත් කරයි.<br>• ආගමික ස්ථානවල ශුද්ධත්වය රැකෙන ක්‍රියාකාරකම් වල නිරත වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල සහයෝගයෙන් කටයුතු කරයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 මුල් සියවසේ ජුදා සංස්කෘතික සම්ප්‍රදායයන් දැනගෙන තම සංස්කෘතික සම්ප්‍රදායයන් අනුගමනය කරයි. | • භාෂාව<br>• සමාජ සිරිත් විරිත්<br>• ආගමික චාරිත්‍ර වාරිත්‍ර<br>• ආගමික උත්සව | • ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා සංස්කෘතිය හා ආගමික සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ජුදා ආගමික හා සාමාජීය සිරිත්විරිත් ක්‍රිස්තුන් වහන්සේ පිළිපැද්ද බව පිළිගනියි.<br>• ජුදා ආගමික උත්සව පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව කැමැත්තට අනුව ක්‍රියාකිරීමට පුරුදු පුහුණු වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 20 |
| 4.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි. | 4.1 ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිතය තුළින් පිළිඹිබු වූ වටිනාකම් තම ජීවිතයට උකහා ගනියි. | • ක්‍රිස්තුස් වහන්සේ ගේ ක්‍රියා (ලූක් 4/16-19)<br>  • ජේසුස් වහන්සේ හා සමාරිතානුවරයා<br>  • ජේසුස් වහන්සේ හා අයබදු අයකරන්නා<br>  • ජේසුස් වහන්සේ හා පව්කාරයින්<br>• ශ්‍රාවකත්වය පිළිබඳ ඉගැන්වීම් (මාක් 8/31, 9/33-35, 10/45)<br>• පාද දෝවනය (ජොහාන් 13/1-16) | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම වන ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ ගෙනහැර දක්වන අදහස් ගොනුකරයි.<br>• ක්‍රිස්තුස් වහන්සේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම බව පිළිගනියි.<br>• ක්‍රිස්තුස් වහන්සේ කවුද? යන්න පිළිබඳ විස්තර කරයි.<br>• ක්‍රිස්තුස් වහන්සේ ගේ උත්ථානය විශ්වාස කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 ජේසුස් වහන්සේගේ දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් අයිති කර ගනියි. | • ජේසුස් වහන්සේගේ නව සමාජ දැක්ම<br>• කන්ද උඩ දේශනාව (මතෙව් 5-7)<br>• දේව රාජ්‍ය පිළිබඳ ප්‍රකාශනය (මතෙව් 13)<br>• දේව රාජ්‍යයේ සලකුණු වන ප්‍රාතිහාර්යයන්<br>• අශුද්ධාත්මයන් පලවාහැරීම (මාක් 5/1-20)<br>• පූප වැඩිකිරීම (මාක් 6/30-44)<br>• සුවකිරීම (ශතාධිපතියාගේ සේවකයා) (ලූක් 7/1-10)<br>• මළවුන් උත්ථාන කිරීම, වැන්දඹු ස්ත්‍රියකගේ පුතා (ලූක් 7/11-17) | • ජේසුස් වහන්සේ ගේ දේවරාජ්‍යය පිළිබඳ පහදා දෙන කන්ද උඩ දේශනාව උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සමකාලීන සමාජය තුළ ජේසුස් වහන්සේ වෙනස් චරිතයක් වූ බව පිළිගනියි.<br>• කන්ද උඩ දේශනාව, උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• දේවරාජ්‍යයේ ගුණාංග අනුව ජීවත් වීමට උත්සහ දරයි.<br>• සතුරන් මිතුරන් බවට පත්කර ගනියි. | 36 |
| | 4.3 ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය තුළින් ඔවුන් වහන්සේ ඇතිකළ ආගමික හා සාමාජීයීය පුනරුදය තමන් සතු කර ගනියි. | • ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය<br>• දුක්විඳීම පිළිබඳ පෙර දැනුම්දීම හා හේතුව (මාක් 8/31-38)<br>• දුක්විඳීම හා මරණය (ජොහාන් 18-19)<br>• උත්ථානය (ජොහාන් 20) | • පාස්කු අභිරහස පිළිබඳ තොරතුරු රැස්කරයි.<br>• ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය තුළින් ලද නව පිබිදීම පිළිගනියි.<br>• ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සුබාරංචිය එදිනෙදා ජීවිතය තුළ උපයෝගී කර ගනියි.<br>• කණ්ඩායමේ සහයෝගයෙන් ක්‍රියාකාරකම්වල යෙදෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 5.0<br>ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලු තුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධවූ සභාවේ වර්ධනයට සහය දක්වයි. | 5.1<br>මුල් ක්‍රිස්තියානීන්ගේ ජීවන ක්‍රමය දැනගෙන ඒ අනුව ජීවත්වීමට උත්සාහ කරයි. | • ශුද්ධාත්මාගමනය හා මුල් කිතුණු සභාවේ ආරම්භය (ක්‍රිය 2/1-41)<br>• මුල් කිතුනු සභාවේ සාමූහික ජීවිතය<br>  • යාච්ඤාව<br>  • පූප කැඩීම<br>  • අපෝසතුලුවරුන්ගේ ඉගැන්වීම් වලට සවන්දීම<br>  • බෙදාගැනීමේ ජීවිතය (ක්‍රියා2/42-47, 4/32-37 1 කොරි:11/17-32) | • කිතුනු දහමේ ආරම්භක ඉතිහාසය පිළිබඳ කරුණු රැස්කරයි.<br>• ශුද්ධාත්මාගමනය සමග නව කිතුණු ජීවිත පැවැත්ම ආරම්භ වූ බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධවූ සභාවේ උන්නතියට දායක වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වලට උනන්දුවෙන් සහභාගි වෙයි. | 14 |
| | 5.2<br>කිතුදහම සියල්ලන් වෙතට ගෙනයාමට පවුලුතුමා යොදාගත් උපක්‍රම හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කරයි. | • පාවුලුතුමාගේ කැඳවීම, විජාතීන්ගේ අපෝස්තුලුවරයා (ක්‍රියා 9/1-20)<br>• පාවුලුතුමා ධර්මදූත කාර්යය සඳහා යොදගත් උපක්‍රම<br>  • ධර්මදූත ගමන් (3)<br>    1. ක්‍රියා 13/14-14/28<br>    2. ක්‍රියා 15/36-18/22<br>    3. ක්‍රියා 18/23-21/20 | • ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත කාර්යය පිළිබඳ තොරතුරු රැස්කරයි.<br>• ශුද්ධවූ පාවුලු තුමා විජාතීන්ගේ අපෝස්තුලුවරයා බව පිළිගනියි.<br>• පාවුලු තුමාගේ ඉගැන්වීම් ලැයිස්තුගත කර පෙන්වයි.<br>• පාවුලුතුමා ධර්මදූත කාර්යය සඳහා යොදාගත් උපක්‍රම, අනුගමනය කරයි.<br>• සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවේ නියැලෙන අය හා එක්ව ක්‍රියාකරයි. | 36 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ධර්මදූත සංදේශ<br>පාවුලුතුමාගේ සංදේශ පිළිබඳ හැඳින්වීම<br>- දේව වරප්‍රසාද (රෝම 2/12-19, 7/7-20, ගලාති 3/15-29)<br>- ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය හා බැගෑපත්කම (කොලොස්සි 1/15-20, එපීස 1/3-10, පිලිප්පි 2/5-11)<br>- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය හා නැවත පැමිණීම (1 තෙසලෝනික 15/35-58, 1 තෙසලෝනියා 4/13-5/11)<br>1. කිතුනු පවුල් ජීවිතය (1 කොරින්ති 7/1-16, එපීස 5/22-31, 6/1-4, ගලාති 3/28)<br>2. කිතුනු ඒකත්වය (1කොරින්ති 12/12-31, එපීස 2/11-18, 4/1-6)<br>3. සහෝදර ප්‍රේමය (1 කොරින්ති 8/9-13, 13/3-8/2 කොරින්ති 8/9 පිලමෝන් 1/8-21)<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ දිවි ගෙවීම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 ශුද්ධවූ පාවුලුතුමාගේ ජීවිතාදර්ශය අනුගමනය කර තම කිතුනු කැඳවීමට පිළිතුරු දෙයි. | • පාවුලුතුමා මුහුණ දුන් අභියෝග (2 කොරින්ති 11/22-33 ක්‍රියා 16/16-28)<br>• ශුද්ධ වූ පාවුලුතුමාගේ ප්‍රාණ පරිත්‍යාගය | • ධර්මදූත කාර්යයන් වලදී ශුද්ධවූ පාවුලුතුමා මුහුණ දුන් අභියෝග පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවන් වල නියැලෙන විට අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• රැස්කරගත් කරුණු ලැයිස්තු ගත කරයි.<br>• අභියෝගවලට මුහුණ දී අපෝස්තලික සේවාවන් කිරීමට ඉදිරිපත් වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වලදී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 මුල් යුගයේ කිතුනු සභාවල ගොඩනැගුනු ප්‍රතිපත්තිමය චින්තනයන් හා සංස්කෘතික ගුණාංග හඳුනා ගනියි. | • ග්‍රීක- රෝම ශිෂ්ටාචාරයේ බලපෑම තුළින් ගොඩනැගුනු කිතුනු චින්තනය<br>• කිතුනු දේව ධාර්මික විද්‍යා පීඨ<br>  • ඇලෙක්සැන්ඩ්‍රියාව<br>  • අන්තියෝකිය<br>• වේදභේද හා මන්ත්‍රණ සභා<br>  • ඒරියන් වේදභේදය - නිසියානු මන්ත්‍රණ සභාව<br>  • බෙලාජියානු වේදභේදය - කාතේජ් මන්ත්‍රණ සභාව<br>  • නෙස්ටෝරියානු වේදභේදය - එපීස මන්ත්‍රණ සභාව<br>  • යුතිකේය වේදභේදය - කැල්සිදෝනියානු මන්ත්‍රණ සභාව<br>• මුල් යුගයේ කිතුනු චින්තකයෝ සහ ඔවුන්ගේ දායකත්වය ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ඉරේනියස්තුමා | • මුල් යුගයේ කිතුනු සභාවේ දැකිය හැකි වූ ග්‍රීක-රෝම සංස්කෘතික ගුණාංග ලැයිස්තුගත කරයි.<br>• ක්‍රිස්තියානිය තුළ යහපත් සංස්කෘතික ගුණාංග ග්‍රහණය කරගතහැකි තත්ත්වයක් ඇති බව පිළිගනියි.<br>• රැස්කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• යහපත් සංස්කෘතික ගුණාංගවලට ගරු කරමින් ජීවත්වීමට උගනියි.<br>• ශුද්ධවූ සභාවේ ප්‍රතිසංස්කරණයට සහය වෙයි. | 26 |
| | 6.3 පෙර - අපරදිග තාපස නිකායන් බිහිවීම හා ඒවායේ දායකත්වය වටහා ගෙන ක්‍රියා කරයි. | • තාපස නිකායයන් බිහිවීම<br>  • වනවාසී තාපසයින්<br>• පෙරදිග තාපස නිකායයන් බිහිවීම හා වර්ධනය (ශුද්ධවූ බැසිල්තුමා)<br>• අපරදිග තාපස නිකායයන් බිහිවීම හා වර්ධනය (ශුද්ධවූ අතනාසියස් තුමා, ශුද්ධ වූ බෙනඩික් තුමා) | • තාපස නිකායයන් බිහිවීම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• පැවිදි ජීවිතයක් ගත කරන අයට ගරුකළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• පැවිදි ජීවිත අනුගමනය කරමින් ජීවත්වෙයි.<br>• පැවිද්දන්ගේ ධර්මදූත කාර්යයට සහය වෙයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 බටහිර යුරෝපා රටවල කිතු දහම පැතිරුණු ආකාරය දනගෙන ශුද්ධවූ සභාවේ වර්ධනයට දායක වෙයි. | 7.1 මධ්‍යතන යුගයේ කිතු දහම පැතිරයාම හා එහි ප්‍රතිවිපාක වල සිදුවූ වෙනස්කම් හඳුනාගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි. | • රෝම අධිරාජ්‍යයේ වැටීම හා කොන්ස්තන්තිනෝපලයේ නැගිටීම<br>• යුරෝපයේ ආදිවාසීන් දහම වැළඳ ගැනීම<br>  • බෙනදිකාන තාපසයින්ගේ දායකත්වය<br>  • ශුද්ධවූ බොනිපස්තුමාගේ විශිෂ්ට දායකත්වය<br>• යුරෝපීය ආදිවාසීන් නාගරීකරණය කිරීමේ සේවය<br>  • අධ්‍යාපන සේවය<br>  • කය වෙහෙසා වැඩකිරීම | • යුරෝපයේ ආදිවාසීන්ගේ සිත්හැරීම පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• බෙනදිකාන තාපසයින් ආදිවාසීන් නාගරීකරණය කිරීමේ සේවය කළ බව පිළිගනියි.<br>• බෙනදිකාන තාපසයන්ගේ සේවාවන් ලැයිස්තුගත කරයි.<br>• තාපස නිකායයන් මගින් ඉටුකරන සේවාවන් ආදර්ශයක් කර ගනියි.<br>• තාපසයින්ගේ සේවාවන්ට සහය වෙයි. | 20 |
| | 7.2 මධ්‍යතන යුගයේ අඳුරු කාලවකවානුවේ කිතුනු ජීවිත පැවැත්මේ වෙනසක් ඇති කිරීමට යාචක නිකායන් දැක්වූ දායකත්වය වටහා ගෙන ක්‍රියාකරයි. | • අඳුරු යුගය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්<br>• සභාව දෙකඩවීම හා එහි ප්‍රතිඵල, පෙරදිග-අපරදිග සභා<br>• කුරුස යුද්ධය<br>• යාචක නිකායන් බිහිවීම<br>- දායකත්වය - පසුබිම<br>  • වැල්දෙන්සියාන<br>  • ෆ්‍රැන්සිස්කාන<br>  • දොමිනිකාන | • මධ්‍යතන යුගයේ කිතුනු සභාවේ දෙකඩවීම් සිදුවීමට හේතු ගොනුකරයි.<br>• ශුද්ධවූ සභාව තුළ පුනර්ජීවනයක් ඇති කිරීමේ අරමුණින් යාචක නිකා බිහිවූ බව පිළිගනියි<br>• රැස්කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධවූ සභාවේ නවෝදය ඇති කිරීමට වෙහෙසෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී උනන්දුවෙන් සහයෝගය දක්වයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 කිතු දහමේ නවෝදයට හේතුවූ කරුණු හා එහි ප්‍රතිඵලයන් පිළිබඳ ව දැන ස්ථිර විශ්වාසයකින් ජීවත් වෙයි. | • නවෝදය සඳහා බලපෑ ආගමික, සාමාජීය, දේශපාලනමය, ආර්ථික හා දේව ධාර්මික කරුණු<br>• නවෝදයේ බීජය වැපුරූ කිතුනු චින්තකයන්<br>  • මාටින් ලූතර්<br>  • ස්විංග්ලි<br>  • ජෝන් කැල්වින්<br>  • තෝමස් මුන්ට්සර්<br>• ඇංග්ලිකාන, මෙතොදිස්ත හා බැප්තිස්ත සභා<br>• කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණය<br>  • ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව<br>• ප්‍රතිසංස්කරණයට දායක වූ සභාවන් හා ඔවුන්ගේ සේවය<br>  • ජේසු නිකාය<br>  • වින්සෙන්තියානු නිකාය<br>  • කාර්මෙල් නිකාය<br>  • කැපුචින් නිකාය | • සභාවේ නවෝදය සඳහා බලපෑ ආගමික, සාමාජීය, දේශපාලනමය, ආර්ථික කරුණු පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව තුළින් කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණයක් ඇතිවූ බව පිළිගනියි.<br>• රැස්කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධවූ සභාවේ ඉගැන්වීම් පිළිපදිමින් ජීවත්වෙයි.<br>• ශුද්ධවූ සභාවේ ක්‍රියාකාරකම් වලට සහය වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන, කිතුනු වගකීම් ඉටුකරයි | 8.1 ක්‍රිස්තියානි සභාව විසින් අධ්‍යාපනය සඳහා ඉටුකළ සේවාව දැනගෙන, තම දැනුම වර්ධනය කර ගෙන සමාජ සංවර්ධනයට තමන් ව කැපකරයි. | • අධ්‍යාපනයේ උන්නතියට කිතුනු දායකත්වය<br>  • මිසම් පාසල්<br>  • කැත්‍රිඩ්‍රල් පාසල්<br>  • විශ්ව විද්‍යාල (බොලඤ්ඤෝ, පැරීසිය, කේම්බ්‍රිජ් සහ සලමන්කා)<br>• විද්‍යාවේ දියුණුවට කිතුනුවන්ගේ දායකත්වය<br>  • තෙයියා ද ෂාඩැන්<br>  • ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්<br>  • සර් අයිසැක් නිව්ටන්<br>  • ඇල්බට් අයින්ස්ටයින්<br>  • ඇලෙක්සැන්ඩර් ෆෙලෙමින් | • මධ්‍යතන යුගයේ අධ්‍යාපනයේ උන්නතියට කිතුනුවන් කළ සේවාව පිළිබඳ කරුණු රැස්කරයි.<br>• අධ්‍යාපනයේ උන්නතියට කිතුනුවන් සේවය කළ බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• නූගත් අයට ඉගැන්වීමට ඉදිරිපත් වෙයි.<br>• සමාජ සංවර්ධනය සඳහා අන්අය හා එක් ව ක්‍රියාකරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 නව චින්තනයට මග පෑදූ කිතුනු චින්තකයින් හඳුනා ගනියි. | • ශුද්ධවූ අගොස්තීනු තුමාගේ ජීවිතය හා එතුමන්ගේ නිර්මාණ<br>• තෝමස් ඇකවයිනාස් තුමාගේ ජීවිතය හා එතුමන්ගේ නිර්මාණ | • ශුද්ධවූ සභාවේ නව චින්තනයට මග පෑදූ කිතුනු චින්තකයින් පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• ශුද්ධවූ අගොස්තීනු තුමා, තෝමස් ඇක්වයිනාස් තුමා වැනි අය නව චින්තනයක උදාවට මග පෑදූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධවූ සභාවේ නව චින්තනයේ වෙනස ට සහය දක්වයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 08 |
| | 8.3 කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වය හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි. | • කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ<br>• කිතුනු සංගීතය<br>• කිතුනු ගොඩනැගිලි කලාව<br>• කිතුනු මූර්ති කලාව<br>• කිතුනු චිත්‍ර කලාව | • කිතුනු සාහිත්‍යය තුළින් ගොඩනැගුණු නව චින්තනයන් ගොනුකරයි.<br>• කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වයක් වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• කලාවේ උන්නතිය සඳහා තම නිර්මාණාත්මක දායකත්වය ලබා දෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 නව චින්තනයට මග පෑදූ කිතුනු චින්තකයින් හඳුනා ගනියි. | • ශුද්ධවූ අගොස්තීනු තුමාගේ ජීවිතය හා එතුමන්ගේ නිර්මාණ<br>• තෝමස් ඇකවයිනාස් තුමාගේ ජීවිතය හා එතුමන්ගේ නිර්මාණ | • ශුද්ධවූ සභාවේ නව චින්තනයට මග පෑදූ කිතුනු චින්තකයින් පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• ශුද්ධවූ අගොස්තීනු තුමා, තෝමස් ඇක්වයිනාස් තුමා වැනි අය නව චින්තනයක උදාවට මග පෑදූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධවූ සභාවේ නව චින්තනයේ වෙනස ට සහය දක්වයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 08 |
| | 8.3 කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වය හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි. | • කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ<br>• කිතුනු සංගීතය<br>• කිතුනු ගොඩනැගිලි කලාව<br>• කිතුනු මූර්ති කලාව<br>• කිතුනු චිත්‍ර කලාව | • කිතුනු සාහිත්‍යය තුළින් ගොඩනැගුණු නව චින්තනයන් ගොනුකරයි.<br>• කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වයක් වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• කලාවේ උන්නතිය සඳහා තම නිර්මාණාත්මක දායකත්වය ලබා දෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.3 ශ්‍රී ලාංකික සමාජය තුළ මිනිස් සංහතියේ උන්නතිය සඳහා අවශ්‍ය දෑ හඳුනාගෙන තම වගකීම් ඉටුකරයි. | • පශ්චාත් නිදහස් සමය<br>  • අධ්‍යාපන සේවයේ සංවර්ධනය<br>  • කිතුනු අධ්‍යාපනඥයින් (රදගුරුහිමිවරුන් වන අතිගරු බොන්ජීන් හිමිපාණෝ (නිමනි), අතිගරු එඩ්මන් පීරිස් හිමිපාණෝ (නිමනි), අතිගරු පීටර් පිල්ලෙ පියතුමා, අතිගරු නල්ලූර් ස්වාමි (නිමනි), ඥාණප්‍රගාසර් පියතුමා (නිමනි), ගරු මයිකල් රොද්‍රිගු පියතුමා (නිමනි), ගරු මේරි බැස්ටියන් පියතුමා, ගරු එච්. එස්. දාවිත් පියතුමා, ගරු එස්. ජී. පෙරේරා පියතුමා, විලී වික්‍රමසිංහ මහතා, ආර්. එස්. ඩී. සේරම් මහතා)<br>  • පාසල් රජයට පවරා ගැනීමේ ප්‍රතිවිපාක<br>• ශ්‍රී ලංකීය සමාජය තුළ සුහසාධක සේවාවන්<br>  • ආරෝග්‍යශාලා සේවාව (දේව මාතාවන්ගේ ෆ්‍රැන්සිස්කාන පැවිදි සොයුරියෝ, සිරිකුරුසයේ පැවිදි සොයුරියෝ, ශ්‍රීන් ආරෝග්‍ය ශාලාව)<br>  • සමාජ නීතිඥ සේවාව (ලියෝ නානායක්කාර රදගුරුතුමා, (සා.බෙ.නි.) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා) | • පශ්චාත් නිදහස් සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• අධ්‍යාපනයේ උන්නතිය තුළින් ශ්‍රී ලාංකීය සමාජය ලබාගත් ප්‍රයෝජන අගය කරයි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• සුහසාධන සේවාවල නියැලෙයි.<br>• තම හැකියා සමාජ උන්නතිය සඳහා යොදවයි. | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නව ශිෂ්ටාචාරයක් බිහිකිරීමේ කිතුනු සේවාවට සහභාගිවෙයි. | 10.1 ශුද්ධවූ සභාවේ සමාජීය සංවර්ධනය පිළිබඳ ඉගැන්වීම් දැන ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි. | • ශුද්ධවූ සභාවේ සාමාජීයීය ඉගැන්වීම් පිළිබඳ හැඳින්වීම<br>• දෙවන වතිකාන සභා ප්‍රකාශන - වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව,<br>  • මිනිස් වටිනාකම්<br>  • පවුල් දිවිය<br>  • සංස්කෘතිය<br>  • සාමය හා සහජීවනය<br>• ආසියානු රදගුරු සම්මේලනයේ බිහිවීම හා සාමාජීයීය අරමුණු (FA B C) | • ශුද්ධ වූ සභාවේ සමාජීය සංවර්ධනය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ආසියානු රදගුරු සම්මේලනයේ සමාජීය චින්තනය පිළිගනියි.<br>• පවුලේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම්, සමාජයේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ මිනිස් වටිනාකම් පිළිබඳ ඉගැන්වීම් තම ජීවිතය කර ගනියි.<br>• මිනිස්කම සුරකින ක්‍රියාවල අන්අය හා එක්ව කටයුතු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 කිතුනු ආයතන වල සමාජීය ඉගැන්වීම් හා මගපෙන්වීම් ඉගෙන ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නියැලෙයි. | • ලෝක කිතුනු සභා සම්මේලනයේ බිහිවීම - සමාජීයීය අරමුණු (W C C)<br>• ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ බිහිවීම - සමාජීයීය අරමුණු (C C A)<br>• දේශීය කිතුනු සභාවන්හි සම්මේලනයේ බිහිවීම - සමාජීයීය අරමුණු (N C C) | • කිතුනු සභා සම්මේලනවල බිහිවීම, සමාජීයීය අරමුණු පිළිබඳ කරුණු රැස්කරයි.<br>• කිතුනු සභා සම්මේලනයන් සමාජ සංවර්ධනය සඳහා ක්‍රියාකරන බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• කිතුනු සභා සම්මේලනවල සමාජීයීය අදහස් ආදර්ශයක් කර ගනිමින් ජීවත්වීමට උත්සහ දරයි.<br>• අන්අය හා සහයෝගයෙන් ක්‍රියාකරයි. | 14 |
| | 10.3 කිතුනු සභාවන් හා බහු ආගමිකයින් සමග සාකච්ඡා කර අවබෝධයෙන් සුහදතාවය ඇති කර එකමුතුව ජීවත්වීමට වෙර දරයි. | • කිතුනු සභා එකමුතුව හා බහු ආගමික සංවාදය<br>- විශ්ව කිතුනු සභාවේ (W C C) කිතුනු සභා එකමුතුව පිළිබඳ ඉගැන්වීම් හා වෑයම්<br>- දෙවන වතිකාන සමුළුවේ කිතුනු සභා එකමුතුව සඳහා වන ඉගැන්වීම් හා වෑයම්<br>• බහු ආගමික සංවාදයේ වැදගත්කම<br>- දෙවන වතිකාන සමුළුවේ ඉගැන්වීම්<br>- ආසියානු රදගුරු සම්මේලනයේ ඉගැන්වීම් | • කිතුනු සභාවන්, අන්‍යාගමිකයින් හා සුහදතාවය ඇති කිරීමේ මාර්ගය පිළිබඳ කරුණු ගොනුකරයි.<br>• කිතුනු සභාවන්, අන්‍යාගමිකයින් හා සුහදතාවයන් ජීවත්විය යුතු බව පිළිගනියි.<br>• කිතුනු එකමුතුව ඇති කළ හැකි ආකාරය නිර්මාණයකින් ඉදිරිපත් කරයි.<br>• කිතුනු සභා හා අන්‍යාගමිකයින් සමග සමගියෙන් ජීවත් වෙයි.<br>• අන්‍යාගමිකයන්ගේ යහපත් ක්‍රියාවලට සහයෝගය දක්වයි. | 16 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව** 1.0 : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැගීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි.

**නිපුණතා මට්ටම** 1.1 : සංස්කෘතිය තුළ හා ශිෂ්ටාචාරය තුළ ඇති ගුණාංග අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල**

- ශිෂ්ටාචාරය හා සංස්කෘතිය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ගංගා නිම්න ආශ්‍රිත ව ශිෂ්ටාචාර ගොඩනැගී වර්ධනය වූ බව පිළිගනියි.
- ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමානකම් හා අසමානකම් වෙන්කර දක්වයි.
- තම සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගනියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

### 1.1.1 ශිෂ්ටාචාරයේ බිහිවීම

- මුල් යුගයේ දී මිනිසා දඩයම් කරමින් කඳුකරයේ වාසය කළේ ය.
- ආහාර මිනිසාගේ මූලික අවශ්‍යතාවලින් එකක් වූ බැවින් ආහාර ලබාගත හැකි ස්ථානවල ඔහු රැඳී සිටියේ ය.
- එකිනෙකා සමඟ රංචු ගැසී ජීවත්වීම වසර 40000 කට පෙර ආරම්භ වන්නට ඇතැයි සිතිය හැකි ය. නමුත් ශිෂ්ටාචාරය පිළිබඳ ව කතා කළ හැකි වන්නේ ක්‍රි.පූ. 8000 ට පසුව ය.
- විශේෂයෙන් ගංගා නිම්න ආශ්‍රිතව ජීවත් වූ මිනිසා කණ්ඩායම් වශයෙන් කුඩාරම් ඉදිකොට ජනපද නිර්මාණය කළේ ය.
- විශේෂයෙන් ක්‍රි. පූ. 5000 පමණ කාලයේ ඉජිප්තු, මෙසපොතේමියානු, බැබිලෝනියානු ශිෂ්ටාචාරයන් නයිල් ගඟ, යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා ආශ්‍රිතව ද, ක්‍රි. පූ. 3000 දී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය, ඉන්දු ගඟ ආශ්‍රිත ප්‍රදේශවල ද බිහිවිය.
- මෙම ගංගා නිම්නයන් ජල සම්පත හා භූමි සම්පත ආදියට ප්‍රධාන තැනක් උසුලයි. කෘෂිකර්මය ඉතා සරුසාර අන්දමින් සිදුවිය.
- අවශ්‍යතාවයට වඩා වැඩියෙන් ආහාර ද්‍රව්‍ය වැඩුණි.
- මෙම පසුබිමෙහි ගොවිතැන හා සම්බන්ධ වඩුවැඩ , කම්මල් කර්මාන්ත වැනි බොහෝ වෘත්තීන් බිහිවී වර්ධනය විය.
- ශිෂ්ටාචාරයන් ගංගා නිම්න ආශ්‍රිතව බිහිවී ඇත.
- නගරවැසියන්ගේ ජීවන චර්යාව පෙන්නුම් කරන මෙම වචනයේ, නාගරීකරණය වූ, නාගරික ජීවිත පැවැත්ම තුළ සංවර්ධනය වූ ගොවිතැන, එම පසුබිමෙහි ගොඩනැගුනු විවිධ වෘත්තීන්, ව්‍යාපාරික සබඳතා, ඒ සඳහා වන මාධ්‍යයන්, පාලන ක්‍රම, විධිමත් හා අවිධිමත් අධ්‍යාපනයේ දියුණුව, කලාවේ වර්ධනය, විශේෂයෙන් අක්ෂර බිහිවීම, ජ්‍යොතිෂය බිහිවීම, කාලගුණ දැනුම වැනි විවිධ විෂයයන් ගැබ්වීම දැක්විය හැක.

- ශිෂ්ටාචාරය යන්න නගරය සමග එක්වී, ජීවිතයේ සෑම අංශයක්ම හා සෑම කරුණක්ම ඇතුළත් වන ආකාරයට නගරවැසියන්ගේ ජීවන චර්යාව ගෙනහැර දක්වන වචනයක් වෙයි.
- ශිෂ්ටාචාරය යන්න (Civilization) යන ඉංග්‍රීසි ව්‍යවහාරයේ සිංහල පරිවර්තනයකි. මෙය (Civitas) නගරය යන ලතින් වචනයෙන් බිඳී ආවකි.
- CITIZEN යන්නෙන් ''නගර වැසියන්'' යන අදහස දෙයි. Civilization යන ඉංග්‍රීසි වචනය මෙයින් බිඳී පැමිණියකි
- මෙයින් නගරවැසියන්ගේ ජීවන චර්යාව ගෙනහැර දක්වයි.
- සිංහල භාෂාවට අනුව ශිෂ්ටාචාරය මෙහිදී ''ශිෂ්ට'' යනු හොඳ එනම් ශිෂ්ටසම්පන්න.''ආචාර'' යනු ආචාරධර්ම යන්නෙන් බිඳී ආ වචනයකි. එනම් '' පුරුදු'' ශිෂ්ටාචාර යනු යහපත් පුරුදු යන අර්ථය ගත හැක.

### 1.1.2 ශිෂ්ටාචාරය පිළිබඳ නිර්වචන

- ශිෂ්ටාචාරය යනු නගරය හා සම්බන්ධ වූවකි. නගරයේ සැලැස්ම අවශ්‍යතාවයන්ට හා කලාත්මක හැඟීම්වලට උචිත ආකාරයට සකස් කිරීම. අන් අය හා සුහද ව ආශ්‍රය කිරීම. මනස හා ශරීරය පිරිසිදුව තබා ගැනීම, සෞඛ්‍යමය පුරුදුවලට හුරුවීම ; ගමනාගමනය සඳහා බස්රථ ; පොදු ජීවිතය සඳහා අවශ්‍ය ආයතන බිහිකර හොඳින් පරිහරණය කිරීම ; ආර්ථික ප්‍රතිසංස්කරණය, දේශපාලනික සැකැස්ම ; නීති අධිකාරියේ ප්‍රතිසංස්කරණ වැනි විවිධ අංගයන්ගෙන් සමන්විත වූවක් යැයි නිර්වචනය කළ හැක.
- නමුත් ශිෂ්ටාචාරය පිළිබඳ අදහස් කාලානුරූපීව වෙනස්වෙමින් පවතී.
- ශත වර්ෂ ගණනාවකට පෙර, වහල්කම, යටත්විජිත රටවල් සූරාකෑම වැනි කටයුතු යුක්ති සහගත බව පිළිගැණුනි.
- නමුත් වර්තමානයේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය සමසහභාගිත්වය හා ස්වාධීනත්වය ශිෂ්ටාචාරයේ ගුණාංගයන් යැයි පිළිගැනේ.
- වර්තමානයේ යුද්ධය, ස්වභාවධර්මය විනාශ කිරීම, මානව සම්පත් සූරාකෑම වැනි දෑ ශිෂ්ටාචාරයට පටහැනි පුරුදු යැයි සැලකේ.

### 1.1.3 සංස්කෘතියේ බිහිවීම

- සංස්කෘතිය යන සිංහල වචනය Culture යන ඉංග්‍රීසි වචනයේ පරිවර්තනයකි.
- 'Culture' යන ඉංග්‍රීසි වචනය Cultura යන ලතින් වචනයකින් බිඳී ආවකි.
- 'Cuttura' යන ලතින් නාමපදය 'Colere' යන ක්‍රියාපදයේ මූලයෙන් (ප්‍රභවයෙන්) බිහිවූවකි. එය ගොවිතැන හා සම්බන්ධ පදයකි.
- ''සංස්කෘතිය'' යන්න සංස් + කෘතිය - 'සංස්' යනු වඩා හොඳ යන අර්ථය දෙයි. 'කෘතිය' යනු ක්‍රියාවයි. ඒ අනුව සංස්කෘතිය යන්න ' වඩා හොඳ ක්‍රියා' යන අර්ථය ගෙන දෙයි.
- මේ අනුව සංස්කෘතිය යන්නෙහි පූර්ණ අර්ථය වන්නේ මිනිසාගේ ඇතුලාන්තයේ පවතින ගුණාංග වේ.
- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය සකස් කර ගන්නා සේම මිනිස් ජීවිතය සඳහා මනස සකස් කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

- සංස්කෘතිය ශිෂ්ටාචාරයේ පදනමයි. මෙම සංස්කෘතිය, එය බිහිවූ භූමියට හා එම භූමියේ ජීවත් වන සියල්ලන්ටම අයත් වේ.
- ඒ සමග ම එම භූමියේ ජනතාවට, තම මුතුන්මිත්තන්ගෙන් පැවත එන පාරම්පරික දායාදයක් වේ. මෙය එම භූමියේ ජනතාවගේ ජීවන දර්ශනයේ වසර දහස් ගණනක් පුරා ක්‍රමක්‍රමයෙන් සුළු වශයෙන් සංකලනය වී වර්ධනය වූවකි.

### 1.1.4 සංස්කෘතිය පිළිබඳ නිර්වචන

- ජාතියකට අනන්‍ය වූ ජීවන චර්යාව, ඔවුන්ගේ නිජබිම හා එක්වී සංවර්ධනය කෙරෙන අතර, මිනිසා ස්වාධීන පුද්ගලයකු ලෙසත්, සාමාජීය ලෙසත්, ඔහුගේ චින්තනය, වචන හා ක්‍රියාකාරකම් සීමා කළ හැකි ආකාරයේ පූර්ණ තක්සේරුව, අදහස් හා විශ්වාසයන් යන්නෙහි ප්‍රකාශ වීම සංස්කෘතිය යැයි හැඳින්වේ.
- මෙහි පරිණාමය ලෙස ධාර්මික පැවැත්ම, දාර්ශනික දැක්ම, කලාත්මක හැඟීම් හා අරමුණු යැයි බොහෝ ප්‍රකාශයන් බිහිවෙයි.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම අනුව මිනිසා තම ශාරීරික, මානසික ගුණාංග, හැකියාවන් ආදිය ඔපමට්ටම් කර, වර්ධනය කර, සංවර්ධනය කිරීම සඳහා ගන්නා වූ සියලු ම උත්සාහයන් සංස්කෘතිය යැයි කියැවේ.
- තව ද මිනිසා තම දැනුම, ඉපැයීම ආදිය නිසා, තම සමාජ ජීවිතයට උචිත හුරුපුරුදු, තම ආධ්‍යාත්මික අත්දැකීම් ආදිය අන්අය හා බෙදාහදා ගනිමින් ජීවත් වී, බොහෝ දෙනාගේ වර්ධනය සඳහා සහයවන ආකාරයට ඒවා පත්කර, ආරක්ෂා කිරීමට ගන්නා උත්සාහයන් යැයි ද කියැවේ.
- කෙටියෙන් පැවසුවහොත් ශිෂ්ටාචාරය, බොහෝවිට අන්තර්වර්ති වන අතර, ශිෂ්ටාචාරය අන්තර්වර්ති හා බහිර්වර්ති වනු ඇතැයි සිතීම උචිත වන බව පෙනේ.
- මෙය කෙසේ වෙතත්, මහාචාර්ය වෛයාපුරී පිල්ලෙ පවසන ආකාරයට, ශිෂ්ටාචාරය හා සංස්කෘතිය බොහෝවිට එකම අදහස ගෙන දෙන්නකි.

**ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමාන අසමානකම් :**

**සමානකම්**

1. මානව සමාජයේ වර්ධනීය තත්ත්වයන් පිළිබඳ ව සඳහන් කිරීමට උපයෝගී කර ගන්නා අදහස්වල මූලයන් වන්නේ ශිෂ්ටාචාරය හා සංස්කෘතිය යන වචනයන් ය.
2. ශිෂ්ටාචාරය යන්න මිනිසාගේ '' විනයානුකූල වටිනාකම් '' යන අදහසින් බැලෙන අතර, සංස්කෘතිය යන්න මිනිස් ජීවිතයේ සෑම අංගයක් හා සෑම විෂයයක් ම අන්තර්ගත වන ස්වභාවයන් සලකා බැලේ.
3. සෑම ජාතියකටම අනන්‍ය වූ ශිෂ්ටාචාරයක් හෝ සංස්කෘතියක් පවතී.
4. රටක විවිධ ජාතීන් හෝ රටරටවල් වල විවිධ ජන කණ්ඩායම් හෝ ජීවත් වන විට එක් ජාතියකගේ සංස්කෘතිකාංග අනෙක් ජාතියේ සංස්කෘතියට බලපෑම් සිදු කරයි.
5. ශිෂ්ටාචාරය හා සංස්කෘතිය වෙනස්වන සුලු හා වර්ධනය වන සුලු ගුණාංගයන්ගෙන් සමන්විත වේ.

6. වර්තමානයේ පොදුවේ එකම අදහස බොහෝවිට උපයෝගී කර ගැනේ.

7. මේවා තුළින් එකම ජනසමාජයේ, ජීවන චර්යාවේ වර්ධනය ගෙනහැර දැක්වේ.

**අසමානකම් :**

| අනු අංකය | සංස්කෘතිය | ශිෂ්ටාචාරය |
|---|---|---|
| 1. | සමාජයක ජිවන චර්යාව, සිරිත් විරිත් තක්සේරු හා වටිනාකම් වැනි අනන්‍ය වූ අංගයන් පිළිබඳ අවධානය යොමු කරති. | ජීවිතයේ සියලු ම අංශ, එනම් මානව සමාජයේ සම්පූර්ණ වර්ධනයට ආදාළ සෑම අංගයක් ම ඇතුළත් වේ. |
| 2. | අන්තර්වර්තීය වේ. (භෞතික දෑ අඩංගු නොවේ.) | බහිර්වර්තීය, භෞතික දෑ අඩංගු වේ. (ගොඩනැගිලි) |
| 3. | ජනසමාජයක් විශ්වය සමඟ හා තවත් මිනිසෙකු සමඟ ජීවත්වීම සඳහා සකස් කර ගන්නා විශ්වාසයන්, වටිනාකම්, සිරිත්විරිත්, විනය හා කලාව වැනි අංශවල බෙදාගැනීමේ ආකාරය සඳහන් කරයි. (මෙය ඉගෙනීම තුළින් එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට දායාද කෙරේ.) | විවිධ නගරයන්, විවිධ සමාජ පන්ති, රාජ්‍යයන් වැනි අංශ ඇතුළත් විශාල සමාජයක් ලෙස දැකිය හැක. |
| 4. | ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ වැඩියෙන් තහවුරු කරයි. | උචිත හැකියාවන් හා ද්‍රව්‍යයන් සමඟ සබඳතාවක් දැකිය හැක. |
| 5. | ශිෂ්ටාචාරයට පෙර බිහිවූවකි. | සංස්කෘතියට පසුව බිහිවූවකි. |
| 6. | සුළු ගැමි ජන සමාජය, පරම්පරාගතව රක්ෂා කළ පාරම්පරික ජීවන රටා පිළිබඳව පැහැදිලි කරයි. | රටේ ජීවත්වන නාගරික ජනතාවගේ ජීවන චර්යාව පිළිබඳ ව පැහැදිලි කරයි. |
| 7. | සම්ප්‍රදායානුකූල ගුණාංග පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරයි. | නවීන ගුණාංග පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරයි. |

සංස්කෘතිය ශිෂ්ටාචාරයේ එක් අංගයක් වේ. ශිෂ්ටාචාරය නොමැති ව සංස්කෘතිය පැවතිය හැක. නමුත් සංස්කෘතියක් නොමැති ම ශිෂ්ටාචාරයක් පැවතිය නොහැක.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

1. ශිෂ්ටාචාරය, සංස්කෘතිය වැනි වචන නිර්වචනය කරයි.
2. ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමාන අසමාන ගුණාංග හඳුනා ගෙන පැහැදිලි කරයි.

**නිපුණතාව 1.0 :** ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැගීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 1.2 :** ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන්ට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 36

**ඉගෙනුම් පල**

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කළ සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් පිළිබඳ කරුණු ගොනු කරයි.
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය බිහිවීමෙහි ලා පෙරදිග ශිෂ්ටාචාරයන් හි දායකත්වයක් වූ බව පිළිගනියි.
- ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පෙරදිග සංස්කෘතීන්හි ගුණාංග හඳුනා ගෙන ඒවාට ගරු කිරීමට පුරුදු වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

## 1.2.1 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කළ ශිෂ්ටාචාරයන් පිළිබඳ හැඳින්වීම

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ බිහිවීමට ආබ්‍රහම් තුමාගේ කැඳවීමට පෙර හා පසු යුගවල දායකත්වය ලැබී ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමට පෙර, ක්‍රි.පූ. 1800 දී පමණ සිදුවූ ආබ්‍රහම් තුමාගේ කැඳවීමට පෙර, බිහිවූ ශිෂ්ටාචාරයන් ලෙස යුප්‍රටීස් ටයිග්‍රීස් හා නයිල් නිම්න ශිෂ්ටාචාරයන් සඳහන් කළ හැකි ය. විශේෂයෙන් ජුදා ජනතාවගේ අසල්වැසි රටවල්වල ශිෂ්ටාචාරයන් වන සුමේරියානු , ඉජිප්තු, අසිරියානු, බැබිලෝනියානු, පර්සියානු, ග්‍රීක, රෝම ශිෂ්ටාචාරයන් පැවතුණි. මේවා එක් ආකාරයකින් ජුදා ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කරන විට, තවත් ආකාරයකින් ආබ්‍රහම් තුමාගේ කැඳවීමත් සමග තෝරාගත් ජනතාව ලෙස ගෝත්‍ර නායකයින් වීරවරු, රජවරුන් හා දිවැසිවරුන් මගින් ශිෂ්ටසම්පන්න කොට මගපෙන්වනු ලැබූහ. ඉහත සඳහන් කළ යුග පසුබිම් කොට ගෙන ජුදා ශිෂ්ටාචාරය බිහිවී ඇත. ජුදා, ග්‍රීක රෝම ශිෂ්ටාචාරයන්ගේ ප්‍රමුඛ මූලිකාංග තමන් සතුකර ගනිමින් ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය බිහි වී ඇත.
- එක්තරා සංස්කෘතියක් සතු වූ බලවත් ගුණාංග තවත් සංස්කෘතියක බෙලහීන ගුණාංගවලට බලපෑමක් ඇති කිරීම ස්වභාවික වේ. වෙනත් සංස්කෘතියක පවතින ගුණාංග පුද්ගලයෙකු ස්වකැමැත්තෙන් තමන් සතු කර ගැනීම ''සංස්කෘතිකකරණය ''යැයි හැඳින්වේ.
- මෙම සංස්කෘතිකකරණයේ බලපෑම් නොදැනුවත්ව ම සිදුවේ.
- වර්තමානයේ කුමන ජාතියක් වුවත්, ''මෙය අපේ සුපිරිසිදු සංස්කෘතිය '' යැයි කිව හැකි ආකාරයකට කිසිදු සංස්කෘතියක් දැකිය නොහැක. ඒවා සියල්ල මිශ්‍ර සංස්කෘතීන් ලෙස, විශ්වීය සංස්කෘතියක් ලෙස දැකිය හැක.
- ඒ ආකාරයෙන් ක්‍රිස්තියානි සංස්කෘතිය ද පවතී. එයට ද අසල්වැසි රටවල සංස්කෘතීන්හි බලපෑම් එල්ල වී ඇත.

- එබැවින් ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය නියමාකාරයෙන් අවබෝධ කර ගැනීමට, එයට බලපෑම් එල්ල කළ අසල්වැසි රටවල සංස්කෘතීන් පිළිබඳ අවබෝධය ලබා ගත යුතු ය.

**1.2.2 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය : (යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා නිම්න ශිෂ්ටාචාරය)**

- මානව ඉතිහාසයේ ප්‍රථමයෙන් ම බිහිවූ ශිෂ්ටාචාරය ''සුමේරියානු ශිෂ්ටාචාරය'' යැයි ඉතිහාසඥයින්ගේ අදහසයි.
- වර්තමාන, මැද පෙරදිග රටක් වන ''ඉරාකය'' මෙසපොත්මියා යන ප්‍රදේශයයි. (ක්‍රි. පූ. 3000 ට පෙර සංස්කෘතියේ තොටිල්ල'' යන විරුදාවලිය ලද ප්‍රදේශය මෙයයි.)
- මෙසෙපොතේමියාව අතීතයේ දී සුමේරියාව යැයි ද, ගල්දියාව යැයි ද පසුව බැබිලෝනියාව යැයි ද හඳුන්වනු ලැබුණි.
- පර්සියානු මුහුද හා මුසුවන යුප්‍රටීස් ටයිග්‍රීස් නමැති ගංගා නිම්න ආශ්‍රිත ව මෙම ශිෂ්ටාචාරය ගොඩනැගුණි.
- ඌර්, නිපූර්, රුක්, සිෂ්, ලාකාස් හා රිඬු වැනි නගර මෙම ශිෂ්ටාචාරයෙන් පෝෂණය වූ මහ නගරයන් ලෙසත් රාජධානීන් ලෙසත් වර්ධනය විය.

**විශේෂාංග**

- මෙසපොතේමියානු රජ මෙම රටේ ප්‍රධානියා වෙයි. නායකත්වයට පාලනය කිරීමේ බලය දෙවියන් වහන්සේ විසින් දෙන ලද බව විශ්වාස කරන ලදි.
- රාජ්‍ය පාලනය සඳහා අවශ්‍ය මූල්‍යමය ආදායම බදු අය කිරීම මගින් ලබා ගත් හ.
- අමුරාබිවරු දක්ෂ පාලකයින් ද යුධ භටයින් ද නීති වෘත්තියෙහි විශේෂඥයින් ද වූහ. මොවුහු විවිධ ක්ෂේත්‍ර සඳහා නීති සම්පාදනය කළ හ. මේවා අමුරාබි නීතිය නම් විය.
- ප්‍රථමයෙන් මුදල් පරිහරණය කළ ශිෂ්ටාචාරය මෙයයි. මේ නිසා පණ්ඩමාරු ක්‍රමයට වඩා මුදල් මගින් අධික ලෙස ගනුදෙනු කළ හ.
- මෙසපොතේමියා ජනතාව අතර දේව විශ්වාසය අධික විය. මර්ඩොක්, ඉදා, සින්, සමාස් වැනි දෙවිවරුන් ඔවුන්ගේ ප්‍රබල දෙවිවරු වූහ. සූර්යයා, චන්ද්‍රයා හා දිග රැවුල ඔවුන්ව බුද්ධිමතුන් ලෙස පෙන්නුම් කරයි.
- අශුද්ධාත්මයන් මනුෂ්‍යයාට පීඩාවක් ඇති කරන බවත්, එම අශුද්ධාත්මයන්ගේ ක්‍රියා නවත්වාලීමට පූජකවරු ද සිටිය හ.
- අර්ධ කවාකාර අක්ෂර දැකිය හැකි විය. එම අක්ෂරවල චිත්‍ර දැකිය හැකි විය. සෑම රූපයකට ම අදහසක් විය. තරුවලින් දෙවියන්ව ද පාදයෙන් ගමන ද පිළිඹිබු කෙරේ.
- සිහිනයන් තේරීමේ පුරුද්ද ද මොවුන් සතුවිය. ඒ සමග රෝග මායා බලයෙන් සුව කළ හැකි බව මොවුන්ගේ විශ්වාසයයි.
- සුමේරියාවේ මූර්ති කලාව හා අමුරාබි රජුට සමාස් නමැති සූර්ය දෙවියන් මුද්දක් හා යෂ්ටියක් ප්‍රදානය කරන ආකාරයට නෙළා ඇත.
- ගොවිතැන හා සත්ව ගොවිතැන මොවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් විය.
- සෑම දෙයකට ම එක් එක් දෙවියෙක් විය. මිනිසා ගැලවීමේ ශක්තිය දෙවිවරුන්ට පමණක් ඇති බව විශ්වාස කළ හ.

- උෟර් නැමැති නගරයේ ප්‍රබල ගොඩනැගිල්ල වුයේ, ජිගුරාද් නමැති දේව මාලිගාවයි.
- කැලැන්ඩර් ක්‍රමය ද මෙහි දැකිය හැකි විය. ලෝකයේ ප්‍රථම සිතියම නිර්මාණය කරන ලද්දේ මෙසපොතේමියාවේ ය. සිලිං භාවිතය ද මෙහිදී අරඹන ලදි.
- ඖෂධ පැළෑටි 600 කට වඩා අධික ප්‍රමාණයක් බෙහෙත් සඳහා භාවිත කළ හ.
- ලෝක පුදුමවලින් එකක් වන ''එල්ලෙන උයන'' ගොඩනැගිලි කලාවටත්, කළුගල්වලින් නිර්මාණය කරන ලද කෞඩියා රජුගේ රූපය මූර්ති කලාවටත්, ජීවමාන යථාර්ථයක් ලෙස සැකසූ, ස්ත්‍රී පුරුෂ ශාරීරික සැලැස්ම සෙල්මුවා කලාවට ආධාරයක් ලෙස ද එකල කලාකරුවන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සහය විය.
- 1-9 දක්වා වූ විශේෂාංග ජුදා ශිෂ්ටාචාරයේ බලපෑමෙන් ඇති විය.

### 1.2.3 ඉජිප්තු ශිෂ්ටාචාරය (නයිල් නිම්න)

- පැරණි ම ශිෂ්ටාචාරය වේ. ක්‍රි. පූ. 3300- 1070 දක්වා කාලය තුළ මෙහි පාලන ආර්ථිකය, සමාජ සංස්කෘතික කරුණු යනාදිය විශිෂ්ට ලෙස පැවතුණි.
- මෙය අප්‍රිකානු මහාද්වීපයේ මිසිර් (එජිප්තු) ප්‍රදේශයේ නයිල් ගඟ ආශ්‍රිත ව වර්ධනය විය.
- මෙම ගඟ අප්‍රිකාවේ වික්ටෝරියා ගඟින් ඇරඹී, ඉජිප්තුව හරහා මධ්‍යධරණී මුහුදට ගලා බසියි.
- ඉජිප්තුවේ නැගෙනහිර සීමාවේ රතු මුහුද පිහිටා ඇත. පැරණි වෙළඳුන් ශ්‍රී ලංකාව, චීනය වැනි රටවල් හරහා ද එජිප්තුවේ නයිල් නදිය ආශ්‍රිත ( සූවස් ඇල) ප්‍රදේශය හරහා ද බටහිර රටවල් හා වෙළඳ සබඳතා ඇති කළ හෙයින් මෙය වෙළෙඳ මධ්‍යස්ථානයක් විය.
- ක්‍රි.පූ. 3000 දී උතුරු එජිප්තුව හා දකුණු එජිප්තුව ලෙස පැවති ප්‍රදේශ එකට සම්බන්ධ කරන ලදි.

**විශේෂාංග**

- සරුසාර පසකි ඉරිඟු, තිරිඟු, මිලට් වැනි බෝග වගාවට උචිත විය.
- රාජ්‍ය පාලන බලය දෙවියන්ගෙන් රජුන්ට ලැබෙන බව විශ්වාස කළ හ. රජු ආත්මික හා ලෞකික නායකයා විය.
- ආගමික රජු යටතේ ඇමතිවරු ද ආගමික පූජකවරු රජුට පසුව වැදගත් පුද්ගලයින් ලෙස ද සලකනු ලැබූ හ.
- පාලනය, ආගම, ආර්ථිකය ලෙස පාලන වගකීම් ඒකාබද්ධ කෙරුණි.
- බොහෝ විට පාලන බලය පියාගෙන් පුතුට හිමි විය. පිරිමි දරුවන් නොමැති අවස්ථාවල එම අවස්ථාව ගැහැණු දරුවනට හිමිවිය.
- ''පැපිරස්'' නමැති තෘණ වර්ගයක් ලේඛන කටයුතු සඳහා භාවිත කළ හ.
- දෙවිවරුන්, අශුද්ධාත්මයන් පිළිබඳව ද, ඒවායේ හැකියාවන් ඒවා සමඟ සබඳතා පැවැත්විය හැකි ක්‍රම, අවමංගල්‍ය සිරිත් විරිත්, අවමංගල්‍ය මෙහෙයන්වල දී පැවසිය යුතු යාච්ඤා යනාදිය කොටන ලද ගල්පුවරු සොයා ගන්නා ලදි.
- මරණයෙන් පසු ජීවිතයක් ඇති බව මුලින් ම මොවුන් අතර වූ විශ්වාසයයි. මේ සඳහා පිරමීඩ් සොහොන ඇරඹුණි.

- ගොඩනැගිලි කලාව ඉජිප්තු ශිෂ්ටාචාරයේ විශේෂාංගයකි. මූර්ති කලාව, චිත්‍ර කලාව වැනි දෑ ද, රූපාක්ෂර ආදිය මෙම ශිෂ්ටාචාරය සමඟ වර්ධනය විය.
- වර්ෂයන්, මාස හා දින ගණනය කිරීම සඳහා මේවා උපයෝගී කර ගන්නා ලදී.
- රජවරු, පාරාවෝ යන පොදු නාමයකින් හඳුන්වනු ලැබූහ.
- ගණිත අංශය හා වෛද්‍ය අංශය ජ්‍යොතිෂ කලාව ආදිය වර්ධනය විය.
- ධාන්‍ය මැනීමට ගබඩාවන්හි වර්ග ප්‍රමාණය ගණනය කිරීමට ගොඩනැගිලිවලට අවශ්‍ය ගල්වල ප්‍රමාණය තීරණය කිරීමට ගණක රාමු උපයෝගී කර ගන්නා ලදී.
- එඬේරු තෙල්, රටඉඳි, අත්තික්කා වැනි දෑ ඖෂධ ලෙස භාවිත කරන ලදී.
- 1-10 දක්වා වූ විශේෂාංග ජුදා ශිෂ්ටාචාරයේ බලපෑමෙන් ඇති වූ ඒවා ය.

### 1.2.4 ජුදා ශිෂ්ටාචාරය හැඳින්වීම

- ඉශ්‍රායෙල්වරුන්ගේ ජීවන ඉතිහාසය ක්‍රි.පූ. 1800 සිට 1700 පමණ කාලය අතරතුර මෙසපොත්මියාවේ පිහිටා ඇති හාරාන් දේශයේ සිට කානාන් දේශයට දෙවියන් වහන්සේ විසින් ඉශ්රායෙල් ජනතාවට කැඳවනු ලැබීමත් සමඟ ආරම්භ විය.
- ජුදා ධර්මය ඉශ්‍රායෙල් ජනතාව සමීපයේ ජීවත් වූ, සුමේරියාව, ඉජිප්තුව, බැබිලෝනියාව, අසිරියාව, පර්සියාව, ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරයන්ගේ බලපෑම්වලට ලක් විය.
- ගැලවීමේ ඉතිහාසය ආබ්‍රහම්තුමාගේ කැඳවීම සමඟ ඇරඹේ. ආබ්‍රහම්තුමා මෙසපොතෝමියාවේ ඇති ''ඌර්'' නම් ස්ථානයේ සිට ක්‍රි. පූ. 1900 - 1800 පමණ කාලවකවානුවේ දී කැඳවනු ලැබූ බව පිළිගැනේ.
- ආබ්‍රහම් මෙසපොත්මියානු ශිෂ්ටාචාරය අග භාගයේ උපත ලබා හැදී වැඩුණු කෙනෙකු බව පැහැදිලි ය.
- බැටලුවන් රැක බලා ගැනීම ඔහුගේ රැකියාව වූ නිසා, යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා මැදින් ගමන් කර පලස්තීනයේ ජෝර්දානයට ළඟාවිය.
- මෙම ප්‍රදේශය කානානිවරුන්ගේ නිජබිම විය.
- ආබ්‍රහම් තුමාට ඊසාක් ද, ඊසාක්ට ඒසව් හා ජාකොබ් ද, ජාකොබ්ට පුතුන් 12 දෙනෙක් ද බිහිවීම හා ඔවුන්ගෙන් කෙනෙකු වන ජෝශප් පිළිබඳවත් ශුද්ධ බයිබලයේ සඳහන් වේ. මෙම ජෝශප්ගේ සමයේ ඉශ්රායෙල් ජනතාව ඉජිප්තුවට සංක්‍රමණය වූහ.
- ඉජිප්තුවේ සිටි ඉශ්රායෙල් ජනතාව මෝසස් හා ආරොන්ගේ නායකත්වයෙන් නික්ම ගිය හ. ඉශ්රායෙල්වරුන්ව පිටත් කරන ලදි. ඉජිප්තුව හොඳින් සංවර්ධනය වූ ශිෂ්ටාචාරයකට හිමිකම් කියන රටක් බව නොරහසකි.
- ඉශ්රායෙල්වරු ඉජිප්තුවේ වසර 450 ක් ජීවත් වූහ. මේ නිසා ඔවුන් කෙරෙහි ඉජිප්තු ශිෂ්ටාචාරයේ බලපෑම් සැලකිය යුතු ප්‍රමාණයකට තිබුණි.
- ඉජිප්තුවේ සිට කානාන් දේශයට පැමිණි ඉශ්රායෙල්වරු, සාවුල් රජ යටතේ ක්‍රි.පූ.1020 දී ඉශ්රායෙල් රාජ්‍යයක් ස්ථාපනය කළහ. පසුව එය උත්තර රාජ්‍යය, දක්ෂිණ රාජ්‍යය යනුවෙන් දෙකඩ වූ අවස්ථාවේ දී ක්‍රි.පූ. 722 අසිරියන්වරු උත්තර රාජ්‍යය අත්පත් කරගත් හෙයින්, ඉශ්රායෙල්වරු වසර 200 කට අධික කාලයක් අසිරියන්වරුන්ගේ පාලනය යටතේ ජීවත් වූහ. එබැවින් අසිරියානු ශිෂ්ටාචාරයේ බලපෑම ඉශ්රායෙල් ශිෂ්ටාචාරයට ඇති විය.

- ක්‍රි.පූ. 604-586 කාලයේ බැබිලෝනිවරු ජුදෙයාව හා පලස්තීනය මුලුමනින් ම අත්පත් කරගත් අතර, ජෙරුසලම් නගරය විනාශ කර, එහි සිටි ඉශ්රායෙල්වරුන්ව බැබිලෝනියාවට රැගෙන ගිය හ. ඉශ්රායෙල් වසර 70 ක් පමණ එහි වහලුන් ලෙස සිටිය හ. මෙම කාලවකවානුවේ දී බැබිලෝනි ශිෂ්ටාචාරයේ බලපෑමට ලක් වූහ.
- බැබිලෝනියන්වරුන්ගේ පාලනය දිගු කාලයක් නොපැවතුණි. එයට හේතුව වූයේ පර්සියාව බටහිර ආසියාවේ මහ අධිරාජ්‍යයක් වූ හෙයින්, තම සීමාවන් පුළුල් කිරීමට පටන්ගත් අවස්ථාවේ දී, ක්‍රි.පූ. 539 දී මෙසපොතේමියාව ද (බැබිලෝනියාව) එහි පාලනයට යටත් වී, වසර 200 ක පමණ කාලයක් ඉශ්රායෙල්වරු එහි ජීවත් වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස පර්සියානු ශිෂ්ටාචාරයේ බලපෑම ද ඇති විය.
- පර්සියානු පාලනයෙන් පසු පලස්තීනය ක්‍රි. පූ. 333 දී මහ ඇලෙක්සැන්ඩර් රජුගේ නායකත්වය යටතේ ග්‍රීක පාලනයට යටත් විය. ඉශ්රායෙල්වරුන් කෙරෙහි ග්‍රීක පාලනය ක්‍රි.පූ. 63 දක්වා විකාශනය විය. මෙම කාලවකවානුවේ දී ඉශ්රායෙල්වරු ග්‍රීක ශිෂ්ටාචාරයේ බලපෑමට ලක්වූහ.
- ඉශ්රායෙල් පාලනය කළ මකබි පරම්පාරාවට අයත් වූවන් ග්‍රීකයින් තමන්ගේ සංස්කෘතිය ජුදයින්ට සම්ප්‍රේෂණය කිරීමට උත්සාහ කර, අන්තියෝකයේ එපිපානුස් හා ඉශ්රායෙල්වරුන් අතර සිවිල් යුද්ධයක් ඇති විය. මේ සඳහා රෝම අධිරාජ්‍යවරයාගේ සහය පැතූ අවස්ථාවේ දී රෝමවරුන්ට පලස්තීනයට පැමිණීමට මඟ පෑදුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.පූ. 63 දී හමුදාපති පොම්පේගේ නායකත්වය යටතේ පලස්තීනය අල්ලා ගන්නා ලදි. මේ නිසා රෝම බලපෑමට ලක් වූහ.
- ජුදයින්ගේ වේද ග්‍රන්ථය වූ පැරණි ගිවිසුම කියවන විට ඔවුන්ගේ මුතුන්මිත්තන් වන ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේ පිළිබඳ අත්දැකීම්, සාමූහික ජීවිතය, ඉතිහාසය හා කලාව පිළිබඳ සැලකිලිමත්වීමේ දී අසල්වැසි රටවල සංස්කෘතික වටිනාකම්වල බලපෑම දැකිය හැක.
- ඉශ්රායෙල්වරුන්ගේ ජීවිතයට විශේෂයෙන් ජුදා ශිෂ්ටාචාරයේ බිහිවීමට, මෙසපොතේමියානු ශිෂ්ටාචාරය අධික ලෙස බලපෑම් සිදුකර ඇත.
- බැබිලෝනියානු ශිෂ්ටාචාරයේ දැකිය හැකි වූ සමහර අංග ජුදා ශිෂ්ටාචාරය විසින් උකහා ගන්නා ලදි.
- කාලයත් සමඟ ග්‍රීක - රෝම ශිෂ්ටාචාරයන් ද ජුදා ශිෂ්ටාචාරයට බලපෑම් ඇති කළේ ය.

### 1.2.5 ජුදා ශිෂ්ටාචාරය

- ක්‍රිස්තියානි ජුදා ජාතියේ දහම හා ජුදා ආගමේ ශාඛාවක් ලෙස ඇරඹුණි. එයට හේතුව එය ස්ථාපනය කළේ ක්‍රිස්තුන් වහන්සේ ය.
- ක්‍රිස්තුස් වහන්සේ ජුදා ජාතිකයෙකි. එතුමන් ජීවත් වූ පරිසරය ජුදා සංස්කෘතික පරිසරයයි. ආරම්භයේ සුවිශේෂය දේශනා කරන ලද්දේ ජුදයින්ට ය. එබැවින් මුල් කාලයේ කිතුනුවන්ගේ ශිෂ්ටාචාරය වූයේ ජුදා ශිෂ්ටාචාරයයි.

- ජුදා සංස්කෘතික විශේෂාංග සමග ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය බිහිවී වර්ධනය විය. පලස්තීනයට බාහිර ප්‍රදේශවල ක්‍රිස්තියානිය පැතිරුණු විට ක්‍රිස්තියානිය විසින් ජුදා සංස්කෘතිකාංග බොහෝමයක් අතහැර, එම පරිසරයට අනුව ජීවන චර්යා, සිරිත් විරිත්, චින්තනයන් ආදියට අදාළ ගුණාංග තමන් සතු කර ගනිමින් වර්ධනය විය.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

1. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනය පිළිබඳව ද, එයට පදනම් වූ අනෙකුත් ශිෂ්ටාචාරයන් පිළිබඳව ද ගවේෂණය කරයි.
2. ජුදා ශිෂ්ටාචාරයේ බිහිවීමට හේතු කාරක වූ ශිෂ්ටාචාරයන් හා ඒවායේ විශේෂාංග පිළිබඳ විස්තර කරයි.
3. මෙසපොතේමියානු, ඉජිප්තු ශිෂ්ටාචාරයන් ජුදා හා ක්‍රිස්තියානිට ශිෂ්ටාචාරයට කෙළෙස බලපෑම් කර ඇද්දැයි සාකච්ඡා කරයි.

**නිපුණතාව 1.0** : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැගීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 1.3** : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන බටහිර ශිෂ්ටාචාරයන්ට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 14 යි.

**ඉගෙනුම් පල**

- ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු ගොනුකරයි.
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට බටහිර ශිෂ්ටාරයන් දායකත්වය ලබා දී ඇති බව පිළිගනියි.
- ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ග්‍රීක - රෝම ශිෂ්ටාචාරවල සංස්කෘතික ගුණාංග චරිතායනය කර ගනියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ජුදා ශිෂ්ටාචාරයට පසුව බිහිවූවකි. නමුත් පසුකාලීනව ග්‍රීක-රෝම ශිෂ්ටාචාරයන්හි විශේෂාංග බොහෝමයක් අන්තර්ග්‍රහණය කර ගනිමින් වර්ධනය වූ බව සඳහන් කළ යුතු ය. එබැවින් අපි මෙහිදී ග්‍රීක - රෝම ශිෂ්ටාචාරයන් පිළිබඳව ද ඒවායේ විශේෂාංග කෙලෙස ක්‍රිස්තියානි සංස්කෘතියට බලපෑම් එල්ල කළේ ද යන්න පිළිබඳව ද අවධානය යොමු කරමු.

### 1.3.1 ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය

- ජුදා ශිෂ්ටාචාරය එහි වර්ධනයෙන් පසු කාලය, ජුදයින් බැබිලෝනියාවේ සිට තම නිජබිම වන පලස්තීනයට ගිය පසු, බටහිර ශිෂ්ටාචාරයන් වන ග්‍රීක- රෝම ශිෂ්ටාචාරවල බලපෑමට ලක් වූහ.

### 1.3.2 ග්‍රීක - ශිෂ්ටාචාරය

- ඉපැරණි සංස්කෘතියෙන් හා දර්ශනයෙන් උසස් වූ සාහිත්‍යයෙන් පෝෂණය වූ රටකි ග්‍රීසිය
- බටහිර සංස්කෘතියට පදනම් වන මෙම සංස්කෘතිය, ''ග්‍රීට්'' යැයි හඳුන්වනු ලබන දූපතකින්, ඒයෝලි, අයෝනි හා ඩෝරි ජාතිකයින්ගේ සම්මිශ්‍රණයකින් බිහිවූවකි.
- ඉන්දු- යුරෝපීය ජාතීන් වන ග්‍රීකයින් ප්‍රථමයෙන් අභිකුණ්ඨික එඬේර ජීවිතය ගත කර, කාලයාගේ ඇවෑමෙන් තණබිම්වල පදිංචි වී ගොවිතැන් කළ හ.
- මෙම නව මිශ්‍රණය තුළින් බිහි වූ ග්‍රීක ශිෂ්ටාචාරය යකඩ යුගයට පෙර, ක්‍රිපූ. 3000 - 2000 අතර කාලයේ දී පැවතුණි.
- පලස්තීනයේ පර්සියානු රාජ්‍ය සමයේ ක්‍රි.පූ. 333 දී මහ ඇලෙක්සැන්ඩර් රජුගේ නායකත්වය යටතේ ග්‍රීක රාජ්‍යය පර්සියානුවන් විසින් අත්පත් කර ගන්නා ලදී.

- මහ ඇලෙක්සැන්ඩර් රජ මුලු ලෝකයම අත්පත් කර ගනිමින්, එකම(ග්‍රීක) ආගම, එකම භාෂාව හා එකම සංස්කෘතියක් ඇති කිරීම තම එකම සිහිනය කොට ගත්තේ ය.
- ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි ග්‍රීක රාජ්‍ය පාලනය වසර 270 ක් පැවතුණි. මෙම කාලවකවානුවේ දී ඉශ්‍රායෙල්වරු ග්‍රීක ශිෂ්ටාචාරයේ බලපෑමට ලක් වූහ.
- ග්‍රීක භාෂාව ''උගතුන්ගේ භාෂාව'' යැයි හඳුන්වන ලදි.

**විශේෂාංග**

- මානව සමාජයේ සංවර්ධනයට ඉමහත් දායකත්වයක් දැක්වූ ශිෂ්ටාචාරයන් අතුරින් ග්‍රීක ශිෂ්ටාචාරය ප්‍රථම ස්ථානයක් ගනී.
- දාර්ශනික සංවර්ධනය හා විද්‍යාත්මක ගවේෂණවලට බීජ වැපිරීය.
- ග්‍රීකයින් කෘෂිකර්මය හා මුහුදු මාර්ගික වෙළඳාම ප්‍රධාන කොට ගත් හ.
- ග්‍රීකයින් බහුකාර්යයන්වලට දායකත්වය සපයමින් දර්ශනය, තර්කනය, භෞතික විද්‍යාව, නක්ෂත්‍රය, අංකගණිතය වැනි අංශ මගින් දාර්ශනික ඥානය නමැති දාර්ශනික අංශයට බීජ වැපුරූහ.
- ජ්‍යොතිෂය, භූ විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි ජයග්‍රහණය ලැබූහ.
- මෙලෙස සාහිත්‍යය කලාව, නාට්‍ය වැනි අංශවලට මූල බීජය වැපුරූ හ.
- මානවයාගේ ස්ව දක්ෂතා වර්ධනයේ ද ශාරීරික ව්‍යායාම් ක්‍රීඩා තරගවල දක්ෂතා දක්වන්නන් ඇගයීමේ ක්‍රමය ද හමුදා පුහුණු ක්‍රියාකාරකම්වලට ද ප්‍රධාන තැනක් දෙන ලදි.
- සාමාන්‍ය දැනුමින් අවශ්‍ය කරුණු වටහාගෙන තීරණ ගැනීමේ ක්‍රමයට මොවුන්ගෙන් ලද දායාදය ඉමහත් ය.
- සාමාන්‍ය දැනුමට ප්‍රථම ස්ථානය ලබා දී, හොඳින් කල්පනා කර, ගැටලු පිළිබඳ ව විමර්ශනය කර තීරණ ගැනීමේ ක්‍රමය ලෝකයට හඳුන්වා දී, විවිධ මාර්ගවලින් හා නව සොයා ගැනීම්වල සංවර්ධනයට දායකත්වය දැක්වූවෝ ද ග්‍රීකයින් වූහ.
- සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් සුප්‍රසිද්ධ ග්‍රීක දාර්ශනිකයන් වූහ.
- ග්‍රීකයින්ගේ දේශපාලන නිදහස රෝමවරුන් නිසා අහිමිවූවත් තම ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වය අහිමි කර නොගත් හ. දෙවන පිලිප් රජුගේ පුත් ඇලෙක්සැන්ඩර් රාජ්‍ය පාලනය ඉතා කඩිනමින් සිරියාව, බැබිලෝනියාව, පර්සියාව හා ඉජිප්තුව වැනි රටවල සිට ඉන්දියාව දක්වා පැතිරුණි.
- ග්‍රීක ශිෂ්ටාචාරය හා නැගෙනහිර ආසියානු ශිෂ්ටාචාරය එක් වී ''හෙලනිස්ත'' යන ග්‍රීක ඒකාබද්ධ ශිෂ්ටාචාරය බිහිවීමට මඟ පෑදූහ.

### 1.3.2.1 ග්‍රීක් භාෂාව

- ග්‍රීක් භාෂාව ඉන්දු යුරෝපීය පවුලට අයත් භාෂාවකි.
- ලතින්, සංස්කෘත, ජර්මානු භාෂා සමඟ සබඳතාවක් ඇත.
- සංගීත මිහිර ගෙන දෙන මෙම භාෂාව විවිධ රූපීය වෙනස්කම්වලින් යුක්ත වචනවලින් සමන්විත වේ.

- ග්‍රීක භාෂාවත්, ග්‍රීක ශිෂ්ටාචාරයත් මෙන් ම විශිෂ්ට ලෙස වර්ධනය වී ඇත.
- ග්‍රීක විද්‍යාඥයින්, ගවේෂකයින්, චින්තකයින්, කලාකරුවන් හා වෙනත් අංශවල සොයා ගැනීම් නිසා තම අවසන් තීරණ හා සොයා ගැනීම් ද ගවේෂණ ද ඒවා හා සම්බන්ධ අදහස් ද අන් අයට ප්‍රකාශ කරන විටත්, පැහැදිලි කරන විටත් තම මව්බස වන ග්‍රීක බස උපයෝගී කර ගනිති. මේ නිසා භාෂාවේ වාක් කෝෂය වැඩිවීමටත් නව වචන බිහිවීමටත් මග සැලසී ඇත.
- විද්‍යාත්මක හා දාර්ශනික චින්තනයන්හි නිර්වචන ක්‍රමයට සිතීමේ දී ඉතා නිවැරදි වචනය භාවිත කළ යුතු විය.
- විවිධ කරුණු පහදා දීමේ දී භාෂාවේ පෝෂිත බවත්, වාක්‍යවල රටාවත් භාෂාවේ අනෙකුත් ස්වභාවයන් ද වර්ධනය වනු ඇත.
- මහ ඇලෙක්සැන්ඩර් රජුගේ පාලනයට යටත් වූ ප්‍රදේශවල ද ඔහුගේ පාලන සමයේ ද ග්‍රීක භාෂාව හොඳින් පෝෂණය වූ භාෂාවක් ලෙස පැවතුණි.
- රෝමයේ බිසෙන්තියානු අධිරාජ්‍යයේ මෙම භාෂාව විශිෂ්ට ව පැවතුණා.
- රෝම අධිරාජ්‍යයත්, රාජ්‍ය සභාවත් තමන්ට අවශ්‍ය නීති සම්පාදනය සඳහා ග්‍රීක භාෂාව යොදා ගත් හ.

### 1.3.2.2 ග්‍රීක් භාෂාව හා ශුද්ධ බයිබලය

- පලස්තීනවරුන්ට බොහෝ අන්‍ය ජාතික යුධ හමුදාවන්ට හා රාජ්‍ය බලයට වහල් වී සිටීමේ තත්ත්වය උදාවිය. මේ තත්ත්වය යටතේ ඉජිප්තුවරු, අසිරියන්වරු, බැබිලෝනියන්වරු, පර්සියානුවන්, ග්‍රීකයින් හා රෝමවරුන් යන අයගේ පාලනයට යටත් වූහ.
- මෙවන් ඓතිහාසික පසුබිමක් නිසා ඉශ්රායෙල් ජනතාවගේ සංස්කෘතියේ ද විශාල වෙනස්වීමක් සිදු විය.
- මෙම වෙනස්වීම ඔවුන්ගේ භාෂාවේ ද ඇතිවීම හේතුවෙන් හෙබ්‍රෙව් භාෂාව ක්‍රමක්‍රමයෙන් අමතක කර බැබිලෝනයේ භාවිත වූ ඇරමයික් භාෂාව ජුදයින්ගේ ව්‍යවහාරික භාෂාව විය. මෙම තත්ත්වය යටතේ හෙබ්‍රෙව් භාෂාවෙන් ලියන ලද ශුද්ධ ලියවිල්ල කියවා ප්‍රයෝජනයක් ලැබිය නොහැකි තත්ත්වයක් උදාවිය.
- එබැවින් ඇරමයික් භාෂාවෙන් පරිවර්තනය කරනු ලැබූ ශුද්ධ බයිබලය ''තාර්ගුම්'' (Targum) යැයි හැඳින්වූහ.
- ක්‍රි.පූ. 333 සිට ක්‍රි.පූ. 63 දක්වා වූ සමයේ ග්‍රීක රජු වූ ඇලෙක්සැන්ඩර් රජුගේ නායකත්වය යටතේ ග්‍රීක පාලනයට යටත් වූ හෙයින් ග්‍රීක සංස්කෘතිය ඉජිප්තුවේ සිට ඇෆ්ගනිස්ථානය දක්වා විහිදුනි.
- මෙම සමයේ සාමාන්‍ය ජනතාව ''හොයිනේ'' නම් වූ ග්‍රීක භාෂාව කතා කළ හ. ග්‍රීක භාෂාව නොදත් අය ශිෂ්ටාචාරයක් නොමැති අය යැයි අදහස් කළ හ.
- නව ගිවිසුම බිහි වූ කාලයේ ග්‍රීක පාලනය යටතේ බොහෝ ස්ථානවල විසිරී සිටි ජුදෙව්වන්, ග්‍රීක සංස්කෘතියේ බලපෑමට නතු වූවන් ලෙස ද, ග්‍රීක භාෂාව හොඳින් දත් අය ලෙස ද දැකිය හැකි විය.

- පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ බොහෝමයක් හේබ්‍රෙව් භාෂාවෙන් ලියන ලද නමුත් සමහර ග්‍රන්ථ ඇරමයික් භාෂාවෙන් ද සමහර ග්‍රන්ථ ග්‍රීක භාෂාවෙන් ද ලියන ලදි.
- මකාබිවරුන්ගේ ග්‍රන්ථ දෙක, සලමොන්ගේ ප්‍රඥාව හා නව ගිවිසුමේ සියලු ම ග්‍රන්ථ ග්‍රීක භාෂාවෙන් ලියන ලද ඒවා ය.
- ග්‍රීක භාෂාවේ බලපෑම ශුද්ධ බයිබලයට  ද ඇති වූ බව ගෙනහැර දැක්වීමට මෙය සුදුසු උදාහරණයකි.
- පුරාණ ගිවිසුම මුළුමනින්ම ග්‍රීක භාෂාවෙන් පරිවර්තනය කළ යුතු ඓතිහාසික අවශ්‍යතාවයක් පැන නැගුණකි. ග්‍රීක භාෂාවට පරිවර්තනය කරනු ලැබූ පැරණි ගිවිසුමේ ග්‍රන්ථ, ''සෙප්ටුවාජින්ත'' නැතහොත් ''හැත්තෑදෙනාගේ ග්‍රන්ථය'' යන්න විසිරී සිටි ජුදෙව්වන්ට ඉමහත් සහනයක් විය.
- ග්‍රීක පරිවර්තනය (සෙප්ටුවාජින්ත) ශුද්ධ වූ සභාවේ ඉතිහාසයේ විශේෂයෙන් මුල් කිතුණු සභා ඉතිහාසයේ ඉතා වැදගත් ග්‍රන්ථයක් ලෙස පිළිගැනේ.
- ශ්‍රාවකයින් හා මුල් කිතුණුවන් මෙම පරිවර්තනය භාවිත කළ හ.
- මෙම පරිවර්තනයේ අධිකාරීත්වය ශුද්ධ වූ සභාවේ ග්‍රීක- ලතින් සභා පියවරුන් විසින් පිළිගන්නා ලදී.
- නව ගිවිසුම ග්‍රීක භාෂාවෙන් ලියන ලද්දකි. ජොහාන් සුවිශේෂය තුළ ද පාවුලුතුමාගේ සන්දේශ තුළ ද ග්‍රීක බලපෑම වැඩි  වශයෙන් දැකිය හැක.
- මුල් කාලයේ දී සභාපියවරුන් (ජස්ටින්, ටර්ටූලියන්, අයිරේනියස්, ක්ලෙමන්ට්, ඔරිජින්) කිතුනු විශ්වාසය ආරක්ෂා කිරීමට ග්‍රීක භාෂාවෙන් ලියන ලද අපොලොජිස්ත පිටපත් ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට දායකත්වය දැක්වීය.

### 1.3.2.3 ග්‍රීක දර්ශනවාදය

**නොස්ටික්වාදය**

- මෙය ඉදිරිපත් කළ අය ඥනවාදීන් යැයි හඳුන්වනු ලැබූ හ. මෙය ඥාන පිළිබඳ හැඟීමක් ප්‍රතිපත්තියක් එනම් දැනුමට බර වූ ගැලවීමේ ප්‍රතිපත්තියක් වේ.
- මෙය මිනිස් ජීවිතයේ වැදගත් සන්ධිස්ථාන වන, මිනිසා පැමිණියේ කොහේ සිට ද? යායුත්තේ කොහේ ද? කෙලෙස යා යුතු ද?  වැනි මූලික ගැටලු කිහිපයකට පිළිතුරු සැපයීමට ඉදිරිපත් වී ඇත.
- මෙම විශ්වය ආත්මයන්ගේ ලෝකය හා භෞතික ලෝකය ලෙස කොටස් දෙකකි. ආත්මයන්ගේ ලෝකය යහපත් යැයි ද යහපත උදාවන්නේ ඒ නිසා බව ද භෞතික ලෝකය අයහපත් යැයි ද එය අයහපත උදාවීමට හේතුව බව ද පවසයි.
- දෙවියන් වහන්සේ භෞතික ලෝකය නො මැවූ බවත් දෙවියන් වහන්සේගෙන් වෙන් වී ගිය බලයක් අයහපත් වී භෞතික ලෝකය මැවී ය.
- මනුෂ්‍ය ආත්මය මේ ලෝකයට අයත් නොවේ යැයි පවසන ඥානවාදීන් අහසින් නික්මෙන සත්‍යය තුළින් ගැලවීම ළඟා කර ගත හැක යන ප්‍රතිපත්තියේ එල්බ සිටිති.
- මේ ප්‍රතිපත්තියේ ආරම්භක කාලය නිශ්චිත වශයෙන් ම පැවසිය නොහැක.

**ප්ලේටෝ වාදය**

- මෙය ග්‍රීක දාර්ශනිකයකු වූ ප්ලේටෝ (ක්‍රි.පූ. 428-348) විසින් ඉදිරිපත් කරන ලදී.
- සත්‍ය වූ ලෝකය, ස්වරූප ලෝකය යැයි ලෝක දෙකක් පවතී.
- මේ ලෝකය තුළ අප දකින සියල්ල සත්‍ය ලෝකයේ ස්වරූපයන් ය, මෙය ප්ලේටෝ භෞතික ලෝකය යැයි හඳුන්වයි.
- මෙයට විරුද්ධ අර්ථය සත්‍ය ලෝකය ලෙස හැඳින්වේ.

**ස්ටොයික්වාදය**

- ස්ටොයික් චින්තන සම්ප්‍රදාය ඇති කළේ, සීනෝ (Zeno –ක්‍රී. පූ. 300) නැමැත්තා ය.
- මෙතුමාගේ අදහස අනුව, කුමන තත්ත්වයක වුවද ඇති දුක හා සතුට සම තත්ත්වයෙන් පිළිගැනීමේ ස්වභාවය ස්ටොයික් මානසිකත්වයයි.
- සෑම සිදුවීමක් ම ''ඉරණම '' යන තත්ත්වයෙන් සලකනු ලැබේ.
- මිනිස් ආත්මය දෙවියන් වහන්සේ කෙරෙන් නික්මුණ ඉතා කුඩා බීජයකි. මෙම බීජය නැවත දෙවිඳුන් හා එක් වේ. මේ සඳහා තමන්ව මුලුමණින් ම කැප කිරීම ඉරණමකි. මෙම නීතියට බාරදීම නිදහස් ය. බාරදීමට අකමැති විරුද්ධ ක්‍රියා මෝඩකම වේ.
- ස්ටොයික් මිනිසා දැඩි තපස් රකින්නෙක් ලෙස තම ස්වභාවික හැඟීම් පාලනය කරන්නෙක් ලෙස ද, පිරිසිදු ජීවිතයක් ගත කරන්නෙක් ලෙස ද, අන් අය වෙනුවෙන් වැයවීමේ සිතක් ඇති කෙනෙක් ලෙස ද කරුණාව ඇත්තෙකු ලෙස ද දිවි ගෙවයි.

**ඇරිස්ටෝටල් (ක්‍රි.පූ. 384-322)**

- ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ හේතුඵලවාදී න්‍යාය ඉතා වැදගත් න්‍යායකි. මොහුගේ අදහසට අනුව යම් කාර්යයක් සම්පූර්ණ වීම සඳහා හේතුන් 4 ක් සම්බන්ධ වේ.

    1. ද්‍රව්‍යමය හේතුව - (Material Cause)

        උදා: කුමකින් නිර්මාණය වූයේ ද? යන්න

        - තඹ ප්‍රතිමාවක් නිර්මාණය සඳහා ''තඹ'' අවශ්‍යයි.
        - මේසයක ද්‍රව්‍යමය හේතුව ''ලී'' මේසය සෑදීමට ලී අවශ්‍ය වේ.

    2. රූපිය හේතුව - (Formal Cause)

        උදා: යමක් නිර්මාණය විය යුතු ආකාරය

        - මෙය ප්‍රතිමාව ලෙස නෙලන්නාගේ චින්තනයේ ඇත. එනම් ප්‍රතිමාවක හැඩය

    3. නිමිත්ත හේතුව - (Efficient Cause)

        උදා: යමක් බිහිකිරීමට හේතු වූ තැනැත්තා (ප්‍රතිමාව නෙලන්න.)

    4. අවසාන හේතුව (Final Cause)

        උදා: යමක් කුමක් සඳහා කරනු ලබන්නේ ද?

        - ප්‍රතිමාව නෙලන්නේ ඇයි?

- ග්‍රීක දර්ශන මගින් බිහි වු දාර්ශනික චින්තනයන් පාවුලු හා ජොහාන් නමැති ලේඛකයින්ගේ චින්තනයට හා ලේඛනයට විශාල බලපෑමක් කර ඇත.

### 1.3.3 රෝම ශිෂ්ටාචාරය

- ටයිබර් (Tiber) ගඟ අසබඩ පිහිටි රෝම නගරය ලතින් ජන සමාජයේ නිජබිම හා වෙළෙඳ කේන්ද්‍රය විය.
- මේ නගරයේ නාමයටම එම ජනතාවගේ නගරයේ නම විය.
- රෝමයට පදනම දැමූවන් වන රොමුලස් නමැත්තා හා ඔහුගේ මුතුන් මිත්තන් ග්‍රීසියේ සිට යුද්ධය නිසා මෙම ප්‍රදේශයට සංක්‍රමණය වී පදිංචි වූහ.
- ලතින් ජන සමාජය හැර ඉතාලියේ අනෙකුත් ප්‍රදේශවල තව බොහෝ ඉතාලි ජන කණ්ඩායම් දැකිය හැකි විය. ඔවුන් සියලු දෙනා ඉන්දු- යුරෝපීය පවුලට අයත් වූවන් ය.

**විශේෂාංග**

- රෝමය විශාල අධිරාජ්‍යයක් ලෙස වෙනස්වීමට හේතුව මෙම ජනතාවට ස්වභාවිකව ම සතු වූ ආධිපත්‍ය ස්වභාවයයි. අසල වූ ප්‍රදේශවල ජීවත් වූ ජනතාව කෙරෙහි එල්ල කළ යුධමය ක්‍රියාකාරකම් හා ඒවායින් ලැබූ ජයග්‍රහණයන් හේතු විය.
- රෝම නගරය අනෙකුත් රටවල් සමග මහමාර්ගවලින් සම්බන්ධ වූ හෙයින් විවිධ සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් හමුවන ස්ථානයක් ලෙසට වෙනස්වීමට හේතු විය.
- ක්‍රි.පූ. 5 වන සියවසේ දී බිහි වූ රෝම අධිරාජ්‍යය, ක්‍රි.ව. 5 වන සියවස දක්වා පැවතුණි.
- මෙහි පාලනයට යටත් වූ ප්‍රදේශයක් ලෙස අත්ලන්තික් සමුද්‍රයේ සිට යුප්‍රටීස් ගඟ දක්වා ද උතුරේ රයින්, ඩන්යුබ් ගඟේ සිට දකුණේ සහරා කාන්තාරය දක්වා ද පැවතුණි.
- රෝම අධිරාජ්‍ය සමයේ යුරෝපය පුරා ආගමික, දේශපාලනික හා ශිෂ්ටාචාරමය සහජීවනයක් පැවතුණි.
- ක්‍රි.ව. 4 වන සියවසේ ශිෂ්ටාචාර නොවූ ජනතාවගේ ආක්‍රමණ නිසා යුරෝපයේ රෝම අධිරාජ්‍යය බිඳ වැටුණි.

#### 1.3.3.1 ලතින් භාෂාව

- රෝම පාලන සමයේ අධිරාජ්‍යයේ රාජ්‍ය භාෂාව හා පරිපාලන භාෂාව වූයේ ලතින් භාෂාවයි.
- බොහෝමයක් යුරෝපීය භාෂාවන්ගේ මව්බස වූයේ ලතින් භාෂාවයි. (ඉතාලි, ස්පාඤ්ඤ, පෘතුගීසි, ප්‍රංශ හා රුමේනිය භාෂා)
- ඉංග්‍රීසි භාෂාවේ බොහෝමයක් වචනවලට මූල භාෂාව වූයේ ලතින් භාෂාවයි.
- නීති, විද්‍යා, වෛද්‍ය, අධ්‍යාපන අංශවල මෙම භාෂාවට වැදගත් ස්ථානයක් හිමි විය.
- වසර 1000 කට අධික කාලයක් ( 18 වන සියවස දක්වා) විද්වතුන්ගේ සාහිත්‍යමය භාෂාව ලෙස භාවිත විය.
- වර්තමානයේ රෝමානු කතෝලික දහමේ මූලස්ථානයේ පරිපාලන භාෂාව වී ඇත්තේ මෙයයි. තව ද මූල්සථානය විසින් නිකුත් කරන ලිපි ආදිය ලතින් භාෂාවෙන් නිකුත් කෙරේ.

- දෙවන වතිකාන සම්මේලනය පැවැත්වෙන තෙක්ම (1962-1965) ලතින් සම්ප්‍රදායට අනුව ජන වන්දනාමය භාෂාව ලතින් භාෂාව ලෙස පැවතුණි.
- තව ද මේ කාලය දක්වා, කතෝලික දහමේ ප්‍රධාන දෙව්සත්හල්වල පූජක සිසුනට අධ්‍යාපනය ලබාදෙන භාෂාව ලෙස මෙම භාෂාව භාවිත කළහ.

#### 1.3.3.2 ශුද්ධ බයිබලීය පරිවර්තනය

- රෝම අධිරාජ්‍යයේ ලතින් භාෂාවට පිළිගැනීම වැඩි වූ හෙයින් ශුද්ධ බයිබලය ලතින් භාෂාවෙන් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි.
- ක්‍රි.ව. 390 දී දමස්කස් (Damasus) නමැති ශුද්ධෝත්තම පියතුමා ලතින් ශුද්ධ බයිබලය වෙනස් කිරීමට සිතා ග්‍රීක, හේබ්‍රෙව් වැනි භාෂා විශාරද ශුද්ධ වූ ජෙරොම්තුමාට එම කාර්යය පැවරුවේ ය.
- ක්‍රි.ව. 4වන සියවස අග භාගයේ ශුද්ධ වූ ජෙරොම් නමැත්තා විසින් කරන ලද ලතින් පරිවර්තනය ''වල්ගේට්'' (Valgate) යැයි හඳුන්වනු ලැබේ.
- මෙහි භාවිත වන ''වල්ගදුස්'' යනු පොදු බව, දිළිඳු බව යන අර්ථය දෙන අතර, අසරණයින්ට වටහාගත හැකි ආකාරයෙන් පරිවර්තනය කරන ලද බව අර්ථවත් වේ.
- ක්‍රි.ව. 1546 දී පැවැත්වුණු ත්‍රිදෙන්තීහු මන්ත්‍රණ සභාවේ දී ''වල්ගේට්'' යන ලතින් පර්වර්තනය ජනවන්දනාවට උචිත බව නිල වශයෙන් පිළිගන්නා ලදී.

#### 1.3.3.3 ගොඩනැගිලි කලාව

- රෝමවරුන් ගොඩනැගිලි කලාවේ විශිෂ්ටයින් බව මොවුන් විසින් නිර්මාණය කරන ලද මංමාවත්, පාලම්, වේල්ල, වරාය, රංගපීඨ, ජලාශ ආදියෙහි දැකිය හැක.
- මොවුන්ගේ බැසිලිකා ගොඩනැගිල්ලේ සැකැස්ම අනුව කිතුනු බැසිලිකා දෙව්මැදුර ගොඩනගන ලදි.
- කොන්ස්තන්තිනෝපලය නම් ස්ථානයේ ශුද්ධාත්මයාණන් සඳහා දේවස්ථානයක් ද කල්වාරි කන්දේ සොහොන් දේවස්ථානයක් ද ඔලිව කන්දේ උත්ථාන දෙව් මැදුරක් ද බෙත්ලෙහෙමේ කිතු උපතේ දේවස්ථානයක් ද ගොඩනගා ඇත. මේ දේවස්ථාන සියල්ල ම බැසිලිකා සැකැස්මට සමාන දේවස්ථානයන් ලෙස ගොඩනගා ඇත.
- බැසිලිකාවේ සැලැස්ම සෘජුකෝණාස්‍ර හැඩයෙන් යුක්ත වේ. එහි දිග කොටස කොටස් 3 කට බෙදා ඇති බවත් ඒවායින් එකක් මැද කොටස ලෙස ද අනෙක් කොටස් මැද කොටස හා එක් වී දෙපස ඇති කොටස් ලෙස ද දැකිය හැක.

#### 1.3.3.4 දේශපාලන සැකැස්ම

- රෝමවරු සාමාජයීය වශයෙන් දෙපිරිසක් වූහ.
  1. පැට්‍රීෂියන්
  2. පිලේෂියන්ස්

1. පැට්‍රීෂියන් :

මොවුන් 10% ප්‍රතිශතයක් වුවද, බොහෝ පිරිස ඉඩම්හිමියන් හා පාලනය සඳහා දායකත්වය දක්වන්නන් ද වූහ. රෝම සමාජ සැකැස්ම තුළ අධික ලෙස පිළිගැනීමට ලක්වූවන් ය.

2. පිලේෂියන්ස්:

90% මෙම පන්තියට අයත් වූවෝ ය. මොවුන් අතුරින් සුළු පිරිසක් ව්‍යාපාරිකයින්, සුළු පිරිසක් ගොවියන්, සුළු පිරිසක් කුඩා කර්මාන්ත හිමියන්, සුළු පිරිසක් ඉඩම්හිමියන් ද වූහ.

- 4 වන සියවසේ සිට රෝමයේ කිතුනුවන්ගේ ගණන වැඩි වන විට ඔවුන්ව පිළිගත යුතු තත්ත්වයක් උදාවිය. ඒ සමගම ඔවුන්ගේ සමාජ තත්ත්වය ද ඉහළ නැංවුණි.
- ශුද්ධ වූ සභාවේ පූජකවරුන් (Cergy) හා ගිහියන් (Laity) වශයෙන් පැහැදිලි බෙදීමක් වර්ධනය විය.
- මේ තත්ත්වය යටතේ රෝමයේ රාජ්‍ය ආයතනවල ස්වභාවය කෙරෙහි ඇති වූ බලපෑම් දැකිය හැක.
- ත්‍රිකෝණාකාර ධූරාවලිය රෝම දේශපාලන සමාජ මට්ටමේ දැකිය හැකි විය.
- මෙම සැකැස්ම අනුව අගනුවර ආශ්‍රිත සභාව පාලනය කිරීමේ බලය සතු රදගුරුවරයා අගරදගුරු ලෙස ද අනෙකුත් නගරවලට රදගුරුවරුන් මීසම්වලට පූජකවරුන් ද තේවාචාරීවරු හා පැවිද්දන් ලෙස ද ඉහළම තනතුර ශුද්ධෝත්තම පියාණන් ලෙස ද දැකිය හැක. මෙම ධූරාවලිය යටතේ ගිහියන් අවසාන මට්ටමේ සිටින අය ලෙස දැකිය හැකි විය.
- ශුද්ධවූ සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ වැදගත් තීරණ ගැනීමේ වගකීම හා ක්‍රියාත්මක කිරීමේ බලය පූජකවරු සතුවේ.
- ගිහියන්ගේ දායකත්වය හා ක්‍රියාකාරීත්වය ඉතා සුළු වශයෙන් නැතහොත් මුලුමනින් ම නොමැති තත්ත්වයක් පැවතුණි. නමුත් රෝමවරු මධ්‍යයෙහි පිලිප්පීවරු යම් මට්ටමකින් තම නියෝජිතයින් තෝරා ගැනීමේ බලය හිමිකර ගෙන සිටියෝ ය.
- මෙලෙස ධූරාවලිය තුළ වූ වෙනස දෙවන වතිකාන කතිකාව පවත්වන තුරු පැවතුණි. මෙය වෙනස් කළ යුතු බව මෙම කතිකාවතේ දී යෝජනා විය.

### 1.3.3.5 ජනවන්දනා ක්‍රම

- රෝම අධිරාජ්‍යය යටතේ පැවති කිතුදහම, රෝම ජනතාවගේ ජනවන්දනා සම්ප්‍රදායේ පැවති බොහෝ සිරිත් විරිත් අන්තර්ග්‍රහණය කර වෙනස් කර ගත්තේ ය.
- රෝමරුන් තම දෙවිවරුන්, වීරවරුන්, රජවරුන් ආදී අය වෙනුවෙන් උත්සව සංවිධානය කළ හ. එලෙස ම කිතුනුවන් විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දරා ප්‍රාණ පරිත්‍යාගී කළ අය වෙනුවෙන් මංගල්‍යය පැවැත් වූහ.
- රෝමවරු දෙසැම්බර් 25 වන දින සූර්යයා උපත ලද දින ලෙස සලකා උත්සවශ්‍රීයෙන් සැමරූහ. මෙම දින රෝම අධිරාජ්‍යය තුළ විසූ කිතුනුවන් ක්‍රි.ව. 366 සිට (යුක්තියේ) රජාණන් හා බුද්ධිමතාණන් වන ජේසුස් වහන්සේ උපත ලැබූ දින ලෙස උත්කෘෂ්ට ලෙස සැමරූහ.

- ක්‍රි.ව. 366 සිට බටහිර රටවල්වල රෝම - ලතින් ජනවන්දනා ක්‍රමයට අනුව කිතු උපත මංගල්‍යය සමරන ලදි.
- කිතුණුවන් අතර පවතින යැදුම්, උපවාස දින (ජුදයින් අතරද විය) පෙරහැර ආදිය රෝම සම්ප්‍රදායයෙන් පැමිණි සිරිත් විරිත් ය.
- රෝමවරුන් අතර තිබූ රජවරුනට හා හමුදාපතිවරුනට ගරුත්වය, මොවුන් අතර වූ ඇඳුම් පැළඳුම්වල සම්ප්‍රදාය කිතුනු සංස්කෘතියට එක්විය.
- මෙහෙයයන්වල දී දණ ගැසීමේ ක්‍රමය මොවුන්ගෙන් ලබා ගත්තකි. රෝමවරුන් අතර රජුට හා හමුදාපතිවරුනට යුධභටයින් එක් දණක් නමා ආචාර කිරීම උසස් ගෞරවයක් ලෙස සැලකේ.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

1. ග්‍රීක ශිෂ්ටාචාරයේ විශේෂංග ඉදිරිපත් කරයි.
2. රෝම ශිෂ්ටාචාරයේ සංස්කෘතික ගුණාංග විස්තර කරයි.
3. බටහිර ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට සිදුකර ඇති බලපෑම් පිළිබඳ සාකච්ඡා කරයි.

**ආශ්‍රිත මූලාශ්‍ර**

**නිපුණතාව 2.0 :** පලස්තීනයේ භූගෝලීය ඉතිහාසයේ පසුබිම වටහා ගෙන තම ජීවිතය සකසා ගනියි.

**නිපුනතා මට්ටම 2.1 :** පලස්තීනයේ භූගෝලීය පසුබිම වටහා ගනියි.

**කාලච්ඡේද :** 10

**ඉගෙනුම් පල :**

- පලස්තීනයේ භූගෝලීය පසුබිම පිළිබඳ කරුණු රැස්කරයි.
- පලස්තීනය ශුද්ධවූ දේශය බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- අපේ රටේ ඇති වන්දනා ස්ථානයන්හි ශුද්ධත්වය රැකෙන ආකාරයට කටයුතු කරයි.
- මීසමේ දේවස්ථානයේ ශුද්ධත්වය රැකීමට මීසම් ජනතාව හා එක් ව කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය**

**2.1.1 පලස්තීනයේ භූගෝලීය පසුබිම**

ශිෂ්ටාචාරයක ආරම්භයට හා වර්ධනයට භූමියක භූගෝලීය ස්වභාවයත්, එම භූමියේ ජීවත්වන ජනතාවගේ ජීවන චර්යාව හා ඓතිහාසික පසුබිම මහත් දායකත්වයක් දක්වයි. ඒ ආකාරයට ජුදා, කිතුනු ශිෂ්ටාචාරවල බිහිවීම සංවර්ධනය වූ පලස්තීනයේ භූගෝලීය පසුබිමේ ස්වභාවය හා එහි විශිෂ්ටත්වය පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කරමු.

- පලස්තීනය අප ජීවත් වන ආසියා මහද්වීපයේ බටහිර ප්‍රදේශයේ ඇත. පලස්තීනයේ උතුරු ප්‍රදේශයේ ලෙබනන් කඳු පන්තියෙන් ද, දකුණින් ඉදුමිය කාන්තාරය ද, බටහිරින් මධ්‍යධරණී මුහුද ද, නැගෙනහිරින් ආරාබි කාන්තාරද කුළුණු ලෙස පිහිටා ඇත.
- මෙය ජුදයින් ඉශ්රායෙල් රට යැයි ද, කිතුනුවන් ශුද්ධවූ දේශය යැයි ද, ආරාබිවරුන් පලස්තීනය යැයි ද හඳුන්වති. තවද මෙය පොරොන්දු දේශය යැයි ද, කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශයක් යැයි ද හඳුන්වති. මුල් කාලයේ මෙය කානාන් දේශය යැයි හැඳින්වූ හ.
- මධ්‍යධරණී දූපත්වල සිට පැමිණි පිලිස්තිවරු පලස්තීන වෙරළබඩ ප්‍රදේශයේ දකුණු ප්‍රදේශය අත්පත් කරගෙන එහි වාසය කළ හ. මොවුන් හා සබඳතා පැවැත්වූ ග්‍රීකයින් මෙය 'පිලිස්තීනය' යැයි හැඳින්වූ හ. මෙය කාලයත් සමග වෙනස්කම්වලට බඳුන් වී පලස්තීනය නම් විය.
- ගැලවීමේ ඉතිහාසයේ ඉතා වැදගත් යැයි සැලකෙන පලස්තීනය වර්ග ප්‍රමාණයෙන් ඉතා කුඩා රාජ්‍යයකි. මෙහි වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 1120 පමණ වේ.
- නයිල් නිම්න ශිෂ්ටාචාරයේ මූලාරම්භය වූ ඉජිප්තු අධිරාජ්‍යයටත්, යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරයේ මූලාරම්භයවූ අසිරියානු බැබිලෝනියානු අධිරාජ්‍යයන්ටත් මධ්‍යගත ව පලස්තීනය පිහිටා ඇත.
- මෙම දේශය, බැබිලෝනියාවේ සිට අඩසඳක ආකාරයේ හාරාන් දේශය දක්වාත්, පසුව හාරාන්වල සිට අඩසඳක ආකාරයෙන් සිරියාව දක්වාත්, පසුව සිරියාවේ සිට අඩසඳක ආකාරයෙන් ඉජිප්තුව දක්වාත්, අඛණ්ඩව තිබූ සශ්‍රීක ප්‍රදේශවල පිහිටා තිබූ හෙයින් ''සශ්‍රීක අඩසඳ'' දේශය යැයි ද හඳුන්වන ලදී.

- පලස්තීනය මධ්‍යයෙන් උතුරේ සිට දකුණ දක්වා දිවෙන ජොර්දාන් නදිය කේන්ද්‍ර කරගනිමින්, එය ජෝර්දාන් නදියට බටහිරින් ඇති ප්‍රදේශය හා ජෝර්දාන් නදියට නැගෙනහිරින් ඇති ප්‍රදේශය ලෙස දෙකොටසකට බෙදා දැක්විය හැක.
- ඉජිප්තුවෙන් නික්ම ඉශ්‍රායෙල් ජනතාව ජෝෂුවාගේ නායකත්වයෙන් මෙම ජෝර්දාන් නදිය පසුකර ගොස් පලස්තීනය අත්පත්කර ගත් හ.
- ස්නාවක ජොහාන්තුමා ජුදයින්ට දේශනා කර බෞතීස්මය ලබාදුන්නේ ද, ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමාගෙන් බෞතීස්මය ලබාගත්තේ ද මෙම නදියේ දී ය.

2.1.1.1 **මධ්‍යධරණී වෙරළබඩ තීරය**

- පලස්තීනයේ මෙම ප්‍රදේශය ඇලෙක්සැන්ද්‍රියාවේ සිට වාඩි එල් අරිස් දක්වා විහිදී ඇත. මෙහි උතුර පටුවන අතර දකුණ පළල් ව පිහිටා ඇත.
- මෙම ප්‍රදේශයෙන් හීසොන්, ජාකොන් යන නමින් යුත් කුඩා අතු ගංගා දෙකක් ද ගලා බසියි..
- 'මුහුදු මාර්ගය' යැයි හඳුන්වනු ලැබූ ජාත්‍යන්තර අධිවේගී මාර්ගය උතුරු මායිමේ සිට දකුණු මායිම දක්වා විහිදෙයි. මෙම ප්‍රදේශය තැනිතලාවක් ලෙස ද හඳුන්වති. ආකෝ තැනිතලාව, එස්ත්‍රලෝන් තැනිතලාව, සාරෝන් තැනිතලාව, පිලිස්ති තැනිතලාව, බටහිර නේගෙබ් වශයෙන් මෙම ප්‍රදේශය බෙදා දක්වති.

**ආකෝ තැනිතලාව**

- මධ්‍යධරණී වෙරළබඩ තීරයේ පිහිටා ඇති ලෝකප්‍රසිද්ධ වරාය නගර ප්‍රදේශයකි.
- මධ්‍යධරණිය, පෙරදිග රටවල් හා සබඳතා පැවැත්වූ දියුණු වෙමින් පවතින වෙළඳ කේන්ද්‍රයක් ලෙස වසර 2500 ක් පමණ කාලයක් පැවතුණි.
- මකබිවරුන් හා ග්‍රීකයින් අතර මෙම ප්‍රදේශයේ දී යුද්ධයක් පැවතුණි. (1 මකබි 5:14-15, 20-23)
- ශුද්ධවූ පාවුලුතුමා තම තෙවන ධර්මදූත ගමනේ දී මෙම ප්‍රදේශය බැහැදැක ඇත. (ක්‍රියා 21:7)

**එස්ත්‍රලෝන් තැනිතලාව**

- මෙම තැනිතලාව ශුද්ධවූ බයිබලයේ මෙහිදෝ තැනිතලාව යැයි ද, ඉශ්රියල් තැනිතලාව යැයි ද හඳුන්වනු ලැබේ.
- මෙය පලස්තීනයේ මධ්‍යම කඳු පන්තියත්, එමෙන් ම ගලීලයත්, සමාරියත් වෙන්කර, වෙරළබඩ තීරයත් ජොර්දාන් නිම්නයත් සම්බන්ධ කරයි.
- ත්‍රිකෝණාකාර වූ මෙම ප්‍රදේශයේ තුඩු තුනෙහි ම පිළිවෙලින් කාර්මෙල් කන්ද, තාබෝර් කන්ද හා ඒබාල් කන්ද පිහිටා ඇත.
- මෙම ප්‍රදේශය හරහා හීසෝන් නදිය ගලා බසී. මෙය කෘෂිකර්මයට උචිත ප්‍රදේශයකි.

**සාරෝන් තැනිතලාව**

- මෙය වෙරළබඩ ප්‍රදේශයේ කේන්ද්‍රස්ථානය වේ.
- කාර්මෙල් කන්දේ සිට ජොප්පාව දක්වා කි.මී.64 දිග ය.
- මෙය වගුරුබිම් ප්‍රදේශයකි.

- නූතන නවීන නගරයක් වන ටෙල්-අවිව් මෙම ප්‍රදේශයේ දකුණු දිගින් පිහිටා ඇත.
- ජොප්පා නගරය පිහිටා ඇත්තේ ද මෙහි ය.

**පිලිස්ති තැනිතලාව**

- මෙම ප්‍රදේශය ජොප්පාවට දකුණින් ඉජිප්තු මායිම දක්වා විහිදී ඇත.
- ඉජිප්තුවෙන් නිදහස ලබා පැමිණි ඉශ්‍රායෙල් ජනතාව සම්සොන්, දාවිත් හා සලමොන් යන අයගේ නායකත්වයෙන් යුතු ව පිලිස්තිවරුන් හා සටන් වැදී මෙම ප්‍රදේශය අත්පත්කර ගත් හ.
- මෙම ප්‍රදේශයේ ඔලිව් ගස් හා ධාන්‍ය වර්ග බහුල ව වැඩුණි.
- අසුදෝසු, අස්කලෝන් හා ගාසා යන ප්‍රධාන නගර මෙම ප්‍රදේශයේ ඇත.

**බටහිර නේගෙබ්**

- නේගෙබ් වියළි කාන්තාරයකි.
- ශුද්ධ වූ බයිබලයේ ප්‍රධාන ස්ථානයක් ලෙස පිළිගනු ලබන බෙයර්ෂෙබා නගරය මෙහි පිහිටා ඇත.
- ආබ්‍රම් සමඟ දෙවියන්වහන්සේ ඇතිකර ගත් ගිවිසුම, ඔහු තම පුතණුවන්වන ඊසාක් හා එක්ව බෙයර්ෂෙබා යන ස්ථානයේ දී අලුත් කරගත්තේ ය.
- මෝසස් හා ඉශ්‍රායෙල් ජනතාව පාළුකරය මැදින් වසර 40ක් ගමන් කළ අවස්ථාවේ වසර 38ක් ම මෙහි වාසය කළ හ.

**2.1.1.2 බටහිර කඳුකරය හා නිම්නය**

- පලස්තීනයේ කොඳු ඇටය ලෙස පවතින්නේ මෙම ප්‍රදේශය යි.
- මෙය මුලු පලස්තීනයෙන් ම ඉතා සශ්‍රීක ප්‍රදේශය කි.
- බටහිර කඳුකරය භූගෝලීය වශයෙන් කොටස් 3කට බෙදා දක්විය හැක.
  1. ගලීලය
  2. සමාරිය
  3. ජුදෙයාව

**ගලීලය**

- මෙය පලස්තීනයේ ඉතා සශ්‍රීක ප්‍රදේශය කි.
- ලෙබනන් කඳුපන්තිය හා සිරියාව උතුරු සීමාව ලෙසත්, කාර්මෙල් කඳුපන්තිය හා එස්ත්‍රලෝන් තෘණබිම් දකුණු සීමාව ලෙසත් පවතී.
- නව ගිවිසුමේ වැදගත් ස්ථානයක් වන ගලීලය ඉහළ හා පහළ ලෙස කොටස් දෙකකට බෙදා දක්වති.
- පලස්තීනයේ දැකිය හැකි ඉතා උස්වූ කඳුපන්තිය පිහිටා ඇත්තේ ගලීලයේ ඉහළ කොටසේ ය.
- කුඩා ගල්වැටි හා සශ්‍රීක ප්‍රදේශ ගලීලයේ පහළ කොටසේ දැකිය හැක.

**සමාරිය**

- ගලීලය හා ජුදෙයාව අතර ඇති කඳු ප්‍රදේශයකි. නැගෙනහිර ජොර්දාන් ගං ඉවුරත්, බටහිරින් මධ්‍යධරණී මුහුදත් කුළුණු කොටගත් මධ්‍යම පලස්තීනයේ මෙම ප්‍රදේශය පිහිටා ඇත. ඉශ්‍රායෙලය උතුරු රාජ්‍ය හා දකුණු රාජ්‍ය ලෙස දෙකඩවීමෙන් පසු සමාරිය ප්‍රසිද්ධ විය.

- උතුරු රාජ්‍ය ක්‍රි.පූ. 722 හි අසිරියන්වරුන් විසින් අල්ලාගෙන එහි සිටියවුන් රටින් පිටුවහල් කර, පසුව අන්‍ය ජාතිකයින් ව රැගෙනවිත් එහි පදිංචි කරවූ හ. ජුදයින් හා අන්‍ය ජාතිකයින් මිශ්‍ර විවාහ කරගත් බැවින් බිහිවූ නව ජාතිය සමාරියයන් යැයි හඳුන්වනු ලැබූ හ. (2 රාජාවලිය 17:24)
- සමාරියේ ගෙරසීම් කන්ද ඇත. මෙහි සමාරීය දේවස්ථානයක් ගොඩනගා ගනිමින් මොවුන් වන්දනාමාන කළ හ. ජුදයින් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ සමාරියයන් හට ජේසුස්වහන්සේ ප්‍රේම කරන ආකාරයත් ඔවුන් හා ඇසුරු කරන ආකාරයත් සුවිශේෂය මඟින් හඳුනාගත හැක. (ජොහාන් 4:1-42 )

ජුදෙයාව

- පලස්තීනයේ තෙවන විශාල ප්‍රදේශය මෙය වේ.
- මෙය සමාරියට දකුණෙන් ද, ඊජිප්තුවේ සීනයි කාන්තාරය ට උතුරින් ද පිහිටා ඇත.
- මෙම ප්‍රදේශය කුඩා කඳුවැටිවලින් සමන්විත වූ ප්‍රදේශයක් ලෙස දැකිය හැකි විය.
- ජුදයින්ගේ ආධ්‍යාත්මික- සාමාජීයීය ජීවිතයේ කේන්ද්‍රස්ථානයවන ජෙරුසලම පිහිටා ඇත්තේ මෙම ප්‍රදේශයේ ය.
- එකම රාජ්‍යයක් ලෙස පැවති ඉශ්රායෙල් රාජ්‍යය උතුරු රාජ්‍යය හා දකුණු රාජ්‍යය ලෙස දෙකඩ වූ අවස්ථාවේ දකුණු රාජ්‍යයේ අගනුවර ලෙස ජුදෙයාව පැවතුණි.
- ජුදයින් මෙම ප්‍රදේශය පුරා වාසය කළ හ. ගලීලය, සමාරිය වැනි සශ්‍රීක ප්‍රදේශ තවත් නො වීය.

බටහිර බෑවුම

- ජොර්දාන් නිම්නය, මුහුදු මට්ටමේ සිට අඩි කිහිපයක් උසින් ඇරඹී, ජොර්දාන් ගඟ මුහුදට එක්වන මළ මුහුද අසල මුහුදු මට්ටමට වඩා අඩි 1000කට අධික ප්‍රමාණයක් ගැඹුරු ය.
- පලස්තීනයේ උතුරු ප්‍රදේශයේ හර්මෝන් නැමැති කඳු පන්තිය වැසී ඇති අයිස් දියවී, ජොර්දාන් නදියේ අතු ගංගා තුනට ම, ප්‍රමාණවත් ආකාරයට ජලය ලබා දෙයි.
- මෙහි මළ මුහුද ඇත. ජොර්දාන් ගඟ මුහුදට ගලා බසිනුයේ මෙම ස්ථානයේ දී ය. කිලෝ මීටර් 80 පමණ දිග කිලෝ මීටර් 16 පමණ පළල වූ මෙම ජල සීමාව ලුණු ගඟ (ද්වි.නි.සං 3:17) යැයි ද හඳුන්වති. මෙම ගංගාවේ කිසිඳු ජීවියෙකුට ජීවත් විය නොහැක. මෙම ගංඉවුරේ කිසිඳු බෝගවගාවක් කළ නො හැක. එබැවින් මළ මුහුද යැයි හඳුන්වනු ලැබේ.

**2.1.1.3 නැගෙනහිර කඳු හා කාන්තාරය**

- පලස්තීනයේ නැගෙනහිර ප්‍රදේශයේ ජොර්දාන් කඳු පන්තිය පිහිටා ඇත. මෙම ප්‍රදේශය පලස්තීනයේ මධ්‍යම කඳුකරයට වඩා සුලු ප්‍රමාණයක් උසින් වැඩි ය. මෙම ප්‍රදේශය බාසාන්, ගිලියද්, ආමෝන්, මොවාබ් හා ඒදොම් වශයෙන් බෙදිය හැක.

- බාසාන් ප්‍රදේශය මනස්සේ ගෝත්‍රයට ලබාදෙන ලදී. මෙහි බටහිර ප්‍රදේශය සශ්‍රීක ප්‍රදේශයක් ලෙස ද, නැගෙනහිර ප්‍රදේශය වියළි ප්‍රදේශයක් ලෙස ද පවතී. මෙම ප්‍රදේශය හොඳින් හැඳුණු වැඩුණු හරකුන් හා එළදෙනුන් දැක්කීමට ප්‍රසිද්ධ ප්‍රදේශයකි.

- බාසාන් හා මෝවාබ් මිටියාවත අතර ගිලියද් පිහිටා ඇත. මෙම ප්‍රදේශය රූබන්, ගාද්, මනස්සේ යනාදි ගෝත්‍රවලට ලබාදෙන ලදී. මෙහි කඳු, ලඳුකැළෑ හා ඔලිව් ගස් දැකිය හැකි විය.

- ජොර්දාන් නදිය ට නැගෙනහිරින් ආමොන් ප්‍රදේශය දැකිය හැක. ආබ්‍රහම්ගේ බෑනණුවන් වූ ලොත්ගේ පුත්‍රයාණන් වන අම්මි නැමැත්තා මෙම රටේ නිර්මාතෘ යැයි පැවසේ. ඔහුගේ පෙළපත අමෝනිවරුන් ය.

- මළමුහුදේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටා ඇති උස් කඳුකරය මෝවබ් මිටියාවත නම්වේ. මුහුදු මට්ටමේ සිට අඩි 3000ක් පමණ උස් වූ ප්‍රදේශයකි. නික්මයාම ගමනේ දී, මෝසස් ඉශ්රායෙල්වරුන් ව මෙම ප්‍රදේශයෙන් ආරක්ෂිත ව රැගෙන ගියේ ය (ගණන් 35:1). මෝසෙස් මෙම ප්‍රදේශයේ ඇති නෙබෝ නම් කන්දේ සිට පොරොන්දු දේශය වන කානාන් දේශය බැලුවේ ය. (ද්වි.නි.සං. 34:1-4)

- පලස්තීනයේ දකුණු ප්‍රදේශයේ ඒදොම් කාන්තාරය ඇත. මෙහි ජීවත්වන ජනතාව ඉදුමියවරුන් යැයි හඳුන්වනු ලැබූ හ. රෝම රාජ්‍ය සමයේ පලස්තීනය පාලනය කළ හෙරෝද් රජ ඉදුමිය ජාතිකයෙකු බව සඳහන් කළයුතු ය.

### 2.1.1.4 ප්‍රධාන භූමි ප්‍රදේශය හා නගර

ජුදා කිතුනු ශිෂ්ටාචාරයන්හි ආරම්භය පලස්තීනයේ සිදුවී ඇත. නව ගිවිසුම කාලසේ පලස්තීනයේ ප්‍රධාන භූමිභාගය ලෙස සැලකුනේ ගලීලය, සමාරිය හා ජුදෙයාව වැනි ප්‍රදේශයන් ය.

#### 2.1.1.4.1 ගලීලය

නාසරෙත් හි ජේසුස් වහන්සේගේ ජීවිත කාලය තුල බොහෝ කාලයක් ගලීලය ප්‍රදේශය තුළ ගතවුණි. ගලීලයේ නාසරතය, කානා, නායින්, කපර්නාවුම, තිබේරියා හා බෙත්සයිදා, තාබෝර් කන්ද වැනි ප්‍රධාන ස්ථාන දැකිය හැකිවිය.

**නාසරතය**

ජෙරුසලමේ සිට කිලෝමීටර් 72 පමණ දුරින් පිහිටි මෙම නගරය මුහුදු මට්ටමෙන් අඩි 1200 පමණ උසින් පිහිටා ඇත. ජේසුස් වහන්සේ තම තරුණ කාලය මෙම ප්‍රදේශයේ ගත කළ සේක. ජේසුස් වහන්සේගේ උපන්ගම ලෙස හඳුන්වනු ලැබූ නාසරතයේ කෘෂිකාර්මික කටයුතු ඉතා හොඳින් සිදුවුනි. මිදි, අත්තික්කා හා ඔලිව් ගස් සරුවට වැඩෙන ස්ථානයකි. මෙහි වඩුවන්, ගොපල්ලන් හා ගොවියන් වාසය කරති. ජේසුස් වහන්සේ නාසරතයේ ධර්මශාලවේ දී යෙසායා දිවැසිවරයාගේ පුස්කොළ පොත කියවා, පැහැදිලි කරමින් තම ප්‍රසිද්ධ ජීවිතය ඇරඹූ සේක.

**කානා**

නාසරතයට කිලෝමීටර් 8ක් දුරින්, උතුරුකරයේ පිහිටා ඇති කඳුකර ප්‍රදේශයකි. ජොහාන් සුවිශේෂයට අනුව ජේසුස් වහන්සේ මෙම නුවර දී තම ප්‍රථම ප්‍රාතිහාර්යය වන ජලය මිදියුෂ බවට හැරවීමේ ප්‍රාතිහාර්යය කළසේක. (ජොහාන් 2:1-11)

**නායින්**

තාබෝර් කන්දට තරමක් දකුණින් නායින් නුවර පිහිටා ඇත. මෙහි දී ජේසුස් වහන්සේ වැන්දඹු ස්ත්‍රියගේ පුතා මරණින් නැගිට වූ සේක. (ලූක් 7:11-16)

**කපර්නාවුම**

මෙම නගරය ගලීල මුහුදේ උතුරු වෙරළේ පිහිටා ඇත. සුවිශේෂයට අනුව ජේසුස් වහන්සේ තම දෙමාපියන් සමඟ මෙහි වාසය කළ සේක. (මතෙව් 4:13, මාක් 2:1, 3:32) ශ්‍රාවකයෙකු වන මතෙව්තුමාගේ නිවස පිහිටා තිබුණේ ද මෙම ප්‍රදේශයේ ය. (මතෙව් 2:15-17) අශුද්ධාත්මය පළවා හැරීම(මාක් 1:21-28), පේදුරුතුමාගේ නැන්දනියගේ උණ රෝගය සුවකිරීම (මාක් 1:29-31), අංසබාග රෝගියා සුවකිරීම (මාක් 2:1-12) වැනි ප්‍රාතිහාර්යයන් සිදු කළේ ද මෙම ප්‍රදේශයේ ය.

**තිබේරියස්**

රෝම අධිරාජ්‍යයා තිබේරිය සීසර්ගේ නමින් හොරෝද් රජ රෝමානු සංස්කෘතියට අනුව මෙම නගරය ගොඩනැගීය. මෙම නගරයේ වැදගත්කම නිසා, මේ අසල වූ ගලීල මුහුදට තිබේරියස් මුහුද යැයි ජනතාව හැඳින්වූ හ. සැතැපුම් තුනක් පමණ දිග පවුරකින් මෙම නගරය වට වී ඇත. මෙහි දේවස්ථාන, නිවාස, පොදු වැසිකිලි, රජමාළිගා, කලා මණ්ඩප හා නාට්‍යාගාර ආදිය තිබුණි. තිබේරියස් අසල පුරාණ කානානිවරුන්ගේ නගරයක් පුරාවිද්‍යාඥයින් මෑතක දී සොයා ගත් හ.

**බෙත්සයිදා**

කපර්නාවුම ට ඉතා සමීපයේ බෙත්සයිදා නමැති නගරය පිහිටා ඇත. කුඩා ධීවර ගම්මානයක් වූ බෙත්සයිදාව හොරෝද් රජුගේ පුත් පිලිප්, රෝම කලාවට අනුව නගරයක් ලෙස ගොඩනගා, තම ප්‍රධාන නගරය කර ගත් හ. අපෝස්තුළුවරයෙක් වූ පේදුරු හා අන්ද්‍රෙයාස් තුමන්ලාගේ නගරයත්, පිලිප්ගේ උපන් ස්ථානයත් මෙය විය. තමන් කෙරෙහි විශ්වාසය නො තැබූ මෙම නගරයට ජේසුස් වහන්සේ ශාපකළ සේක. (ලූක් 10:13-15) වර්තමානයේ මෙම නගර පාළුවී ඇත.

**තාබෝර් කන්ද**

එස්ත්‍රලෝන් තැනිතලාවේ එක් කොණක තාබොර් කන්ද පිහිටා ඇත. මෙය මුහුදු මට්ටමේ සිට අඩි 1800 වඩා උසැති ප්‍රදේශයකි. මෙම කඳු මුදුනේ සිට කාර්මෙල් කන්ද හා හර්මෝන් කන්ද බැලිය හැක. ජේසුස් වහන්සේ අන්‍යරූප විලාශ වූයේ මෙම කන්ද මත දී ය. (මාක් 9:1)

**2.1.1.4.2 සමාරිය**

ෂෙකෙම් නගරය සමාරියේ ප්‍රධාන නගරයකි. පලස්තීන ඉපැරණි නගර අතුරෙන් මෙය ද එක් නගරයකි. ආබ්‍රහම් කානාන් දේශයට ඇතුලු වී ප්‍රථමයෙන් මෙම ස්ථානයේ නතර වූ අතර, මෙහි පූජාසනයක් ද ඉදි කළේ ය. (උත්පත්ති 12:6-7) ඉශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවෙන් ගෙන ආ ජෝශප්තුමාගේ ඇටකටු තැන්පත් කළේ ද මෙහි ය. (ජෝෂුවා 24:32). ජාකොබ්තුමාගේ ළිඳ ද මෙහි පිහිටා ඇත (ජොහාන් 4:6). මෙහි දී ජෝෂුවා ජනතාවට තම අවසාන දේශනය පැවැත්වී ය. (ජෝෂුවා 24:1-29)

**2.1.1.4.3 ජුදෙයාව**

හේබ්‍රොන්, ජෙරුසලම, බෙත්ලෙහෙම, ජෙරිකෝව, බෙතානිය, ඔලිව් කන්ද යනාදිය ජුදෙයාවේ ඇති වැදගත් ස්ථාන යැයි සඳහන් කළ හැක.

**හේබ්‍රොන්**

මුහුදු මට්ටමේ සිට අඩි 3300 ක් පමණ උසින් පිහිටා ඇති මෙම නගරය ජුදෙයාවේ ඉතා උස් ප්‍රදේශයක පිහිටා ඇත. ආබ්‍රහම් හා සාරා භූමදාන කරනු ලැබුවේ මෙම ප්‍රදේශයේ ය. (උත්පත්ති 23:19, 25:9) දාවිත් රජ අභිෂේක කරනු ලැබුවේ ද මෙම ස්ථානයේ ය. (2 සාමුවෙල් 2:1-4, 15:7-10) ජල සම්පත ඇති නිසා පළතුරු ගස් මෙහි සරුසාර ලෙස වැවේ. වීවීම, වීදුරු කර්මාන්තය ආදිය ප්‍රමුඛ වෘත්තීන් වේ. වර්තමානයේ මෙය ඉස්ලාම් නගරයකි.

**ජෙරුසලම**

ගැළවීමේ ඉතිහාසය කේන්ද්‍ර කොටගත් මෙම නගරය අඩි 2550 ක් පමණ උසැති කන්දක් මත පිහිටා ඇත. මධ්‍යධරණී මුහුදේ සිට කිලෝමීටර් 53 නැගෙනහිරින්ද, මළ මුහුදේ උතුරු තුඩුවේ සිට කිලෝ මීටර් 22ක් බටහිරින්ද මෙම නගරය පිහිටා ඇත. දෙවියන් ගේ නගරය යැයි හඳුන්වනු ලබන මෙම නගරය ක්‍රි. පූ. 1000 දී දාවිත් රජ විසින් අත්පත් කර ගොඩනගන ලද්දකි. ජුදෙව්වරුන්ගේ ප්‍රසිද්ධ දේව මාළිගාව පිහිටා ඇත්තේ මෙහි ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිතයේ ප්‍රධාන සිදුවීම් බොහෝමයක් මෙම ප්‍රදේශයේ සිදු වී ඇත.

**බෙත්ලෙහෙම**

හේබ්‍රොන් නගරයට උතුරින් කිලෝ මීටර් 24 පමණ දුරින්, ජෙරුසලමට කිලෝ මීටර් 8ක් පමණ දුරින් මෙම නගරය පිහිටා ඇත. දේවපුත්‍ර ජේසුස් වහන්සේ උපත ලැබුවේ මෙහි ය. ක්‍රි.ව. 4 වන සියවසේ දී කොන්සන්ටයින් අධිරාජ්‍යයා විසින් මෙහි විශාල දේව මාළිගාවක් ගොඩනගන ලදී. වර්තමානයේ බෙත්ලෙහෙමේ ජීවත් වන බොහෝමයක් ජනතාව කතෝලිකයන් ය.

**ජෙරිකෝව**

ජෙරුසලමේ සිට කිලෝ මීටර් 27.2 දුරින් මෙම නගරය පිහිටා ඇත. තවද මුහුදු සීමාවෙන් අඩි 800 පමණ පහළින් පිහිටා ඇත. ඉශ්‍රායෙල් ජනතාව, ඊජිප්තුවෙන් පිටත් වී කානාන් දේශයට ඇතුල්වනවිට මුලින් ම අත්පත් කර ගත්තේ ජෙරිකෝවයි. (ජොෂුවා 6) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජෙරිකෝව අසල වූ ජෝර්දාන් ගඟේ ප්‍රසාද ස්නාපනය ලැබූ බව කියැවේ. ජේසුස් වහන්සේ යහපත් සමරිතානුවරයාගේ උපමාවේ දී මෙම නගරය පිළිබඳ සඳහන් කරන සේක. (ලූක් 10:30)

**බෙතානිය**

බෙතානිය ජෙරුසලමට නැගෙනහිරින් කිලෝ මීටර් 3.2 දුරින් පිහිටා ඇත. ජේසුස් වහන්සේගේ මිතුරෙකු වූ ලාසරස් හා ඔහුගේ සොයුරියන් වන මාර්තා හා මරියා ජීවත් වුයේ මෙම ප්‍රදේශයේ ය. ජේසුස් වහන්සේ ලාසරස් මරණයෙන් නැගිටවනු ලැබුවේ ද මෙහි දී ය. (ජොහාන් 11:35-53) ලාදුරු රෝගියෙකු වූ සීමොන් ගේ නිවසේ ජේසුස් වහන්සේ ආහාර අනුභව කරන විට පව්කාර ස්ත්‍රීය සුවඳ තෛලයකින් උන්වහන්සේ ගේ පාද ආලේප කලේ ද මෙම ස්ථාන යේ දී ය. (මතෙව් 26:6,මාක් 14:3, ජොහන් 12:3)

**ඔලිව් කන්ද**

ජෙරුසලම අසල ජෙත්රෝ නිම්නයට නැගනෙහිරින් ඔලිව්කන්ද පිහිටා ඇත. මෙම කඳු බෑවුමේ ඔලිව් ගස් සරුවට වැඩී ඇත. ජෙත්සමනි උයන ඇත්තේ ද මෙම ප්‍රදේශයේ ය. ජේසුස් වහන්සේ කීප අවස්ථාවක දීම පැමිණ දෙවි පියාණන්ට මෙම ස්ථානයේ දී යාච්ඤා කළ බව සුවිශේෂයන්හි සඳහන් වේ. ජේසුස් වහන්සේ තම දුක් විඳීමට හා මරණය ට මුහුණදීමට පෙර මෙම ස්ථානයට ගොස් දෙවි පියාණන් ට යාච්ඤා කළ සේක. මෙහි දේවස්ථාන බොහෝමයක් දැකිය හැක.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකරකම්**

1. පලස්තීනයේ භූගෝලීය පසුබිම පිළිබඳ රචනාවක් ලියයි.
2. පලස්තීනයේ වැදගත් ස්ථානයක් හා ඒවායේ විශේෂත්වයක් සඳහන් කරයි.
3. දේවස්ථාන වල හා ශුද්ධවූ ස්ථානවල ශුද්ධත්වය රකිමු යන මැයෙන් පෝසටර්යක් නිර්මාණය කරයි.

**නිපුණතාව 2.0** : .පලස්තීනයේ භූගෝලීය ඉතිහාසයේ පසුබිම වටහා ගෙන තම ජීවිතය සකසා ගනියි.

**නිපුණතා මට්ටම 2.2** : පලස්තීනයේ භූගෝලීය පසුබිම වටහා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- ජුදා ඉතිහාසය පිළිබඳ කරුණු රැස්කරයි.
- ඉශ්රායෙල් ඉතිහාසය තුළ දේව ප්‍රකාශනය සිදුවී ඇති බව පිළිගනියි.
- ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිත සිදුවීම් තුළ දෙවියන් වහන්සේ ව අත්දකියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය**

**2.2.1 පුරාණ ඉශ්රායෙල් ඉතිහාසයේ ප්‍රධාන අංශ**

**2.2.1.1 ගෝත්‍ර නායකයන්ගේ කාලය**

- ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුම දළ වශයෙන් ඉශ්රායෙල් ජනතාවගේ වසර 2000ක් පමණ පැරණි ඉතිහාසය අඩංගු ග්‍රන්ථය කි.

- ඒ අනුව ඉශ්රායෙල් ජනතාවගේ ඉතිහාසය ගෝත්‍ර නායකයෙකු වන ආබ්‍රහම් කැඳවීමත් සමඟ ඇරඹුණි.

- ගෝත්‍ර නායකයෙකු යන වචනය තුළින් ජාතියක, ගෝත්‍රයක පියා යන අර්ථය දෙයි.

- ආබ්‍රහම්, ඊසාක් හා ජාකොබ් ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර නායකයින් වෙති. මොවුන් පිළිබඳ ඉතිහාසය අපට උත්පත්ති 12 වන පරිච්ඡේදයේ සිට 50 වන පරිච්ඡේදය දක්වා දැකිය හැක.

- ආබ්‍රහම් මොසපොතේමියානු ජාතිකයෙකි. ආබ්‍රහම් හාරාන් නම් ප්‍රදේශයේ බැටළුවන් බලාගනිමින් සිටිය දී දෙවියන් වහන්සේ ගෙන් කැඳවීමක් ලැබ කානාන් දේශයට යවනු ලැබී ය. (උත්පත්ති 12:1-6)

- කානාන් දේශයේ මම්රේ නම් නිම්නයේ හෙබ්‍රොන් නම් ස්ථානයේ ස්ථිර ව පදිංචි වී සිටි අවස්ථාවේ දෙවියන් වහන්සේ ඔහු හා ගිවිසුමක් ඇතිකරගත් සේක. (උත්පත්ති 15:1-21, 17:1-22)

- දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇතිකරගත් ගිවිසුම ඔහුගේ පුත් ඊසාක් සමග ද, ඊසාක්ගේ පුත් ජාකොබ් සමඟ ද අලුත් කරගත් සේක.

- ගැලවීමේ සැලැස්ම තුළ ආබ්‍රහම් ට පසුව ජාකොබ් වැදගත් තැනක් උසුලයි. ජාකොබ්ට **'ඉශ්රායෙල්'** යන නම ලබාදෙන ලදී. (උත්පත්ති 32:28)

- ජාකොබ්තුමාට පසුව ඔහුගේ පුතුන් 12 දෙනා මගින් ගෝත්‍ර දොළසක් ඇති වූ අතර, තම පියාගේ නම වන ඉශ්රායෙල් යන්න තම ජාතියේ නාමය ද කර ගත් හ.

**2.2.1.2 නික්මයාම**

- ජාකොබ්ගේ පුතුන් දොළොස් දෙනාගෙන් එක්කෙනෙකුවන ජෝශප් ඊජිප්තුවේ ආණ්ඩුකාරවරයා ව සිටි අවදියේ දී ජාකොබ්, ඔහුගේ දරුවන් හා පවුලේ අය ලෙස 70 දෙනෙකු ඊජිප්තුවට ගොස් ගෝෂෙන් නම් සශ්‍රීක ප්‍රදේශයක පදිංචි වූහ.

- එම කාලයේ, එනම් ක්‍රි.පූ. 1720-1550 දක්වා කාලයේ 'හිකොස්' නම් වූ අන්‍ය ජාතිකයින් විසින් ඊජිප්තුව අල්ලා ගෙන පාලනය කරන ලදී. මොවුන් ද සෙමතික මිශ්‍රජාතීන් වූහ.

- මෙම කාලයේ සෙමතික ජාතියට අයත් බොහෝදෙනා ඊජිප්තුවට පැමිණිය හ. මොවුන් සියලු දෙනා ම හෙබ්‍රෙව්වරුන් හා එක්වී ඉශ්රායෙල් යන විශාල ජාතිය බවට පත්වූ හ.

- නමුත් 3 වන දොද්මොෂ් (ක්‍රි.පූ. 1490 -1430) යන පාරාවෝ රජ හිකොස්වරුන්ගේ පාලනයෙන් මුදවා ඊජිප්තු අධිරාජ්‍යය ස්ථාපිත කළේ ය.

- ක්‍රි.පූ. 1375-1366 අතර කාලයේ ඊජිප්තුව රජකම්කළ 4වන ආමන් ගොටබු නම් වූ පාරාවෝ රජ සූරිය දෙවියන් වන තමන් හැර වෙනත් දෙවිකෙනෙකු වන්දනාමාන නොකළයුතු ය යන්නෙහි දැඩි ව එල්බ සිටියේ ය.

- ඊජිප්තුව දෙවන රමසෙස් නමැති පාරාවෝ රජුගේ පාලන සමයේ (ක්‍රි.පූ.1290-1224) ඉශ්රායෙල් ජනතාව වහල් ජීවිතයක් ගත කළ හ.

- නව රජු ඉශ්රායෙල් ජනතාවගේ ගණන වැඩිවීම හා ඔවුන්ගේ මිනිස්බලය ශක්තිමත් වනු දැක, බිය වී, ඔවුන්ගේ බලය හීන කිරීම සඳහා, ඔවුන් ට විරුද්ධ ව ඉතා කෲර ආකාරයට ජාතිය විනාශ කිරීමේ ක්‍රියාකලාපයක් අනුගමනය කළේ ය.

- ඊජිප්තුවේ ඉශ්රායෙල් ජනතාවට ඉතා බරවැඩ කිරීමට නියෝගයක් ලැබුණි. වහල්වැඩ ගැනීමට නිලධාරීන් පත්කරනු ලැබූ හ. කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, කෘෂිකර්මය වැනි වැඩ ගනිමන් ඔවුන්ට වදහිංසා කළ හ. පිතොම්, රමසෙස් වැනි විශාල නගර දෙකක් තැනීමට නියෝග කළ හ.

- මේ හැර හෙබ්‍රෙව්වරුනට උපදින පිරිමි දරුවන් මරා දමන ලෙස හෙදියන්ට නියෝග කළ අතර, ඔවුන්ගේ අතින් මිදෙන දරුවන් නයිල් ගඟට විසිකර මරාදමන ලෙස මව්වරුනට නියෝග කළ හ. මෙලෙස ඉශ්රායෙල් ජනතාව ඊජිප්තුවේ බොහෝ පීඩා වින්ද හ.

- ඊජිප්තුවන්ගේ වහල්කම දැරිය නොහැකි වූ ඉශ්රායෙල් ජනතාව මෝසස් හා ආරෝන්ගේ නායකත්වයෙන් එහි සිට නික්මයාමට පටන්ගත් හ. (මෙම පසුබිම තුළ ඊජිප්තුව පුරා වසංගත බෝ විය.)

- මෝසෙස්ගේ නායකත්වයෙන් නික්ම ගිය ඉශ්රායෙල් ජනතාව රතු මුහුද පසුකර සීනයි කඳු මුදුනේ දී යාවේ දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමක් ඇති කර ගත් හ. යාවේ දෙවියන් වහන්සේ බොහෝ අරුම පුදුම දෑ සිදුකර තමන් ම ඊජිප්තුවෙන් බේරාගත් බව ස්ථිරව ම විශ්වාස කළ හ.

**සිනයි ගිවිසුම**

- ඉශ්රායෙල් ජනතාව එජිප්තුවෙන් නික්ම 3 වන මාසයේ පළමුවන දින සීනයි කන්ද අසලට පැමිණිය හ. ඉශ්‍රායෙල් ජනතාව සීනයි පාළුකරයට පැමිණි අවස්ථාවේ දී දේවප්‍රකාශනය අත්දුටු හ.

- සීනයි කන්දේ දී දෙවියන් වහන්සේ මොසෙස් මඟින් ඉශ්‍රායෙල් ජනතාව සමඟ ගිවිසුමක් ඇති කරගත් සේක. එම ගිවිසුම මඟින් එක ම දෙවියන්වහන්සේ වන යාවේ දෙවියන් වහන්සේ ට පමණක් වන්දනා කළයුතු බව ඉශ්‍රායෙල් ජනතාව පිළිගත් හ. තව ද මෙම ගිවිසුම මඟින් ඉශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ ට අයත් සම්පතක්, පූජක රාජ්‍යයක් හා කැප වූ ජාතියක් වූ හ. (නික්ම 19:5-6)

- සීනයි කන්ද මත දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව සමඟ ඇතිකරගත් ගිවිසුම, පුරාතන හිත්තීය, අසිරියාව වැනි පෙරදිග රටවල් ක්‍රි.පූ. 13,14 වන සියවස්වල අධිරාජ්‍යයින් හා ඔවුන් අත්පත් කරගන්නා කුඩා රටවල්වල යුවරජුන් සමඟ ඇතිකරගත් ගිවිසුම හා සමානත්වයක් දැකිය හැක. එම ගිවිසුමේ සැකැස්ම තුළ පහත සඳහන් වැදගත් අංග දැකිය හැක.

    1. ගිවිසුම ඇතිකර ගැනීමට යන තැනැත්තා, අධිරාජ්‍යයා පිළිබඳ ව හොඳින් විමසා දැනගැනීම.
    2. අධිරාජ්‍යයා විසින් මින්පෙර කාලවල අත්පත්කරගත් දේශයන් ට කළ උදව් උපකාර, සුභසාධන පිළිබඳ ඉතිහාසය දැනගැනීම
    3. ගිවිසුම තුළින් තහංචි පනවනලද කොන්දේසි, වගකීම් හා අයිතිවාසිකම්
    4. දේවසාක්ෂි, ආශිර්වාදයන් හා ශාපයන් පිළිබඳ ලැයිස්තුව
    5. ගිවිසුම කියවා, භෝජන සංග්‍රහයක් සමඟින් අවසන් කිරීම
    6. පසුව ගිවිසුම් පත්‍රය ශුද්ධවූ ස්ථානයක සුරක්ෂිත ව තැන්පත් කෙරේ.

- සීනයි ගිවිසුමේ ද මීට සමාන අංග දැකිය හැක. දෙවියන් වහන්සේ ව හඳුනාගෙන, ඔවුන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට කළ අරුම පුදුම ක්‍රියා පිළිබඳ දැන ගැනීම (නික්ම 19:4-6, 20:2), කොන්දේසි, වගකීම් හා ආඥා (නික්ම 20 :3-23:33), ගිවිසුම කියවීම (නික්ම 24:7), භෝජන සංග්‍රහය පැවැත්වීම (නික්ම 24:9-11), ශුද්ධවූ ස්ථානයක ගිවිසුම සුරක්ෂිතව තැබීම (නික්ම 25:16), දේවසාක්ෂි, ආශිර්වාදයන් හා ශාප වැනි කරුණු ද්විතීය නීති සංග්‍රහය තුළ දැකිය හැක.(ද්වි.නී.ස. 4:26, 30:19, 27:11-26 )

- සීනයි ගිවිසුම මඟින් සාමාන්‍ය එඬේරුන් ලෙස ජීවත්වූ ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේට අයිති රාජකීය, පූජක, ශුද්ධවූ ජනතාවක් වූ හ.

- ඔවුන්ට ම අනන්‍යවූ ජීවිත රටාවක් සකසා ගැනීමට මේවා සියල්ල පදනම් විය.

### 2.2.1.2 විනිශ්චයකාරවරුන්ගේ කාලය (ක්‍රි.පූ. 1300-1100)

- ඉශ්‍රායෙල් ජනතාව සීනයි කඳු මුදුනේ දෙවියන්වහන්සේ සමග ගිවිසුමක් ඇතිකරගැනීමෙන් පසු ව ජෙරිකෝව හරහා කානාන් දේශයට ඇතුල්වී එහි සිටි කානානිවරුන් හා පිලිස්තිවරු සමග යුද්ධ කර ඔවුන් පරාජයට පත්කර, පියවරෙන් පියවර එම දේශය අත්පත් කරගත් හ.

- ජොෂුවා ඉශ්‍රායෙල් ජනතාව ට නායකත්වය දෙමින් ඔවුන් ව කානාන් දේශයට රැගෙන ගිය අතර එහිදී ඔවුනට විනිශ්චය ලබා දී, ප්‍රථම විනිශ්චයකාරවරයා ලෙස කටයුතු කළේ ය.

- කානාන් දේශයේ ඉශ්‍රායෙල් ජනතාව ගෝත්‍රවලට බෙදී ජීවත් වූ අතර, කානානිවරුන් හා මිශ්‍ර ව ජීවත් වූ හ. කාලයාගේ ඇවෑමෙන් ඉශ්‍රායෙල් ජනතාව ගිවිසුමේ දෙවියන්වහන්සේ අමතක කර, තම පරිසරය තුළ ජීවත්වූ ජනතාවගේ දෙවිවරුන්ට වන්දනාමාන කරන්නට පටන්ගත් හ. මෙහි ප්‍රතිපලයක් ලෙස ඉශ්‍රායෙල් ජනතාවට බොහෝ පීඩා විදීමට සිදුවිය. (වීරාවලිය 2:11-3:6, 10:6-16)

- තම ජනතාව කෙරෙහි අනුකම්පා කළ දෙවියන්වහන්සේ ඔවුන් ගලවාගැනීමට යුගයෙන් යුගයට නායකයින් තෝරාගත් සේක. ඔවුහු 'විනිශ්චයකාරවරු' යැයි හඳුන්වනු ලැබුවෝ ය. මොවුන් අතුරින් බොහෝ දෙනෙකු බලසම්පන්න වීරවරුන්, සේනාපතිවරුන් හා ආණ්ඩුකාරවරුන් ලෙස ද සිටිය හ. ඔත්නියෙල් (වීරා 3:7-11), දෙබෝරා (වීරා 4:1-24), ගිඩියොන් (වීරා 6:11), අබිමෙලෙක් (වීරා 9:16), ජෙප්තා (වීරා 11:1), සම්සොන් (වීරා 13:24-25) යන අය ඉශ්‍රායෙල්වරුනට මග පෙන්වූ ප්‍රධාන විනිශ්චයකාරවරු වූහ.

- ඔත්නියෙල් වසර අටක කාලයක් ඉශ්‍රායෙල් ජනතාව වහලුන් ලෙස තබාගෙන සිටි මෙසපොතේමියානු රජ වූ කුෂාන් රිෂාතයිම් ගෙන් ඔවුන් මුදවා ගත්තේ ය.

- ඉශ්‍රායෙල් ජනතාවට විනිශ්චය ලබාදුන් දෙබෝරා, ඉශ්‍රායෙල් ජනතාවට වසර විස්සක් පුරා පීඩා කළ කානානිය රජු ජාබින් හා ඔහුගේ හමුදාවත් බාරුක්ගේ සහය ඇතිව විනාශකොට ඔවුන් මුදවා ගත්තා ය.

- ගිඩියොන් වසර හතක් මුළුල්ලේ ඉශ්‍රායෙල් ජනතාවට පීඩා කළ මිදියන්වරුන් පරාජය කර ඔවුන් ගලවා ගත්තේ ය.

- සැම්සොන් ඉශ්‍රායෙල්වරුන් ට පීඩා කළ පිලිස්තිවරුන් පරාජය කර, ඔවුන් ආරක්ෂා කළේ ය.

**ඉශ්‍රායෙලයේ විනිශ්චයකාරවරුනට දෙවියන්වහන්සේ පැවරූ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් ආකාරයට සඳහන් කළ හැක.**

1. අන්‍යජාතිකයින්ගේ හමුදාවලින් ජනතාව මුදවාගැනීම
2. සමාජය තුළ නීතිය තහවුරුකිරීම
3. සමාජයේ ඇතිවන භේද, ගැටුම් ආදිය නිරාකරණය කිරීම
4. ඔවුන් තම ජීවිත කාලය පුරාම ගිවිසුමට පක්ෂපාතී ව කටයුතු කර දේව සැලැස්ම සම්පූර්ණත්වයට පත්කිරීම

**2.2.1.4 රජ සමය**

- රජ සමය ඉශ්රායෙල්වරුන්ගේ ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයකි. මෙම කාලවකවානුවේ ඉශ්රායෙල්වරුන්ගේ ආගමික, සමාජීයීය හා සංස්කෘතිය තුළ ඉමහත් වර්ධනයක් සිදුවිය. සාහිත්‍යයන් බිහිවීමට පටන් ගැනුණි. රජවාසල, දේවමාළිගාව, ගොඩනැගිලි ලෙස ගොඩනැගිලි කලාවේ දී ඉමහත් වර්ධනයක් ඇති විය.
- විනිශ්චයකාරවරුන්ගේ කාලයේ ඉශ්රායෙල් ජනතාව නිතර නිතර ඔවුන් වටා විසූ අන්‍ය රජවරුන් විසින් ආක්‍රමණය කරනු ලැබූ නිසා තමන් ව ආරක්ෂා කිරීමට රජ කෙනෙකු අවශ්‍ය බව වටහා ගැනීමට පටන් ගත් හ.
- අවසාන විනිශ්චයකාරවරයාත් දිව්‍යසිවරයාත් වූ සාමුවෙල් වයස්ගත වූ විට තම සේවා ව තම පුතණුවන්ට පැවරුවේ ය.

**රාජ්‍ය පාලනය ඇතිවීමට හේතු**

1. අසල්වැසි රටවල් වල රාජ්‍ය පාලනයක් දැකීම
2. රාජ්‍ය පාලනය මගින් ඉශ්රායෙල් ජනතාව තමන්ට ම අනන්‍ය වූ සංස්කෘතියක් හා සාරධර්මවලින් හෙබි ජනතාවක් බව අන් අයට පෙන්වාදීමේ අවශ්‍යතාව
3. තම විරුද්ධවාදීන් ජයගැනීමට රජ කෙනෙකු හා හමුදාවක් අවශ්‍ය ය යන අදහස
4. ඉශ්රායෙල්වරුන් අතර සාමුවෙල්ගේ දරුවන් හරියාකාර ව ක්‍රියා නොකළ හ. ඔවුහූ අල්ලස් ගෙන යුක්තියට පිටු පා ක්‍රියාකළ හෙයින් කෝපයට පත් ජනතාව, තමන් ට රජ කෙනෙකු ලබා දෙන ලෙස ඉල්ලූහ. (1සාමුවෙල් 8:3-5). සාමුවෙල් මුලින් එයට එකඟ නොවීය. මන්දයත් යාවේ දෙවියන් වහන්සේ ඉශ්රායෙල්වරන්ගේ රජු යන විශ්වාසයට එය පටහැනි හෙයිනි. දේව ආඥා පරිදි සාවුල් රජකමට පත් කළේ ය.

**සාවුල් රජ (ක්‍රි. පූ. 1020-ක්‍රි.පූ. 1000)**

- බෙන්ජමින් ගෝත්‍රයට අයත් කිෂ් නමැත්තාගේ පුතණුවන් වන සාවුල්, ප්‍රථම රජ ලෙස සාමුවෙල් විසින් පත්කරනු ලැබී ය. (1 සාමුවෙල් 9:1, 10:1-24)
- සාවුල් රජ අම්මෝනිවරුන් හා පිලිස්තිවරුන් පරාජය කර, ඉශ්රායෙල් ජනතාව තුළ විශ්වාසයක් ඇති කළේ ය.
- කාලයාගේ ඇවෑමෙන් සාවුල් රජ සාමුවෙල්ට කීකරුවීම ප්‍රතික්ෂේප කළ නිසා, ඔහුගේ උදහසට ලක් විය.(1 සාමුවෙල් 13: 8-14)
- අමලෙක්වරුන් සමඟ සටනේ දී අමලෙක්වරුන්ගේ රජ ආගග් හා වටිනා භාණ්ඩ සියල්ල රක්ෂා කර, දෙවියන්වහන්සේ ගේ අණට පිටුපෑ හෙයින් දේව උදහසට පාත්‍ර විය. (1සාමුවෙල් 15:10, 11)
- එබැවින් දෙවියන් වහන්සේ ඔහුට ශාපකර, රාජ්‍ය පාලනය දාවිත් ට ලබාදුන් සේක.

**දාවිත් රජ (ක්‍රි. පූ. 1000 - ක්‍රි.පූ. 962)**

- දාවිත් බෙත්ලෙහෙමට අයත්, ජෙස්සේගේ බාල පුත්‍රයා විය. කඩවසම් පෙනුමකින් යුත්, වීණා වාදනයේ දක්ෂයෙකු වූ දාවිත්, යුද කිරීමෙහි ද දක්ෂයෙක් විය.
- සාවුල් රජ විශ්වාසවන්ත නොවූ නිසා දෙවියන්වහන්සේ බැටළු එඬේරෙකු ව සිටි කුඩා දාවිත් සාමුවෙල් ලවා රජෙකු ලෙස අභිෂේක කළ සේක.

- පිලිස්තිවරුන්ගේ නායකයා වූ දුෂ්ට ගොලියත් මරා, පිලිස්තිවරු පරාජය කළ හෙයින්, ජනතාවගේ ප්‍රසාදය දිනා ගත්තේ ය. (1 සාමුවෙල් 17:41-54)
- ආරම්භයේ දී දාවිත් හෙබ්‍රොන්හි සිට ජුදෙයාව පමණක් වසර හතක් පාලනය කළේ ය. පසුව ඉශ්රායෙල්වරුන් ගේ ගෝත්‍ර දොළසට ද රජ වූයේ ය. (2 සාමුවෙල් 5:1) ඉශ්රායෙල්වරුන් ගේ ගෝත්‍ර දොළස එක්සේසත් කර, ස්වරාජ්‍යයක් බිහිකිරීමේ ගෞරවය දාවිත් ට හිමිවේ.
- දාවිත් ජෙබුසිවරුන් හා ජෙරුසලම අත්පත් කරගෙන, එහි තමන් ට මාළිගාවක් තැනූ අතර, ගිවිසුම් කුඩාරමක් තනා, ගිවිසුම් කරඬුව එහි තැන්පත් කර, ජෙරුසලම ආගමික වශයෙන් වැදගත් ස්ථානයක් බවට පත් කළේ ය.
- මෙලෙස විශේෂිත වූ දාවිත්, උරියා මරා, ඔහුගේ බිරිඳ තමන් සරණපාවා ගැනීමේ පාපය කළේ ය. ඔහුගේ පාපය පිළිබඳ ව නාතාන් දිවැසිවරයා ගෙනහැර දක්වා, දාවිත මනස්ථාපනයවීමට මඟ සැලසුවේ ය.
- තමන් ට පසු ව තම පුත් සලමොන් රජකමට පත්කර පියට පසුව පුතා රජකමට පැමිණීමේ ක්‍රමය ඇති කළේ ය.

**දාවිත්ගේ පාලන සමයේ රටේ සංවර්ධනය**

- දාවිත් ගේ ජයග්‍රණයන්, පලස්තීනය හා සිරියාව එක් වී ඉශ්රායෙලය බලවත් රාජ්‍යයක් බවට පත්කිරීමට සහය විය.
- දාවිත්ගේ අධිරාජ්‍යවාදී පාලනය, ඉජිප්තුවේ අධිරාජ්‍යවාදී පාලනය ට සමාන විය.
- ජෙරුසලම අගනුවර කර, එහි යාච්ඤා ගෘහයක් ඉදිකර, ගිවිසුම් කරඬුව රැගෙනවිත් එහි තැන්පත් කළේ ය.
- මෙහෙයයන්වල දී ශුද්ධවූ සංගීතය භාවිත කිරීමේ ක්‍රමයක් ඇති කරන ලදී.
- දාවිත් එහි තමනට මාළිගාවක් තැනූ අතර, දේව මාළිගාවක් තැනීමට අවශ්‍ය ද්‍රව්‍ය රැස්කර තැබී ය.
- ජෙරුසලම් මෙහෙයයන්වල දී, පුදපූජා පැවැත්වීමට පූජකයින් පත් කරනු ලැබූ හ.
- ආණ්ඩුකාරවරුන්, නිලධාරීන් හා රජවාසලේ සේවකයන් පත්කරනු ලැබූ හ.
- සේනාපතිවරුන් කිහිප දෙනෙක් ද පත්කරනු ලැබූ හ.
- මෙලෙස දාවිත් රජ විසින් ඉශ්රායෙලයේ නව සංස්කෘතියක් බිහි කරන ලදී.

**සලමොන් රජ (ක්‍රි.පූ. 962-ක්‍රි.පූ. 922)**

- සලමොන් රජෙකු ලෙස අභිෂේක කරනු ලැබූ විගස දෙවියන් වහන්සේ ගෙන් අයැද, තම ජනතාව යහමග ගෙනයාමට අවැසි ප්‍රඥාව වරමක් ලෙස ලබාගත්තේ ය. (1 රාජාවලිය 3:9)
- දාවිත් රජගේ පුත් සලමොන් විශිෂ්ට පාලකයෙකු, දේශපාලන වශයෙන් සූක්ෂම වූ, දක්ෂ ව්‍යාපාරිකයෙකු හා ගොඩනැගිලි නිර්මාණකරුවෙකු ද විය.
- බොහෝ රටවල් සමග ව්‍යාපාරික වශයෙන් සබඳතා ගොඩනගාගත් සලමොන් වානිජමය ගමනාගමන කටයුතු සඳහා රතු මුහුද අද්දර වරායක් ගොඩනැගී ය.
- දේශය සතුරන්ගෙන් බේරා ගැනීමට විවිධ මාළිගා හා මුර කොටු ගොඩනැගූ අතර, හමුදාවක් ද ඇති කළේ ය.

- දාවිත් රජ, රැස්කර තිබූ භාණ්ඩ උපයෝගී කරගනිමින්, විදේශවලින් කැඳවා ගත්, විවිධ කලාකරුවන් මගින් දෙවියන් වහන්සේ සඳහා මනරම් වූ දේව මාළිගාවක් ගොඩනැගුවේ ය.
- ජෙරුසලම ඉතා හොඳින් ගොඩනැගීම සඳහා කලාකරුවන්, මූර්තිකරුවන් හා භාණ්ඩ විදේශ වලින් ආනයනය කිරීමට විශාල මුදලක් වැය කළේ ය. මේ නිසා ඇති වූ වියදම අඩුකිරීම සඳහා, හැම කෙනෙක් ම මාසයක් වේතනයක් නොගෙන වැඩකළ යුතු යැයි නියෝග කළ අතර, ජනතාව මත අධික බද්දක් ද පැනවීය. මේ නිසා ජනතාව ඔහුව ප්‍රතික්ෂේප කිරීමට පටන් ගත්හ.
- සලමොන් රජ තම වයෝවෘද්ධ කාලයේ දී යාවේ දෙවියන් වහන්සේ ව අමතක කර, අන් දෙවිවරුන් ඇදහීමට පටන් ගත්තේ ය. එබැවින් ඔහු දේව උදහසට ලක්විය.

(1 රාජාවලිය 11:1-15 )

- සලමොන් රජ මහළුව මරණයට පත් වූ පසු, ඔහුගේ පුත් රෙහොබෝවම් රජකමට පත් විය..

**සලමොන් රජගේ පාලන සමයේ විශිෂ්ටත්වය**

- දේශීය ප්‍රතිපත්තිවලට ප්‍රධාන තැනක් දුන් අතර, විශිෂ්ට පාලනයක් කර, රජ දිස්ත්‍රික්ක දොළසකට බෙදා, හැම දිස්ත්‍රික්කයකට ම ආණ්ඩුකාරවරයෙකු පත් කළේ ය. (1 රාජාවලිය 4:7-19)
- නව යුදායුධ බොහෝමයක්, යුධ රථ ආදිය යොදවා, හමුදා බලය තහවුරු කිරීම මගින්, විරුද්ධවාදීන්ගේ ආක්‍රමණය නවතාලීය.
- බොහෝ අරාබි රටවල් සමග, ව්‍යාපාරික සබඳතා පවත්වා, පලස්තීනයේ ආර්ථිකය නංවාලීය.
- ගොඩනැගිලි සේවාව ඉතා විශිෂ්ට අන්දමින් සංවර්ධනය කර, නව නගර ඉදිකර, ජනතාවට මානා පහසුකම්වලින් සමන්විත වාසස්ථාන ඉදිකර දුන්නේ ය.
- මොහු සතු වූ ප්‍රඥාව ගෙනහැර දක්වන විශිෂ්ට ගණයේ සාහිත්‍යයක් ඇති කළේ ය. උදාහරණයක් ලෙස යාවේ සම්ප්‍රදාය (J සම්ප්‍රදාය) මෙතුමන්ගේ පාලනසමයේ ඇති වූවකි.
- තම පාලනයට එරෙහි වූවන් පරාජය කරමින්, රටේ සාමය ඇති කළේ ය.
- මෙලෙස ආගමික, සමාජීයීය, ආර්ථික, කලාත්මක හා සංස්කෘතික වර්ධනයෙන් සමන්විත රටක් බිහිකිරීමෙහි ලා, සලමොන් රජ පුරෝගාමියෙක් වූ අතර, ඉන් ජයග්‍රහණය ද ලැබී ය..

**2.2.1.5 ඉශ්රායෙල් රාජ්‍ය දෙකඩ වීම**

- සලමොන් රජ විදේශික කාන්තාවන් බොහෝ දෙනෙකු විවාහ කරගනිමින් ඔවුන්ගේ දෙවිවරුනට වන්දනාමාන කර, දේව උදහසට ලක්වීම ඉශ්රායෙල් රාජ්‍යය දෙකඩවීමට ප්‍රධාන හේතු ව විය. (1රාජාවලිය 11:1-15)
- සලමොන් රජගේ මරණින් පසු, ඔහුගේ පුත් රෙහොබෝවම් රජකමට පත් විය. ඔහුගේ අනුවණ රාජ්‍ය ක්‍රමය නිසා, එක්සේසත්ව පැවති පලස්තීනය ක්‍රි.පූ. 922 උත්තර රාජ්‍යය හා දක්ෂිණ රාජ්‍යය ලෙස දෙකඩ විය.
- ගෝත්‍ර දසයකින් සමන්විත වූ උත්තර රාජ්‍යය ඉශ්රායෙලය ලෙසත්, ගෝත්‍ර දෙකකින් සමන්විත වූ දක්ෂිණ රාජ්‍යය ජුදා ලෙසත් හඳුන්වන ලදි.

**උත්තර රාජ්‍යය**

- සලමොන් රජුගේ පුත් රෙහොබෝවම් ගේ අනුවණකම නිසා, අතෘප්තියට පත් සේනාපති ජෙරොබෝවම් උත්තර රාජ්‍ය වෙන්කර, ක්‍රි.පූ. 922-901 දක්වා රජකම් කළේ ය.
- ඔහු තම ජනතාව ජෙරුසලම් දේව මාළිගාවට පැමිණීම වළකාලීම සඳහා, බෙතෙල්හි හා දාන්හි රත්තරන් වලින් සෑදූ, වහුපැටියන් දෙදෙනෙක් සාදා ජනතාවට වන්දනාමාන කිරීමට මග සැලසී ය.
- ඊළඟ ට පැමිණි වසර 50 තුළ නාදාබ්, බාෂා, ඒලා, සිම්රි,ඔම්රි, ආහබ් වැනි අය රජකම් කළෝය.
- ආහබ්ගේ රජසමයේ (ක්‍රි.පූ. 869-850) දිවැසිවර එළියා සැබෑ වූ දෙවියන්වහන්සේ ව ගෙනහැර දක්වා බාල් වන්දනාව හෙළා දැක්කේ ය.
- දිවැසිවර එළියා, එලිෂා, මීකා, ආමොස් හා හොෂෙයා වැනි අය උත්තර රාජ්‍ය විශිෂ්ට දැහැමි ජීවිතයක් සඳහා රැගෙන ගිය හ.
- ක්‍රි.පූ. 722 අසිරියන්වරු උත්තර රාජ්‍ය අත්පත් කර ඉශ්රායෙල් ජනතාව රටින් පිටුවහල් කළ පසු උත්තර රාජ්‍යයේ පාලනය අවසන් විය.

**දක්ෂිණ රාජ්‍යය**

- සලමොන් රජුගේ පුත් රෙහොබෝවම් ජෙරුසලම අගනුවර කරගෙන, ජුදා, බෙන්ජමින් ගෝත්‍රිකයින් පාලනය කළේ ය. රෙහොබෝවම්ට පසුව, ඔහුගේ පුත් අබියාම් පාලනය කළේය.
- මෙම කාලවකවානුවේ ඉදෝ, අනානේ හා අෂාරියෂ් වැනි දිවැසිවරු දෙවියන්වහන්සේ ඉදිරියේ නුසුදුසු ක්‍රියා අතහැර, අවංක ව ජීවත්වීමට ඉගැන්වූ හ.
- ජෙහෝෂාපාට්, අමශියා වැනි රජවරු ඉතා උසස් අන්දමින්, අවංක ව ජනතාව පාලනය කළහ.
- දක්ෂිණ රාජ්‍යය ආහාස් රජ සමයේ යෙසායා, මීකා වැනි දිවැසිවරුන් සේවය කළ හ.
- මොවුන් දක්ෂිණ රාජ්‍යයේ ඇති වූ අයුක්තිය ගෙනහැර පා, එහි විනාශය පිළිබඳ දැක්වූ අතර, රජතුමන්ට හා ජනතාවට නීතිගරුක ව ජීවත්වීමට කැඳවූහ.
- යෙසායා දිවැසිවරයා මෙසියස්තුමාගේ පැමිණීම පිළිබඳ ව පෙර දැනුම් දීමක් කළේ ය.
- බැබිලෝනිය රජ ජුදෙයාව අත්පත්කර ගැනීමත් සමඟ, දක්ෂිණ රාජ්‍යය අවසන් විය.

**2.2.1.6 බැබිලෝනිය විප්‍රවාසය**

- බැබිලෝනිය විප්‍රවාසය අවධි 3කින් සිදුවිය.
- ජොහෝයාකිම් ජුදා දේශය පාලනය කළ සමයේ, බැබිලෝනිය රජ නෙබුකද්නෙශර් ජෙරුසලම ආක්‍රමණය කර, ජුදා දේශයේ ප්‍රධානියන් කිහිප දෙනෙකු විප්‍රවාසගත කළේ ය. ඔවුන් අතර දානියෙල් දිවැසිවරයා ද සිටියේ ය.
- බැබිලෝනිය රජ නැවත ක්‍රි. පූ. 597 කාලයේ ජෙරුසලම අත්පත් කර, ජෙහෝයාකිම් රජ, ඔහුගේ බිරිඳ, මව, නිලධාරීන්, යුදභටයින් හා කලාකරුවන් ලෙස බොහෝ දෙනෙක් විප්‍රවාසගත කළ අතර, ජෙරුසලම් දේව මාළිගාවේ තිබූ අධික වටිනාකමින් යුත් භාණ්ඩ ද පැහැර ගත්තේය.

- බැබිලෝනිය රජ තෙවනවරටත් පූර්ණ හමුදා බලය සහිත ව පැමිණ, ජෙරුසලම අල්ලාගෙන, විනාශ කර, ඉතිරිව සිටියවුන් ද විප්‍රවාසගත කළේ ය.
- බැබිලෝනියට විප්‍රවාසගත වූ ජුදයින් වසර 70ක් එහි ජීවත් වූහ. මෙම කාලයේ ඔවුන් තම අනන්‍යතාවය අහිමි කරගත්තෝ ය.
- පූජා පැවැත්වීමට දේවමාලිගාවක් නොවී ය. ඔවුන්ගේ ආගමික, සාමාජීයීය හා සංස්කෘතික ජීවිතයේ විශාල වෙනසක් හා විනාශවීමක් සිදුවිය.
- මෙම කාලයේ දෙවන යෙසායා, ජෙරමියා හා එසකියෙල් වැනි දිවැසිවරුන්, ඔවුන් අතර සේවය කරමින්, ඔවුන්ට මග පෙන්වූ හ.
- එසකියෙල් දිවැසිවරයා, ඔවුන් තම දේශයට නැවත යන බව පවසා, ධෛර්යවත් කළේ ය. (එසකියල් 37:1-14)
- මෙහි දී ජුදා සිනගෝග වල වන්දනාව ආරම්භ විය. ජුදා පූජකවරුන් සිනගෝග තනවා, එහි ජුදයින් රැස්කර, දේශනා කළ හ. මෙම දේශනා තුළින් පූජක සම්ප්‍රදාය ඇතිවීමට මඟ පෑදුණි

.

**2.2.1.7 නැවත දේශයට පැමිණීම**

- පර්සියාවේ රජ වූ සයිරස් තම සීමාව විශාල කරගැනීමේ අරමුණින් රාජ්‍යයන් පැරදවූ කරගත් අවධියේ, ක්‍රි. පූ. 539 බැබිලෝනියාවත්, 538 පලස්තීනයත් අත්පත් කරගෙන තම බලය යටපත් කරගත්තේ ය.
- ජනතාවගේ අයිතිවාසිකම් වලට ගරුකළ පර්සියානු රජ, බැබිලෝනියාවේ ජීවත් වූ ජුදා ජනතාවට තම මව්බිමට ගොස්, නිදහසේ ජීවත්වීමට අනුමැතිය ලබා දුන්නේ ය.
- තව ද බැබිලෝනියන් රජ ජෙරුසලම් දේව මාළිගාවෙන් සොරාගත් සම්පත්, රන් රිදී පාත්‍රයන්, රන් කුළුණු ආදිය නැවත එවන මෙන් ද නියෝග කළේ ය.
- ජුදයින් ෂෙෂ්බශර්, සෙරුබාබෙල් හා ජොෂුවා වැනි අයගේ නායකත්වයෙන් 538 දී ජෙරුසලමට ආපසු පැමිණිය හ.

**ජුදා ආගමික, සාමාජයීය හා සංස්කෘතික පුනරුදය**

- බැබිලෝනියාවේ සිට තම දේශයට නැවත පැමිණි ජුදයින්ගේ ජීවිතවල ආගමික, සාමාජීයීය හා සංස්කෘතික පුනරුදයක් ඇතිවිය.
- සෙරුබාබෙල් රජුගේ නායකත්වයෙන් ජෙරුසලම් දේව මාළිගාව නැවත ගොඩනැගීමේ කටයුතු අරඹා, එය ක්‍රි. පූ. 513 දී කැප කළෝ ය.
- ජුදා ආගමික, සාමාජීයීය හා සංස්කෘතික පුනරුදයට එස්රා, නෙහෙමියා වැනි අය විශාල දායකත්වයක් දක්වා ඇත.
- මොවුන් දෙදෙනා ම නව ජෙරුසලම, නව දේව මාළිගාව, නව මෙහෙයයන් සකසා, ගිවිසුම අලුත්කර, ජුදා ආගම ප්‍රතිසංස්කරණය කළෝ ය. (එස්රා 3:6, නෙහෙමියා 1-6)

**එස්රා**

- එස්රා නායක පූජකයෙකු වන ආරෝන්ගේ පෙළපතින් පැමිණි, සොරායාගේ පුත්‍රයා ය. එමෙන්ම ව්‍යවස්ථාව පිළිබඳ මනා දැනුමක් ඇති නීතිවේදියෙකි.
- දෙවියන්වහන්සේ ගේ ව්‍යවස්ථාව පිළිබඳ දැනගැනීම හා ඒ අනුව ජීවත්වීමෙහි ලා ඉමහත් උනන්දුවක් දක් විය.
- ජුදා ජනතාව රැස්කර, අණපණත් පිළිබඳ පවසා, ඒවා අනුසාර කිරීමේ සිරිත නැවත ඇති කළේ ය.
- වන්දනාව නැවත සකස් කර, ශුද්ධ ලියවිල්ලට නැවතත් ප්‍රධාන තැනක් දුන්නේ ය.
- ධාර්මික ජීවිතයේත්, දැහැමි ජීවිතයේත් පුනරුදයක් ඇති කළේ ය.
- ගිවිසුමට ප්‍රධාන තැනක් දී ජුදයින් විනය ගරුක පිරිසක් කිරීමට මෙතුමා ඉදිරිපත් වූ හෙයින් '' ජුදා ජනතාවගේ පියා'' යැයි හඳුන්වනු ලැබී ය.

**නෙහෙමියා**

- මොහු පර්සියාවේ අගනුවර වන සූසාහි රජ වූ අර්තක්ෂාස්තා රජුගේ පාත්‍රධාරී ව සිටියේ ය. (නෙහෙමියා 1: 11)
- පර්සියානු රජ විසින් ජුදා දේශයෙහි නායකයා ලෙස පත් කරනු ලැබී ය.
- බොහෝ අභියෝග මධ්‍යයේ ක්‍රි.පූ. 444 ජෙරුසලම් පවුර ගොඩනැගුවේ ය.
- එස්රා සමග එක් වී, ඉශ්රායෙල් ජනතාව අතර විවිධ ආගමික- සාමාජීයීය වෙනස්කම් සිදු කළේ ය. (නෙහෙමියා 1-6)

**2.2.1.7 පලස්තීනයේ ග්‍රීක පාලනය**

- ග්‍රීක අධිරාජ්‍යයා වූ මහ ඇලෙක්සැන්ඩර් රජ ක්‍රි. පූ. 333 දි පර්සියානු රජ වූ තුන්වන තාර්ජොෂෙද් පැරදවූ, පසුව ජුදෙයාව, සමාරිය ආදිය ග්‍රීක පාලනය යටත්විය.
- ග්‍රීකයින් ජුදා ආගමික සිරිත් විරිත් අනුගමනය කිරීමට ඔවුනට අවසර ලබාදුන් නමුදු ග්‍රීක සංස්කෘතික හා ජීවිත ක්‍රමයෙන් ඔවුනට විශාල බලපෑමක් විය.
- ග්‍රීක් භාෂාව නොදත් අය ශිෂ්ටසම්පන්න නොවූවන් ලෙස පිළිගත් හ. බොහෝ නගරවල නම් ග්‍රීක නම් බවට පත්කළ හ.
- කලාගාරයන්, ක්‍රීඩාංගන හා නාන තටාංග ආදිය ග්‍රීක ගොඩනැගිලි කලාවට අනුව ගොඩනගන ලදී.
- මහ ඇලෙක්සැන්ඩර් රජුගේ මරණින් පසු, ඊජිප්තුවේ සේනාපති වූ ටොලමි ජෙරුසලම අත්පත් කරගත්තේ ය. මෙම කාලයේ දී පැරණි ගිවිසුම ඊජිප්තුවේ දී ග්‍රීක් භාෂාවට පරිවර්තනය කරන ලදී.
- පලස්තීනයේ බලය නායක පූජකයින්ට පවරා දෙන ලදී. ඔවුන් ධර්මසභා මණ්ඩප ඇතිකළ අතර, ජුදයින්ගේ ආගමික හා සාමාජීයීය ජීවිතයට මග පාදා දුන් හ.
- ක්‍රි.පූ. 200 දී ටොලමිගෙන් සිරියානු රජ තුන්වන් අන්තියොක පලස්තීනය අත්පත් කරගත්තේ ය. මොහුගේ කාලයේ පලස්තීනයේ ග්‍රීක ශිෂ්ටාචාරය නැවත ඇති විය.
- මේ කාලයේ දී පරිසිවරු, සද්දුසිවරු වැනි ආගමික කොටස් බිහිවිය.
- 4 වන අන්තියොකයේ එපිපානස්ගේ පාලන සමයේ ජුදයින් බොහෝ පීඩා වින්දහ.
- ඔහුට විරුද්ධව මකබිවරු පෙරළි කර, රට බේරාගත්තෝ ය.
- ක්‍රි. පූ. 63 දී රෝම සෙන්පති වූ පොම්පේ ජෙරුසලම අත්පත් කර ගැනීම නිසා පලස්තීනය රෝම පාලනය යටතට පැමිනුණි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

1. ඉශ්රායෙල් ඉතිහාසයේ වැදගත් අංශ යන මැයෙන් කණ්ඩායම් පැවරුමක් සකස් කරයි.
2. ඉශ්රායෙල් ජනතාව මධ්‍යයේ රාජ්‍ය පාලනය ඇතිවූ ආකාරය විස්තර කරයි.
3. තම එදිනෙදා ජීවිත පැවැත්ම තුළ දෙවියන් වහන්සේ අත්දකින ආකාරය විස්තර කරයි.

**නිපුණතාව 3.0** : ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 3.1** : මුල් සියවසේ පලස්තීනයේ දේශපාලන පසුබිම වටහා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ දේශපාලන පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.
- කිතු දහම බිහිවීමට මෙම කරුණු පදනම් වූ බව පිළිගනියි.
- ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- රජයේ නීතිරීතිවල ට කීකරුවෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය**

**හැඳින්වීම** : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ අත්තිවාරම ලෙස සැලකෙන පලස්තීනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳව ද එහි ජීවත් වූ ජනයාගේ සැකැස්ම හා සම්ප්‍රදායන්, දේව මාලිගාවේ සැලැස්ම, ආගමික වතාවත්, පිළිපැද්දා වූ සිරිත් විරිත් පිළිබඳව ද මේ නිපුණතාවයෙන් ඉගැන්වේ.

**3.1.1 රෝම පාලන ක්‍රමය**

- අගොස්තුස්ගේ රාජ්‍ය පාලන සමයේ සශ්‍රීකත්වය හා යහපත් ආරක්ෂාවක් ඇති වූ නිසා මෙහි නව රාජ්‍ය පාලනයක් බිහිවිය. මෙහි රාජ්‍ය භාෂාව ලතින් විය. ඉන්දු - යුරෝපීය පවුලට අයත් වූවන් ද ඉතාලියානුවන් ද මෙහි ජීවත් වූ ප්‍රධාන අය වූහ. මොවුහු තමන් අත්කර ගත් ප්‍රදේශ රටවල් 72ක් ලෙස ද පළාත් 40 ක් ලෙස ද බෙදා හැම පළාතක් ම පාලනය සඳහා රජතුමාගේ නියෝජිතයන් ලෙස ආණ්ඩුකාවරු පත් කළ හ.

- තමන් අත්පත් කරගත් රටවල් පාලනය කරමින් සිටි රජවරුන්ව යුවරජවරුන් ලෙස පත් කරන ලදී. රෝමයට ආදායම් ලබා ගැනීම සඳහා අයකැමියන්ව නිලධාරීන් ලෙස පත් කළ හ.

**3.1.2 පලස්තීනයේ රෝම පාලන ක්‍රමය**

ක්‍රි.පූ. 63 දී සේනාධිපති වන පොම්පේගේ ආක්‍රමණයත් සමග පලස්තීනයේ රෝම පාලනය ආරම්භ විය. ක්‍රි.පූ. 37ට පසු පලස්තීනය පුරා රෝම පාලනය තහවුරු විය.

**පලස්තීනයේ රෝම පාලන ක්‍රමය මෙසේ වර්ග කළ හැක.**

| | | |
|---|---|---|
| ක්‍රිස්තුන් වහන්සේට පෙර | - | ක්‍රි.පූ. 63 - ක්‍රි.පූ. 4 දක්වා කාලය |
| ක්‍රිස්තුන් වහන්සේගේ කාලය | - | ක්‍රි.පූ. 4 - ක්‍රි.ව. 30 දක්වා කාලය |
| ක්‍රිස්තුන් වහන්සේට පසු | - | ක්‍රි.ව. 30 - ක්‍රි.ව. 70 දක්වා කාලය |

නමුත් රෝම අධිරාජ්‍යය 5 වන සියවස දක්වා පැවතුණි.

3.1.2.1 අධිරාජ්‍යවරු

- රෝම අධිරාජ්‍යයේ ප්‍රථම අධිරාජයා ද, සේනාධිපති ද, ආරම්භකයකු වූයේ ද ජූලියස් සීසර්ය (ක්‍රි.පූ. 100-44) ක්‍රි. පූ. 44 දී ජූලියස් සීසර්ගේ ඝාතනයෙන් පසු රජ බවට පත්වීම සඳහා පොම්පේ හා ඔක්ක්‍රෝවියන් යන සේනාධිපතිවරුන් දෙදෙනා අතර වර්ෂ කිහිපයක් ම තරගයක් ඇති විය.

- ක්‍රි.පූ. 27 දී සේනාධිපති ඔක්ක්‍රෝමියන් අගෝස්තුස් සීසර් නමින් රෝම අධිරාජ්‍යයා ලෙස අභිෂේක කරනු ලැබීය. ක්‍රි.ව. 14 දක්වා පාලනය කළේ ය. මොහුගේ පාලන සමයේ දී ක්‍රිස්තුන් වහන්සේ බෙත්ලෙහෙමේ උපත ලැබූ සේක. අගෝස්තුස් සීසර්ගෙන් පසුව තිබේරියස් සීසර් (14-37) කලිකලා (37-41) ක්ලෝඩියස් (41-54) නීරෝ (54-68), ගල්පේ, ඔත්තෝ, විරේලියස් (68-69) වෙස්වසියන් (69-79) රයිටස් (79-81), තෝමියන් (81-96) නේර්වා (96-98) කිරායන් (98-117) ආදීහු පාලනය කළහ.

- රෝම අධිරාජ්‍යයේ අවසාන අධිරාජ්‍යයා වූයේ තියෝක්ලේසියස් ය. (305)

3.1.2.2 ආණ්ඩුකාරවරු

- පලස්තීනය හෙරොද්වරුන්ට පසුව ක්‍රි.ව. 66 දක්වා රෝම පාලකයන් පාලනය කළහ. ක්‍රි.ව. 6-41 දක්වා ජුදයාවේත් ක්‍රි.ව. 44 - 66 දක්වා පලස්තීනයේ අනෙකුත් ප්‍රදේශවලත් රෝම ආණ්ඩුකාරවරුන්ගේ පාලනය පැවතුණි.
- රෝම ආණ්ඩුකාරවරු ජෙරුසලමේ නතර නොවී සෙසාරියාවේ සිටිය හ. මොවුහු මහා මංගල්‍යයන්හි දී ජන සමූහයා අධික වන අවස්ථාවල දී පමණක් ජෙරුසලමට පැමිණෙති.
- කලහයක් ඇති වූ විට වහාම විසදීමත්, ජෙරුසලමේ විනය හා සාමය ඇති කිරීමත් මොවුන්ගේ ප්‍රථම සේවාව විය.
- මොවුන් ද, මොවුන්ගේ ආරක්ෂකයන් ද හෙරොද්ගේ මාලිගාවේ නතර වූහ. මෙම රාජකාරිය ක්‍රි.ව. 41 දී කාල්සිං හෙරොද්ට ද, පසුව 2 වන අග්‍රිපාට ද පවරන ලදී. කොට්ටෝනියු, අම්පිලියු, රූෆු, වැලේරියු, සිරානු, ආදීන් ක්‍රි.ව. 6 සිට 26 දක්වා පලස්තීනයේ රෝම ආණ්ඩුකාරවරු ලෙස සිටියහ.

- ක්‍රි.ව. 26 දක්වා ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා සම්බන්ධ වූ පොන්සියුස් පිලාත් ආණ්ඩුකාරයා ලෙස සිටියේ ය. කයිසාරියේ ආණ්ඩුකාරවරුන් වූ, පෙස්තිස් සහ පේලික්ස් ආදිහු ද සඳහන් කළ යුතු ය.

3.1.2.3 යුවරජවරු

**මහ හෙරෝද් - (ක්‍රි.පූ. 37-ක්‍රි.පූ. 4 දක්වා)**

- මහ හෙරෝද් පලස්තීනයේ ඉදුමීය ප්‍රදේශයට අයත් තැනැත්තෙකු විය. ඉදුමීය අන්තිපාස්ට ද, අරාබි ජාතික ඉබ්රෝස් නැමති කාන්තාවකට දාව උපන්නෙකි. දක්ෂයකු බැවින් ''මහා හෙරොද්'' නමින් අමතන ලදී. ග්‍රීකවරුන්ගේ සංස්කෘතිය හා ඇදහිල්ල ආභාසයට ගත් නිසා පලස්තීන ජුදෙව්වන් මොහුව පූර්ණ ජුදෙව්වකු ලෙස පිළි නොගත් හ.
- මොහු මුළු පලස්තීනයම අත්පත් කරගෙන ඒකාධිපතියෙකු වී අක්‍රමිකතාවයටත්, කෲරත්වයටත් නම් දැරුවේ ය. (මතෙව් 2/16-18)
- ජුදෙව්වරුන්ගේ ගෞරවය ලබා ගැනීමට ජෙරුසලමේ දේව මාලිගාව ප්‍රතිසංස්කරණය කළේ ය.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී අගෝස්තුස් සීසර් රෝම අධිරාජයා විය. හෙරෝද් මිය ගිය විට පලස්තීනයේ ඔහු පාලනය කළ ප්‍රදේශය ඔහුගේ පුතුන් තිදෙනා බෙදා ගත් හ.
  (අ) අර්කෙලාවුස් (ඉ) අන්තිපා (ආ) පිලිප්

**(අ) අර්කෙලාවුස් (ක්‍රි.පූ. 4 - ක්‍රි.ව. 6 දක්වා)**

- මොහු මහා හෙරොද්ගේ වැඩිමල් පුත්‍රයා ය. පලස්තීනයෙන් අඩක් ම (ජුදයාව, සමාරිය, ඉදුමිය) මොහුට හිමි විය. මොහුව රජු ලෙස පත් කිරිමට රෝම අධිරාජයා අකමැති විය. මොහුට ආණ්ඩුකාර ධූරය දෙන ලදි. මොහු තම අභිමතය පරිදි නායක පූජකයන්ව මාරු කළේ ය. මොහු තනතුරු සඳහා කෑදර විය. තම පියාමෙන් සැක සහිත ව සියල්ල දෙස බැලීය.
- ජුදයාවේ අර්කෙලවුස් තම පියාගෙන් පසු රජකම් කරන බව අසා ජෝසෙප් බියවූ බවත් (මතෙව් 2/22) ජෝසෙප් මරියා ද ළදරු ජේසු සමග ඊජිප්තුවෙන් හැරී ආ විට ඇති වූ තත්ත්වය ද මතෙව්තුමා විස්තර කරයි. මොහු ගොඩනැගිලි තැනීම් ආරම්භ කළේ ය. ජෙරිකෝවේ පලතුරු වත්තක් තනා අර්කෙලායිස් යනුවෙන් නම් කළේ ය. ජුදා හා සමාරිය නිලධාරීන් මොහුට විරුද්ධව චෝදනා නැගූ බැවින් මොහුව පදවියෙන් පහ කරන ලදී. ක්‍රි.ව. 6 දී වියනාවට පිටුවහල් කරන ලදි.

**(ආ) පිලිප් (ක්‍රි.පූ. 4 - ක්‍රි.ව. 34)**

- පිලිප් මහ හෙරොද්ටත්, ඊජිප්තුවේ ක්ලියෝපැට්රාටත් දාව ජෙරුසලමේ දී උපත ලැබීය. ගලීලයේ නැගෙනහිර ප්‍රදේශවලටත් උතුරු ප්‍රදේශවලටත් යුවරජු ලෙස කටයුතු කිරීමට වගකීම භාර ගත්තේ ය.

- මොහු නීතියටත්, අවංක බවටත්, ප්‍රේමයටත් කාරුණික බවටත් ප්‍රසිද්ධ වූවකි. හෙරොද් පවුලේ විශේෂිත කෙනෙකි. ධීවර වරායන් වන බෙත්සයිදාව අගනුවර කර ගත්තේ ය. එය අගස්තුස් රජුගේ දුව වන ජූලියාගේ නමින් ජූලියස් යයි නම් කළේ ය.
- ජොර්දාන් නදිය ආරම්භ වන ස්ථානය අසල තිබූ පෙනරාස් නම් ස්ථානයට පිලිප්පි කයිසාරිය යයි නම් කළේ ය. (මාර්ක් 8/27, මතෙව් 16/13) වසර 37 ක් රජකම් කර ක්‍රි.ව. 34 දී දරු පරපුරක් නැතිව ම මිය ගියේ ය. ඔහුගේ මරණින් පසු මොහු පාලනය කළ ප්‍රදේශ සිරියාව සමග සම්බන්ධ කරන ලදි. ටික කලකට පසු එම ප්‍රදේශ අග්‍රිපාට පවරන ලදී.

**(ඉ) හෙරොද් අන්තිපස් (ක්‍රි. පූ. 4- ක්‍රි.ව. 39)**

- හෙරොද් අන්තිපස් රජු යුවරජු ලෙස හඳුන්වන ලදී. ගලීලයේත්, පෙරයාවේත් පාලන බලය පවරන ලදී. ගලීලයේ බටහිර මුහුදු තීරයේ ''තිබේරියා '' කියා විශාල අගනුවරක් ගොඩනැගීය. පියාගේ හැම නපුරු ගතිගුණයක්ම ඔහු තුළ දැකිය හැකි විය. එබැවින් ජේසුස් වහන්සේ ඒ හිවලාට ගොස් කියන්න '' යැයි පවසන සේක (ලූක් 13/32). අරේතා සේනාව ගෙනවිත් ක්‍රි.ව.39 දී මොහුව පරාජය කර ලියොන් නම් ස්ථානයට පිටුවහල් කරන ලදී.

**1 වන හේරොද් අග්‍රිපා (ක්‍රි.ව. 37 - ක්‍රි. ව. 44)**

- හෙරෝද් අග්‍රිපා අරිස්නෝවු මහ හෙරොද්ගේ පුතා ය. මොහුගේ සොහොයුරිය හෙරොදියාය. ක්‍රි.ව. 41 දී මුළු පලස්තීනයම පාලනය කළේ ය. දේශපාලන අරමුණු සඳහා පරිසිවරුන්ගේ පිළිවෙත් අනුගමනය කරන බව හැඟෙව්වේ ය.
- ජුදෙව්වන් සතුටු කිරීම සඳහා ක්‍රිස්තියානිකාරයන්ට වද දුන්නේ ය.
- මොහුගේ පාලන සමයේ දී කිතු දහම වේගයෙන් පතල විය. අපෝස්තලික ජාකොබ්තුමා ව (සෙබදිගේ පුත්) මරණයට පත් කළේ පළමුවන හෙරෝද් අග්‍රීපාය.
- පේදුරුතුමාව සිරගත කළේ ය. (අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා 12 පරිච්ඡේදය) ඔහුට පසුව මොහුගේ පුත් දෙවන හෙරෝද් අග්‍රීපා රජකළ බවට ඉතිහාසයේ කියැවෙයි.)

**3.1.2.4 බදු අය කරන්නන්**

- ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පහත් කුලයට අයත් යැයි ජුදෙව්වන් විසින් ප්‍රතික්ෂේප කරන ලද කණ්ඩායම බදු අය කරන්නන් ලෙස සැලකේ. ජුදා සම්ප්‍රදාය අනුව මොවුන් සොරුන්, මංකොල්ලකරුවන් හා පවුකාරයන් ලෙස සලකන ලදී
- ''මිස්නා'' යන ජුදා නීති සංග්‍රහයේ පාපිෂ්ඨ රැකියාවන් ලෙස බදු අය කිරීම සඳහන් කර ඇත. මොවුන් ජුදා වංශිකයෝ ය. පලස්තීනයේ රෝම පාලන සමයේ දී රෝම අධිරාජ්‍යයා වෙනුවෙන් ජුදයින්ගෙන් බදු අය කිරීම සඳහා සමහර ජුදෙව්වන් පත් කරන ලදී.
- මොවුන් පව්කාරයන් ලෙස කොන් කිරීමට හේතු වූ කරුණු:
    1. අන්‍ය ජාතිකයන් වෙනුවෙන් තම ජනතාවගෙන් බදු අය කිරීම
    2. ඉතා කෲර අන්දමින් බදු අය කරන ක්‍රමයන් අනුගමනය කිරීම.
    3. මොවුන් ජනතාවගෙන් වංචා සහගත ලෙස බදු රැස් කළ හ.

- ක්‍රමවේදයන් දෙකකට අනුව බදු අය කරන ලදි. ඒවා නම්,
    i. මහ හෙරෝද් පලස්තීනයට පාලකයා ලෙස පත් කිරීමේ දී තම සුඛෝපභෝගී ජීවිතයට අවශ්‍ය වියදම් සඳහා දිනපතා ජනතාව මත නව බදු පැනවීය.
    *උදා:* නගරයන්, බලකොටු, වරායන් ගොඩනැගීම, ජෙරුසලම් දේව මාලිගය අළුත්වැඩියා කිරීම ආදිය උදෙසා ජනතාවගෙන් වැඩි මුදලක් බදු අය කිරීම මගින් හෙරොද් උපයා ගත්තේය. මේවා මුදලින් හෝ භාණ්ඩ මගින් හෝ ගෙවූ බව දක්වේ.

    ii. වස්තුව අවශ්‍ය වූ විට මෙසේ බදු අය කරන ලදී. ආහාරවලටත් වස්තුව වෙනත් තැනකට ගෙනයාමටත්, වහලුන් විකිණීමටත්, ඉඩම් විකිණීමටත් ජුදෙව්වන් රෝම අධිරාජ්‍යයට බදු ගෙවිය යුතු විය. අපනයන බදු, විකුණුම් බදු, මරණ බදු ආදී බදු බර නිසා ජනතාව තව තවත් දුකට පත් වූහ.
    *උදා:* 1. **ලෙවී(මතෙව්)** : කපර්ණාවුම අසල දමස්කයටත්, අක්රේ නගරයටත් යන ප්‍රධානමාර්ගයේ තම සුංගම්පොළ පිහිටුවා ගත්තේ ය. ''**මා අනුව එන්න**'' යැයි
    ජේසුස් වහන්සේ කැඳවූ විට උන්වහන්සේ අනුව ගියේ ය. (මතෙව් 9/9)
    2. **ජෙරිකෝ නගරයේ සකේවුස්** : මොහු ප්‍රධාන බදු අය කරන්නෙක් විය. මොහුයටතේ බොහෝ බදු අය කරන්නන් සිටිය හ. මොහු විශාල වස්තුවකට හිමිකම් කීය. (මතෙව් 19/1-10)

#### 3.1.2.5 සොල්දාදුවන්

- පලස්තීන ඉතිහාසයේ සොල්දාදුවන් ප්‍රධාන තැනක් ගනිති. රෝමවරු පලස්තීනය යටත් කරගත් පසු තම නියෝජිතයන් ආණ්ඩුකාරවරු පත් කළ විට ඔවුන් යටතේ සොල්දාදුවන් සේවය සඳහා පත් කළහ.
- සොල්දාදුවන් 1000 කට අධිපතිව සොල්දාදුවෙක් ද (දසාධිපති) සොල්දාදුවන් 100 කට අධිපතිව සොල්දාදුවෙක් ද (ශතාධිපති) පත් කරන ලදී. මොවුහු නගරය ආරක්ෂා කිරීමත්, බදු අය කරන්නන්ට සහයවීමටත්, මංගල්‍ය කාලවල දී ආරක්ෂාව සැපයීමත්, වරදකරුවන් අත්අඩංගුවට ගැනීමත්, ඔවුන්ට දඬුවම්දීමත්, රෝමවරුන්ට අයත් විය යුතු බදු ගෙනයාමත් ආදී කළහ.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී පිලාත්ගේ සොල්දාදුවන් ජෙරුසලම් දේව මාලිගාවේ ඉදිරිපස නතර වී උන්වහන්සේගේ ක්‍රියාවන් පරීක්ෂා කරමින් පිලාත්ට තොරතුරු යැවූ බැව් සඳහන් වේ.
- ජේසුස් වහන්සේව අත්අඩංගුවට ගැනීම, දඬුවම් දීම, ජේසුස් වහන්සේගේ කුරුසිය පාමුල සිටීම, ජේසුස් වහන්සේගේ ශුද්ධ වූ ගල්ලෙන මුර කිරිම ආදී අවස්ථාවල දී ඔවුන් ගැන විස්තර වැඩියෙන් ක්‍රියා පොතේ දැකිය හැකි ය. (ජුවාම් 19/31, ක්‍රියා 23/31-35)

### 3.1.2.6 නායක පූජකයන්

- ඉශ්රායෙල් ගෝත්‍ර 12න් ලෙවී ගෝත්‍රය පමණක් දේවමාලිගාවේ පූජක කටයුතු කිරීමේ වගකීම දැරූහ. ලෙවී ගෝත්‍රයේ ආරොන්ගේ පවුලේ අයත්, ආරොන්ගේ පවුලේ ''සදොක්'' වංශිකයනුත් පමණක් පූජක කටයුතු කිරීමේ මූලිකත්වය දැරූහ.
- ඉශ්රායෙල් රජවරුන්ගේ යුගයේ දී දාවිත් රජුගේ කාලයේ දී සදොක් නමැත්තා පූජක කටයුතුවලට තේරීපත් වී ජෙරුසලමේ දේවස්ථානයේ යාගපූජා පැවැත්වීය. එයින් පසුව සලමොන් රජුගේ කාලයේ දී නායක පූජක ලෙස සදොක් පත් කරන ලදී. එදින පටන් සදොක්ගේ පවුලේ අය පූජක කටයුතුවල දී මූලිකත්වය ගත් හ. මොවුන් ''සදිසිවරුන්'' යනුවෙන් හඳුන්වනු ලැබූහ.
- බැබිලෝනීය විප්‍රවාසය දක්වා සදොක්ගේ පරපුර පරම්පරාවෙන් පරම්පාවට පූජක කටයුතු කරගෙන ආ නමුත් බැබිලෝනීය විප්‍රවාසයෙන් පසුව සදොක්ගේ පරම්පරාව යයි හඳුන්වනු ලැබූ අය පමණක් නායක පූජකවරුන් ලෙස පත් කරන ලදී.
- ඉශ්රායෙල් රජුත්, නායක පූජකයනුත් එක්ව සමාජය පාලනය කළ බැවින් දෙපාර්ශවයම එකසමානව ගෞරවය ලැබූහ. විප්‍රවාසයට පසු නායක පූජකයන්ගේ බලතල රජයතුලත් දහමතුලත් උසස් විය.
- ක්‍රි.පූ. 2 වන සියවසේ දී, පූජකවරු, විනයධරයන්, පූජා මූලිකයන් ඇතුළු කණ්ඩායමට නායක පූජකතුමා නායකත්වය දැරීය. නායක පූජක පදවිය ඒ පරපුරටම පරම්පරාවෙන් පරම්පරාවට උරුම විය. නායක පූජක ලෙස පත් වූ කෙනෙකු තම ජීවිත කාලය පුරා එම පදවිය දැරිය යුතු විය.
- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී එක් ප්‍රධාන නායක පූජකයකුව පත් කර තිබුණත් විශ්‍රාමික නායක පූජකයා යටතේ බලය පැවතුණි. (ජුවාම් 18/19-24 දක්වා)
- රෝම පාලනය ජුදයින් අතර ව්‍යාප්ත වූ කාලයේ ජුදා ජන ජීවිත තුළ නායක පූජකයන් ලබා තිබූ සැලකිලි දුටු බැවින් තමන්ට අවශ්‍ය අයව නායක පූජකයින් ලෙස පත් කර ගත් හ.
- සමාජයේ උසස් මට්ටමක, සිටි අය වූයේ සදුසිවරුන් වන නායක පූජකයන් ය. මොවුන් ධනවත් ව්‍යාපාරිකයන් ලෙස ද, ඉඩම්හිමියන් ලෙස ද රටේ ප්‍රධාන වගකීම් දැරූ අය ලෙස ද සිටි අය බැවින් මොවුහු ධනවතුන් වූහ.
- දේව මාලිගාව පරිපාලනයේ පූර්ණ වගකීම ද (YOMKIPPUR) යාග පූජා ආදී ප්‍රධාන මංගල්‍යයන්හි දී ද අති ශුද්ධ ස්ථානයට ගොස් චාරිත්‍ර කිරීම ද ඔවුන්ගේ සේවාවන් වේ.
  මොහු ජුදයාවේ සත්‍යවාදී පාලනයක් ගෙනයන නිලධාරීන් ඉදිරියේ ජුදා ජනතාවගේ නියෝජිතයෙක් ලෙස ක්‍රියා කරයි. ජුදයින් සඳහා නීතිය සම්පාදනය කරන නායකයින්ගේ සංගමයේ නායකත්වය දරයි.
- අධික ආදායමක් ලබන තනතුරක් ලෙස මෙය දැකිය හැක. මන්දයත් දේව මාලිගාවේ ඔප්පු කරන පඬුරුවලින් ද සතුන් වෙළඳාමේ ද ඔවුන්ට කොටසක් හිමිවන බැවිනි. කාලයාගේ ඇවෑමෙන් නායක පූජකයන්ව රෝම අධිරාජයා විසින් පත් කරන ලදී. තම කැමැත්තට අනුව ක්‍රියා කරන කෙනෙකු මොවුන් මේ ධූරයට පත් කර ගත් හ. අන් අයව තනතුරෙන් පහ කළහ.

- ජේසුස් වහන්සේගේ කාලයේ දී අන්නාස්ගේ පවුලේ සාමාජිකයන්ව නායක පූජක ධූරයට තෝරා ගන්නා ලදී. අන්නාස් රෝම අධිරාජයා විසින් ක්‍රි.ව. 7 දී නායක පූජකයා ලෙස පත් කර ක්‍රි.ව. 11 දී පදවියෙන් පහ කරන ලදී. ඔහුට පසුව ඔහුගේ බෑනාවරු 5 දෙනා නායක පූජක ධූරය ලැබ තනතුරුවලින් පහ කරනු ලැබූහ.
- අවසානයේ දී ඔහුගේ බෑනා කයිපාස් ක්‍රි.ව. 18-36 දක්වා නායක පූජක ධූරය දැරීය. පදවියෙන් ඉවත් වුවද අන්නාස් නායක පූජක පවුලේ නායකයා වූ බැවින් ඔහු ප්‍රධාන තැනක් දැරීය. ජේසුස් වහන්සේගේ නඩු තීන්දුවේ දී ඔහු ප්‍රධාන තැනක් ගත් බව දැකිය හැක.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ජේසුස් වහන්සේගේ කාලයේ දී පලස්තීනයේ රෝම පාලනය පැවතුණු බවට උදාහරණ ඉදිරිපත් කරයි.
2. ජේසුස් වහන්සේගේ මරණයට පහත සඳහන් අය සම්බන්ධ වූයේ කෙසේදැයි කණ්ඩායම් පැවරුමකින් ඉදිරිපත් කරයි.
   (අ) පිලාත්, ආණ්ඩුකාරයා (ආ) හෙරොද්
   (ඇ) සෙබලුන් (ඈ) නායක පූජකයන්
3. රටේ නීතිරීතිවලට අනුකූලව කළ හැකි ක්‍රියාවන් ඉදිරිපත් කරයි.

**නිපුණතාව 3.0 :** ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 3.2 :** මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන සමාජය තුළ සිටින සියල්ලන්ට ගරු කරමින් ජීවත් වීමට උගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 12

**ඉගෙනුම් පල**

- පලස්තීනයේ වූ සමාජ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජුදා සමාජයේ කුලහීන ජනතාවට ජේසුස් වහන්සේ ගරු කළ බව පිළිගනියි.
- ජුදා සමාජයේ එක් එක් කණ්ඩායම පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.
- සමාජයේ වෙසෙන පහත් මට්ටමේ ජනතාවට ආදරය කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

## 3.2.1 ජුදා සමාජයේ ප්‍රභේදයන්

- මුල් සියවසෙහි ජුදා සමාජය තුළ ජුදෙව්වන්, විසිරී ගොස් සිටි ජුදෙව්වන් හා අන්‍ය ජාතීන් යනුවෙන් ජන කොටස් දැකිය හැකි විය.
- පලස්තීන ජුදෙව්වරුන් අතර, උසස් කුලවත් අය, මධ්‍යම පාන්තිකයන්, කොන් කරනු ලැබූ අය යනුවෙන් වෙනස්කම් දැකිය හැක. මේ පිළිබඳ මෙම නිපුණතා මට්ටමේ දී අප ඉගෙන ගනිමු.

## 3.2.2 පලස්තීන ජුදෙව්වරුන්

- මොවුන් පලස්තීනයේ ඉපදී, හැදී වැඩී ජීවත් වූ අයයි.
- මොවුන් හීබෲ බසින් කතා කළ අය ලෙස හැඳින්වේ. මොවුහු අරමීය බස ද කතා කළ හ.
- මොවුන් අන් රටවල් සමග හෝ අන් රටවල ජනතාව සමග හෝ ඔවුන්ගේ සංස්කෘතිය, කලා ශිල්ප, සිරිත් විරිත් සම්ප්‍රදායන් සමඟ හෝ කිසිම සබඳතාවක් ඇසුරක්, හැඳුනුම්කමක් හෝ නැති අය ය.
- මොවුන් පටු අදහස් ඇති අයයි.
- තම ජාතියේ, ආගමේ, සම්ප්‍රදායේ, ශුද්ධත්වය ආරක්ෂා කිරීමට අන් රාජ්‍යයන්ගේ පාලන සමයේ දී ඔවුන්ට මහත් වෙහෙසක් දරන්නට සිදුවිය.
- එයට හේතු වූයේ 4 වන අන්තියෝකස් එපිපානස් ග්‍රීක සංස්කෘතිය පලස්තීනයේ බලහත්කාරයෙන් ව්‍යාප්ත කිරීමට උත්සාහ කිරීම ය.
- වෙනත් රාජ්‍ය පාලකයන් පලස්තීනය තුළ ඔවුන්ගේ ආගමික වත්පිළිවෙත්, සංස්කෘතිය, සම්ප්‍රදායන් ආදිය ව්‍යාප්ත කිරීමට දැඩිව උත්සාහ කළ හ. මකබි විප්ලවය ජුදා විප්ලවයක් බවට පත්වීම තුළ අපට මෙය දැනගත හැකි ය.

- අන්‍යයන්ව ද ඔවුන්ගේ ක්‍රියා ද, මෝසෙස්ගේ ව්‍යවස්ථාවට පටහැනි වූ බැවින් ඒවා ප්‍රතික්ෂේප කළ හ. පිළිගැනීමට මැළිවූහ.
- දෙවිපියාණන්ටත්, මොසෙස්ගේ ව්‍යවස්ථාවටත් විශ්වාසවන්ත ලෙස ජීවත් වී තම ජාතියේ ශුද්ධත්වය ආරක්ෂා කිරීමට ඇති කර තිබූ නීතිරීති හා පිළිවෙත් දැඩිව අනුසාර කරමින් ජීවත් වූහ.
- මේ ක්‍රියාදාමය ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේත්, ඉන් පසුවත් පැවතුණි.
  *උදා:* ලෙස සමහරු අන්තියෝකයේ ද, ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදී ද කිතුදහම වැළඳගත් අන්‍යජාතීන්ට විරුද්ධව තර්ක කළ අන්දම දැකිය හැක. (ක්‍රියා 15/ 1-15)
- අන්‍යජාතීන්ගේ බහුදේව වන්දනාව, රූප වන්දනාව, ජුදා දහමට අභියෝගයක්ව පැවති හෙයින් ඒවා ප්‍රතික්ෂේප කළ හ.

### (අ) කුලවන්තයන්

- රජ පවුලේ උදවියත්, ඔවුන්ගේ සමීපතම නෑයින්, දුරස්ථ නෑයින් හා ඔවුන්ගේ මිත්‍රයන් කුලවන්ත අය ලෙස සලකන ලදී.
- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ හෙරෝද් රජ පවුලේ උදවිය කුලවන්තයින් ලෙස ප්‍රමුඛ ස්ථානයක් ගත් හ.
- තව ද මහා පරිමාණ ව්‍යාපාරිකයන්. ඉඩම්හිමි ප්‍රභූවරුන්, බැංකු හිමිකරුවන් ද, ස්වයං ව්‍යාපාර කළ බොහෝ ජුදා මන්ත්‍රණ සභා සාමාජිකයන් ද ධනවතුන් වූ බැවින් මොවුන් ද කුලවන්තයන් ලෙස සලකන ලදී.
- රටේ පොදු වස්තුවට රජ පවුලේ උදවිය හිමිකම් පෑහ.
- එබැවින් ඔවුන්ගේ ආහාර, වස්ත්‍ර, නිවාස ආදිය අතිඋසස් ලෙස සැකසුණි.
- තම සුඛෝපභෝගී දිවි පෙවෙත විවිධ අන්දමින් විදහා පෑහ.
- ධනවතුන්ට භාර්යාවන් කිහිපදෙනෙකු තබාගත හැකි බවට නීතියක් ද තිබුණි. රජකෙනෙකුට භාර්යාවන් 18 දෙනෙකු සරණපාවා ගත හැකි බව ''මිස්නා'' නීතියෙන් සීමා කර තිබුණි.
- නමුත් ''තාල්මුට්'' නීතියට අනුව භාර්යාවන් 24-28 දක්වා ද සිටිය හැකි බව කියැවේ. (තාල්මුට් යනු ග්‍රීක පාලන සමයේ දී ජුදෙව්වරුන් වෙනුවෙන් ලියන ලද නීතිපොත වේ.)
- ධනවතුන් තම පොහොසත්කම පෙන්වීමට නිතර නිතර භෝජන සංග්‍රහ පැවැත්වූහ. (ලූක් 14:15-24) මේ භෝජන සංග්‍රහයට බොහෝ දෙනෙකුට ආරාධනා කරනු ලැබේ.
- මේ සඳහා වෙනම ම අරක්කැමියන් නියම කරනු ලැබේ.
- ජලය මිශ්‍ර නොකළ උසස් වර්ගයේ මිදියුෂ වීදුරු බඳුන්වල දමා සංග්‍රහ කරනු ලැබේ.
- ඉන් අනතුරුව ආරාධිතයෝ නටමින් ප්‍රීති වෙති.
- ධනවතුන් තම භාර්යාවන් වෙනුවෙන්, සුඳ විලවුන්, වටිනා ඇඳුම්, ආභරණ, දියමන්ති, මුතු, රන්මාල හා රිදී භාණ්ඩ සඳහා අධික මුදලක් වැය කළහ.
- සමහර ධනවත් නායක පූජකවරුන්ගේ භාර්යාවන් තම නිවසේ සිට දේවස්ථානයට පා ගමනින් යාම සඳහා පලස් එලන ලදී.

**(ආ) මධ්‍යම පන්තිකයන්**

- සමාජයේ ධනවතුන්ට පසුව සිටින්නේ මධ්‍යම පාන්තිකයන් ය.
- පූජක පක්ෂයේ අය ද, සුළු ව්‍යාපාරිකයන් ද, ගෘහ නිර්මාණ ශිල්පීන් ද මධ්‍යම පංතියට අයත් වූහ.
- ජෙරුසලමේ මංගල්‍ය කාලවල දී සුළු ව්‍යාපාරිකයන්ටත් (ගෘහ) කලාකරුවන්ටත් අධික ආදායමක් ලැබුණු බව දැකිය හැක.
- ජුදා පූජකවරුන් අතර වර්ග 24 ක් සිටිය හ.
- මොවුන්ගෙන් ජෙරුසලමේ පූජකයන් හැර අන් අය මධ්‍යම පන්තියට අයත් වූහ.
- මේ පූජකවරුන්ට තම තේවා වාරයේ දී ලැබෙන පූජා පඬුරු ද පාප පූජා පඬුරු ද, දේවස්ථානයට දෙන නැඹුල්ඵල පඬුරු ද භූමියෙහි වගාවෙන් 1/10 ක් ද ලැබුණි.
- මේවා සුඛෝපභෝගී දිවිපෙවෙතකට ප්‍රමාණවත් නොවූවත්, දිළිඳුන් යයි හැඳින්වීමට තරම් මොවුහු පහත් තත්ත්වයක නොවූහ.

**(ඇ) කොන්කරනු ලැබූවන්**

- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ආර්ථික තත්ත්වයෙන් පහත්වූවන්, දිළිඳුන් හෝ කොන්කරනු ලැබූවන් ලෙස සලකනු ලැබීය.
- මොවුහු සමඟ වහලුන්, බදු අය කරන්නන්, සමාරියයන් පාපිෂ්ඨයන්, කාන්තාවන් ආදීන් ද ඇතුළත් වූහ.

**I දිළිඳුන් :**

- දිළිඳුන් ආර්ථික අපහසුතාවලින් පෙලුන හ. මොවුන්ව ''හම් හා අරෙස්'' (AM–HA–AREZ) යනුවෙන් අමතන ලදි. එනම් (**භූමියේ දරුවන්**) ලෙස හඳුන්වනු ලැබූහ.
- ගැමියන් යනු මෙහි අරුතයි.
- මොවුන් මිනිසුන් ලෙස සිටියත් ආත්මයක් නැති ලෞකික භාණ්ඩයක් ලෙස සලකනු ලැබූහ.
- ලෙඩුන්, එඬේරුන්, කුලීකරුවන් ආදීහු මේ ඝනයට අයත් වූහ.
- මේ දිළිඳුන්ට ක්‍රිස්තුන් වහන්සේ අධික ලෙන්ගතුකමක් දැක්වූ සේක. (ලූක් 15/1-7)

**II වහලුන් :**

- ක්‍රිස්තු පූර්ව 3 සියවසේ සිට වහල් වෙළඳාම පලස්තීනයේ පැවතුණි.
- ගලක් මත වහලුන් හිඳුවා වෙන්දේසි කරන ලදි.
- වෙළෙඳපලේ භාණ්ඩයන් ලෙස වහලුන්ව ද සලකන ලදි.
- ගමේ සහ නගරයේ මේ වහලුන් අධික ලෙස ජීවත් වූහ.
- පාඩුව පිරිමැසිය නොහැකි වූ අය හෝ ණයක් ආපසු දිය නොහැකි වූ හෝ ජුදයින්ට තමන්ව වහලුන් ලෙස විකිණීමට සිදුවිය.

- මහ හෙරෝද්ගේ කාලයේ දී වහලුන් පිළිබඳ නීති තද කරන ලදි.
- වසරක් තුළ ජුදෙව්වන් ලෙස හැඩ නොගැසුණු අන්‍ය ජාතිකයින් වහලුන් ලෙස විකුණන ලදි.
- අනාථව සිටින කෙනෙකු තමන්ව තවත් කෙනෙකුට වහලකු ලෙස විකිණිය හැක.
- දරිද්‍රතාවයෙන් පෙළෙන කාන්තාවක් අවුරුදු 12ක් වයසැති තම දියණිය වහලියක ලෙස විකුණයි.
- යුද්ධයෙන් අල්ලාගත් අයව ද වහලුන් කළහ.
- තාල්මුඩ් ව්‍යවස්ථාවට අනුව ජුදා වහලෙකුව තඹ කාසි 1 කට හෝ 2 කට (MINAS) විකුණන ලදි. නමුත් අන්‍ය වහලකුගේ මිල තඹ කාසි 5-10 දක්වා විය.
- ජුදා වහලෙකු තම ස්වාමියාට සේවය කළ යුත්තේ වසර 6ක් පමණි.
- ජුදා වහලියකට වයස අවුරුදු 12 දී නිදහස ලැබුණත් ඇගේ ස්වාමියා හෝ ස්වාමියාගේ පුතා හෝ ඇයව සරණපාවාගෙන එම වහල් තත්ත්වයම ලබාදීම සිරිතක් විය.
- ක්‍රිස්තුන් වහන්සේ තම දේශනාවන් තුළින් මෙවන් වහල් බවින් මිනිසුන් මුදාගත යුතු බවට බොහෝ දේශනා ද අදහස් ද පැහැදිලිව ඉදිරිපත් කළ සේක. (මතෙව් 10/24)
- ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් මුල් කරගෙන දේශනා කළ පාවුළුතුමා ඔනේසිමස් නමැති වහලා සම්බන්ධව පිලමොන්ට ලිපි ලියූ බව දකිමු. (පිලමොන් 1/15, 16)

**III කාන්තාවන්**

- පෙරදිග රටවල කාන්තාවෝ සමාජය හා වැඩි ඇසුරක් නොදැක්වූහ.
- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ජුදා සමාජය තුළ කාන්තාවන්ව ඉතා පහත් ලෙස සලකන ලදි.
- කාන්තාවන්ට සමාජයේ නිසි තැනක් නොලැබුණි.
- ආගමික හා දේශපාලනමය වශයෙන් කාන්තාවන් කොන් කරනු ලැබූහ. මොවුන්ගේ අයිතිවාසිකම් ද ප්‍රතික්ෂේප කරන ලදි.
- පලස්තීන කාන්තාවක් නිවසින් බැහැර යන විට හිස හා මුහුණු වසාගෙන යායුතු ය. එසේ නොගියහොත් ස්වාමිපුරුෂයාට ඇයව දික්කසාද කළ හැකි විය.
- එසේ දික්කසාද කරන විට ඇයට දිය යුතු දීමනා කිසිවක් දිය යුතු නැත.
- කිසිම කාන්තාවක් පිරිමියකු සමග තනිව සිටීම හෝ පුරුෂයෙක් විවාහ වූ කාන්තාවක් දෙස බැලීම හෝ ඇයට සුභ පැතීම හෝ තහනම් විය.
- කිසිම භාර්යාවකට තම ස්වාමිපුරුෂයා සම්බන්ධ ව නීතිමය අධිකරී බලයක් නැත.
- නමුත් ස්වාමිපුරුෂයකු තම බිරිඳව පෞද්ගලික වස්තුවක් ලෙස සලකන ලදි.
- එබැවින් ස්වාමිපුරුෂයාට තම බිරිඳව පහසුවෙන් දික්කසාද කිරීමට නීතියෙන් අනුමැතිය දී තිබුණි.
- දික්කසාදය සඳහා පුරුෂයන්ට නීතිමය අනුමැතිය තිබුණි. නමුත් කාන්තාවන්ට මෙම අයිතිය ප්‍රතික්ෂේප කරන ලදි.
- කාන්තාවන් පිරිමින් හා එක්ව ආහාර අනුභව නොකළ යුතු ය.
- පිරිමින් අනුභව කරන විට කාන්තාවන් ඔවුන්ට උපස්ථාන කළ යුතු විය.
- වීථිවල ද, දේවස්ථානයේ ද, සිනගෝගවල ද කාන්තාවන්ට වෙන් කළ විශේෂ ස්ථාන විය.

- පොදුවේ තමන්ගේ නිවස මොවුන්ගේ ලෝකය විය. නිවසේ ජනේල තිර දමා වසා තිබේ.
- වැන්දඹු කාන්තාවන් බොහෝ පීඩාවන්ට ලක් වූහ. කිසිම රැකියාවක ඔවුන්ට නිරත විය නොහැකි විය.
- මිනිස්කමකින් තොරව මොවුන්ට සලකන ලදි. පා සේදීම වැනි පහත් ක්‍රියා සඳහා මොවුන් යොදවන ලදි.
- ආගමික දෘෂ්ටියෙන් බලන කළ පුරුෂයින්ව ඔවුන්ගේ යුතුකම්වලින් නිදහස් කර තිබුණි.
- ''ක්ෂේමා'' යන ජුදෙව්වන්ගේ යාච්ඤාව මොවුන් කිව යුතු වූයේ නැත.
- රෙදි විවීම, රොටි පිළිස්සීම, ගෘහ භාණ්ඩ නිර්මාණය කිරීම, දිය උල්පත්වලින් ජලය රැගෙන ඒම, තෙල් නිපදවීම ආදිය කාන්තාවන්ට නියම වූ සේවාවන් ලෙස සලකන ලදි.

## IV සමාරියයන්

- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පහත් ලෙස සලකනු ලැබූ අයගෙන් සමාරියයන් ද ප්‍රධාන තැනක් ගනිති.
- මොවුන් ජුදෙව්වන් වුවද දේශපාලන, ආගමික, කරුණු නිසා ප්‍රතිපත්ති වෙනස් වූ ජුදයන්ගෙන් වෙන්ව තනිව ජීවත් වූහ.
- ක්‍රි. පූ. 922 දී සලමොන් රජුගේ මරණින් පසු පලස්තීන රාජ්‍යය උත්තර හා දක්ෂිණ රාජ්‍ය ලෙස රාජ්‍යයන් දෙකකට බෙදුනි.
- සමාරියාවේ සිටි ''ජෙරොබොවාම්'' රජු දකුණේ පිහිටි ජෙරුසලමට තම ජනතාව යෑමත්, වන්දනා කිරීමත් පිළිබඳව අකමැති විය.
- එම නිසා සමාරියාවේ ''දොන් බෙතෙල්'' වැනි ස්ථානවල ශුද්ධස්ථාන පිහිටුවා වන්දනාමාන කිරිමට සැලැස්වීය.
- එම නිසා ජුදෙව්වන් මොවුන්ව බෙදුම්වාදී කණ්ඩායමක් ලෙස අදහස් කර, ප්‍රතික්ෂේප කර කොන් කළ හ.
- තව ද ක්‍රි. පූ. 722 දී අසිරියේ රජු (එතික්ලාස් බල්සාර්) ඉශ්‍රායෙල්වරුන්ව රටින් පිටුවහල් කර, හිස්තැන් පිරවීමට අන්‍ය ජාතිකයින්ව සමාරියාවේ පදිංචි කරවීය.
- ඉතිරිව සිටි ජුදෙව්වරු මොවුන් සමග මිශ්‍ර විවාහ කර ගත්හ. මොවුන්ගෙන් බිහිවූ අය සමාරියයන් වේ.
- එම නිසා මොවුන් කිලිටි වූ අය ලෙස ද, තම ජාතියේ ශුද්ධත්වය නැති කර ගත් මිශ්‍ර අය ලෙස ද, අර්ධ ජුදෙව්වන් ලෙස ද සලකා මොවුන්ව ජුදෙව්වරු කොන් කළ හ.
- ජුදෙව්වන් සමාරියයන් සමග කතා කිරීම හා සමාරිය මැදින් ගමන් කිරීමෙන් පවා වැළකී සිටියහ. (ලූක් 9/53 ජුවාම් 4/9)
- ක්‍රිස්තුන් වහන්සේ අර්ථශූන්‍ය වූ ජුදා නීතිය කඩ කරමින් සමාරිය ස්ත්‍රිය සමග කතා කර, සමාරිය ප්‍රදේශවලින් ගමන් කර, මිනිස්කමේ උතුම් බව හුවා දැක්වූ සේක.
- මොවුන් හැර එඬේරුන්, කුෂ්ට රෝගීන්, ප්‍රසිද්ධ පව්කාරයන් (වෛශ්‍යාවන් අයකැමියන්) ආදි අයව ද පහත් කොට සැලකුහ.

### 3.2.3 විසිරී ජීවත්වූ ජුදෙව්වරුන්

- පලස්තීනය විවිධ කාලවකවානුවල දී අධිරාජ්‍යවරුන් විසින් අත්පත් කරගෙන අන්‍ය රජවරුන් විසින් පාලනය කරන ලදී.
- ජුදෙව්වරු අන් රටවලට පිටුවහල් කරනු ලැබූහ. ජුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් තම මවුරට වන පලස්තීනයට නැවත නොපැමිණිය හ.
- ග්‍රීක හා රෝමවරු පලස්තීනය යටත් කරගෙන පාලනය කළ සමයෙහි, සමහර ජුදෙව්වරු රැකියා ව්‍යාපාර ආදී ආර්ථික දියුණුව නිසා හෝ සෙබලුන් ලෙස හෝ පෙරදිග ප්‍රදේශවලත්, මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශවලත් පදිංචි වූහ.
- එම රටවල රජවරු ඔවුන්ට ආරක්ෂාව සපයා සැලකිලි දැක්වූහ. ඔවුහු නිදහසේ එම රටවල ජීවත් වූහ.
- ඔවුහු සිරියාව, අසිරියාව, මෙසපොතේමියාව, ඊජිප්තුව ( ඇලෙක්සැන්ඩ්‍රියාව, ග්‍රීසිය) රෝමය, සුළු ආසියාව, සිසිලිය, තෙසලෝනිය, ලිබියාව ආදී රටවල පදිංචි වී ජීවත් වූහ.
- මොවුහු ග්‍රීක බස කතාකළ ජුදෙව්වරු නැතහොත් යෞවන සම්ප්‍රදායකයින් ලෙස හඳුන්වනු ලැබූහ.
- පලස්තීන ජුදෙව්වරු මොවුන්ව තමන්ට වඩා පහත් අය ලෙස සැලකූහ.
- පිටරටවල ජීවත්වූවන් පලස්තීනය තම මව්රට ලෙස ද, ජෙරුසලම තම ආගමික මූලස්ථානය ලෙස ද සලකා ජීවත් වූහ.
- දේවස්ථානයේ පරිපාලනය කටයුතු සඳහා වාර්ෂිකව මුදල් ද පඬුරු ද යැවූ අතර වාර්ෂිකව පෙන්තකොස්ත මංගල්‍යයට ජෙරුසලමට පැමිණියහ.
- මොවුහු පෙන්තකොස්ත මංගල්‍යයට ජෙරුසලමේ නතරව සිටි කාලයේ දී ශුද්ධාත්ම ආගමනය සමග ශුද්ධ වූ සභාව ආරම්භ විය. (ක්‍රියා 2/1-13)
- පේදුරුතුමාගේ මංගල දේශනය අසා 3000 කට අධික පරිසක් කිතුදහම වැළඳ ගත්හ. (ක්‍රියා 2/14-41)
- අන්‍ය සම්ප්‍රදායන් පිළිබඳ පුළුල් මනසක් ඇත්තාවූ මොවුන් හා පලස්තීන ජුදෙව්වන් අතර නිතර නිතර මතභේද ඇති කර ගත්හ.
- මොවුහු ඈත්ව ජීවත්වූවත්, මෝසෙස්ගේ ව්‍යවස්ථාවේද, පාරම්පරික ආගමික සිද්ධස්ථානයන් කෙරෙහි ද අධික බැතියක් හා බැඳීමක් ඇති අය වූහ.
- ස්තේපන්ගේ ප්‍රාණ පරිත්‍යාගී මරණයට මොවුහු හේතුකාරයන් වූහ. (ක්‍රියා 7 වන පරිච්ඡේදය)
- පාවුළුතුමා තම ධර්මදූත ගමනේ දී මොවුන් හමුවී තම දේශන පැවැත්වීය.
- බොහෝ තැන්වල පාවුළුතුමාට විරුද්ධව කටයුතු කළ අයත් මොවුන්ම ය.

### 3.2.4 අන්‍ය ජාතීන්

- ජුදා හැර අන් හැම ජාතියක් ම අන්‍ය ජාතීන් ලෙස හැඳින්වූහ.
- ජුදෙව්වන් තමන් දෙවියන් වහන්සේ විසින් තෝරාගත් අය ලෙස ද, අන්‍ය ජාතීන් පහත අය ලෙස ද සැලකූහ. මන්දයත් අන්‍යජාතීන් දෙවියන් වහන්සේගේ නීතිය නොදන්නා අය නිසා ය.
- ජුදා ජාතීන්ට තිබූ අයිතිවාසිකම් මොවුන්ට නොතිබුණි.
- මොවුන් සමග ආහාර ගැනීමත්, ඔවුන්ගේ නිවෙස්වල නැවතීමත් ජුදා නීතියට පටහැනි ක්‍රියා ලෙස සැලකූ බැවින් ශුද්ධ වූ පේදුරුතුමා කොර්නේලියස්ගේ නිවසට යෑම ජුදා කිතුනුවන්ගේ විමසුමට ලක් විය.
- ජුදා නොවන අයට ගැලවීමක් නැත යන්න ජුදා පිළිගැනීමයි.
- මොවුන්ට සේවය කිරීම ශුද්ධ වූ පාවුළුතුමා තමන් ලද භාග්‍යයක් සේ සැලකුවේ ය. (රෝම 11/13)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. පලස්තීනයේ සමාජ පසුබිම ගැන කෙටියෙන් විස්තර කරයි.
2. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ සමාජ කොටස් කිතු දහමේ දියුණුවට බලපෑ අන්දම උදාහරණ සහිතව ඉදිරිපත් කරයි.
3. ''කොන් කරනු ලැබූ ජනයා'' අතර සේවය කිරීමේ අවශ්‍යතාව ගෙනහැර පායි.
4. පාඩමේ සඳහන් කරනු ලබන ''කොන් කරනු ලැබූ ජනයා'' අතර සේවය කිරීම සඳහා ව්‍යාපෘතියක් කරයි.

**නිපුණතාව 3.0 :** ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 3.3 :** මුල් සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන ආගමික ස්ථාන වලට හා ආගමික නායකයින්ට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 12

**ඉගෙනුම් පල**

- පලස්තීනයේ ජේසුස් වහන්සේ ගේ කාලයේ ආගමික පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජුදයින් ජෙරුසලෙම් දේවස්ථානයට ප්‍රධාන තැනක් දුන් බව පිළිගනියි.
- ජුදා ආගමික ස්ථාන හා කණ්ඩායම් පිළිබඳ නිර්මාණාත්මක කරුණු ඉදිරිපත් කරයි.
- ආගමික ස්ථානවල ශුද්ධත්වය රැකෙන ක්‍රියාකාරකම් වල නිරත වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

**3.3.1 ආගමික සිද්ධස්ථාන**

- ආගම දෙවියන් වහන්සේත්, මිනිසාත් අතර සබඳතාවයක් ගොඩනගයි.
- මිනිසාගේ ආගමික දිවියේ උසස් තැනක් දෙවියන් වහන්සේට හිමිවේ.
- ඊශ්‍රායෙල්වරුන්ගේ අධ්‍යාත්මිකත්වය, සමාජ, දේශපාලන, ආර්ථික ජීවිත මුළුමනින්ම දෙවියන් වහන්සේව කේන්ද්‍ර කර ගනිමින් ගොඩනැගී ඇත.
- ඉශ්‍රායෙල්වරුන්ගේ ඇදහිල්ල, තම ආදිපිතෘ ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් ආදීන්ට ලැබුණු දේව ආනාවරණයත්, සීනයි ගිවිසුමත් පදනම් කරගෙන ගොඩනැගුණකි. ඊශ්‍රායෙල්වරුන්ගේ ඇදහිල්ලේ පදනම ''ඒක දේව වාදය'' විය.
- මොවුහු ජීවිතයේ විවිධ කාල වකවානුවල තමන් ලද අත්දැකීම් අනුව, එකම දෙවියන් වහන්සේව විවිධ නම්වලින් අමතා පුදනු ලැබූහ.''එල්'' යනු දෙවියන් වහන්සේව අමතන පොදු නාමය
වේ.
- එනමුදු පහත සඳහන් නාම දෙවියන් වහන්සේගේම අසමසම ගුණාංග හඟවන ඒවා වෙයි.
- එල් එලොහිම් - (මැවුම්කරුවාණන් වන දෙවියන්වහන්සේ, ස්වර්ගයේ සිටින දෙවියන් වහන්සේ)

| | | |
|---|---|---|
| එල් ඒලියොන් | - | (මහෝත්තම වූ දෙවියන්වහන්සේ) |
| එල්ෂඩායි | - | (සියලුබලැති දෙවියන් වහන්සේ/ මහිමාන්විත වූ දෙවියන් වහන්සේ) |
| එල් පෙරික් | - | (ගිවිසුමේ දෙවියන් වහන්සේ) |
| යාවේ | - | (ස්වයම්භූ තැනැන්වහන්සේ - ආරම්භයත් අවසානයත් නැති දෙවියන් වහන්සේ) |
| අදෝනායි | - | (දෙවියන් වහන්සේ) |

මේ නාමයන්ගෙන් අමතමින් තමන්ගේ යැදුම්, භාරහාර, පඬුරු යාගපූජා ඔප්පු කළ හ.

- තව ද ගිල්හාල්, බෙතෙල්, ෂෙකෙම්, සීලෝ, දාන් ආදි ස්ථානවල පීඨික (පුදසුන්) තනා පුදපූජා ඔප්පු කළ හ.
- විධිමත් රටාවකට තැණුනු ආගමික සිද්ධස්ථාන රජවරුන්ගේ කාලයේ දී ඇති විය.
- දාවිත් රජතුමාගේ රාජ්‍ය සමයේ දී ජෙරුසලමේ ගිවිසුම් කරඬුව තැන්පත් කර කුඩාරමක් තනා, එය ශුද්ධස්ථානයක් බවට පත් කර, ආගමික වතාවත් කිරීමට කටයුතු කළේ ය. පසු කාලයේ දී මෙය අති උසස් දේව මන්දිරයක් බවට පත්වීමට මෙයට හේතු විය.
- මෙවන් සිද්ධස්ථානවලින් මුල්තැන ගන්නේ ජෙරුසලමේ දේව මාලිගාවයි.
- මේ හැර සිනගෝගද, ජුදා මන්ත්‍රණ සභාව ද, ජුදා ආගමික ස්ථාන ලෙස පිළිගන්නා ලදි.
- මෙවැනි ස්ථානවල ආරම්භය, නිර්මාණය, ඉන් සිදුවන සේවය, ශ්‍රේෂ්ඨත්වය ආදිය ගැන විමසා බැලීම අත්‍යවශ්‍ය වේ.

### 3.3.0.1 ජෙරුසලම් දේවස්ථානය

**ආරම්භය**

- ''දේවස්ථානය'' දෙවියන්වහන්සේ වැඩ සිටින ශුද්ධ වූ මන්දිරයක්, දේව වරප්‍රසාදයේ සංකේතයක්, දෙවියන් වහන්සේ වැඩසිටින මූලස්ථානයක් යනුවෙන් අදහස් කෙරේ.
- ඉශ්‍රායෙල්වරුන් තුළ මෙවැනි සිතුවිලි ඉතා ප්‍රබලව තිබුණි.
- මෙයට නිදසුනක් වනුයේ ජෙරුසලම් දේව මන්දිරයයි.
- ජෙරුසලම් දේව මන්දිරය ජුදෙව්වරුන්ගේ ජීවිතය හා බැඳී, තම ජීවිතයටත් වඩා උසස් දෙයක් ලෙස සලකන ලදි.
- දාවිත් රජුගේ රාජ්‍ය සමයේ දී ජෙරුසලම අගනුවර බවට පත් කළ අවස්ථාවේ, තම දෙවිඳුන්ට වැඩ සිටීමට වාසස්ථානයක් තැනීමේ උත්සාහයක් දරන ලදි.
- නමුත් මෙම උත්සාහය ව්‍යර්ථ වී (අසාර්ථක වී) ඔහුගේ පුත් සලමොන් මේ දේව මන්දිරය ගොඩනැගුවේ ය. මේ දේව මන්දිරය ලොව ඇති අනර්ඝතම ගොඩනැගිලි ද්‍රව්‍යවලින් ද කලා නිර්මාණයන්ගෙන් ද ගොඩනැගු බව කියැවේ.
- නමුත් මේ දේව මන්දිරය විවිධ වකවානුවල දී විවිධ අධිරාජ්‍යවරුන් අතින් විනාශයට පත් වී දේවස්ථානයේ වටිනා භාණ්ඩ පැහැර ගනු ලැබ සිදබිඳ දමන ලදි. (ක්‍රි.පූ. 597 ක්‍රි.පූ. 587 ක්‍රි.පූ. 538 ක්‍රි.පූ. 169/2, රාජාවලිය 16/40-16,21/4-5,7)
- එනමුත් නැවත නැවත ප්‍රතිසංස්කරණය කරනු ලැබ නව මුහුණුවරක් ගත්තේ ය.
- අවසානයේ ක්‍රි.පූ. 19 දී ජුදා රජුවන මහහෙරෝද් ජුදෙව්වන්ගේ හොඳ හිත දිනා ගැනීම සඳහා අති උසස් ලෙස මෙය ප්‍රතිසංස්කරණය කළේ ය. වැඩ අවසන් කිරීමට වසර 46 ක් ගත විය. (ජුවාම් 2/20)

**සැකැස්ම**

- ජෙරුසලම් දේවස්ථානය හා එයට අයත් භූමියේ වටප්‍රමාණය අඩි 2350 කි.
- මෙය ඝනකම ඇති බිත්ති හා මණ්ඩපවලින් යුක්ත ය. සතර දිසාවෙන් ප්‍රධාන දොරටු 8 කින් යුක්ත ය. (උතුර 01, දකුණ 02, නැගෙනහිර 01, බටහිරෙන් 04)

- දකුණේ දොරටු දෙකම උමං මාර්ග සඳහා වේ. මින් ඇතුළු වන විට පළමුව ඇත්තේ ''අන්‍ය ජාතීන්ට වෙන්වූ මිදුලයි''.
- උතුරින් රාජ මණ්ඩපයක්, නැගෙනහිරෙන් සලමොන් මණ්ඩපයක් පිහිටියේ ය. (ක්‍රියා 3/11, 5/12, ජුවාම් 10/23)
- මේ ප්‍රදේශයේ මුදල් හුවමාරුව ද, යාගපූජා භාණ්ඩ විකිණීම ද සිදුවේ. (මතේව් 21/12 - 13)
- අන්‍ය ජාතීන්ට වෙන්වූ මිදුලට පසුව දෙවන කොටසේ දොරටු නවයක් තිබුණි. මෙහි නැගෙනහිර ප්‍රදේශයේ සුදර්ශන දොරටුව පිහිටියේ ය. (ක්‍රියා 3/2)
- මේ ප්‍රදේශයට ඇතුළු විය හැක්කේ ජුදෙව්වන්ට පමණි. මෙහි මිදුල් තුනක් සහිත වේදිකා තිබුණි. පළමු වේදිකා මිදුල කාන්තාවන් සඳහා ය. දෙවන වේදිකා මිදුල ඉශ්‍රායෙල්වරුන් සඳහා ය. තෙවන වේදිකා මිදුල පූජකවරුන් සඳහා ය.
- මේ ප්‍රදේශයේ තිබෙන පඬුරු පෙට්ටියේ මිනිසුන් තම පඬුරු දමන අතර පූජකවරුන්ට යාග පූජා භාණ්ඩ දී යාග පූජා කළ හ.
- මෙහි තෙවන කොටස ''පූදසුන'' ඇති කොටසයි. මෙය ''ශුද්ධස්ථානය'' ලෙස හැඳින්වේ. මෙහි ධූම පාත්‍ර ද රන් පූජාසනය ද, පිදීමේ පූප තැබීමට රන් මේසය ද, ශාඛා 7 ක් සහිත පහන් රුකක් ද විය.
- ශුද්ධස්ථානයට පිටුපසින් ඇත්තේ ''අති ශුද්ධසථානයයි.''
- මෙය තිරයකින් වසා ඇත.
- මුල් කාලයේ දී අතිශුද්ධස්ථානයේ ශෛලමය පීඨකයක් මත ''ගිවිසුම් කරඬුව'' තබා තිබුණි.
- විප්‍රවාසයෙන් පසු ''ශෛලමය පීඨකය'' පමණක් තිබුණි.
- අතිශුද්ධස්ථානයට වසරකට වරක්, පාපපූජා මංගල්‍යයේ දී නායක පූජකයා පමණක් ඇතුළු වී ශෛලමය පීඨකයේ ලේ ඉස යාගය ඔප්පු කරයි.
- මේ හැර දේවස්ථානය වටා ලොකු කුඩා මැදිරි තිබුණි.
- දේවස්ථානය සුදු හුණුගලින් තනා තිබුණි.
- රන් තහඩු සෙවිළි කළ පියස්ස ද, රන් ආලේපිත කුළුණු ද දේවස්ථානය අලංකාර කළේය.

**වැදගත්කම**

- ජෙරුසලම් දේවස්ථානය ජුදයින්ගේ ආගමික හා සාමූහික එකමුතුකමේ මුලස්ථානය වන බැවින් ජුදයින්ගේ ජීවිත සිදුවීම් සියල්ල ම එහිදී ආරම්භ විය.
- ජුදා ළදරුවකු දේවස්ථානයේ ඔප්පු කර, දෙවියන් වහන්සේට කැප කිරීමත්, වාර්ෂික මංගල්‍ය උත්සවවලට සහභාගිවීමත්, යාග ඔප්පු කිරීමත්, දේවසථානය මුල් කරගෙන කළ අතර මෙය සෑම ජුදෙව්වකුගේම යුතුකම ද විය.
- සෑම ජුදෙව්වකුම වසරකට වරක්වත් දේවස්ථානයට පැමිණීම අනිවාර්ය විය.
- දේවස්ථානයේ නඩත්තුවට ජුදයින් බදුදීම තම අයිතිය ලෙස සැලකූ බැවින්, දේවස්ථානයේ කැටය නිතරම මුදලින් පිරී තිබුණි.
- මේ දේවස්ථානය ක්‍රි.ව. 70 දී රෝම අධිරාජයා වන තීතුස් විසින් සම්පූර්ණයෙන් ම විනාශ කර දමන ලදී.
- බටහිර දිසා ප්‍රාකාරය පමණක් අද එහි සළකුණක් ලෙස ඇත. ජුදයින් මෙය ''වැළපෙන පවුර'' ලෙස හැඳින්වූහ.

### 3.3.1.2 ධර්මශාලා

- මෙය ග්‍රීක බසින් සිනගෝග ලෙස හැඳින්වේ.
- ''සිනගෝග' යනු එකතුවීම යන්නයි.
- මෙයි ජුදෙව්වන් එකතු වී පැමිණ, යාච්ඤා කිරීමත්, දේව වාක්‍ය කියවීමත් එහි අර්ථය ඇසීමත් කළ හ.

**ආරම්භය**

- මෙවැනි ධර්මශාලා මුලින් ආරම්භ වූයේ බැබිලෝනියානු විප්‍රවාස සමයේ දී බව සැලකේ.
- විප්‍රවාසයෙන් පසු නැවත තම දේශයට පැමිණි පසු ද මෙවැනි පිළිවෙත් අනුගමනය කරන ලදි.
- විසිරී ජීවත් වූ ජුදයින් අතරත් මෙවැනි ධර්මශාලා ගොඩනගා තිබුණි.

**නිර්මාණය**

- මෙය සෘජුකෝණාශ්‍රාකාර හැඩයෙන් යුතු ය. ජෙරුසලම් දේවස්ථානයට මුහුණලා මේවා ගොඩනගා තිබුණි.
- ධර්මශාලාව ඇතුළත ''ශුද්ධස්ථානය'' ලෙස හැඳින්වෙන කොටසේ ශුද්ධ වාක්‍ය ලියැවී ඇති ග්‍රන්ථ තබා එය තිරයකින් වසා තිබුණි.
- මෙය සමීපයෙන් වේදිකාවක් තනා තිබුණි. එහි සිට දේව වාක්‍ය කියවන ලදි.
- ශුද්ධ ග්‍රන්ථ තබා ඇති ස්ථානය සමීපයෙන් ධනවතුන්ට වාඩිවීමට පහසුකම් සලසා තිබුණි.
- ධර්මශාලාවල පුදසුන් නොතිබුණි. නමුත් අතු පහක් සහිත ඉටි පහන් රුකක් තිබුණි.
- ධර්මශාලාවලට ඇතුළුවීමට පෙර අත් පා පිරිසිදු කිරීමට දොරකඩ ජල බඳුන් තබා තිබුණි.

**සේවය හා ප්‍රයෝජන**

- ධර්මශාලාවල යැදුම් මෙහෙයන් පැවැත්වූ අතරම මේවා දහම් පාසල් ලෙස ද, නඩු විසඳන මන්ත්‍රණ සභා ලෙස ද භාවිත කරන ලදි.
- ජනතාවට ඔවදන් දීමට ධර්මශාලා අධිපතිවරු දක්ෂ දේශනාවාදීන් ගෙන්වා ධර්ම දේශනා පැවැත්වූහ.
- දේවස්ථානයේ වස්තූන් රැකබලා ගන්නා ලදි.
- ධර්මශාලාවල ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ බව සුවිශේෂවල සඳහන් වේ.
  (ලූක් 4/16-17 මාර්ක්12/28 මතෙව් 12/38)
- ශුද්ධ වූ පාවුළුතුමා ද තම චාරිකාවල දී ධර්මශාලාවල සුභාරංචිය දේශනා කළේ ය.
  (ක්‍රියා 13/15)
- ධර්මශාලාවල එදා පැවති පිළිවෙත්, අද ශුද්ධ වූ සභාවේ විධිමත් පිළිවෙත් හා සමවන බව කියැවේ.
- ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී 300-400 දක්වා ධර්මශාලා තිබුණු බව දැන ගන්නට ලැබී ඇත.

### 3.3.1.3 ජුදා මන්ත්‍රණ සභාව

- මෙය ජුදයින්ගේ ශ්‍රේෂ්ඨාධිකරණය බව කියැවේ.
- මෙය සෙන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාව, ''මන්ත්‍රණ සභාව'', ''ශ්‍රේෂ්ඨාධිකරණය'' යන විවිධ නම්වලින් හඳුන්වනු ලබයි.

**බිහිවීම**

- මෙහි ආරම්භය ගැන තොරතුරු දැන ගැනීමට නැතත් මෝසස් තුමාගේ කාලයේ දී පටන් මෙවන් සභාවක් පැවති බව කියැවේ.
- ක්‍රි.ව. 400 දක්වා මෙය ක්‍රියාකාරීව තිබූ බව දැන ගැනීමට ලැබී ඇත.
- පලස්තීනය රෝම අධිරාජ්‍යයට යටත්ව පැවති කාලයේ දී, ජුදා මන්ත්‍රණ සභාව ගෞරවණීය තත්ත්වයකින් පැවති බව ද පැහැදිලි ය.

**සැකැස්ම**

- මෙහි 71 දෙනෙකු සාමාජිකත්වය දැරූහ. මොවුහු තත්ත්වයන් තුනකින් සමන්විතවූවන්
    - අ. නායක පූජකයන් හා ඔවුන්ගේ පවුලේ අය (සදූසිවරු)
    - ආ. ප්‍රධානීන්, ප්‍රජා මූලිකයන්, ප්‍රභුවරුන්ගේ නායකයන්, විනයධරයන් (මොවුන් ද සදූසිවරු වෙති)
    - ඇ. පරිසිවරු
- මේ මන්ත්‍රණ සභාවේ හේවායන් ද සිටිය හ.

**වැදගත්කම**

- ජුදෙව්වන්ගේ ආගමික පිළිවෙත්වල ශුද්ධභාවයත්, නීතියත්, නිවැරදිව පිළිපැදිය යුතු බව අවධාරණය කිරීම මෙහි අරමුණයි.
- මේ මන්ත්‍රණ සභාවට, ජෙරුසලම් දේව මාළිගයෙහි මෙහෙයන් පරීක්ෂා කිරීමටත්, දේව මාළිගාවට ලැබෙන ආදායම නිසිලෙස පරිහරණය කිරීමටත් අධිකාරී බලය තිබුණි.
- වැරදි විමසා බලා තීන්දු දීමේ අධිකාරීබලයත් තිබුණි.
- කස පහරදීම, දඩ මුදල් නියම කිරීම, ගල්ගසා මැරීම, දේව මාළිගාවෙන් නෙරපීම ආදී දඬුවම් මොවුහු නියම කළ හ.
- මරණ දණ්ඩනය නියම කිරීමට බලය මොවුන්ට තිබුණත් එය අනුමත කර ක්‍රියා කරවීමේ බලය තිබුණේ රෝම අධිරාජයාටය.
- මේ මන්ත්‍රණ සභාව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ නීතිරීති ''මිස්නා'' ග්‍රන්ථයේ සඳහන් ව ඇත.

ඒවා නම්,

i මේ මන්ත්‍රණ සභාව, දේව මාළිගාවේ ඒ සඳහාම තනා ඇති මණ්ඩපයේ රැස්විය යුතුයි.

i මංගල්‍ය කාලයන් හැර සාමාන්‍ය දිනවල දිවා කාලයේ දී මන්ත්‍රණ සභාව රැස්විය යුතුයි.

iii ජුදෙව්වෙක් තම දහමට විරුද්ධව වැරදි කළහොත් ඔහුට නඩු තීන්දුවක් දීමට මෙය රැස්විය යුතුයි.

iv. වැරදිකරුවකු වෙනුවෙන් සාක්ෂි දෙකක් වෙන වෙනම විමසිය යුතුයි.
v. වැරදිකරුවකු පවසන කරුණු අනුව තීන්දුව දිය නොහැක.
vi. සාක්ෂි දෙකම එක ලෙස තිබුණහොත් පමණක් දඬුවම් දිය හැක.
vii. වැරදිකරුවකු නිදොස් යයි තීන්දු වුවහොත් එදිනම ඔහු නිදහස් කළ යුතුයි.
viii. මරණීය දඬුවම නියම වී දින දෙකකට පසුව එය ක්‍රියාත්මක කළ යුතුයි.

- මේ මන්ත්‍රණ සභාවේ බලය ජුදයින්ට පමණක් වලංගු වේ.
- මෙවැනි මන්ත්‍රණ සභා, විසිරී ජීවත් වූ ජුදයින් අතරත් තිබුණි.

### 3.3.2 ජුදා ආගමික ජනකොටස්

- ජුදයින්ට තම ආගම වැදගත් වූවාක් මෙන්ම ජුදා ආගමික ජන කොටස් ද වැදගත් විය.
- මෙම ආගමික ජන කොටස්, ආගමික ව්‍යවස්ථා, රජයට පක්ෂපාතී හා සාමූහික සම්මිශ්‍රණය ආදි කරුණු මත බිහිවිය
- එනම් සදූසිවරු, පරිසිවරු, විනයධරයන්, එසීනවරු හා අන්තවාදීන් ආදීන් ය.
- මොවුන් ජුදා ජාතීන්ගෙන් වෙනස් වූ කොටස් ලෙස හැඳින්විය හැක.
- මේ ජනකොටස් සියල්ලම තමන් පමණක් ජුදා සම්ප්‍රදායන් ශුද්ධවත්ව පිළිපදින අය ලෙස සිතූහ.
- මේ නිසා මේ කොටස් අතර මතභේද හා විවාද පැවතුනි.
- මොවුන්ගේ ආරම්භය, ප්‍රතිපත්ති පිළිබඳ ව සොයා බැලීමේ දී විවිධ වෙනස්ම් දැකිය හැක.

#### (අ) සදූසිවරු

- මොවුන්ගේ ආරම්භය පිළිබඳ ව විස්තර පැහැදිලිව දැනගත නොහැකි වුවත් දාවිත් රජ, සලමොන් රජවරුන්ගේ කාලයේ දී පූජක මෙහෙවර කළ ''සාදොක්'' නමැත්තාගේ පරපුරෙන් පැවත එන බව කියැවේ.
- දේශපාලන වාසි තකා පාලකයන් හා එක්ව කටයුතු කළ හ.
- මේ නිසා ධනවත්, කුලවන්ත උසස් පුරවැසියන් ලෙස ද, ඉඩම්හිමියන් ලෙස ද, නායක පූජකයන් ලෙස ද සිටිය හ.
- ආගමික ප්‍රතිපත්ති අනුව ශුද්ධ බයිබලයේ ''පංච පුස්තකය'' පමණක් පිළිගත් හ.
- මරණයෙන් පසු නැවත උත්ථානය, අවසාන තීන්දුව, මෙසියස්තුමාගේ පැමිණීම, ආත්මයේ අමරණීය බව, දේවදූතයන් ආදී සත්‍යතාවන් පිළිගැනීමට මැළිවූහ.
- ටෝරා හි දඬුවම් පිළිබඳ නීතිරීති ඉතා තදින් ක්‍රියාත්මක කළ හ.
- ග්‍රීක රෝම සම්ප්‍රදායන්ට ගරු කළ අතර සාඩම්බර ජීවිත ගත කළ හ.
- ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් ලෙස ක්‍රියා කළ හ.
- මොවුන්ගේ අහංකාර ගතිපැවතුම් නිසා ජනතාවගේ ගෞරවයට පාත්‍ර නොවූහ
- තමන්ගේ ලෞකික සුඛවිහරණය ( සැප සම්පත්) අහිමිවේ යන බියෙන් ක්‍රිස්තුස් වහන්සේව මරණීය දණ්ඩනයට නියම කිරීමට ප්‍රමුඛව කටයුතු කළ හ.

(ආ) පරිසිවරු

- පරිසිවරු යන වදන (PERUSIM) පෙරුසිම් යන හීබෲ වදනින් ආවකි.
- මෙහි ''අරුත වෙන් වී සිටින අය හෝ තනි වී සිටින අය'' හෝ යන්නයි.
- මොවුන් ජුදා දහමට පටහැනි වූ , පිටරට සම්ප්‍රදායන්, අන්‍යාගමික සම්ප්‍රදායන් නීතිරීති, සැමකින් ම ඈත්ව වෙන් වී ජීවත් වූහ.
- ජුදයින් කෙරෙහි වෙනත් රජවරුන්ගේ රාජ්‍ය පාලනයට විරුද්ධව නැගීසිටි අතර, ''දෙවියන් වහන්සේ එකම රජුය'' යන ප්‍රතිපත්තිය දැරූහ.
- මොවුන්ගේ ආගමික සම්ප්‍රදායන් මෝසස්තුමාගේ ව්‍යවස්ථාව මත සකස් වූවකි. එම නිසා මොවුන් ''ව්‍යවස්ථාවේ ජනයා'' ලෙස හඳුන්වන ලදි.
- ශුද්ධ බයිබලයේ පංච පුස්තකයත් (ටෝරා) එහි අර්ථයනුත්, සම්ප්‍රදායනුත් නිල වශයෙන් පිළිගත් හ.
- සබත් දින, චාරිත්‍රවල පවිත්‍ර බව, දේවස්ථානයේ පඬුරු ආදී ව්‍යවස්ථාවන්ට මුල්තැනක් දුන් හ.
- තව ද ව්‍යවස්ථාව සිය ගණන් උප ව්‍යවස්ථාවන්ට බෙදා ඒවා විස්තර සහිත ව පැහැදිලි කර ලියූහ.
- ආත්මයේ අමරණීය බව, මරණින් පසු තීන්දුව, උත්ථානය, දේවදූතයන් ආදිය පිළිගෙන විශ්වාස කළ හ.
- දේව රාජ්‍යයේ උදාවද, මෙසියස්තුමන්ගේ පැමිණීම ද බලාපොරොත්තුවෙන් සිටිය හ.
- ජනතාව අතර ප්‍රශංසාවත් ගෞරවයත් ලැබූහ.
- මොවුන් ද ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකත්වය ලබා සිටිය හ.
- ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට මොවුන් ද හේතුකාරයන් වූහ.

(ඇ) විනයධරයන්

- ඉශ්රායෙල්වරු බැබිලෝනියාවේ විප්‍රවාසව සිටි කාලයේ ''ව්‍යවස්ථාව'' ඔවුන්ගේ ආගමික ජීවිතයේ මුල්තැනක් ගත්තේ ය.
- නැවත පැමිණි විට ක්‍රි.පූ. 526 දී දේව මාළිගාව ප්‍රතිසංස්කරණය කරන තුරු ''ව්‍යවස්ථාව '' ඔවුන්ගේ ආගමික වතාවත්වලට ඉවහල් විය.
- ව්‍යවස්ථාව කියවා එහි අර්ථය පැහැදිලි කිරීම අවශ්‍ය වී තිබුණි.
- මේ පසුබිම තුළින් බිහිවූ අය විනයධරයන් වූහ.
- මොවුන් ලෙවී වංශයෙන් මෙන් ම අනිකුත් වංශවලින් ද බිහිවූහ.
- මොවුන්ගේ ප්‍රථමයා ලෙස ''එස්රා'' හඳුන්වනු ලැබේ
- ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ග්‍රීක සම්ප්‍රදායන්ට නැඹුරු වී, ව්‍යවස්ථාව කෙරෙහි උනන්දුව අඩුවූ අයට තරවටු කර, ව්‍යවස්ථාව කෙරෙහි උනනදුවක් ඇති කිරීමට විනයධරයන් උත්සාහ දැරූහ.
- ජුදා පාරම්පරික ග්‍රන්ථ සීමා කළහ.
- ජුදා ආගමික සාහිත්‍ය ග්‍රන්ථ එක්රැස් කර ඒවා පිටපත් කර, ඒවා වෙනස් නොකර ආරක්ෂා කිරීමෙහිලා කැප වී ක්‍රියා කළ හ.

- මොවුන් ආගමික දැනුම ලබාදුන් අතර ම, සමාජයේ ගැටළු විසඳූහ.
- ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ඔවුන්ගේ වැඩිහිටියන් පාරම්පරික ව දී තිබූ ආගමික අර්ථකථනයන් වෙනස් නොකර එලෙසම පැවසූහ.
- මේ නිසාම ක්‍රිස්තුස් වහන්සේ ව ප්‍රතික්ෂේප කිරිමට මුල් වූහ.
- ක්‍රිස්තුස් වහන්සේගෙන් ප්‍රශ්න අසා උන්වහන්සේගේ දැනුම පරීක්ෂා කළ හ. (මතෙව් 12/38-41) (මතෙව් 15/1-12) (මාර්ක් 12/28-34, 11/8) (ලූක් 5/17-25, 10/25-37)
- ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට මොවුහු ද හේතු කාරකයන් වූහ.

**(ඈ) එසීනවරු**

- එසීනවරු, ජුදා මකබි ගැටුම් කාලයේ දී (ක්‍රි.පූ. 200) වර්ධනය වූ ජුදා මතධාරීන් ය.
- මොවුන්ගේ ජීවිත සටහන් කුම්රාන් පුරාවිද්‍යා කැනීම්වල දී හමුවිය.
- බැබිලෝනීය විප්‍රවාස ජීවිත කාලය, ජුදයින්ට ලැබුණු දේව දඬුවමක් යයි සිතා, නැවත මෙවන් මහා විනාශයක් නොවීමට, තම ජීවිතයේ ශුද්ධවත් බව රකිමින්, ජීවත් විය යුතු බව අදිටන් කරගෙන ජීවත් වූහ.
- ක්‍රි.ව. 01 දී පමණ මළ මුහුදට බටහිර දෙසින් ඇති පාළුකරයේ ''එන්ගෙඩි'' නම් ප්‍රදේශය තම මූලස්ථානය කරගෙන ක්‍රියා කළහ.
- මොවුන්ගේ ජීවිත රටාව සාමූහික ජීවන ක්‍රමයක් ලෙස සකස් වී තිබුණි.
- නිතරම තම නායකයාට කීකරුව, ඔහුගේ උපදෙස් අනුව ජීවත් වූහ.
- මොවුහු තමන් සතු වස්තූන් පොදුවේ තබා ගත්හ.
- අලුයම නැගිට යාච්ඤා කිරීමත්, දහවල් වනතුරු කුඹුරු වැඩවල නිරත වූ පසු, නා පිරිසිදු වී කුසගිනි නිවෙන ප්‍රමාණයට ආහාර ගත් හ.
- සවස් වනතුරු නැවත වැඩකර රාත්‍රී ආහාරය ගත් හ.
- නිශ්ශබ්දතාවය රැකීම මොවුන්ගේ ප්‍රධාන අංගයක් විය.
- මොවුන්ගේ ආගමික ප්‍රතිපත්ති අනුව, ආත්මය යනු සිරුර තුළ සිරකර ඇති දෙයක් ලෙසත්, මරණයෙන් පසු එම සිරකර තැබීමෙන්, ආත්මය නිදහස් වන බවත් සිතුහ.
- මනුෂ්‍යයාගේ දඬුවම හෝ මිදීම හෝ දෙවියන් සතු බව මොවුහු විශ්වාස කළහ.
- ''මනුෂ්‍යයාගේ සෑම ක්‍රියාවක් ම දෙවියන් වහන්සේ කලින් සැලසුම් කළ පරිදි සිදුවන බව'' දේශනා කළ හ.
- ජේසුස් වහන්සේගේ ගෝලයන්ගෙන් ජාකොබ් සහ ජුවාම් එසීනවරුන් විය හැකි බව කියැවේ.
- ක්‍රි.ව. 68 දී 10 වන රෝම හමුදාව ජෙරිකෝව අත්කර ගැනීමට සටන් කිරීමේ දී එසීනවරුන්ගේ නගරය සම්පූර්ණයෙන් ම විනාශ විය.
- පසුකාලයේ දී බිහිවූ පැවිදි ජීවිත රටාවට මොවුන් අත්තිවාරමක් වූ බව කියැවේ.

### (ඇ) අන්ත ජාතිවාදීන්

- ජේසුස් වහන්සේගේ කාලයේ දී තිබූ දේශපාලන කණ්ඩායම්වලින් එකක් ලෙස මොවුන් සැළකේ.
- ක්‍රි.ව. 6 දී ගලීලයකු වූ ජුදා නමැත්තා රෝම ආධිපත්‍ය තුරන් කිරීමේ අදහසින් මේ කණ්ඩායම තනා ගත්.ෙත් ය.
- ක්‍රි.ව. 6 දී ජුදයාව පාලනය කළ හෙරෝද් ආර්කිලාව, රෝම අධිරාජ්‍යයා නෙරපා, තම ආණ්ඩුකාරවරුන් මගින් ඍජුව පාලනය කිරීමට පෙළඹීම ගැන විරුද්ධ ව අන්තජාතිවාදීන් කටයුතු කළ හ.
- මේ අන්ත ජාතිවාදීන් මෙසියස්තුමාගේ පැමිණීම බලාපොරොත්තු නොවී තමන් ම විමුක්තිය ලබා ගැනීමේ අරමුණින් ක්‍රියා කළ හ.
- රෝමවරු ජුදයින් මත අධික බදු බර පැටවීම ගැන විරුද්ධ ව කැරලි ගැසූහ.
- රෝම අධිරාජ්‍යයට විරුද්ධ ව කෙළින්ම සටන් කළ නොහැකි නිසා කඳු ප්‍රදේශවල සැඟවී සිට රෝම හමුදාවට පහර දුන් හ.
- ජනතාවගෙන් රෝමවරු එකතු කළ බදු මුදල් මොවුන් කොල්ලකෑමට පෙළඹුණු නිසා මොවුන්ව කොල්ලකරුවන් හා සොරුන් ලෙස හඳුන්වන ලදි.
- ජුදෙව්වරු මොවුන්ව ''මෙසියා කණ්ඩායම'' යයි හැඳින්වූහ.
- ක්‍රි.ව. 70 දී ඇති වූ ජුදා රෝම යුද්ධයේ දී මොවුන්ගේ පහරදීම් දරුණු ලෙස සිදුවූ අතර මසාදා යන ස්ථානය තම පාලනය යටතේ දිගුකල් තබා ගන්න.
- සුභාරංචිවල සඳහන් වන පරිදි ජේසුස් වහන්සේගේ ගෝලයන් වන අන්තවාදී වන සීමොන්, ජුදාස් ඉස්කාරියොත් හා මංකොල්ලකරුවකු වන බරබාස් ද මේ කණ්ඩායමේ අය බව කියැවේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ජේසුස් වහන්සේගේ කාලයේ දී දැකිය හැකි ආගමික සිද්ධස්ථානත්, ඒවායේ ආරම්භය, සේවය පසුබිම පිළිබඳ විස්තර ගොනු කරයි.
2. තම මීසමේ ඇති ආගමික, සමාජ සංවිධානවල ආරම්භය සැකැස්ම හා සේවය පිළිබඳ ස්ව නිර්මාණයක් පැවරුමක් ලෙස ඉදිරිපත් කරයි.
3. ජේසුස් වහන්සේගේ කාලයේ දී ජුදා සමාජයේ දැකිය හැකි ජුදා ආගමික ජන කොටස්වල ආරම්භයත් ඒවාට ආවේණික සම්ප්‍රදායයන් පිළිබඳ විස්තරත් ඉදිරිපත් කරයි.

**නිපුණතාව 3.0** : ජේසුස් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

**නිපුණතා මට්ටම 3.4** : මුල් සියවසේ ජුදා සංස්කෘතික සම්ප්‍රදායයන් දැනගෙන තම සංස්කෘතික සම්ප්‍රදායයන් අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා සංස්කෘතිය හා ආගමික සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු රැස් කරයි.
- ජුදා ආගමික හා සාමාජීය සිරිත්විරිත් ක්‍රිස්තුන් වහන්සේ පිළිපැද්ද බව පිළිගනියි.
- ජුදා ආගමික උත්සව පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව කැමැත්තට අනුව ක්‍රියාකිරීමට පුරුදු පුහුණු වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය :**

**3.4.1 පලස්තීනයේ ජුදා සංස්කෘතික සම්ප්‍රදායන්**

- ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිපත්ති, දේශනා, ජීවිත පිළිවෙත් පිළිගෙන ඒවා ජීවිතය කර ගැනීමට උත්සාහ දැරීම, ක්‍රිස්තියානි සංස්කෘතිය වේ.
- එනමුත් ජේසුස් වහන්සේගේ උපත, වැඩීම, ජීවිතය, සේවය ආදිය පලස්තීන ජුදා සංස්කෘතික සම්ප්‍රදායන්ට අදාළ වේ.
- මේ සංස්කෘතිය විවිධ, විශේෂයෙන් සෙවතිය (සුමේරිය) කානානීය, ඊජිප්තු, බැබිලෝනිය, ග්‍රීක, රෝම සංස්කෘතීන්වල සමහර අංගවලින් සමන්විත ය. එනමුත් විශේෂිත අනන්‍යතාවයකින් ද යුක්ත විය.
- ආබ්‍රහම්ගේ පරපුරෙන් පැවත ආ එඬේරුන් ලෙස කටයුතු කළ අය පසුකාලයේ දී ගොවිතැන් කටයුතුවලත්, විවිධ රැකියාවලත් නිරත වී දියුණු වූහ.
- මොවුන් සෙමතිය බස වන හීබෲ බස කතා කළ බැවින් හීබෲවරු යනුවෙන් ද අමතනු ලැබූහ. හීබෲ යන්නට ''ගඟ තරණය කළ'' යනුවෙන් ද අරුතක් ඇත.
- මොවුන්ගේ සංස්කෘතික සම්ප්‍රදායන් ගැඹුරින් විමසා බැලීමේ දී සමහර විශිෂ්ටාංග දැකිය හැක.

**3.4.1.1 ජුදා භාෂාව**

- ජුදයින්ගේ ප්‍රධාන බස හීබෲ ය. මෙය සෙමතිය භාෂාවන්ගෙන් එකකි.
- ඉශ්‍රායෙල් පරපුර ඉජිප්තුවේ වාසය කළ කාලයේ දී මොවුන් හීබෲ බසින් කතා කළ බැවින් ඔවුන් ''හීබෲවරුන්'' යයි හඳුන්වනු ලැබූහ.
- ජුදයින්ගේ ආගමික ග්‍රන්ථ හීබෲ බසින් ලියැවී ඇත.
- ජේසුගේ කාලයේ දී ධර්මශාලාවල දී කියවන ලද කියවීම් හීබෲ බසින් කියන ලදි.
- එදිනෙදා ජීවිතයේ දී ජුදයින් කතා කළේ අරමීය බසිනි.

- මෙය  බැබිලෝනීය විප්‍රවාසයෙන් පසු භාවිතයට ආවකි.
- ක්‍රි.පූ. 8 සියවසේ දී ජුදා සමාජයේ අරමීය බස, උසස් කුලවන්ත අය පමණක් කතා කළ අතර සාමාන්‍ය ජනතාව හීබෲ බස කතා කළ හ.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී සාමාන්‍ය ජනතාව අරමීය බසත්, උසස් කුලවන්ත අය හීබෲ බසත් කතා කළහ.
- පලස්තීනය, ග්‍රීක, රෝම අධිරාජ්‍යයේ පාලනයට යටත් වූ නිසා ග්‍රීක ලතින් ආදී බස ද භාවිතයේ තිබුණි.
- එනමුත් ජුදයින්ගේ ලේඛන බස හීබෲ ද කතා කරන බස අරමීය ද  රාජ්‍ය  භාෂාව ලෙස ග්‍රීක හා ලතින් බස ද භාවිතයේ තිබුණි.

### 3.4.1.2 සාමාජීය සම්ප්‍රදායයන්

- හැම සමාජයක් ම එයට ආවේණික වූ පාරම්පරික සිරිත් විරිත්වලින් ද සමාජ සාරධර්මවලින් ද යුක්ත ය.
- ජුදා සමාජය ද තමන්ටම ආවේණික වූ සම්ප්‍රදායන්ගෙන් යුක්ත විය.
- මේවා ඔවුන් ජිවත් වූ ප්‍රදේශවලින් ලබාගත් ඒවා ය.
- එනමුත් කාලයාගේ ඇවෑමෙන් ජුදයින්ට ආවේණික වූ ඒවා බවට පත් විය.
- මේ සම්ප්‍රදායන් ක්‍රිස්තුස් වහන්සේ ද පිළිපැද්ද නමුත් සමහරෙක් සම්ප්‍රදායන්ට නව දෘෂ්ටියකින් විශිෂ්ට අර්ථකථනයක් දුන් බව දැකිය හැක.

### (අ) පවුල

- ජුදා පවුලේ නායකයා වූයේ ''ගෘහ මූලිකය'' යි.
- පවුලේ සම්පූර්ණ බලය හිමිවූයේ පියාට ය.
- විවාහවුවත් දරුවන් තම පියාට කීකරු වූහ.
- පවුලේ සිදුවන සියලු කටයුතු වලදීත් උත්සව වලදීත් පියා මූලිකත්වය ගනියි.
- ජුදා පවුලේ දරුවන් බිහිවීම ආශිර්වාදයක් ලෙස සැලකූහ.
- කුළුදුල් දරුවා පිරිමි දරුවකු වීමට කැමති වූහ.
- දරුවා බිහිවූවිට සෝදා ලුණුවලින් පිසදමනු ලැබේ.
- නිවුන් දරුවන් බිහිවුවහොත් පළමුව බිහිවූයේ කොයි දරුවාදැයි සුපරීක්ෂාකාරීව බලා ලකුණක් දමති.
- දරුවන්ට මව්කිරිදීම ජුදා මවුවරුන්ගේ අනිවාර්ය යුතුකමක් විය.
- දරුවා බිහිවී අටවන දිනයේ දී හෝ දින 40 ඇතුළත හෝ දේවස්ථානයට ගෙන ගොස් චර්මඡේදනය කළ යුතු බව අනිවාර්ය කරන ලදි.
- දරුවාට නම් තැබීම පියාගේ වගකීම විය.

## (ආ) විවාහය

- ජුදා පුරුෂයකුට හා ස්ත්‍රියකට විවාහ ජීවිතය උසස් අරමුණක් විය.
- මේ නිසා පුරුෂයකු අවු 13 දීද ස්ත්‍රියක අවු. 12 දීද විවාහ වීමට අවසර ලැබුණි.
- දෙමාපියෝ තම දරුවන්ට මනාලයන් හා මනාලියන් තෝරා විවාහ කරදෙති.
- විවාහවීමට සිටින පුරුෂයා ද ස්ත්‍රිය ද නැතහොත් දෙදෙනාගේ දෙමාපියන් කැමැත්ත ප්‍රකාශ කර ගිවිසුමක් ඇතිකර ගත් හ. මෙය ''කෙටුපා'' යනුවෙන් හැඳින්වේ.
- විවාහ ගිවිසගෙන වසරකට පසුව විවාහය සිදුවේ.
- මනමාලියව හැඩගන්වා, මනාලයාගේ ගෙදර කැඳවාගෙන විත් එහිදී විවාහ ගිවිසුම් වදන් පවසා විවාහය සිදුවේ . මෙහිදී මනාලයා, ''අද පටන් මැය මගේ බිරිඳයි. මම ඇයගේ ස්වාමිපුරුෂයා''යනුවෙන් පවසයි. මනාලිය කිසිවක් පවසන්නේ නැත.
- මෙය ''ආරාල්'' යනුවෙන් හැඳින්වේ.
- මනාලයා තම විවාහ වන මනාලිය වෙනුවෙන් මනාලියගේ පියාට මුදල් හෝ භාණ්ඩ හෝ නැතහොත් ඔවුන් වෙනුවෙන් සේවය කිරීම හෝ ආධාර දීම හෝ කළ යුතුයි. මෙය ''මෝකර්'' යනුවෙන් හැඳින්වේ.
- විවාහ මංගල්‍යයට කැඳවනු ලබන අයට සංග්‍රහත්, විවාහ ඇඳුම් ද දෙන ලදී.
- විවාහයෙන් පසුව වෙනම ම ජීවත් වූහ.
- විවාහ වූ බිරිඳගේ හැසිරීමෙහි වැරදි දුටුවහොත් ස්වාමි පුරුෂයාට ඇයව දික්කසාද කිරීමේ බලය ලැබී තිබුණි. නමුත් ස්ත්‍රියට එසේ කිරීමට හැකියාවක් නැත.

## (ඉ) භෝජන සංග්‍රහ

- ජුදයින් සමාජය සමග සම්බන්ධතා ඇති කර ගැනීමේ උනන්දුවක් දැක්වූහ.
- මේ වෙනුවෙන් නිතර නිතර භෝජන සංග්‍රහ පවත්වා සතුටු වූහ.
- බොහෝදුරට මෙය ධනවත් නිවෙස්වල නිතර නිතර පැවැත්විණි.
- ආරාධිතයින්ව නිවසේ ගෘහමූලිකයා වැළඳගෙන, සිපගෙන, පිළිගෙන තම සේවකයන් ලවා ඔවුන්ගේ පාද සෝදා සුවඳ තෛලයෙන් ආලේප කරයි.
- භෝජන සංග්‍රහයේ දී මිදි යුෂ වීදුරු බඳුන්වල වතුර මිශ්‍ර නොකර පිළිගැන්වේ.
- තිරිඟු හා යව රොටි ද, එළු, ගව, කුකුල් මස් වර්ග ව්‍යාප්ත ලෙස ද ඇත.
- දිළිඳුන්ගේ භෝජන සංග්‍රහවල (රොටි, ඔලිව්තෙල්, ධාන්‍ය හා කිරි වර්ග, පලතුරු ආදිය පිළිගැන්වේ.
- කෑමට පෙර, දෙවියන්ට ස්තුති කර යාච්ඤා කළ පසුව අනුභව කරනු ලැබේ.
- ධනවතුන් මේසයේ හාන්සිවී වාඩිවී අනුභව කරති.
- දිළිඳුන් පොළොවේ වාඩිවී අනුභව කරති.
- කිරි ආහාරත්. මාංශ ආහාරත් එකවර පිළිගන්වනු නොලැබේ.

(ඊ) අධ්‍යාපන ක්‍රම

- ජුදා සමාජයේ දරුවන්ගේ මූලික අධ්‍යාපනය මවට භාර වේ.
- ළමා වියේ දී ආගමික පිළිවෙත් ද, සමාජයේ හැසිරීම් රටාවන් ද මවගෙන් ඉගෙන ගත යුතු ය.
- ජුදා දරුවෙක් වයස අවුරුදු 6 දී පියාගේ භාරකාරත්වය යටතේ අධ්‍යාපනය හැදෑරිය යුතුය.
- ධර්මශාලාවල ඇති දහම්පාසල්වල ආගම, නීතිරීති, කටපාඩම් කර ඉගෙන ගත යුතුයි.
- එදිනෙදා යාච්ඤා (ක්ෂේමා) ස්තුති ප්‍රශංසාමය, යාච්ඤා, නීති සංග්‍රහය, ප්‍රඥා සාහිත්‍ය ඉගැන්වීම පියවරුන් සතුයි.
- තව ද ජුදා නීතිරීති, පිළිවෙත්වල පසුබිම, දැනගත යුතු යයි බලාපොරොත්තු වූහ.
- වාචික ඉගැන්වීම් මගින් ඔවුන් ඉගෙන ගත්හ.
- කටපාඩම් කිරීමේ දී ශබ්දනගා මේවා කියවා මතක තබා ගත් හ.
- සමහර දරුවන්ට පියවරු තමන් කරගෙන ආ රැකියා සම්බන්ධ අධ්‍යාපනයක් දුන් හ.
- තව ද ඉතිහාසය භූගෝලය, ව්‍යාකරණ ආදිය බයිබල් පසුබිම තුළින් ඉගෙන ගැනීමට සමහරු උත්සාහ කළ හ.

(උ) වාසස්ථාන

- ජුදෙව්වන්ගේ නිවෙස්වල ගෘහනිර්මාණ කලාවක් නැත.
- මෙය ඔවුන්ගේ විවේක ස්ථානයක් ලෙස පිළිගැනේ.
- මැටිවලින් තනන ලද බිත්තිය මත සැහැල්ලු පැළක් තනා කුඩා ගස් අතු ඒ මත විසුරුවා එය මත තදට මඩ තවරනු ලැබේ.
- ධනවතුන්ගේ නිවාස පිළිස්සූ ගලින් සාදා ඇත.
- නිවසට එළියදීමට පහන් රඳවා තැබීමට පහන් කණු ද තනා ඇත. සමහරු පහන් දල්වා පහන් රුක මත තබති.
- ධනවතුනගේ නිවෙස්වල පිත්තලවලින් සෑදූ පහන් කණු ඇත.
- සාමාන්‍යයෙන් නිවෙස්වල සියලු කටයුතු එක් පැත්තක පමණක් සිදු කෙරේ. තව ද නිවසට එක් දොරක් පමණක් තනනු ලැබේ.
- සමහරු තම බැටළුවන් ද නිවසේ එළිපත්තේ ගාල් කරති.
- සාමාන්‍යයෙන් නිවෙස් මහමාර්ගයට ආසන්නව ඇත. නිතරම එම වීදි ජනයාගෙන් පිරී පවති.

### 3.4.3 ජුදා ආගමික සම්ප්‍රදායන්

- ජේසුස් වහන්සේගේ කාලයේ දී පලස්තීනයේ ජුදයින්ගේ ආගමික විශ්වාසයත්, ජීවිත ක්‍රමයත්, දෙවියන් හා මනුෂ්‍යයා අතර සම්බන්ධතාවයක් ඇති කරන බව සිතුහ.
- එබැවින් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ දී පිළිපදින ආගමික පිළිවෙත්, උත්සව, යාච්ඤා මෙහෙයන් ආදිය ඊශ්‍රායෙල්වරුන්ගේ ආගමික බැතියට උදාහරණයකි.
- මේ ආගමික සම්ප්‍රදායයන්හි විවිධ රටවල ආගමික සංස්කෘතික ආභාෂයන් තිබුණත් ''එකම දෙවියන්''' යන මතයෙහි ස්ථිරව සිටිය හ. මොවුන්ගේ පිළිවෙත්වල ප්‍රධානතම අංගය බිලිපූජා කිරිමයි.
- තව ද යාච්ඤා ද, එක්වරු රැකීමේ ක්‍රමයන් ද, පවිත්‍රවීමේ පිළිවෙත් ද, භාරභාර, පඬුරු, සබත්දින පිළිවෙත් ආදිය කැපී පෙනුණි.

#### 3.4.3.1 යාග

- ජුදයින්ගේ පිළිවෙත්හි මුල්තැනක් ගන්නේ යාග ඔප්පු කීම යි.
  මෙය දවන පූජා සහභාගිකමේ පූජා, පාපපූජා, වන්දි ගෙවීමේ පූජා ධූමපූජා ආදිය වේ.
- මේ යාගපූජා දිනපතා ජෙරුසලම් දේව මාළිගාවේ පුදනු ලැබීය.

#### (අ) දවන පූජා

- මෙය ''ඉහළම නගින'' යන අදහස දෙයි. දවන පූජා යාගයේ දී පූජා කරනු ලබන පඬුරු, පක්ෂීන් හෝ සතුන් හෝ පිරිමි සතා විය යුතුයි.

#### (ආ) සහභාගිකමේ පූජා

- පඬුරු කොටස් තුනකට එනම් බෙදා, දෙවියන් වහන්සේට, පූජකයාට, පඬුරු ඔප්පු කරන්නාට යනුවෙන් කොටස් තුනකට බෙදනු ලැබේ. මෙයින් සතුන් පමණක් ඔප්පු කරනු ලැබේ. තව ද නුමුහුන් පූපද පඬුරු ලෙස පිදිය යුතුයි. (ලෙවී 3/6-17)

#### (ඇ) පාප පූජා

- මේ පූජාව ඔප්පු කරන තැනැත්තාගේ තත්ත්වය අනුව සිදුකෙරේ. මේ හැර ධාන්‍ය, මිදියුෂ,ධූප ආදිය පුදනු ලැබේ. (ලෙවී 4/1-35)
- මේ යාග මගින් මිනිසා පවිත්‍රවන බවත්, දෙවියන්ට මිනිසා දක්වන කැමැත්ත බවත්, භූමියත් මිනිසාත් දෙවියන්ට අයිති බවත්, දෙවියන්ට මිනිසා දක්වන ආදරයේ බාහිර ලකුණක් ලෙසත් සිතුහ.

- ජේසුස් වහන්සේගේ කාලයේත්, මේ යාග ඔප්පු කිරීමේ චාරිත්‍ර පැවතුණි.
  (මාර්ක් 10/45 - මතෙව් 5/23)
- ජේසුස් වහන්සේ තම දේශනයන්හි දී ''**තමන්ට මෙන් ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම, දවන යාගපූජා හා වෙනත් පූජා සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ**'' යයි කී සේක. මාර්ක් 12/34

**2. යාච්ඤා**

- ඉශ්රායෙල්වරුන්ගේ ආගමික මෙහෙයන්හි යාච්ඤාව වැදගත් තැනක් ගන්නේ ය. යාග ඔප්පු කිරීම ඔවුන් යාච්ඤාව ලෙස පිළිගත් හ.
- දෙවියන් වහන්සේ සමඟ කතා කළ යුතු වූ විට නගරය තුළ ඇති ධර්මශාලවේ යාච්ඤා කිරිමට නොහැකි වූවාට නින්දට යාමේ දී ඔබේ හදවත විවෘත කර දෙවියන්ට පෙන්වන්න කියා ''පූජකවරු'' දේශනා කළ හ.
- ජුදයින්ගේ එදිනෙදා යාච්ඤාව ''ක්ෂේමා'' යනුවෙන් හැඳින්විණි. ක්ෂේමා යනු ඉශ්රායෙල්වරුනී දෙවියන් වහන්සේට සවන් දෙන්න යන්න අරුත් ගැන්වේ.
- මෙය කොටස් 2 කින් යුක්තය. දිනකට තුන්වරක් යාච්ඤා කළහ.
- මේ හැර ''එමෝයේ එස්රේ'' යන ප්‍රශංසා යැදුම් 18කින් ද ජුදෙව්වන් යාච්ඤා කළහ.
- ජේසුගේ කාලෙයේ දී උදය දවල් සවස් කාලයේ යාච්ඤා කළහ.
- යාච්ඤා කරන විට ''තෙපිලින්'' යන දේවවචනය අඩංගු සමින් සාදන ලද පෙට්ටිය පැළඳ ගනිති. ''තාලිත්'' නමැති සළුවෙන් තමන් වෙලාගෙන දෙවියන්ගේ නගරය වන ජෙරුසලම දෙස බලා දණින් වැටී දෑත් ඔසවා මහ හඬින් යාච්ඤා කරති.
- පොදුවේ ජුදයින් දේව මාළිගාවේදී ද, ධර්මශාලාවලදී ද යාච්ඤා කළහ.

**නිරාහාරශීලය**

- ජුදා ආගමික සම්ප්‍රදායේ නිරාහාරශීලය රැකීම ශ්‍රේෂ්ඨ අංගයකි.
- පාපපූජා මංගල්‍යයේදී සෑම ජුදෙව්වකුම නිරහාරශීලය රකිති.
- සමහර ජුදෙව්වන් තම අවශ්‍යතා ඉටුවීම සඳහා භාරහාර වී නිරාහාරශීලය රකිති.
- නිරාහාරශීලය රකින විට හිසට තෙල් ගා, ඇගේ අළු තවරා, ගෝනි හෝ සනකම රෙදිවලින් හෝ මැසූ ඇඳුම ඇන්දේය.
- සමහරු සතියකටවරක් නිරාහාරශීලව සිටිති.
- ජේසුස් වහන්සේ දින හතළියක් පාළුකරයේ නිරාහාරව උපවාසයේ සිටි බව අපි සුවිශේෂයේ දකිමු.
- ජේසුස් වහන්සේ උපවාසය පිළිබඳ ව මතෙව් 6/16-18හි සඳහන් කරන සේක.

### දන්දීම

- ජුදා ආගමික සම්ප්‍රදායේ දන්දීම ද ශ්‍රේෂ්ඨ අංගයකි.
- ධනවතුන් තම ආදායමෙන් සුළු කොටසක දන් දුන්හ.
- තමන් දන්දීම පිළිබඳ ව ආඩම්බර වූහ. එමෙන් ම තමන් දන්දීම අන් අය දැකිය යුතු බව සිතූහ.
- දිළිඳුන් ද තමන්ට ලැබෙන ආදායමින් දන් දුන්හ.
- ජේසුස්වහන්සේ ''ඔබේ දකුණත කරන දෙය වමත නොදනීවා'' යනුවෙන් දන්දීම පිළිබඳ ව පැවසූ සේක. (මතෙව් 6/2-4)

### 3.4.1.4 චාරිත්‍ර පවිත්‍රවීම හා ඔප්පු කිරීම

- උපත විපත ලෙඩරෝග ඇතිවන අවස්ථාවල දී ඒවාට පිළියම් ලෙස ජුදයින් පවිත්‍රවීමේ චාරිත්‍ර ඉටු කළහ.
- ජුදෙව්වකු ඉපදී දින 08කින් හෝ 40 කින් චර්මඡේදන පිළිවෙත ඉටු කිරීමේ නීතියක් පැවතුණි.
- මෙහිදී දෙමාපියන් උපන් බිළිඳා දේවස්ථානයට ගෙන ගොස් පරවියන් දෙදෙනෙකු හෝ කොබෙයියන් දෙදෙනෙකු දෙවස්ථානයට පඬුරු ලෙස ඔප්පු කර චර්මඡේදන පිළිවෙත ඉටු කළහ.
- කෙනෙකු මියගිය විට එම මෘතදේහය සෝදා සුවඳ තෛලයෙන් ආලේප කර සුදු හණ රෙදිවලින් ඔතා භූමදාන කරති. (මාර්ක් 16/1 මතෙව් 27/59)
- අවමංගල්‍ය පිළිවෙතට සහභාගි වූ සියලු දෙනා කිළිටි නොවනු පිණිස තුන්වන හෝ හත්වන දින ස්නානය කිරීමේ සිරිත ඉටු කළහ.
- මියගිය කෙනා අහිමිව ශෝකවන අයට ඥාතීන්, හිතවතුවන් ආහාර පිස දී සනසති.
- කෙනෙකු කුෂ්ඨ හෝ ලාදුරු හෝ රෝගයෙන් පීඩිත ව සිටින විට ඔවුන්ව පූජකයන් සමාජයෙන් නෙරපා හුදකලාව විසීමට සැලසූහ.
- ඔවුහු සුව වූවිට නායක පූජකයන් ඉදිරියේ පෙනී සිට තමන් සුව වූ බවට ලිඛිත සහතිකයක් ගෙන යළි සමාජයට එක් වෙති.

### සබත් දින

- ජුදා ආගමික සම්ප්‍රදායේ සබත් දින චාරිත්‍ර පිළිපැදීම ප්‍රධාන තැනක් ගත්තේ ය.
- මෙදින '' සබත් '' ලෙස කියති. සබත් යන හීබෲ වදනට නිවාඩු නැවැත්වීම, අතහැරීම, අවසන් කිරීම යනුවෙන් ද අදහස් ඇත.
- සබත් දිනය ගිවිසුමේ සංකේතයක් ලෙස ජුදයින් තදින් ම විශ්වාස කළ නිසා එය ඉතා ඕනෑකමින් පිළිපැද්ද හ.
- සෑම සතියකම සිකුරාදා සවස තරු තුනක් අහසේ දිස් වූ විට රාත්‍රිය උදා වූ බව ඉගැන්වීමට අනුව ධර්මශාලාවේ තබා ඇති සබත්දින හොරණෑව පිඹිනු ලැබේ. මේ නාදයත් සමග සබත්දින උදාවේ.

- එදින ආහාර පිසීම ඇතුළු වර්ග 39 ක වැඩ කිරීම තහනම් කර තිබුණි.
- නිවෙස්වල මිනිසුන් පහන් දල්වා නිශ්ශබ්දව දෙවිඳුන්ට යාච්ඤා කළහ.
- ජේසුස් වහන්සේ සබත්දින මානව දයාවෙන් යුතුව සේවාවන් කර සබතට වඩා ප්‍රේමය උසස් බව පෙන්වූ සේක.

### 3.4.1.5 මංගල්‍යයන්

- ජුදා ආගමික සම්ප්‍රදායේ මංගල්‍යයන් ප්‍රධාන තැනක් ගත්තේ ය.
- ඔව්හු විවිධ මංගල්‍යයක් පවත්වා සතුටු වූහ.
- මෙවන් මංගල්‍යයන් සැමරීම මගින් දෙවියන්ටත් මිනිසාටත් ඇති සබඳතාව තහවුරු කර ගත්හ.
- මේ මංගල්‍යයන් හා සම්බන්ධ වන්දනා චාරිකා යනු ලැබීය
- මේ මංගල්‍යයන්හි දී ජෙරුසලම් නගරය පවිත්‍ර කර මනහර ලෙස අලංකාර කරනු ලැබීය.
- විවිධ ප්‍රදේශවලින් මේ මංගල්‍යයට පැමිණෙන වන්දනාකරුවන්ගේ විඩාව සංසිඳවන පිණිස බැති ගී ගයමින්, සංගිත භාණ්ඩ වාදනය කරමින්, දෙවියන්ට ප්‍රශංසා කරමින් ජෙරුසලමට පැමිණෙති. මෙවැනි මංගල්‍යයන්වල විස්තර දැන ගැනීම අවශ්‍ය වේ.

### ජුදෙව්වන්ගේ ප්‍රධාන මංගල්‍යයන්

1. පාස්කු මංගල්‍යය
2. පෙන්තකොස්ත මංගල්‍යය
3. කූඩාරම් මංගල්‍යය
4. නුමුහුන්පූප මංගල්‍යය
5. පාපපූජා මංගල්‍යය
6. දේව මාළිගාව කැප කිරීමේ මංගල්‍යය

### 1. පාස්කු මංගල්‍යය

- ජුදා මංගල්‍යයන්ගෙන් පාස්තු මංගල්‍යය ප්‍රධාන හා වැදගත් මංගල්‍යයකි.
- මෙය එතෙරවීම හා නුමුහුන් පූප මංගල්‍යය යනුවෙන් ද හඳුන්වති.
- මෙය ඉශ්රායෙල්වරුන් වහල් බවින් මිදීම ලැබීමට පෙර සිටම සැමරීමේ සිරිතක් තිබුණත්, විමුක්තිය ලැබීමෙන් පසු විශේෂවූත් ප්‍රධානවූත් මංගල්‍යයක් බවට පත් විය.
- ජුදෙව්වන් වසර 450ක් ඊජිප්තුවේ වහල් ව සිට වහල්බවින් නිදහස් වී ඉන් නික්ම ආ සිදුවීම සිහිකිරීමේ දිනයක් ලෙසත් තමන්ටත්, තම පරම්පරාවටත් දේව සංරක්ෂණය හඟවන දිනයක් ලෙසත් සළකා මේ මංගල්‍යය සැමරූහ.
- ජුදෙව්වන්ගේ පළමු මාසයවන ''නිසාන් මස'' (මාර්තු - අප්‍රියෙල්) 14 වන දින පාස්කු භෝජනය අනුභව කිරීම සිදුවීමත් සමඟ මෙම මංගල්‍යය ආරම්භ වේ.

- මෙය ජෙරුසලම් නගරය තුළ ම සැමරිය යුතු බවට නීතියක් විය.
- ජේසුස් වහන්සේ ද තම ගෝලයන් සමඟ මේ මංගල්‍යය සමරා ඇති බව සුවිශේෂයන්හි සඳහන් වේ. (ලූක් 2/41-43 මතෙව් 26/17-19 මාර්ක් 14/12-16 ජුවාම් 2/13-19)
- මෙම මංගල්‍යය ක්‍රිස්තුස් වහන්සේගේ දුක්විඳීම, උකුත් වීම, උත්ථානයෙන් පසු කිතුනුවන් විසින් ලෝකයාගේ ගැලවීම ලැබූ දිනය ලෙස සලකනු ලැබේ.

**2. පෙන්තකොස්ත මංගල්‍යය**

- ජුදයින් සමරන මංගල්‍යයවලින් දෙවනුවට උසස් ලෙස සැලකෙයි.
- මෙය සතිමංගල්‍යය, පනස්වන දින මංගල්‍යය, ප්‍රථම අස්වනු මංගල්‍යය යනුවෙන් හැඳින්වේ.
- පාස්කු මංගල්‍යයෙන් සති හතකට පසු දින (දින 50 කට පසු) සමරනු ලැබේ.
- ජුදෙව්වන් භූමියෙන් ගත් අස්වැන්නත්, තම කුළුදුල් බැටළුවන් ද පඬුරු ලෙස ඔප්පු කරන ස්තුති පූජාවක් ලෙස මේ මංගල්‍යය සිදු කෙරේ.
- වහල් බවින් මිදීමෙන් පසු සීනයි ගිවිසුම සිහිකරන මංගල්‍යයන් ලෙස ද සිදුකෙරේ.
- ලොව පුරා විසිරී ජීවත් වූ ජුදෙව්වන් මේ මංගල්‍යයට වන්දනා චරිකාවක් ලෙස පැමිණෙති.
- ජේසුගේ උත්ථානයෙන් පසු ගෝලයන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කිරීමේ මංගල්‍යයේ දී සිදුවිය.
- මෙදින කිතුනුවන් ශුද්ධාත්මයාණන්ගේ මංගල්‍යය ලෙසත්, ශුද්ධ වූ සභාවේ උපන්දිනය ලෙසත් සමරති.

**3. කූඩාරම් මංගල්‍යය**

- ජුදෙව්වන්ගේ මංගල්‍යවලින් පැරණිම මංගල්‍යය මෙයයි.
- හීබෲබසින් මෙය ''සුක්කොත්'' යනුවෙන් හැඳින්වේ. එහි අර්ථය කූඩාරම් පැල ගාල යනුයි.
- මුල් කාලයේ දී තම බැටළුවන් තණබිම් කරා දක්කාගෙන යාමේ දී එහි කූඩාරම් තනා නතර වී සිටීම සිහිකරමින් ද, පසුව තම අස්වනු නෙලා ගැනීමට කූඩාරම් තනා නතර වී සිටීමත් සිහිකරමින් ද මේ මංගල්‍යය සමරනු ලැබීය.
- නික්මයාමෙන් පසු ''සීන්'' කාන්තාරයේ කූඩාරම් තනා නතර වී සිටීමත් සිහිකරමින් ද සීනයි ගිවිසුමක් සිහිකර මෙය ''යාවේගේ'' මංගල්‍යය ලෙස ඉතා සතුටින් සැමරූහ.
- මෙහි ''තිස්රි'' (සැප්තැම්බර් - ඔක්තොම්බර්) මාසයේ 156 දිනෙන් පසුව දින 8 ක් එකදිගට පවත්වනු ලැබේ.
- සරුව වැඩුණු ඔලිව් අතු ද ඉඳිගසේ දළු ද තාල අතු ද ඔසවාගෙන දේවමාළිගාව වට සත්වරක් ගමන් කර, පැමිණ කූඩාරම්වල නතරවීම විශේෂත්වයකි.

### 4. නුමුහුන් පූප මංගල්‍යය

- මේ මංගල්‍යය හීබෲ බසින් ''මසෝද්'' යනුවෙන් හැඳින්වේ. මෙහි අර්ථය නුමුහුන් යන්නයි.
- මේ මංගල්‍යය අස්වැන්න නෙලීම හා සම්බන්ධයි.
- පාස්කු මංගල්‍යයෙන් දින හතකට පසුව මේ මංගල්‍යය සමරනු ලැබීය.
- තම ගොයම්බිම්වලින් මුල්දින හතේ නෙලාගත් අස්වැන්න එනම් තිරිඟු, ධාන්‍ය අඹරා පිටිගෙන, නුමුහුන් රොටි තනා එය පඬුරු ලෙස ඔප්පු කරන අතර තමන් ද අනුභව කරති.
- තව ද එළු, ගව, කුළුදුලන් දෙවියන්ට පඬුරු ලෙස ඔප්පු කරති.
  (නික්මයාම 34/18-20 ලෙවී 23/5-8)
- පාස්කු මංගල්‍යයත්, නුමුහුන් පූප මංගල්‍යයත්, නිසාන් මස පැවැත්වූ බැවින් මේ දෙකම පසුව එක්ව සමරන ලදි.

### 5. පාපපූජා මංගල්‍යය

- මෙය හීබෲ බසින් ''ජෝම් කිපූර්'' යයි හැඳින්වේ.
- ජුදෙව්වන්ගේ හත්වන මාසය වන තිස්රි (සැප්තැම්බර් - ඔක්තෝබර්) මස දහනව වන දින සමරනු ලැබීය.
- එදින පූජකයන් ද, ජනතාව ද, ''නිවාඩු දින'' පිළිවෙත් අනුගමනය කර, තම පාපවලට වන්දි ගෙවීමේ යාග ඔප්පු කිරීම නීතිය වේ.
- එදින නිරාහාරශීලය රැකීම වැදගත් වේ.
- වසරකට වරක් පැවැත්වෙන මේ මංගල්‍යයේ දී පමණක්, නායක පූජකයා දේවමාළිගාවේ අතිශුද්ධස්ථානයට ගොස්, එහි ඇති ශෛලමය පීඨිකයේ (කරුණාසනය) ලේ තවරා පාප පූජාව සිදු කරති. (ලෙවී 16/1-37)
- මනුෂ්‍යයාගේ පාපවලට බිලි පූජාවක එළුවන්ගෙන් එකෙකු පාළුකරයට පලවා හරිනු ලැබේ.

### 6. දේවමාළිගාව කැප කිරීමේ මංගල්‍යය

- හීබෲ බසින් මෙය ''හනුක්කා'' යැයි හැඳින්වේ. මෙහි අරුත අළුත් කිරීම හා ආරම්භ කිරීම වේ.
- ක්‍රි.පූ. 175 දී අන්තියෝකස් එපිපානස් නමැති ග්‍රීක රජු ජෙරුසලම් දේවමාළිගාවත්, පූදසුනත් කිළිටි කළ බැවින් ජෙරුසලම් දේවමාළිගයේ පවිත්‍රත්වය නැති වූ බව සිතූහ.
- මෙය පවිත්‍ර කිරීමට ජුදා මකබි ගත් උත්සාහය ක්‍රි.පූ. 164 දී සම්පූර්ණ වී ''කිෂ්ලු'' (දෙසැම්බර් 25) මාසයේ නැවත දේව මාළිගාව කැපකර යාගපූජා ද උත්සව ද සිදුකරනු ලදි.
- මෙය සිහිකිරීමේ දින ලෙස මේ මංගල්‍යය පවත්වනු ලැබීය.
- එකදිගට දින අටක් මේ මංගල්‍යය උත්කෘෂ්ට ලෙස, නැටුම් ගැයුම් සහිතව, එක් එක් දිනට එක දෙක බැගින් පහන් හතක් හත්වන දින දී දල්වා සමරනු ලැබීය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ජුදා සමාජයේ තිබුණු සමාජ සම්ප්‍රදායයන් දැන ගෙන විස්තර කරයි.
2. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ජුදෙව්වන්ගේ අගමික සම්ප්‍රදායන් හා චාරිත්‍ර පැවරුමක් ලෙස ඉදිරිපත් කරයි.
3. ජුදෙව්වන් සැමරූ ආගමික මංගල්‍යයන්ගේ ස්වභාවයන් හැඳින යහපත් දේ අනුගමනය කරයි.

**නිපුණතාව** **4.0** **:** ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුනතා මට්ටම** **4.1** **:** ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළින් පිළිඹිබු වූ වටිනාකම් තම ජීවිතයට උකහා ගනියි.

**කාලච්ඡේද** **:** 10

**ඉගෙනුම් පල** **:**

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම වූ ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ගෙනහැර දක්වන අදහස් ගොනු කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම බව පිළිගනියි.
- ක්‍රිස්තුස් වහන්සේ කවුද? යන්න පිළිබඳ පෝස්ටරයක් විස්තරයක් කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ ගේ උත්ථානය විශ්වාස කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් වල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය** **:**

**නාසරතයේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ - හැඳින්වීම**

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නාසරතයේ ජුදා පවුලක උපත ලැබූ සේක. ජුදා සංස්කෘතියට අනුව හැදී වැඩුණ සේක. ජුදා පරිසරයට අනුව සිතීමට හා ජීවත්වීමට පුහුණුව ලැබූ සේක. ඔවුන්වහන්සේ ප්‍රඥා මහිමයෙන් ද කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ද හැදි වැඩුණු සේක. (ලූක් 2:52) දේව මාතාව තුළ දකිය වූ අචල දේව විශ්වාසය ඔවුන්වහන්සේ ද උගෙන (ලූක් 1:47-5), දෙවියන් වහන්සේ කරුණාව, ආදරය, අවංක හා යුක්තිගරුක වන බව විශ්වාස කළ සේක. '' නීතිගරුක හා අවංක'' පුද්ගයෙකු වන ජෝශප්තුමාගෙන් ජුදා නීතියට එපිට, **අවංකකම හා සත්‍යයට ප්‍රථම ස්ථානය ලබාදිය යුතු ය යන වටිනාකමික් යුත් සිතුවිලි සමඟ හැදී වැඩුණ සේක.** ජුදා නීතියට වහල් නොවී, සම්පූර්ණයෙන් ම මිනිසාගේ යහපත පමණක් ආරක්ෂා කළ යුතුය යන දෑඩි අධිෂ්ටානයකින් පසු වූ සේක.

ජේසුස් වහන්සේ ධර්මශාලාවල පැවැත්වූ මෙහෙයන් වලට සහභාගි වූ සේක. ශුද්ධවූ ගීත වලින් යැදීමට උගත් සේක. ජුදා සම්ප්‍රදායට අනුව යමින්, ජෙරුසලම් දේව මාළිගාවට වන්දනාවේ ගිය සේක. පාරම්පරික ජුදා පාස්කුව සැමරූ සේක. ස්නාවක ජුවාම්තුමාගෙන් ඔවුන්වහන්සේ

බෞතීස්මය ලැබූ අවස්ථාවේ උන්වහන්සේ ලද අත්දැකීම සමඟ, ජුදා 'යාවේ' දෙවියන් ව, පියාණන් යැයි ඇමතූ සේක. දෙවියන් වහන්සේ සමඟ පිය-පුත් සෙනෙහසින් යුතුව වැඩුණු සේක. දෙවියන් වහන්සේ ව ගැඹුරින් අදහමින්, දේව ජනතාවක් ලෙස ජීවත් වී, පූර්ණත්වය ලැබීම දේව කැමැත්ත බව විශ්වාස කළ සේක. එබැවින්, '' නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය. මනස්ථාපනය වන්න. සුබ අස්න අදහා ගන්න'' (මාක් 1:14- 15) යැයි දේශනා කළ සේක. **දේව රාජ්‍යයේ ස්වභාවය අන් අය දැනගත හැකි ආකාරය ඉගැන් වූ සේක. දේව රාජ්‍ය උදා වූ බව ගෙන හැර දක්වන ක්‍රියාකාරකම් කළ සේක**. දේව රාජ්‍ය සඳහා ජීවත් වී, උකුත් වී, මරණයට පත් කරනු ලැබ උත්ථාන වූ සේක. ජේසුස් වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම් හා ක්‍රියාකාරකම් ද නව සංස්කෘතියක් බිහිවීමට පදනම් විය.

### 4.1.1 ජේසුස් වහන්සේ ගේ ක්‍රියාකාරකම්

ජේසුස් වහන්සේ තම බෞතීස්මයෙන් පසුව, පාළුකරයේ දී පරීක්ෂා කරනු ලැබූ සේක. (ලූක් 4:1-13). පරීක්ෂාවල දී ද, තම දේව කැමැත්තට අනුව ජීවත්වීමේ හා ක්‍රියාකිරීමේ තිර අධිෂ්ටානයක එල්බ සිටි සේක. නාසරෙත් ධර්මශාලාවේ දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථයෙන් එක් කොටසක් (යෙසායා 61:1-2) කියවා, ප්‍රථම වතාවට ජනතාවට දේශනා කළ සේක. (ලූක් 4:16-22). ජේසුස් වහන්සේ මෙම දේශනාව මඟින් දේව රාජ්‍යයට උචිත ආකාරයට තම ක්‍රියා කෙලෙස සැකසේ දැ යි ප්‍රකාශ කළ සේක.

ජුදා සම්ප්‍රදාය ය මූලික ව ම ශුද්ධවූ සම්ප්‍රදායකි. (ලෙවී 19:2). ජේසුස් වහන්සේගේ කාලයේ ශුද්ධ යන්න ශරීරයට අදාළ ව, ජාතියකට අදාළ ව, ව්‍යවස්ථාව ට අදාළ ව ඉතා සියුම් අදහසක් දෙන දෙයක් යැයි සිතන ලදී. **පව්කරුවන්. අයබදු අයකරන්නන්,** රෝගීන්, විශේෂයෙන් ලාදුරු රෝගීන් ශාරීරික ශුද්ධත්වය නැති අය යැයි අදහස් කරන ලදී. මිශ්‍ර ජාතියක් වන සමාරියය් හා අන්‍ය ජාතිකයින් ජාතීන් වශයෙන් අශුද්ධ ජාතියක් යැයි සිතන ලදී. ව්‍යවස්ථාව නිවැරදි ව අනුගමනය නොකරන දිළිඳුන්, ව්‍යවස්ථාවට අනුව අශුද්ධයින් හා පව්කරුවන් යැයි අදහස් කර කොන් කරන ලදී.

මෙම ජනතාවට පූර්ණ ජීවිතයක් අවශ්‍ය යැයි යන්න ජේසුස් වහන්සේගේ ප්‍රථම අරමුණ විය. තව ද සමාරියයන්, අයබදු අයකරන්නන්, පව්කරුවන් යැයි සමාජයෙන් කොන්කරනු ලැබූවන් සමඟ ජේසුස් වහන්සේ යහපත් සබඳතා පැවැත් වූ සේක. ජේසු මෙවැනි ජනතාව සමග සබඳකම් පවත්වා, ඔවුන් අතුරින් කෙනෙකු මෙන් ජීවත් වූ සේක.(පිලිප්පි 2:6-8, ගලාති 4:4, ජොහාන් 1:14) ජේසුස් වහන්සේගේ මෙම ක්‍රියාකාරකම්, දයානුකම්පාව මත පදනම් වූ සාරධර්මයක් වේ.

#### 4.1.1.1 ජේසුස් වහන්සේ හා සමාරියයන්

සමාරියයන් ක්‍රි.ව. 722 දී අසිරියන්වරු ඉශ්‍රායෙලය ආක්‍රමණය කළ පසු, ඔවුන් හා මිශ්‍ර වී ජුදා ජාතියෙන් බිහි වූ මිශ්‍ර ජාතියකි. ජුදා ජාතිකයන් මොවුන් පහත් ජාතියක් යැයි සිතා, ඔවුන් හා සබඳතා පැවැත්වීම ප්‍රතික්ෂේප කළ හ. මෙය එක් ආකාරයකින් ජාතිය නිසා ඔවුන් පීඩාවට පත් කිරීම ලෙස ගත හැක. නමුත් ජුදයින් සමාරියයන් ව පහත් කොට සලකා, පහත් මට්ටමින් සැලකීම දේව රාජ්‍යයට විරුද්ධ හුරු පුරුදු ලෙස ජේසුස් වහන්සේ සැලකූ සේක.

ජේසුස් වහන්සේ සමාරියයන් ට කිසිඳු වෙනස්කමක් නොපෙන්වූ සේක. ඔවුන් ව සමාන මට්ටමින් සලකා, ඔවුන් හා යහපත් සබඳතා පවත්වා ගෙන ගිය සේක. ගලීලයේ සිට ජෙරුසලමට පිටින් දිගු ගමන් මගක නොගොස්, සමාරියය මැදින් ගමන් කළ සේක. මෙම සත්‍ය ය වටහා දීමට, ඔවුන් පිළිබඳ ව ඉතා උසස් අන්දමින් කථා කළ සේක. (යහපත් සමරිතානුවරයාගේ උපමාව ලූක් 10:25-37, කුෂ්ට රෝගීන් දසදෙනා සුවය ලැබීමේ සිද්ධිව ලූක් 17:11-19). සමරිතානුවන් ගේ ගමක ජනතාව ඔවුන් වහන්සේ ව පිළිගැනීමට ප්‍රතික්ෂේප කළ අවස්ථාවක, ශ්‍රාවකයින් කිහිප දෙනෙකු එවුනට ශාප කිරීමට සිතූ අවස්ථාවේ, ඔවුන් වහන්සේ ශ්‍රාවකයින් ට තරවටු කර, වෙනත් ගමකට ගිය සේක. (ලූක් 9:51-56). සමරිතානු ස්ත්‍රීයට ඔවුන්වහන්සේ ම කථා කර, ඇයගේ සිත වෙනස් කර තම සාක්ෂිකාරියක කරගත් සේක. එම ගමේ ජනතාවගේ කැඳවීම පිළිගෙන දින දෙකක් ඔවුන් හා ගත කළ සේක. (ජොහාන් 4:5-30)

#### 4.1.1.2 ජේසුස් වහන්සේ හා අයබදු අයකරන්නන්

අයබදු අයකරන්නන් ජුදා ජාතිකයෝ ය. රෝම පාලකයින් සඳහා මහජනතාවගෙන් බදු අයකරමින් ජීවත් වූහ. තමන් ව ආක්‍රමණය කර, පාලනය කරන ඔවුන් වෙනුවෙන් අයබදු අය කරන මොවුන් ව ජුදා ජනතාව අවමානයට ලක්කළ යුතු පිරිසක් ලෙස සැලකූ හ. ඔවුන් කෙරෙහි වෛරය හා කෝපය පළ කළ හ. නමුත් ජේසුස් වහන්සේ මොවුන් හා සබඳතා පැවැත් වූ සේක. ඔවුන්වහන්සේ, ජෙරිකෝවට යන ගමනේ දී අයකැමියන්ගේ කෙනෙකු (නායකයකු) වූ සකේවුස් හමු වූ සේක. ඔහු සමග කථා කොට ඔහුගේ ගෙදර භෝජන සංග්‍රහයකට ද සහභාගි වූ සේක. (ලූක් 19: 1-10). තවද රේගු පොළේ සිටි ලෙවී නමැත්තා ට තමන් පසුපස එන්නැ යි කැඳවූ සේක. ඔහුගේ නිවසෙහි අයකැමියන් හා පව්කාරයින් බොහෝ දෙනෙක් සමග කෑමට වැඩහුන් සේක. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පසුව ඔවුන්වහන්සේගේ අනුගාමිකයෝ වූහ. (මාක් 2:13-17)

#### 4.1.1.3 ජේසුස් වහන්සේ හා පව්කරුවන්

යුදා සමාජයේ අයකැමියන් හා කාමමිථ්‍යාචාරයේ යෙදෙන්නන් පව්කරුවන් ලෙස සැලකූ හ. යුදා ආගමික ව්‍යවස්ථාවට අනුව, අපිරිසිඳු තැනැත්තන් හා කාමමිථ්‍යාචාරයේ යෙදෙන්නන් සමාව නොලැබිය යුත්තෝ ය. ගල්ගසා ඝාතනය කළ යුත්තන් ය. දිනක් කාමමිථ්‍යාචාරයේ හැසිරෙද්දී ම අසු වූ ස්ත්‍රියක, විනයධරයෝ හා පරිසිවරු ජේසුස් වහන්සේ වෙතට රැගෙන විත්, ඇයට ගල්ගසා මරා දැමීම පිළිබඳ ඔවුන්වහන්සේගෙන් ඇසූ හ. ඔවුන්වහන්සේ ඇයට තීන්දුවක් ලබානොදුන් සේක. (ජොහාන් 8:1-11).

ජේසුස් වහන්සේ අයකැමියන්, ගණිකාවන් කෙරෙහි අනුකම්පා කළ සේක. ''මා ආයේ දමිටුන් නොව අදමිටුන් කැඳවීමට'' ය, යන්න ජේසුස් වහන්සේ ස්ථිර අධිෂ්ඨානය විය. මොවුන් ජේසුස් වහන්සේ නැතිවූවන් යැයි පිළිගත් සේක. මොවුන් සොයා ගැනීමටත්, ගැලවීමටත් පැමිණියෙමි යැ යි දැඩිව ම ක්‍රියා කළ සේක. (ලූක් 15:1-7)

#### 4.1.2. ශ්‍රාවකත්වය පිළිබඳ ඉගැන්වීම්

ජේසුස් වහන්සේ ගේ සමාජයේ යුදා ආගමික පූජකයන්ගෙන් ඉගෙන ගනිමින්, ඔවුන්ගේ ශ්‍රාවකයින් ලෙස ජීවත්වීමේ සිරිතක් විය. ඔවුහු යුදා ආගමික පොතපත හොඳින් උගත්තෝ ය. යුදා ආගමික සිරිත් විරිත් ඉටුකිරීමටත්, යුදා සම්ප්‍රදාය ආරක්ෂා කිරීමටත්, යුදා ව්‍යවස්ථාවට අනුව ජීවත් වීමටත් ඉගෙන ගත්තෝ ය. උදාහරණයක් ලෙස ගතහොත්, දිනක් ජේසුස් වහන්සේව හමුවීමට පැමිණි පොහොසත් තරුණයා මෙන් පුහුණුව ලැබ සිටිය හ. (මාක් 10:17-21).

ජේසුස් වහන්සේ තමන් සමඟ නැවතී සිටීමටත්, පිටත්කර යැවීමටත් කිහිපදෙනෙකු කැඳවූ සේක. නමුත් ඔවුන් විශේෂයෙන් දේව රාජ්‍යයේ ස්වභාවය, ගුණාංග හා ක්‍රියාකරකම් වල දී තමන් අනුගමනය කරමින් දායකවීමට ඔවුන් ට උපදෙස් දුන් සේක. උදාහරණ ලෙස පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨවලට අපගේ අවධානය යොමු කරමු. (මාක් 8:31-37, 9: 33-37, 10: 35-45)

**4.1.2.1 මාක් 8:31-37** ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් අමතා, තමන් වහන්සේ ට කෙබඳු දුක් වේදනා, මරණයක් හිමිවේ දැයි කලින් ම කී සේක. ජේසුස් වහන්සේ දුක් විඳ ප්‍රතික්ෂේප කරනු ලැබ, මරනු ලබන බව කීමට පේදුරු විරුද්ධ විය. මන්දයත්, ජේසුස් වහන්සේ 'මෙසියා' යැයි ඔහු විශ්වාස කළේ ය. ජේසුස් වහන්සේ රාජ්‍ය බලය අත්පත් කළ යුතු යැයි පවසා ඔවුන් වහන්සේ පරීක්ෂා කළේ ය. නමුත් ජේසුස් වහන්සේ ගේ චින්තනය, පේදුරුගේ චින්තනයට හාත්පසින් ම වෙනස් විය. ඒ කිමිදයත් පේදුරු'' දේව කැමැත්ත පිළිබඳ ව නො සිතා, මිනිස් කැමැත්ත පිළිබඳ''ව සිතී ය.

ශ්‍රාවකයන් අමතා, ''යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරා, මා අනුව ඒවා.......... '' යැයි ඉගැන්වූ සේක.

**4.1.2.2 මාක් 9:33-37** දිනක් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ අතර මග දී තමන් අතුරින් ප්‍රථමයා කවුරුන් දැ යි වාද කරමින් පැමිණියෝ ය. ජේසුස් වහන්සේ ඔවුන් සමඟ වාඩි වී, කුඩා දරුවෙකු ඔවුන් මැද සිටුවා ඔවුනට උපදෙස් දුන් සේක. සමාජයේ බාලයන් යැයි සලකා කොන් කරනු ලැබූවන්ගෙන් කෙනෙකු විය යුතු යැයි ඉගැන්වූ සේක. ප්‍රථමයාවීමට කැමති අය අන්තිමයා විය යුතු යැයි කී සේක. එනම් පහත් මට්ටමින් දිවි ගෙවන්නන් හා එක් වී, ඔවුන්ගේ තත්ත්වය හොඳින් අවබෝධ කරගෙන, ඔවුන්ගේ දුක් කම්කටොළු දුරුවීමට, සේවය කිරීමේ මනසින් ජීවත්වී වැදගත් බව ඉගැන් වූ සේක.

**4.1.2.3 මාක් 10:35-45** තවත් අවස්ථාවක දී ජේසුස් වහන්සේ ගේ ශ්‍රාවකයින්ගෙන් සමහරෙක් ඔවුන්වහන්සේගේ තේජශ්‍රීයෙහි දී, එක් කෙනෙකුට ඔවුන්වහන්සේගේ දකුණු පස ද, තවත් කෙනෙකුට වම්පස ද හිඳගන්නට වරම් ඉල්ලූ හ. සමාජය තුළ සිටින නායකයින් මෙන්, ඔවුනුත් තනතුරු, ගරුබුහුමන් නො සෙවිය යුතු යැයි උපදෙස් දුන් සේක. සේවය අරමුණු කරගනිමින් ඔවුන් ජීවත් විය යුතු යැයි වදාළ සේක. **අධික ආශාවන් සේවය කිරීමේ සිතුවිලි විනාශ කරයි. දේවරාජ්‍යයේ සේවාවට අවශ්‍ය තිර අධිෂ්ඨානය තුරන් කරයි.** ජේසුස් වහන්සේ තම ජීවිතයේ සත්‍යයැ යි ළඟා කරගත් දෑ, තමන් තුළ පැහැදිලි වූ අරමුණ, ඒ නිසා තමන් වහන්සේ තුළ ඇති වූ සිතුවිලි, අන් අය ද ළඟා කරගැනීමට ඉගැන්වූ සේක. ''මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ, සේව ලැබීමට නොව, සේවය කිරීමට යඃ බොහෝ දෙනාගේ මිදීම පිණිස සිය දිවි පිදීමට ය.'' (මාක් 10:45)

**4.1.3 පාද දෝවනය ජොහාන් 13:1-16** ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ දී ණී තම ශ්‍රාවකයන්ගේ පාද සේදූ සේක. ජුදා භෝජන සංග්‍රහයක දී, වහලෙකු අමුත්තන්ගේ පාද සේදීම සිරිතකි. ජේසුස් වහන්සේ වහලෙකු ගේ ක්‍රියාව කර, ඔවුනට දේව රාජ්‍යයේ සේවය පිළිබඳ ආදර්ශයක් දුන් සේක.

දේව රාජ්‍යයේ සේවාව ජේසුස් වහන්සේ මෙන් දේව ආදරය ප්‍රකාශ කරන් ක්‍රියාවක් විය යුතු ය (ජොහාන් 1:1) යන්න පාද සේදීම තුළින් අවබෝධ කෙරේ. හදවතෙහි දේව ආදරය නැත්නම් ශ්‍රාවකයෙකුට තමතම ත්‍යාජ නො හැක.

''ස්වාමීන් ද, ගුරු දේවයන් ද'' වන ජේසුස් වහන්සේගේ නායකත්වය, බැහැපත්කමින් යුත් සේවක නායකත්වය යන්නට පාද සේදීම සලකුණක් වේ. (ජොහාන් 13:13-17)

පාද සේදීම දේව රාජ්‍යයේ සේවාවට සිතේ ශුද්ධත්වය අවශ්‍ය යැයි යන්න අවබෝධ කරවන, තවත් සලකුණ කි. සුවිශේෂකවරයෙකු වන ශුද්ධවූ ජොහාන්තුමා ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීම ස්නානයට සමකරයි. (ජොහාන් 13:10) ස්නානය තුළින් පවිත්‍රවනවා සේ, ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට වදාළ දහම කරණකොටගෙන ඔවුන් පවිත්‍ර විය යුතු ය. (ජොහාන් 15:3).

ඔවුන්ගේ පාද සේදීම නිසා පවිත්‍ර වී, අන් අය ව ද පවිත්‍ර කළ යුතු ය යැයි ජේසුස් වහන්සේ පවසන සේක.(ජොහාන් 15:13-14). ජේසුස් වහන්සේ මෙන් ස්වර්ගීය පියාණන්ගේ දරුවන්වීමට ඔවුන් පවිත්‍ර විය යුතු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. නාසරතයේ ජේසුස් වහන්සේ ක්‍රිස්තියානි සංස්කෘතියට පදනම වන බව උදාහරණ සහිත ව ඉදිරිපත් කරයි.
2. ජුදා සම්ප්‍රදාය තුළ නාසරතයේ ජේසුස් වහන්සේ කවුරුන් ද යන්න හඳුනා ගෙන, ඔවුන් වහන්සේ වර්තමාන ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ කවුරුන් විය හැකි ද යන්න පැහැදිලි කරයි.
3. කිතුනු ශ්‍රාවකයන්ගේ ඉගැන්වීම්වලට අනුව ජීවත්වන විට පැමිණිය හැකි අභියෝග පිළිබඳ ප්‍රකාශ කරයි.
4. පාද දෝවනය තුළින් ක්‍රිස්තුස් වහන්සේ ජීවිතාදර්ශයක් ලබාදුන් බව පිළිගෙන, ඒ අනුව දිවි ගෙවිය හැකි මග  පහදයි.

**නිපුනතාව** 4.0 : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුනතා මට්ටම** 4.2 : ජේසුස් වහන්සේගේ දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් අයිති කර ගනියි.

**කාලච්ඡේද** : 36

**ඉගෙනුම් පල :**

- ජේසුස් වහන්සේ ගේ දේවරාජ්‍යය පිළිබඳ පහදා දෙන කන්ද උඩ දේශනාව, උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සමකාලීන සමාජය තුළ ජේසුස් වහන්සේ වෙනස් චරිතයක් වූ බව පිළිගනියි.
- කන්ද උඩ දේශනාව, උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.
- දේවරාජ්‍යයේ ගුණාංග අනුව ජීවත් වීමට උත්සහ දරයි.
- සතුරන් මිතුරන් බවට පත්කර ගනියි.

**විෂය අන්තර්ගතය**

**4.2.1 ජේසුස් වහන්සේගේ නව සමාජ දැක්ම**

**ජේසුස් වහන්සේගේ දේව රාජ්‍යය - හැඳින්වීම**

දෙවියන් වහන්සේ තමන් ව, එඬෙරෙකු මෙන් රක්ෂා කර, මඟ පෙන්වා, එක ජාතියක් හැටියට ජීවත් කරවූ බව ඉශ්‍රායෙල් ජනතාවගේ විශ්වාසය යි. මෙම විශ්වාසය තුළින් බිහිවූ යහපත් සබඳතාවෙන් යුත් ජීවිතය දේව රාජ්‍යය වේ. ජුදා සම්ප්‍රදායයේ දේව රාජ්‍යය පිළිබඳ බලාපොරොත්තුවක් පැවතුණි. නමුත් ඔවුන් දේව රාජ්‍යයේ ජනතාවක් ලෙස ජීවත්වීමේ දී අඩුපාඩු තිබුණි. එකිනෙකා අතර අදහස් නො ගැලපීම ආදිය දැකිය හැකිවිය. ඔවුන් අතර දැකිය හැකි වූ සමාජීය වෙනස්කම්, උස්පහත්කම්, ව්‍යවස්ථාව අකුරට ම පිළිපැදීම නිසා අත්කරගත් ප්‍රතිඵල දේව රාජ්‍යයට පටහැනි ඔවුන්ගේ ජීවිත පැවැත්මට උදහරණයන් ය.

මෙම සම්ප්‍රදායට අනුව, ජේසුස් වහන්සේ විශ්වාස කළේ, ඉගැන්වූයේ, ජීවත්වී පෙන්වාදුන්නේ, ක්‍රියා කළේ, තම දිවිපිදුවේ සියල්ල ම දේව රාජ්‍යය සඳහා ය. දේව රාජ්‍යය යනු එතුමන් පොළොව මත ඇවිලූ ගින්න වේ. (ලූක් 12:49). දේව රාජ්‍යය දෙවියන් වහන්සේ ගේ ගුණාංග වන ප්‍රේමය, සත්‍යතාව, යුක්තිය රජයන නව මානව සමාජයක් ලෙස ජේසුස් වහන්සේ දුටු සේක. දෙවියන් වහන්සේ ව ම රජු කොටගත්, සමානත්වය, සහෝදරත්වය විදහාපාන ජීවිත පැවැත්මක් ඇති කිරීමට ජේසුස් වහන්සේ උත්සහ කළ සේක. දේව රාජ්‍යය යනු ජේසුස් වහන්සේගේ දැක්මට අනුව වෙනස්වූ සමාජය කි. ශුද්ධවූ පාවුලුතුමා ''දෙවියන් වහන්සේ ගේ රාජ්‍යය වනාහි කා බී ප්‍රීතිවීමක් නොව, යුක්තිය ද, සාමය ද, ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් එන ප්‍රීතිය ද''(රෝම 14:17) වන බව පවසයි.

''ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන්වහන්සේ මා ආලේප කළ සේක'' (ලූක් 4:18) යැයි ප්‍රකාශ කළ ජේසුස් වහන්සේ, දේව රාජ්‍යය ජීවත් කරවීමට කන්ද උඩ දේශනාවෙන් කැඳ වූ සේක. දේව රාජ්‍යය යනු කුමක්ද යි උපමා මඟින් ඔවුනට ඉගැන්වූ සේක. දේව රාජ්‍යය ඔවුන් අතර, දැනටමත් පවතින බව ප්‍රාතිහාර්යයන් මඟින් ප්‍රකාශ කළ සේක.

**4.2.1.1 කන්ද උඩ දේශනාව (මතෙව් 5-7)**

ජේසුස් වහන්සේ ජනතාවට දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කළ බව, සමදර්ශක සුවිශේකවරුන් තිදෙනා සඳහන් කරති. (මතෙව් 4:17, මාක් 1:15, ලූක් 4:43). ශුද්ධවූ මතෙව්තුමා ජේසුස් වහන්සේ ගේ දේව රාජ්‍ය පිළිබඳ ප්‍රකාශය, ඉගැන්වීම් පහක් මඟින් අපට පෙන්වා දෙයි. ඒවානම්:

1. කන්ද උඩ දේශනාව (පරිච්ඡේද 5-7)
2. ධර්මදූත මෙහෙය (පරිච්ඡේද 10)
3. උපමා (පරිච්ඡේද 13)
4. ශුද්ධවූ සභාවේ ජීවිතය (පරිච්ඡේද 18)
5. අවසාන කාලය (පරිච්ඡේද 24-25)

මෙම ඉගැන්වීම් පහ ම, පුරාණ ගිවිසුමේ පංච පුස්තකයට (ටෝරා) සමාන ය.

මතෙව් සුවිශේෂයේ දැකිය හැකි ජේසුස් වහන්සේ ගේ දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් පහේ පළමුවැන්න කන්ද උඩ දේශනාව වේ. ජේසුස් වහන්සේ තම දේව රාජ්‍යයේ සේවාව ආරම්භ කළ අවස්ථාවේ දී, ඔවුන් වහන්සේ තෝරාගත් අය හා එතුමන් වෙත පැමිණි අය, අනුසාර කර ජීවත් විය යුතු ගුණාංග, වටිනාකම්, දහම, ඔවුන් තුළ ගොඩනගා ගතයුතු මානසිකත්වය ආදිය පිළිබඳ ඔවුන්ට ඉගැන්වූ සේක. මෙම ඉගැන්වීම් විවිධ අවස්ථාවල, විවිධ ස්ථානවල දී ජේසුස් වහන්සේ විසින් ලබාදෙන ලද ඒවා ය. මේවායේ සාරාංශය කන්ද උඩ දේශනාව වේ.

ජේසුස් වහන්සේ ජනකාය දැක, කන්ද මතට නැගී හිඳ, තම ඉගැන්වීම කළ බව මතෙව්තුමා සඳහන් කරයි. මොසස්තුමා සීනයි කන්දමතට නැගී, ඉශ්‍රායෙල් ජනතාව අනුසාර කළයුතු, දසපනත ලබාදුන් සේ, ජේසුස් වහන්සේත් කන්ද මත හිඳ, දේව රාජ්‍යයේ සමාජයක් ගොඩනැගීම සඳහා, ජනතාවට ඉගැන්වූ සේක. ඒවා ජෙරමියා දිවැසිවරයා පවසන ආකාරයට ඔවුන්ගේ සිත්වල ලියන ලද නව ගිවිසුම ඔවුන්ගේ ජීවිත පැවැත්ම වේ.(ජෙරමියා 31: 31)

ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනාවේ පහත සඳහන් විස්තර දැකිය හැක.

(අ) භාග්‍ය අට (5:3-12)

(ආ) ශ්‍රාවකයින්ගේ දේව රාජ්‍යය තුළ ජීවිත පැවැත්ම - ලුණු ෘ ආලෝකය (5:13-16)

(ඉ) මූලික ප්‍රතිපත්ති හා ධර්මිෂ්ඨකම (5:17-7:12)

(ඊ) දේව සබඳතාව (6:1-18)

(උ) සැබෑ සම්පත හා එය සොයාගැනීමේ ප්‍රතිඵල (6:19-34)

(ඌ) රන් අණ (7:12)

**(අ) භාග්‍ය අට (5:3-12)**

ජේසුස් වහන්සේ උගන්වන භාග්‍යයන් (මකාරියෝයි- ග්‍රීක වචනය) දිවැසිවරයෙකුගේ පණිවුඩය වේ. භාග්‍යවන්තයෙකු යන්නෙන් අදහස් වන්නේ, දේව දීමනා ලබාගත් තැනැත්තෙකි. දෙවියන් වහන්සේගේ පිළිගැනීමට ලක් වූවෙකි. ජීවිතයේ පූර්ණත්වය ලැබූවෙක් යන්න ය. මෙම තත්ත්වය ලබා ගැනීමට දේව ගුණාංග, යහපත්කම, දිළින්දන්, පීඩාවිඳින්නන්, රෝගීන් හා ප්‍රතික්ෂේප කරනු ලැබූවන් යන අය සමඟ විවෘත මනසකින් යුතු ව ජීවත් විය යුතු යැයි ජේසුස් වහන්සේ පවසන සේක.

බැගෑ සිත් ඇත්තන් ලෙස, නිහතමානී ගුණ ඇත්තන් ලෙස, යුක්තියට සාපිපාස ඇත්තන් ලෙස, දයාවන්තයන් ලෙස, නිර්මල සිත් ඇත්තන් ලෙස, සිටියහොත් දේව රාජ්‍යයට සුදුසුකම් ලබන්නන් බව ජේසුස් වහන්සේ ඉගැන්වූ සේක. භාග්‍ය අටෙන්, පළමු භාග්‍ය තුළින් කෙනෙකු දෙවියන් වහන්සේ සමඟ පැවැත්විය යුතු සබඳතාවේ මානසිකත්වය ගෙන හැර දක්වේ. 5,6 හා 7 වන භාග්‍ය තුළින් එකිනෙකා අතර තිබිය යුතු සහෝදරත්වයේ ස්වභාවය සඳහන් කෙරේ. 4 වන හා 8 වන භාග්‍යයන් තුළින් දෙවියන් වහන්සේ හා එකිනෙකා අතර, සබඳතාව පවත්වාගෙන යාමට, රක්ෂා කළ යුතු දෑ, යුක්තිගරුක බව හා දැහැමියාව පෙන්වා දෙයි.

**(ආ) ශ්‍රාවකයින්ගේ දේව රාජ්‍යය තුළ ජීවිත පැවැත්ම - ලුණු : ආලෝකය (5:13-16)**

දේව රාජ්‍යයේ ස්වභාවය ලුණු හා ආලෝකය යන උපමේයයන් තුළින් සඳහන් කරති. ලුණු හා ආලෝකය එදිනෙදා ජීවිතයේ දී ප්‍රධාන ස්ථානයක් උසුලයි. ඒවා අන් අයගේ අවශ්‍යතාවයන් සඳහා ඔවුන් සමග සිටිමින්, ඔවුනට උදව් උපකාර කරයි. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට ද, මෙලොව තුළ ලුණු හා ආලෝකය වීමට කැඳවන සේක.

**(ඉ) මූලික ප්‍රතිපත්ති හා ධර්මිෂ්ඨකම (5:17-7:12)**

මතෙව් 5:17-20 කන්ද උඩ දේශනාවේ ප්‍රධාන කොටසකි. මේවා තුළින් ජුදයින් විසින් පිළිගත් ව්‍යවස්ථාවත්, ජේසුස් වහන්සේගේ ඉගැන්වීමත් අතර ඇති සබැඳියාව හා වෙනස්කම් පිළිබඳ ව සාකච්ඡා කෙරේ. ''ව්‍යවස්ථාව මෙසේ පවසයි, මම ඔබට මෙසේ කියමි'' යන ජේසුස් වහන්සේ වචන තුළින් සැබැවින් ම, ඒවායේ අභ්‍යන්තර අරමුණ අවබෝධ කරගනිමින් ජීවත්විය යුතු යැයි ඉගැන්වේ.

ව්‍යවස්ථාවේ වැදගත්කම තහවුරු කරන ජේසුස් වහන්සේ, පරිසිවරුන් හා විනයධරයන් ඒවා විස්තර කරන ආකාරයට වඩා වෙනස් ආකාරයකින්, පැහැදිලි කළ සේක. (මතෙව් 5:21-48) ජේසුස් වහන්සේ ව්‍යවස්ථාව හා පරිපූර්ණ ජීවිතය පිළිබඳ කළ පැහැදිලි කිරීම්, විරුද්ධ කියමන්වේ. ඒවා අනන්‍යයන් හා ඇතිකරගන්නා වූ සබඳතාවල දී, රක්ෂා කළ යුතු දැහැමි ගුණධර්ම වේ.

උදාහරණ ලෙස, කෝපවීම, කාමමිථ්‍යාචාරය, දිවුරුම් දීම, පළිගැනීම, සතුරන් කෙරෙහි මෛත්‍රිත් වැඩීම යනාදිය පිළිබඳ වේ.

1. **කෝපවීම**

'' මිනී නොමරන්න, මිනී මරන කවරෙකු වුව ද විනිශ්චයට යටත් වනු ඇතැ'යි (නික්මයාම 20:13)පැරැන්නන්ට කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි, තමාගේ සහෝදරයා සමඟ කෝප වන කවරෙකු වුව ද, ඔහු අධිකරණයට යටත්වනු ඇත''. මෙහි දී ජේසුස් වහන්සේ ව්‍යවස්ථාව වෙනස් නො කළ සේක. එය නව දැක්මකින් ඉදිරිපත් කළ සේක. කෝපය කෙනෙකුගේ මානසිකත්වය වේ. එම මානසිකත්වය අන් අය හා පවත්වනු සබඳතාව පළුදු කරයි. අසල්වැසියන් පිළිබඳ අයුතු චෝදනා එල්ල කිරීමට පෙළඹෙයි. අන්අයගේ නාමය කෙළසයි. ඒ මගින් ඝාතනයන් ද කෙරෙයි. කෝපයෙන් කරනු ලබන සියල්ල දෙවියන් වහන්සේට ප්‍රියමනාප ක්‍රියා නොවේ. එබැවින් කෝප නොවිය යුතුයැයි ජේසුස් වහන්සේ පවසන සේක.

**2. පළිගැනීම**

''ඇසට ඇස ...........(ලෙවී 24:19). එදිරිකාරයාට විරුද්ධව එකටෙක නො කරන්න. යමෙකු ඔබගේ දකුණු කම්මුලට ගැසුවොත්, ඔහුට අනික් කම්මුල ද හරවන්න.'' තවත් කෙනෙකු කරන කුඩා බලපෑම සඳහා  අනවශ්‍ය ලෙස පළිගැනීමේ පුරුද්ද අතහැරීමට, ජේසුස් වහන්සේ දුන් වෙනස් උපදෙස් වේ.

3. **කාමමිථ්‍යාචාරය නොකරව**

''කාමමිථ්‍යාචාරය නොකරව.....(නික්මයාම 20:14).'' ''යමෙකු ස්ත්‍රියක දෙස කාමරාගයෙන් බැලූ කෙණෙහි ම ඔහු ඈ සමඟ සිතින් කාමමිථ්‍යාචාරය කර ඇත.'' (මතෙව් 5:28) ''දික්කසාද වීම.....(ද්වි.නී.ස 24:1-2) ''වේශ්‍යාකම හැර අන් කරුණක් නිසා සිය භාර්යාව දික්කසාද කරන කවරෙකු වුව ද ඔහු ඇය කාම මිථ්‍යාචාරයට පමුණුවන්නේ ය.'' (මතෙව් 5:32)

4. **දික්කසාදවීම ''දික්කසාදවීම .... (ද්වි.නි.24/1-2) නොහොබිනා යමක් නිසා මිස දික්කසාද කළ නොහැකි බව පැවසේ.**

''මෙම කියමනට අභියෝග කරමින්, ජේසුස් වහන්සේ මෙසේ පවසන සේක. ''වේශ්‍යාකමට හැර අන්  කරුණක් නිසා සිය භාර්යාව දික්කසාද කරන කවරෙකු වුවද, ඔහු ඇය කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේ ය.'' ජේසුස් වහන්සේ මෙම ඉගැන්වීම තුලින්  වෛවාහික සබඳතාවට විරුද්ධ වෙනත් විනය නීතිරීතිවල පටහැනි බව පවසන සේක. එසේම විවාහ ජීවිතයේ ඒකත්වය හා වෙන් කළ නොහැකි බව පෙන්වා දෙන සේක. (මතෙව් 5:31-32)

5. **දිවුරුම් පිළිබඳ ඉගැන්වීම**

'' මාගේ නාමයෙන් බොරුවට නොදිවුළ යුතු ය....(ලෙවී 19:12).  '' කොහෙත් ම නො දිවුරන්න. ''(මතෙව් 5:34) අපගේ කීමට දෙවියන් වහන්සේව සාක්ෂියක් ලෙස කැඳවා, ඔවුන් වහන්සේට අගෞරව කරන්නෙමු. දේව ජනතාව මධ්‍යයේ විශ්වාසය සුරැකීමට අතපසු කරන්නෙමු.

''ඔබේ අදහස 'එසේය' කීම නම්, 'එසේ ය' කියා ද, 'නැත' කීම නම්, 'නැත' කියා ද වේවා'' යි ජේසුස් වහන්සේ පවසන සේක.

**6. සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම**

''කෙනෙකුගෙන් පළි නො ගත යුතු ය. නුඹලාගේ ජනයාට විරුද්ධ ව බද්ධ වෛරයක් තබා නො ගතයුතු ය. නුඹ නුඹට ප්‍රේම කරන ලෙස ම නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කළ යුතු ය.'' (ලෙවී 19:18) ජුදා ඉතිහාසයේ 'නුඹලාගේ ජනයා' ලෙස හඳුන්වනු ලබන්නේ, ඉශ්‍රායෙල් ජනතාව වන අතර, සතුරන් ලෙස ඉශ්‍රායෙල් නොවන අන්‍ය ජාතිකයින් හඳුන්වනු ලබති. මෙලෙස වෛර කරන, මනසක් දේව රාජ්‍යයට උචිත නොවන බව ජේසුස් වහන්සේ පවසන සේක. (මතෙව් 5:43-45

**(ඊ) දේව සබඳතාව (6:1-18)**

ජුදා ආගම තුළ යාච්ඤාව, දන් දීම හා උපවාසය යන මෙම භක්ති අභ්‍යාසයන් ත්‍රිත්වය ම කෙනෙකුගේ දේව විශ්වාසය පිළිබඳ ප්‍රකාශ කිරීමක් ලෙස පැවතුණි. මෙම ක්‍රියාකාරකම් ඔවුන්ගේ ආධ්‍යාත්මික ජීවිතය තුළ වැදගත් ස්ථානයක් උසුලයි. නමුත් සාමාන්‍ය පැවැත්ම තුළ තමන් නීතිගරුක යැයි අන්අය ඉදිරියේ පෙන්වීමටත්, මිනිසුන් ගෙන් ප්‍රශංසා ලැබීම සඳහාත් මෙවන් දෑ කිරීමේ පුරුද්දක් පරිසිවරුන් හා විනයධරයන් අතර විය. මොවුන්ගේ මෙම ක්‍රියාව හෙළා දකින ස්වාමීන් වහන්සේ, '' මිනිසුන්ට පෙනෙන පිණිස ලෝකයා ඉදිරියෙහි ඔබේ පුණ්‍ය ක්‍රියා නො කරන්න බලාගන්න. එසේ කළහොත්, ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගෙන් කිසි විපාකයක් ඔබට නො ලැබෙන්නේ ය'' යැයි පවසන සේක.

**1. දන්දීම**

දන්දෙන විට,''ඔබේ දකුණත් කරන දෙය වමතට නො දැනේවා'' යැයි පැවසූ ජේසුස් වහන්සේ කෛරාටිකයින් හා ශ්‍රාවකයින් දන්දෙන ආකාරය එකිනෙකට සන්සන්දනය කර, වෙන්කර දක්වන සේක. එනම් කෙනෙකු දන්දෙන විට, එය තම කල්‍යාණ මිතුරා හෝ නො දැන කළ යුතු බව ජේසුස් වහන්සේ ගේ ඉගැන්වීමයි.

**2. යාච්ඤාව**

ජුදා ආගම තුළ දිනපතා තෙවරක් එකට එක් වී යැදීමේ සිරිතක් විය. එලෙස එකට එක් වී යැදිය යුතු බව ජේසුස් වහන්සේ ද ඉගැන් වූ සේක. (මතෙව් 18:19-20). නමුත් පෞද්ගලික ව අයදින විට, අන් මිනිසුන්ට පෙනෙන ලෙස ධර්ම ශාලාවලත්, මංසන්ධිවලත් සිටගෙන යාච්ඤා කිරීම පිළිබඳ තරවටු කරන සේක. '' ඔබේ ම ඇතුලු කාමරයට වැද, දොර වසාගෙන, රහසිගත ව වසන ඔබේ පියාණන් වහන්සේ ට යාච්ඤා කරන්න'' යැයි දිවැසිවර යෙසායා පැවසූ වදන් මතක් කර දෙන සේක. (යෙසායා 26:20).

''තව ද, ඔබ යාච්ඤා කිරීමේ දී විජාතීන් මෙන් දිගින් දිගට ම හිස් වචන නො දොඩන්න......ඔබ ඉල්ලන්නටත් පෙර ඔබේ වුවමනා කවරේ දැ යි පියාණන් වහන්සේ දන්නා සේක'' යැයි දිවැසිවර යෙසායා පැවසූ ලෙස, (යෙසායා 65:24) ජේසුස් වහන්සේ ද පවසන සේක.

තම ශ්‍රාවකයින්ට යාච්ඤා කිරීමට තම යාච්ඤාමය ජීවිතය තුළින් ද, ඉගැන්වීම් තුළින් ද මග පෙන්වූ ජේසුස් වහන්සේ ඔවුන් යාච්ඤා කළ යුතු ආකාරය ගෙන හැර දක්වන යාච්ඤාවක් ඔවුනට ලබාදුන් සේක. (මතෙව් 6:9-13)

**3. උපවාස කිරීම**

ජුදා ආගමට අනුව උපවාසය මනස්ථාපනයවීමේ සංකේතයක් ලෙස අනුසාර කරනු ලැබේ. ජුදයින් ගේ පශ්චත්තාපික මෙහෙයයන්වල දී, පොදුවේ උපවාස කළහ. නමුත් තනිව ම උපවාස කිරීමේ සිරිතක් ද විය. මෙහි දැකිය හැකි වූ මිනිසුන්ට පෙනෙන ආකාරයට උපවාස කිරීම වෙනුවට, රහසිගත ව උපවාස කරන බව මිනිසුන්ට නොපෙනෙන පරිදි කළ යුතු බව ජේසුස් වහන්සේ පවසන සේක. උපවාසය තමන් පිරිසිඳුවීම, හිස්වීම හා තම නොහැකියාව වටහා ගැනීම සඳහා කරන පරිත්‍යාගී ක්‍රියාවකි. එය පිරිසිදු අරමුණකින් සිදුකළ යුතු බව ජේසුස් වහන්සේ ගේ ඉගැන්වීමයි.

**(උ) සැබෑ සම්පත හා එය සොයාගැනීමේ ප්‍රතිඵල (6:19-34)**

'' එහෙත් පළමු කොට උන්වහන්සේ ගේ රාජ්‍යය ද, ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට මේ සියල්ල ඔබට දෙනු ලැබේ.'' (මතෙව් 6:33) ජේසුස් වහන්සේ මෙම ඉගැන්වීම තුළින් දේව රාජ්‍යය සඳහා වන ජීවිතයේ කෙනෙකුගේ ප්‍රධාන අරමුණ කුමක් විය යුතු ද යන්න ගෙහැර දක්වන සේක. වස්තු රැස්කිරීම ජීවිතයේ ප්‍රධාන අරමුණ වුවහොත්, ඉතිරි වනුයේ දුක වේදනාව හා අවිශ්වාසය පමණී. දිව්‍ය සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තැබීම ස්වර්ගීය ජීවිතයට පදනම වන බව පවසන සේක.

**(ඌ) රන් අණ (7:12)**

'' අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද, ඔබත් ඒ දේ ම ඔවුන්ටත් කරන්න. ව්‍යවස්ථාවලියේ හා දිවැසාවලියේ හරය එය වේ.'' (7:12) කන්ද උඩ දේශනාවේ උච්චස්ථානය ලෙසත්, අවසානය ලෙසත් රන් අණ ගෙනහැර දැක්විය හැක. '' මම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය අවලංගු කරන පිණිස ආවෙමි යි නො සිතන්න. මා ආයේ, ඒවා අවලංගු කිරීමට නොව, සම්පූර්ණ කිරීමට ය'' යැයි අරඹා, ''ව්‍යවස්ථාවලියේ හා දිවැසා වලියේ හරය එය වේ'' යැයි අවසන් කෙරේ.

මෙම රන් අණ පැරණි ගිවිසුමේ ජුදා රබ්බිවරුන්ගේ සම්ප්‍රදාය තුළ දැකිය හැක. එය '' අන් කෙනෙකු නුඹට කරනවාට නුඹ අකැමති දේ නුඹ ද අන් කෙනෙකුට නො කරන්න''(තෝබිත් 4:15) යැයි ව්‍යවස්ථාවලියේ සාරාංශයක් ලෙස දැකිය හැක. පූජකයාණන් ද, ගුරු දේවයාණන් ද වන ජේසුස් වහන්සේ ගේ ඉගැන්වීම් තුළින් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සහ අසල්වැසියන්ට ප්‍රේම කිරීම යන්න ව්‍යවස්ථාවලිය පුරාවට ම වන සාරාංශය වේ. (මාක් 12:28-34, මතෙව් 22: 34-40). මෙය ඉහත සඳහන් පරිදි රන් අණ ලෙස ජේසුස් වහන්සේ පෙන්වන සේක.

### 4.2.2. දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම

#### 4.2.2.1 උපමා

ජේසුස් වහන්සේ ඥානවන්තයින්ට හා ප්‍රඥාවන්තයින්ට නොව, විශේෂයෙන් තම සමාජයේ වූ ඉතා කුඩාවූවන්ට දේව රාජ්‍යය පිළිබඳ ව ප්‍රකාශ කළ සේක. දේව රාජ්‍යයේ ස්වභාවය, ගුණාංග ආදිය පිළිබඳව කතාන්දර, උපමා හා උපමේයයන් මගින් ඉගැන්වූ සේක. සමදර්ශක සුවිශේෂයන්හි ඒවා බොහොමයක් දැකිය හැක.

ඒවා එකල මධ්‍යධරණී රටවල භාවිතයේ තිබූ සෙමතික් සාහිත්‍යයට අයත් විය. ග්‍රීක දාර්ශණිකයින් හා ඉශ්‍රායෙලයේ දිවැසිවරුන් ද මෙම සාහිත්‍ය කලාව උපයෝගී කරගත් හ. උදාහරණයක් ලෙස 2 සාමුවෙල් 12:1-4 හි මෙම ආකෘතිය දැකිය හැක. ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා රබ්බිවරුන් ද එය භාවිත කළ හ.

ග්‍රීක ''පරාබොලේ'' යන වචනය තුළින් උපමාව යන්න අදහස් කෙරේ. එහි අර්ථය 'සැසඳීම' යන්න යි. 'මෂල්' යනුවෙන් ද හේබ්‍රෙව් වචනයක් ඇත. එය ආප්තෝපදේශ (ප්‍රස්තාව පිරුළු) තේරවිලි, ආදේශක ද, උපමා උපමේයයන් යැයි විවිධ අර්ථයන් සඳහා යොදා ගැනේ. නමුත් උපමා යන්න ජනතාවගේ එදිනෙදා ජීවිත පැවැත්ම තුළින් හෝ මනඃකල්පිත සිදුවීම් හෝ පරිසරයෙන් උපුටාගත් ස්වභාවික දර්ශනයක් හෝ උපමේයයක් ලෙස යොදාගෙන, අසන්නන්ට වටහාගත හැකි ආකාරට ඉදිරිපත් කරන සාහිත්‍යයකි. උපමා අසන්නන් තම ස්ව-චින්තනය තුළින් අවසන් තීරණයක් ගත හැකි ආකාරයේ ස්වභාවයකින් යුක්තවේ.

ඒවා, අසන්නන්ගේ මානසික තත්ත්වය වෙනස්වීමට හේතුවේ. (ලූක් 10:25-37, 15:11-32). මේවා සමහර විට දීර්ඝ කථා ආකාරයට සැකසී ඇත. මතෙව් 13 වන පරිච්ඡේදයේ ඇති වපුරන්නාගේ උපමාව තුළින් ගොවිබිමෙහි සිදුවීම උපමේයයක් කොට දක්වයි. මේවායින් එළිදැක්වෙන පණිවුඩය විවෘත පණිවුඩයක් වේ. අබ ඇටය, මුහුන්, නිධානය, මුතු ඇටය, දැල වැනි උපමා ඉතා කුඩා හෙවත් සරළ උපමා රූපක වේ. නමුත් ඒවායින් ලැබෙන පණිවුඩය සැඟවී ඇත. ඒවා පිළිබඳ ව සිතා, ගැඹුරින් අවබෝධ කරගතයුතු සත්‍යතාවන් එහි ගැබ් වී ඇත.

#### 4.2.2.2 දේවරාජ්‍යයේ ස්වභාවය පිළිබඳ උපමා (මතෙව් 13:31-50)

දේව රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ ව විවිධ උපමා මගින් ජේසුස් වහන්සේ වටහාදීමට උත්සහ කළ සේක.

(අ) අබ ඇටයේ උපමාව
(ආ) මුහුන් පිළිබඳ උපමාව
(ඉ) නිධානය
(ඊ) මුතු ඇටය
(උ) දැල

(අ) අබ ඇටය පිළිබඳ උපමාව

අබ ඇටය ධාන්‍යයන් අතුරින් ඉතා කුඩා ධාන්‍ය වර්ගය කි. නමුත් එය වැවෙන විට අනෙකුත් ගස් අතුරින් කුඩා ගසකි. එය අඩි දොළසක් උසැති ගසකි. කුඹුරුවල වැවෙන මෙම ගසේ අතුපතර කුරුල්ලන් කැදලි තනා ලැගුම් ගතහැකි ආකාරයේ ගසකි. මෙම ස්වභාවික සිද්ධිය උපමාවක් කර, දේව රාජ්‍යයේ ස්වභාවය ජේසුස් වහන්සේ පෙන්වා දෙන සේක.

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් හා ප්‍රාතිහාර්යයන් දැක මහා ජනකායක් ඔවුන් වහන්සේ ව අනුගමනය කරතැයි ශ්‍රාවකයෝ බලාපොරොත්තු වූහ. නමුත් කාලයාගේ ඇවෑමෙන් ජේසුස් වහන්සේට විරුද්ධව බොහෝ දෙනෙක් විරෝධය පෑහ. විශාල පිරිසක් ඔවුන් වහන්සේගෙන් වෙන්ව ගිය හ. ශ්‍රාවකයින් ද මේ නිසා සැලුන හ. මෙම අවස්ථාවේ ජේසුස් වහන්සේ දේව රාජ්‍යය අබ ගස මෙන් සෙමින් සෙමින් වර්ධනය වන බව මෙම උපමාව තුළින් ඉගැන් වූ සේක. නමුත් විශාල ගසක් සොයා නානා විධ පක්ෂීන් පැමිණ ලැගුම් ගන්නා ආකාරයට, දේව රාජ්‍යයේ ද විවිධ පුද්ගලයන් පංගුකාරයන් වන බවත්, ප්‍රයෝජන ලබන බවත් ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට පවසා ඔවුන්ගේ විශ්වාසය වර්ධනය කරන සේක.

(ආ) මුහුන් පිළිබඳ උපමාව

ජේසුස් වහන්සේගේ ක්‍රියා හා ඔවුන් වහන්සේට ජනතාව අතර තිබූ ගෞරවය දුටු විට, ජේසුස් වහන්සේ ඉශ්‍රායෙලයේ රාජ්‍ය පාලනය කරතැ යි බොහෝ දෙනෙක් විශ්වාස කළ හ. නමුත් ජේසුස් වහන්සේ ඔවුනට දේව රාජ්‍යයේ ස්වභාවය, ගෘහණියකගේ මුළුතැන් ගෙයක ක්‍රියාකාරකමකට සමාන කර පහදා දෙන සේක. ස්ත්‍රියක් විසින් පිටි නැළි තුනක් සහමුලින් ද පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට ස්වර්ග රාජ්‍යය සමාන කළ සේක.

(ඉ) නිධානය පිළිබඳ උපමාව

නිධානය සෙවීම ජුදා සමාජයේ සිදු වූ සාමාන්‍ය සිදුවීමක් විය. ඉශ්‍රායෙල්වරු තම අසල්වැසි රටවල් සමග බොහෝ අවස්ථාවල යුද්ධ කළ හ. යුදමය අවස්ථාවල ජනතාව අස්ථානගත වන විට, තම වස්තුව ගොවිබිම්වල වළලා ගියහ. ඉන්පසු නැවත තම මව්බිමට පැමිණෙන ඔවුන්ගේ පරම්පරාව, එම ගොවිබිම්වල පදිංචි වී, ගොවිතැන් කරමින් සිටින විට, බලාපොරොත්තු නොවන ආකාරයට එම වස්තුව සොයාගත් හ. නිධානය දුටු අය වහා ක්‍රියාත්මක වී තමන් සතු සියල්ල විකුණා, එම බිම තමන් සතු කරගත් හ.

ජුදා සමාජයේ දැකිය හැකි වූ මෙම සිරිත ජේසුස් වහන්සේ උපමාවක් කරගනිමින්, දේව රාජ්‍යය ද වළලනු ලැබූ නිධානයක් ලෙස ඔවුන් අතර පවතින බවත්, එය සොයා ගැනීම සියල්ලට ම වඩා වැදගත් බවත් පවසන සේක. ඒ කිම්දයත් දේව රාජ්‍යය මිළ මුදල් වලින් වටිනාකමක් දිය නො හැකි ස්වභාවයෙන් යුක්ත නිසා ය.

(ඊ) මුතු ඇටය පිළිබඳ උපමාව

මුතු ඉතා වටිනා භාණ්ඩයකි. මුතු අතරිනුත් මිල අධික මුතු වර්ග ඇත. ව්‍යාපාරිකයින් මුතු අතුරින් මිළ අධික මුතු සොයා වෙහෙසෙති. තමන් සතු සියලුම මුතුවලට වඩා එය සොයති. එය ලබා ගැනීම සඳහා තමන් සතුව ඇති වටිනාකමින් අඩු මුතු අතහැරීමට සූදානමින් සිටිති.

ජුදා වෙළඳපොලේ සිදුවන මෙම සිදුවීම ජේසුස් වහන්සේ උපමාවක් කර ගනිමින්, ඔවුන් අතර පවතින දේව රාජ්‍යය සොයා ලබා ගත යුතු බව පවසන සේක. එය සොයා ලබා ගැනීමට පරිත්‍යාගයන්, අත්හැරීම් හා කැපවීම් ආදිය ද අවශ්‍ය බව පවසන සේක.

**(උ) දැල පිළිබඳ උපමාව**

ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින්ගෙන් බොහෝ දෙනෙක් ධීවරයින් වූහ. ජේසුස් වහන්සේ මුහුදේ දැල් හෙලා මාලු ඇල්ලීමට සමාන කරමින් දේව රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ ව පහදා දෙන සේක. මුහුදේ හෙලන ලද දැල සියලුම මාලුන් හා අනෙකුත් දේවල් දැලට හසුකර ගනියි. දැල පිරුණු කල ධීවරයෝ එය වෙරළට ඇද ගනිමින්, වෙරළ අද්දර වාඩි වී, හොඳ මසුන් භාජනවලට එකතු කරගනිමින් නරක මසුන් ඉවත දැමූ හ.

දැලට අසුවූ මාලුන් ලෙස, තෝරා ගනු ලැබූ ඉශ්‍රායෙල් ජනතාව පමණක් නොව, විශ්වයේ සියලුම දෙනා දේව රාජ්‍යයේ සාමාජිකයෝ වෙති. ඒ කිම්දයත්,''උන්වහන්සේ (දෙවියන් වහන්සේ) දුදනන් හට හා සුදනන් හට තම හිරු එළිය උදා කරවන සේක. දැමිටුන් හා අදැමිටුන් හට වැසි වස්වන සේක.'' (මතෙව් 5:45) දෙවියන් වහන්සේගේ මෙම සාධාරණ ප්‍රේමයත්, යහපත්කමත් සියල්ලන්ට ම අයත් ය. නමුත් එය හඳුනාගෙන ජීවත් වන්නන් කවුද? එය තීරණය කිරීමටත්, විනිශ්චය කිරීමටත් අපට ඇති අයිතිය කුමක් ද? එය දෙවියන් වහන්සේ ම දෙන සේක. ඒ දක්වා දේව රාජ්‍යය යන දෙවියන් වහන්සේගේ දයානුකම්පාව, යුක්තිය හා සාමය යනාදිය ජනතාව අතර දැකිය හැකි බව ජේසුස් වහන්සේ පවසන සේක.

**4.2.3. දේව රාජ්‍යයේ සංකේතයන් වන ප්‍රාතිහාර්යයන්**

**4.2.3.1 ප්‍රාතිහාර්යයන් හැඳින්වීම**

එදා සමාජය තුළ, ජේසුස් වහන්සේ විවිධ රෝගනිසා පීඩා විඳින්නන් මුණ ගැසුණු සේක. (මාක් 1:34). ඒවා පාපවල ප්‍රතිඵල ලෙසත්, දේව දඬුවම් ලෙසත් අර්ථකථනය කරන ලදී. මෙම චෝදනාවලට ලක්වූවන් මානසික් රෝගීන් වූහ. මොවුන්ගෙන් සමහරෙක් අශුද්ධාත්මයන් ආවේශ වූවන් යැයි සලකා, විවිධ වදහිංසාවලට ලක්වූහ.

රෝගීන් සුව කිරීම හා අශුද්ධාත්මයන් පළවා හැරීම, ජේසුස් වහන්සේගේ ප්‍රධාන සේවාවන් විය. පාපය සියලු ම රෝගවලට හේතුව යන අදහස ජේසුස් වහන්සේ වෙනස් කළ සේක. (ජොහාන් 9:3)ඃ රෝගීවූවන් අපවිත්‍ර වූවන් යන අදහස් වෙනස් කිරීමේ අරමුණින් ඔවුන් ස්පර්ශ කළ සේක. (මාක් 1:31, 6:56)ඃ ඔවුන් සුව කළ සේක. (මතෙව් 4:24ඃ මාක් 3:10). ජේසුස් වහන්සේ ඔවුන් කෙරෙහි වූ දයානුකම්පාව නිසා මේවා සිදු කළ සේක.(මාක් 1:41)

ජේසුස් වහන්සේ ගේ කාලයේ නායක පූජකවරුන් විසින් ප්‍රාතිහාර්යයන් කරන ලදී. ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් කරන විට, අශුද්ධාත්මයන්ගේ නායකයා වූ බෙල්සෙබුල්ගේ බලයෙන් ප්‍රාතිහාර්යයන් කරනු ලබන බවට ඔවුහු චෝදනා නැගු හ. නමුත් ජේසුස් වහන්සේ දේව බලයෙන්, දේවරාජ්‍යය අසන්න බවට සලකුණක් ලෙස ඒවා සිදු කළ සේක. දේව බලය ප්‍රකාශ කිරීමටත්, දේව ප්‍රශංසාව උදෙසාත් ජේසුස් වහන්සේ මෙම ප්‍රාතිහාර්යයන් සිදු කළ සේක. ප්‍රාතිහාර්යයන් කිරීමට පෙර ජේසුස් වහන්සේ යාච්ඤා කළ සේක.

ස්වර්ගයෙන් හාස්කම් ඉල්ලන්නන්ට එය නො ලැබෙන බව, ජේසුස් වහන්සේ තරයේ පැවසූ සේක. (මාක් 8:11-13, 15:31-32) ඒ වෙනුවට, ඔවුන්වහන්සේගේ සේවය තුළින් මිහිපිට දේව රාජ්‍යය ගොඩනැගී ඇති බවට ඒවා සාක්ෂි වේ. ''එහෙත් මම දෙවියන් වහන්සේගේ අනුහසින් යක්ෂයක් දුරු කරම් නම්, සැබැවින් ම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙහි උදා වී ඇත.'' (ලූක් 11:20)

ප්‍රාතිහාර්යයන් ඔවුන් වහන්සේ වදාළ දේව රාජ්‍යයේ පණිවුඩයේ විශ්වාසවන්තකමේ සංකේතයන් වේ. ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් මගින් දේව දයාව ප්‍රකාශකරන සේක. ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් දේව විශ්වාසය පදනම් කොට ගෙන කරන ලද ඒවා ය. එනම් සුව වීමට ඇදහිල්ල අවශ්‍ය බව ජේසුස් වහන්සේ තරයේ ප්‍රකාශ කළ සේක. (මාක් 5:36, 10:52). ඇදහිල්ල නොමැති අයට ප්‍රාතිහාර්ය කිරීමට ජේසුස් වහන්සේට නොහැකි විය.(මාක් 6:5, මතෙව් 13:38)

ඇහිල්ල යනු දෙවියන් වහන්සේ අප සමග වැඩ සිටින සේක. ඔවුන් වහන්සේගේ ප්‍රේමය හා වරප්‍රසාද අප සමඟ පවතී, අපට ජීවිතය දෙයි. අපගේ සුවය හා පූර්ණත්වය එතුමන්ගේ සැලැස්ම යි යන සත්‍යතාවයි. මෙම විශ්වාසය ජේසුස් වහන්සේ යක්ෂාවේශ වූවන්, රෝගීන් යන අයගේ සිත් හි ඇති කළ සේක. එබැවින් ඔවුහු සුවය ලැබූ හ. මෙලෙස මිනිසාගේ පූර්ණ ශාරීරික, මානසික සුවය දේව රාජ්‍යයේ වැදගත් පරිමාණයක් යැයි ජේසුස් වහන්සේ පෙන්වා දුන් සේක.

ප්‍රාතිහාර්යයන් දිළිඳු අසරණ ජනතාව අධික ලෙස ඇද ගැනීමට හේතුවිය හැක. දීර්ඝ දේශනාවන් වලට වඩා, ජේසුස් වහන්සේ කළ පුදුම ක්‍රියා සාමාන්‍ය ජනතාවගේ සිත් ගැඹුරින් ඇද ගන්නට ඇත. සුභාරංචිය ජනතාව පහසුවෙන් පිළිගැනීමට ප්‍රාතිහාර්යයන් ඉවහල් විය.

ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් වර්ග 04 කට බෙදිය හැක. ඒවා නම්,

(අ) අශුද්ධාත්මයන් පළවා හැරීම (මාක 5:1-20)

(ආ) ස්වභාව ධර්මය හා සබැඳි ප්‍රාතිහාර්යයන් (මාක් 6:30-44)

(ඉ) රෝගීන් සුව කිරීම (ලූක් 7:1-10)

(ඊ) මළවුන් නැගිටුවීම (වැන්දඹු ස්ත්‍රියගේ පුතා ලූක් 7:11-17) යනාදිය යි.

**(අ) අශුද්ධාත්මයන් පළවා හැරීම (මාක 5:1-20)**

ගෙරසීන් රටේ අශුද්ධාත්ම ආවේශ වූ කෙනෙකු ජේසුස් වහන්සේ සුව කළ සේක. ජේසුස් වහන්සේ ඔහුගේ මානසික රෝගය සුව කරන සේක. ඔහු විවිධ ශාරීරික වද හිංසා වලට ලක් වී සිටියේ ය. අවසාන දිනයේ අශුද්ධාත්මයන්ගේ බලය හීන වන බව ජුදයින්ගේ විශ්වාසය යි. එනමුත් ජේසුස් වහන්සේට අශුද්ධාත්මයන් මෙල්ලවේ: අශුද්ධාත්මයන්ට ස්ථානයක් නොමැති බව තහවුරු කෙරේ. අශුද්ධාත්ම ආවේශ වූ තැනැත්තා ජේසුස් වහන්සේ ඉදිරියේ බැගෑපත්ව ඉල්ලීම තුළින් මේ බව තහවුරු වේ.

සුව වූ තැනැත්තා තමන් ද ජේසුස් වහන්සේ සමග සිටීමට අවසර ඉල්ලා ආයාචනා කළේ ය. ඔවුන් වහන්සේ එයට අවසර නොදුන් සේක. '' එහෙත්, ඔබ ගෙදර නෑ මිතුරන් වෙත ගොස්,

ස්වාමීන් වහන්සේ ඔබට කොතරම් මහත් දේ කළ සේක් ද, කොතරම් අනුකම්පාව පෙන් වූ සේක් ද ඔවුන්ට දන්වන්නැ''යි වදාළ සේක. ඔහු ද ගොස් ජේසුස් වහන්සේ කළ දෑ තම ගම්වැසියන්ට ප්‍රසිද්ධ කළේ ය.

ජේසුස් වහන්සේගේ මෙම ක්‍රියාව නිසා සුවය ලැබූ තැනැත්තා, නැවත තම නෑ හිතමිතුරන් සමග එක් විය. තවද ඔහු දේව රාජ්‍යය ප්‍රකාශ කරන ශ්‍රාවක පවුලකට අයත්, අන්‍ය ජාතික සමාජයක සමාජිකයෙකි.

**(ආ) ස්වභාව ධර්මය හා සබැඳි ප්‍රාතිහාර්යයන් (මාක් 6:30-44)**

ස්වභාව ධර්මය හා සබැඳි ප්‍රාතිහාර්යයන්, ජේසුස් වහන්සේගේ උත්ථානය තුළින් ඇති වූ විශ්වාසයේ ප්‍රතිපලයක් වූ මුල් කිතුනු සභාව තුළ සිදු වූ ඒවා ය. උපත විපත, මුහුදේ චණ්ඩ මාරුතය හා නිහැඬියාව වැනි දෑ ස්වභාවික ක්‍රියාකාරකම් ය. නමුත් ස්වභාවික ක්‍රියාකාරකම් ද දෙවියන් වහන්සේගේ අණට කීකරුව සිදුවේ. උත්ථාන වූ ජේසුස් වහන්සේ දේව ස්වභාවය ඇති තැනැන්වහන්සේ කෙනෙකු විය. එතුමාණන් දේව ස්වරූපයෙන් වැජඹුණ සේකැ යි, විශ්වාස කළ මුල් කිතුනුවන්, එතුමන් හට ස්වභාව ධර්මයාත් කීකරු වන බව පවසති. එතුමන් ගේ දේවත්වය ප්‍රකාශ කරති.

මළවුන් නැගිටුවීම, සුළඟ සහ මුහුද මෙල්ල කිරීම, වතුර වයින් බවට හැරවීම යනාදිය ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යයන් ය. මේවා තුළින් ජේසුස් වහන්සේ ගේ දේවත්වය ප්‍රකාශවේ. මේ අතර, ජේසුස් වහන්සේ පන්දහසකට කෑම දීමේ ප්‍රාතිහාර්යය ද අඩංගුවේ. මෙම සිදුවීම සියලුම සුවිශේෂවල දැකිය හැක. මේ මගින් දේව රාජ්‍යය සියලුම ජනතාව පිළිගන්න හා රැකවරණය ලබාදෙන ස්වභාවයෙන් යුක්ත වන බව ප්‍රකාශවේ.

**පන්දහසකට කෑම දීම (මාක් 6:30-44)**

ජේසුස් වහන්සේ හුදකලා ස්ථානයක තම ශ්‍රාවකයන් සමග සිටි අවස්ථාවේ දී, එතුමන් සොයා මහ ජනකායක් පැමිණිය හ. එඬේරෙකු නැති බැටළුවන් වැනි ඔවුන්ගේ අනුකම්පා කළ සේක. ජනතා ව කෙසේ එඬේරෙකු නැති තත්ත්වයකට පත්වූවෝ දැයි එසකියෙල් දිවැසිවරයා පවසයි. (34 පරිච්ඡේදය). දෙවියන් වහන්සේ ජනතාවට එඬේරෙකු ලෙස මඟ පෙන්වන සේක. ඔවුන් ජීවත් කරවන සේක යන්න එසකියෙල් දිවැසිවරයාගේ කියමනයි. පාඨකරයේ ජේසුස් වහන්සේ මෙම ජනතාව සමඟ සිටීම දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම ගෙනහැර දක්වයි.

ජේසුස් වහන්සේ ඔවුනට මසුන් දෙදෙනෙකු සහ රොටි පහක් ගෙන ස්වර්ගය දෙස බලා, ආශිර්වාදය පවසා රොටි කඩා දුන් සේක. සියලු දෙනා ම කා තෘප්තියට පැමිණ ඉතිරි කෑම කූඩා දොළසකට රැස්කර ගත් හ. මෙම සිද්ධිය දේව රාජ්‍යය පරිපූර්ණය යන්න පෙන්වා දෙයි. ස්වර්ගීය ජීවිතය යනු මෙසියස්තුමන්ගේ නායකත්වයෙන් දෙවියන් වහන්සේ ලබාදෙන, සංග්‍රහයකට සමානවන බව, ජුදා ආගමික විශ්වාසයයි.

**(ඉ) රෝගීන් සුව කිරීම (ලූක් 7:1-10)**

ජේසුස් වහන්සේ රෝගීව සිටි ජුදා නොවන්නනන්ව ද සුවපත් කළ සේක. ජේසුස් වහන්සේ සුව කළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් එක්කෙනෙක් සමාරියයෙක් විය.(ලූක් 17:11-19) කානානීය ජාතික ස්ත්‍රියගේ ඇදහිල්ලට ප්‍රශංසා කර, ඇයගේ දියණියට ආවේශ වූ අශුද්ධාත්මය පළවා හැරිය

සේක. (මාක් 7: 24-30) මෙලෙස ජුදයින් විසින් අන්‍ය ජාතිකයන් යැයි සලකන ලද, සමාරිය, කානානීය හා රෝමවරුන් ජේසුස් වහන්සේ වෙතට පැමිණ, සුව කරන ලෙස ඉල්ලූ විට, ඔවුන්ගේ විශ්වාසය දැක පුදුමයට පත් වී, ඔවුන් ඉල්ලන දෑ ලැබෙන බව තහවුරු කරන සේක.

ජේසුස් වහන්සේ ශතාධිපතියෙකුගේ සේවකයාට සුවය ලබා දෙන සේක. එම සේවකයා මරණ අවස්ථාවේ පසුවූවෙකි. ශතාධිපතියා රෝම ජාතිකයෙකි. ජුදයින් රෝමවරුන් හෙළා දුටුහ. එවැන්නෙක් ජේසුස් වහන්සේ සොයාවිත්, තම විශ්වාසය ප්‍රකාශ කරයි. ජේසුස් වහන්සේට වචන මාත්‍රයක් පමණක් පවසන ලෙසත්, එවිට ඔහුගේ දාසයා සුව වන බවත්, අයැදී ය. ජුදයින් අන්‍ය ජාතිකයින් සිටින ස්ථානවලට නොයති. ජේසුස් වහන්සේ පුදුමයට පත්වී ඔහුගේ ශ්‍රද්ධාව පිළිබඳ ප්‍රශංසා කරන සේක. ඔහුගේ දාසයා ජේසුස් වහන්සේ සුවපත් කරන සේක.

දේව දයාව තෝරාගනු ලැබූ ඉශ්‍රායෙල් ජනතාවට පමණක් අයිති නැත යන්න ජේසුස් වහන්සේ ගේ මෙම සුවකිරීම් තුළින් පෙන්නුම් කෙරේ. තවද ජේසුස් වහන්සේගේ සුවකිරීම්, ඔවුන්වහන්සේගේ මානුෂිකත්වයේ ක්‍රියාකාරකම් ය. ඒවා මිනිස් වටිනාකම් සුරකින, ගරු කරන ක්‍රියාවන් ය.

**(ඊ) මළවුන් නැගිටුවීම (වැන්දඹු ස්ත්‍රියගේ පුතා ලූක් 7:11-17)**

එදා ජුදා සමාජයේ ස්ත්‍රීන් කොන්කරනු ලැබූ හ. ස්ත්‍රීන් පිළිබඳව පහත් මට්ටමකින් සිතූ හා කතා කළ පරිසරයක, ජේසුස් වහන්සේ දේව ජනතාව අතර, ස්ත්‍රීන් හා පුරුෂයින් සමාන බව තහවුරු කරන සේක. ඔවුන් පිළිබඳ ව උසස් අන්දමින් කතා කළ සේක. (ලූක් 7:11-17) විශේෂයෙන් පව්ටු අඟන ට හා කාම මිථ්‍යාචාරයේ යෙදී සිටිය දී හසු වූ පව්කාර ස්ත්‍රියට අනුකම්පා කළ සේක. (ලූක්7:36-50, ජොහාන් 8:3-11) තමන් ව ජනකාය අතරට පැමිණ, ඔවුන්වහන්සේගේ වස්ත්‍රය ස්පර්ශ කළ කළ මහ ලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රිය සුවවීම ප්‍රසිද්ධ කිරීම තුළින්, ස්ත්‍රීන් අපවිත්‍රය යන සිතුවිල්ල වෙනස් කළ සේක. (මාක් 5:25-34) දිළිඳු වැන්දඹුවගේ පඬුරට ප්‍රශංසා කළ සේක. (ලූක් 21:1-4) එතුමන්ගේ පාද වලට සුවඳ විලවුන් ආලේප කර, තම කෙස් කළඹින් පිසදැමූ ස්ත්‍රියගේ ක්‍රියාව පිළිගත් සේක. (මතෙව් 12:3-8) කාන්තාවන්ට ද තම ශ්‍රාවකයන් ලෙස, ගමින් ගමට ගොස්, සේවය කිරීමේ අවස්ථාව ලබාදුන් සේක.

කාන්තාවන් සම තත්ත්වයෙන් සැලකූ ජේසුස් වහන්සේ තම, එකම පුත්‍රයාව අහිමි කරගත් නායින් නුවර වැන්දඹුව කෙරෙහි අනුකම්පා කොට, ඇයගේ පුත් මළවුන්ගෙන් නැගිටුවූ සේක. මෙම සිද්ධිය එළියා දිවැසිවරයා සරෙජතා නුවර වන්දඹුවගේ පුතා මළවුන් නැගිටුවීමේ සිද්ධියට සමාන ය.

ජේසුස් වහන්සේ නායින් නුවර වැන්දඹුවගේ පුතා මරණින් නැගිටුවනු ලැබූ සිද්ධිය දුටු ජනතාව,'' ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටියි. දෙවියන් වහන්සේ සිය සෙනඟ ගලවන්නට වැඩිය සේකැ'' යි කියමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ හ. (ලූක් 7:16) ඒ මන්දයත් ඉශ්‍රායෙල් ජනතාව අතර, එළියා දිවැසිවරයා නැවත පැමිණෙන බවට විශ්වාසයක් විය. ජේසුස් වහන්සේගේ මෙම ප්‍රාතිහාර්යය නිසා දේවරාජ්‍යය පැමිණ ඇති බව ප්‍රකාශ විය. දේව රාජ්‍යයේ පූර්ණත්වය හා මහිමය ප්‍රකාශ විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ දේව රාජ්‍යයේ ගුණාංග ලැයිස්තු ගත කර, ඒවා සමාන අයිතිවාසිකම් හා සහෝදරත්වයෙන් හෙබි සමාජයක් ගොඩනැගීමට පදනම වීමේ අවශ්‍යතාවය පහදයි.
2. කන්ද උඩ දේශනාවේ ඉගැන්වීම් ලැයිස්තුගත කර, ඒවා කිතුනු මානසිකත්වය ගොඩනගා ගැනීමට මූලික වශයෙන් අවශ්‍ය වන බව ප්‍රකාශ කරයි.
3. ජේසුස් වහන්සේ සමකාලීන සමාජයෙන් වෙන්වූ කෙනෙකු ලෙස සිටි බව පිළිගෙන තමන් ද සමකාලීන පරිසරය තුළ ජේසුස් වහන්සේව අනුගමනය කිරීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කරයි.
4. ජේසුස් වහන්සේගේ උපමා තුළින් ගෙනහැර දක්වන සත්‍යතා ලැයිස්තු ගත කර, ඒවා වර්තමාන සමාජයටත් ඔබින ආකාරයට ඉදිරිපත් කරයි.

නිපුණතාව 4.0 : ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම 4.3 :** ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය තුළින් ඔවුන් වහන්සේ ඇති කළ ආගමික හා සාමාජීයීය පුනරුදය තමන් සතු කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 24

**ඉගෙනුම් පල :**

- පාස්කු අභිරහස පිළිබඳ තොරතුරු රැස් කරයි.
- ජේසුස් වහන්සේගේ දුක්විඳිම, මරණය හා උත්ථානය තුළින් නව ජීවිතයක් ලැබුණු බව පිළිගනියි.
- දුක්විඳිම, මරණය හා උත්ථානය පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සුබාරංචිය එදිනෙදා ජීවිතය තුළ උපයෝගී කර ගනියි.
- කණ්ඩායම තුළ සහයෝගයෙන් ක්‍රියාකාරකම් වල යෙදෙයි.

**විෂය අන්තර්ගතය**

4.3.1 **ජේසුස් වහන්සේගේ දුක්විඳිම,මරණය හා උත්ථානය**

ජේසුස් වහන්සේගේ දුක්විඳිම, මරණය හා උත්ථානය ඔවුන් වහන්සේගේ දේවරාජ්‍යය සඳහා වන ජීවිතයේ උච්චතම සිදුවීම යි. සුවිශේෂ සතර තුළ ම මෙම සිදුවීමට වැදගත් තැනක් ලැබේ. (මතෙව්:26-27, මාක් 14-15, ලූක් 22-23, ජොහාන් 18-19). මෙම සුවිශේෂ සතරෙහි ම, ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබීම, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ සිටීම, පිලාත් ඉදිරියට ගෙනයාම, කුරුසියේ ඇණ ගැසීම, ජේසුස් වහන්සේ උකුත්වීම හා උත්ථානවීම යනාදී අනුක්‍රමයෙන් ජේසුස් වහන්සේගේ දුක්විඳිම, මරණය හා උත්ථානය යන සිදුවීම් පෙළ ගස්වා ඇත. මුල් කිතුනු සම්ප්‍රදායට අනුව, මෙම සිදුවීම් වැදගත් තැනක් උසුලන බව මින් පෙන්වා දෙයි.

ශුද්ධවූ මතෙව්තුමනට ජේසුස් වහන්සේ ගේ දුක්විඳිම හා මරණය ඔවුන් වහන්සේගේ ගැලවීමේ ප්‍රත්‍යක්ෂය වේ. ශුද්ධවූ මාක්තුමන්ට එම සිදුවීම් ජේසුස් වහන්සේ අන්ධකාරය ජයග්‍රහණය කිරීමේ සංකේතයන් ය. ශුද්ධවූ ලූක්තුමන්ට කුරුසියේ මරණය දුක්විඳීමේ ප්‍රකාශය යි. ශුද්ධවූ ජොහාන්තුමන් ට කුරුසියේ මරණය ජේසුස් වහන්සේගේ ආදරයේ උතුම් ම ක්‍රියාව හා දේව රාජ්‍යයේ ප්‍රකාශනය යි.

ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය ඔවුන් වහන්සේ මෙලොව ජීවිතය පසුකර, තම පියාණන් වහන්සේ වන දෙවිසමිඳුන් වෙතට යාමේ සිදුවීම යි. මේවා පාස්කු අභිරහසේ සිදුවීම් මාලාව යි. අපෝස්තුළුවරුන්ගේ මුල්කාලීන ඉගැන්වීම් වල කේන්ද්‍රගත සිද්ධීන් ලෙස මේවා පැවතුණි. ''ඉශ්රායෙල් ජනයෙනි.... නාසරෙත්හි ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් තෝරාපත් කළ මනුෂ්‍යයෙකි. ඒ බව දෙවියන් වහන්සේ උන්වහන්සේ මගින් ඔබ අතර කළ ප්‍රබල ක්‍රියාවලින් ද, අරුමපුදුම දේවලින් ද ලකුණුවලින් ද, පෙන්වූ සේක.... ඔබ අදමිටු මිනිසුන්

ලවා, උන් වහන්සේ කුරුසියේ ඇණ ගස්වා මරා දැමුවහු ය. එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන් උන් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක. (ක්‍රියා 2: 22-24)

ජේසුස් වහන්සේට තමන් වහන්සේගේ මරණය, බොහෝදෙනාගේ ගැළවීම සඳහා වන වරප්‍රසාදයක් විය. '' මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ ...... බොහෝ දෙනෙකුගේ මිදීම පිණිස සිය දිවි පිදීමටත් ය''.(මතෙව් 20:28) ජේසුස් වහන්සේ ට තම මරණය, පියාණන් වහන්සේ තමන් කෙරෙහි දක්වන ආදරයට කරන පිදීමකි. (ජොහාන් 10:17-18). '' යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත.'' (ජොහාන් 15:13) යැයි පැවසූ ජේසුස් වහන්සේ ට, තම මරණය තමන්ගේ මිතුදහම වෙනුවෙන් ගෙවූ වන්දියක් විය.

ජේසුස් වහන්සේ තමන් වහන්සේ ගේ දුක්විඳිම, මරණය හා උත්ථානය පිළිබඳ ව තෙවරක් තම ශ්‍රාවකයින් ට ප්‍රකාශ කළ සේක. (මාක් 8: 31, 9: 31, 10: 33) දිවැසිවරුන් මෙන් තමන් ද මරණයට සූදානම් වියයුතු බව පැවසූ සේක. (මතෙව් 23:29-37, ක්‍රියා 7:52). ජේසුස් වහන්සේ තම සේවය ආරම්භ කළ මුල් කාලයේදී ම, ස්නාවක ජොහාන්තුමා සිරභාරයට ගනු ලැබ, මරනු ලැබී ය. (මාක් 6:14-29).

තවද, ජේසුස් වහන්සේගේ ධර්මදූත ජීවිතය ආරම්භයේ දී ම ඔවුන් වහන්සේට විරෝධතා, ප්‍රතික්ෂේප කිරීම් ඇති වූ බව ශුද්ධවූ මාක් සුවිශේෂය අපට පවසයි. පරිසිවරුන් හෙරෝදියයන් සමග එක් වී එතුමන්ට විරුද්ධ ව කුමන්ත්‍රණ කළ හ. (මාක් 3:6) ජේසුස් වහන්සේ දේව මාලිගාව පවිත්‍ර කළ පසු, නායක පූජකවරුන් ද විනයධරයෝ ද උන්වහන්සේ නසා දැමීමට මඟක් සෙවූ හ (මාක් 11:18-19). මේවා ද ජේසුස් වහන්සේ ගේ දුක්විඳීමේ ආරම්භය වේ.

ජේසුස් වහන්සේගේ ජීවිතය සේවාව, දුක්විඳීම හා මරණය යන මේවාට අර්ථයක් ලබා දෙනුයේ ඔවුන් වහන්සේ ගේ උත්ථානය යි. ශ්‍රාවකයෝ උත්ථානයේ අත්දැකීමේ ආලෝකයෙන් ජේසුස් වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම්, ක්‍රියා, දුක්විඳීම හා මරණයේ පූර්ණත්වය දුට හ (ක්‍රියා 2:2). ඉශ්රායෙල් ජනතාව බලාපොරොත්තු වූ වරප්‍රසාදයෙන් පූර්ණ වූ මෙසියස් ජේසුස් වහන්සේ යැයි විශ්වාස කළ හ (1 සාමුවෙල් 2:10). කව්ද? ජේසුස් වහන්සේ දෙවියන්වහන්සේ යැයි මොර ගැසූ හ (මාක් 15:39ආ, ජොහාන් 20:31).

**4.3.2 මරණය හා පුනර්ජ්ජීවනය ගැන කලින් කීම (මාක් 8:31-38)**

''දේව පුත්‍ර ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබ අස්නේ ආරම්භය මෙය ය''(මාක් 1:1) යැයි ආරම්භ වන මාක් සුබාරංචියේ ජේසුස් වහන්සේ ගේ දුක්විඳිම, මරණය හා උත්ථානය පිළිබඳ පෙර දැන්වීම් තුනක් දී ඇත. ඒ මන්දයත්,

මුල් කිතුනුවන් ජේසුස් වහන්සේව තේජාන්විත ව දේශනාකර බොහෝ ප්‍රාතිහාර්යයන් කළ, ජයග්‍රාහයෙක් යැයි සිතා, පිළිගෙන ඔවුන් වහන්සේ ව අනුගමනය කළ හ. එතුමන් මහිමාන්විත ව, සුරදූතයින් පිරිවරාගෙන නැවත පැමිණෙතැයි බලාපොරොත්තුවෙන් සිටිය හ. මෙම කාලවකවානුවේ ක්‍රි.ව. 64 දී රෝම අධිරාජ්‍යයේ නීරෝ රජ විසින් දියත් කළ ආගමික පීඩනය ආරම්භ විය. මෙම පීඩන සමයේ දී ඇති වූ පීඩා නිසා, ඔවුන් ස්ථිර ව, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි වූ විශ්වාසය තුළ ජීවත් කරවීමට පෙළඹවිය යුතු විය.

පුදුම ක්‍රියා කර, තේජාන්විත ව දේශනා කළ මෙසියස්තුමන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ, පරිසිවරුන්, විනයධරයන් හා නායක පූජකවරුන් මගින් චෝදනා කරනු ලැබ, වද හිංසාවලට ලක්කරනු ලදුව, කුරුසියේ ඇණ ගසනු ලැබ දුක් විඳ උකුත් වූයේ මෙසියස් වහන්සේ බව ඔවුනට දන්වා, මාක්තුමන් ආගමික පුරුදයක් ඇති කළේ ය.

ජේසුස් වහන්සේ දුක්විඳින මෙසියස්තුමන් බව දැන්වීමට, තමන් වහන්සේ කළ ප්‍රාතිහාර්යයන් අන් අයට නොදන්වන ලෙස වැළැක්වූ සේක යි යන පණිවුඩය සුවිශේෂක කතුවරුන් විසින් ගෙන හැර දක්වන ලදී.

දෙවි පියාණන්ගේ කැමැත්ත පමණක් පූර්ණත්වයට පත් කරමින් ජීවත් වූ, දේශනා කළ, ප්‍රාතිහාර්යයන් කළ ජේසුස් වහන්සේ මෙසියස් බව පේදුරුතුමාගේ ප්‍රකාශ තුළින් පිළිඹිබුවේ. ගලීලයේ ජනතාව ප්‍රතික්ෂේප කරනු ලැබ, පරිසිවරුන් ගේ කුමන්ත්‍රණ වලට මුහුණ දුන් ජේසුස් වහන්සේගේ සේවය පේදුතුමාගේ ප්‍රකාශය සමග පූර්ණත්වයට පත් විය. මෙම අවස්ථාවේ ජේසුස් වහන්සේ ගේ දුක් විඳීම, මරණය හා උත්ථානය පිළිබඳ ව පෙර දැනුම්දීමක් සිදු විය. (මාක්ඃ 1:14-8:30)

ගලීලය අතහැර පිටත් වූ ජේසුස් වහන්සේ ජෙරුසලම වෙත තම ගමන ඇරඹූ සේක. මෙම ගමනේ දී ශ්‍රාවකයින් තමන් වහන්සේ ව වටහා නොගත් අවස්ථාවක, තම දුක් විඳීම පිළිබඳ ප්‍රකාශ කළ සේක. (මාක් 8:31-10:52). අවසාන වශයෙන් ඔවුන් වහන්සේ දැන්වූ තම දුක් විඳීම, මරණය හා උත්ථානය සිදු විය. විනයධරයින් හා නායක පූජකවරුන්ගේ කුමන්ත්‍රණය නිසා බොරු චෝදනා ලැබ, දුක්විඳීම හා මරණය පිළිගත් සේක. නමුත් තුන්වනදා උත්ථාන වූ සේක. (මාක් 11-16)

ජේසුස් වහන්සේ ගලීලයේ සිට ජෙරුසලම දක්වා ගිය ගමන එතුමන්ගේ දුක්විඳීමේ ගමන විය. ජේසුස් වහන්සේ ජනතාව සමග තමන් වහන්සේ ව ඒකාබද්ධ කළ තැනැත් වහන්සේ ලෙස, දේව රාජ්‍යයේ ජීවිතය සඳහා තමන් වහන්සේව මුලුමනින් ම කැප කළ තැනැත්වහන්සේ ලෙස, ඒ වෙනුවෙන් තම ජීවිතය ද පරිත්‍යාග කිරීමේ ඒකායන පැතුමත් සමග මෙම ගමන ගිය සේක. එබැවින් 'මනුෂ්‍ය පුත්‍රයාණන්' තමන් වහන්සේ ට නමක් ද තබා ගත් සේක. ගලීලයේ ව්‍යවහාරික භාෂාව වූ ඇරමයික් භාෂාවෙන් 'මනුෂ්‍ය පුත්‍රයා' යනු, කෙනෙකු තමන්ව හැඳින්වීමට යොදා ගන්නා ප්‍රකාශයකි. කෙනෙකුට 'මම ප්‍රකාශ කරමි' යැයි කීම වෙනුවට ''මනුෂ්‍ය පුත්‍රයා ප්‍රකාශ කරයි'' යැයි කිව හැක.

ජේසුස් වහන්සේ ගේ දුක්විඳීම පිළිබඳ ව පෙරදැනුම් දීම් (මාක් 8:31-33, 9:30-32, 10:32-34) කොටස් 3කින් සමන්විත වේ.

(අ) දුක්විඳීම පිළිබඳ පෙරදැනුම් දීම

(ආ) ශ්‍රාවකයින් අවබෝධ කර නොගැනීම

(ඉ) ජේසුස් වහන්සේ ගේ පැහැදිලි කිරීම්

ජේසුස් වහන්සේ ගේ කාලයේ වරදකරුවන් යැයි සලකනු ලැබූ බොහෝ දෙනෙක් රෝම ආණ්ඩුකාරවරුන් විසින් කුරුසියේ ඇණ ගසනු ලැබ, මරනු ලැබූ ආකාරයට, දේව රාජ්‍යය වෙනුවෙන් තම දිවි කැප කළ ජේසුස් වහන්සේ ද තම මරණය අපේක්ෂා කරන්නට ඇත. දිව්සිවරුන් මෙන් තමන් ද මරණය සූදානම් වියයුතු ය. අරමුණක් සඳහා යැයි නො සිතා ජනතාව වෙනුවෙන් දුක් විඳීමටත්, මරනු ලැබීමටත් සූදානම් විය යුතු බව ජේසුස් වහන්සේ ගේ අදහස් විය. (මාක් 10:45, 14:24) ජෙරුසලම් දේව මාළිගාවේ සිදුවීමෙන් පසු, ඔවුන් වහන්සේ වෙනුවෙන් පැවති විරෝධය තව තවත් උත්සන්න විය. (මාක් 11: 15-19) අනවශ්‍ය කතාබහ ජේසුස් වහන්සේ ට උචිත නො වීය. දේව රාජ්‍යය උදෙසා සාක්ෂි දැරිය යුතු නම්, ජනතාව තමන් ව වටහා ගත යුතු නම්, ඒ වෙනුවෙන් තම දිවි කැප කළ යුතු බව ජේසුස් වහන්සේගේ අදහස යි. ජේසුස් වහන්සේ මරණය පිළබඳ අදහස 'පළමු කොට උන්වහන්සේ ගේ රාජ්‍යය සොයන්න' (මතෙව් 6:33) යැයි එතුමන්ගේ අරමුණේ මානසිකත්වය පිළිඹිබු වේ.

''යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා, කුරුසිය දරා මා අනුව ඒවා'' (මාක් 8:34), '' මා බොන දුක්වේදනා කුසලානෙන් ඔබට බොන්න හැකි ද?'' (මාක් 10:38) වැනි ජේසුස් වහන්සේ ගේ ප්‍රකාශයන් තමන් අනුගාමී වන ශ්‍රාවකයන් ද දේව රාජ්‍යය සඳහා දුක්විඳීමට හා මරණයට පත්වීමට සූදානම් විය යුතු බව දන්වයි.

එලෙස ම, තම සමාජයේ ශ්‍රාවකයින් නායකත්වය හෝ මුලසුන නො සෙවිය යුතු ය. (මාක් 9:35) ඒ වෙනුවට ඔවුන් තම සමාජයේ සිටින බාලයන් අතුරෙන් කෙනෙක් විය යුතු ය. ඔවුන්ගේ සේවකයකු විය යුතු ය. ඒ කිම්දයත් ''මනුෂය පුත්‍රයාණන් වුව ද වැඩියේ සේවය ලැබීමට නොව, සේවය කිරීමට ය. බොහෝ දෙනා ගේ මිදීම පිණිස සිය දිවි පිදීමට ය'' (මාක් 10: 44-45) යන්න ජේසුස් වහන්සේ ගේ පැහැදිලි කිරීම හා ස්ථිර ඉගැන්වීම වේ.

**4.3.3 දුක් විඳීම, මරණය (ජොහාන් 18- 19)**

සුවිශේෂකවරු සතර දෙනා අතුරෙන් ජේසුස් වහන්සේ ගේ දුක්විඳීම හා මරණය පිළිබඳ ජොහාන්තුමාගේ දේවධාර්මික අදහස් ඉතා ගැඹුරු ය. සදාතන ජීවිතය ලබාදීමට දෙවියන් වහන්සේ විසින් එවනු ලැබූ තැනැත්තා ජේසුස් වහන්සේ ය. '' මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය. සපුරා ම එය ලැබෙන පිණිස ය'' (ජොහන් 10:10) අවසානය දක්වාම දෙව්පියාණන්ගේ ආදරය ලැබූ හෙයින්, තම ජීවිතය පූජා කළ සේක. (ජොහාන් 10:17-18)

''යමෙකු තම මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත ''යි (ජොහාන් 15:13) පැවසූ ජේසුස් වහන්සේ අවසානය තෙක් තම ජනතාවට ප්‍රේම කර දිවි පිදූ සේක. (ජොහාන් 13:1)

ජේසුස් වහන්සේගේ ජීවිතය, ධර්මදූත කාර්යයන්, දේශනා, ප්‍රාතිහාර්යයන් යන සියල්ල ම දෙව් පියාණන් වහන්සේව ලොවට ප්‍රකාශ කිරීමේ සලකුණු විය. ඒවා දේව ආදරයේ එළිදරව්ව වේ. මෙම දේව එළිදරව්වේ උච්චතම අවස්ථාව ජේසුස් වහන්සේගේ දුක්විදිම හා මරණය වේ.

ජේසුස් වහන්සේගේ මරණය දෙව්පියාණන්ට කීකරු වී, දේව ආදරය මුලුමනින් ම එළිදරව් කළ ප්‍රේමවන්ත පුත්‍රයාණන්ගේ ක්‍රියාව වේ. ජේසුස් වහන්සේගේ මරණය ඔවුන් වහන්සේව මහිමයට පත් කිරීම සඳහා, එතුමන් පියාණන් වෙත ආපසු යාමේ ගමන වේ.

ජේසුන් වහන්සේගේ මරණය පිළිබඳ ජොහන් තුමාගේ විශේෂ අදහස් 4 කි. ඒවා නම්

(අ) ජේසුස් වහන්සේගේ මරණයට වගකිවයුත්තෝ රෝමවරුන් නොව ජුදෙව්වන් ය.

(ආ) ජේසුස් වහන්සේ තම දුක්විදීම හා මරණය එඩිතර මිනිසෙකු ලෙස බාරගත් සේක. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ඔවුන් වහන්සේ ජුදාස් හා තමන් වහන්සේව අල්ලාගෙන යාමට පැමිණි අය ඉදිරියට ගොස් එඩිතරව තමන් වහන්සේව ඔවුනට බාරදුන් සේක. දෙව්පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීම ජේසුස් වහන්සේගේ එකම අරමුණ වේ.

(ඉ) ජේසුස් වහන්සේගේ කුරුසිය පාමුල ප්‍රේමවන්ත ගෝලයා වන ජොහාන් හා මරි මව ආදීන් සිටිය හ. ඔවුන් වහන්සේ තම හිස නමා අවසන් හුස්ම හෙලූ සේක.

(ඊ) ජේසුස් වහන්සේගේ මරණය දෙවි පියාණන් මහිමයට පත් කිරීමේ එළිදරව්ව යි.

### 4.3.3.1 ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබීම (18:1-11)

ජුදස් තෙමේ, නායක පූජ්‍යයන්ගෙන් ද පරිසිවරුන්ගෙන් ද එම කණ්ඩායමක් සහ මුර සේවකයන් කීපදෙනෙකුත් ලබාගෙන, පහන්, පන්දම් හා අවිආයුධ ඇතිව එතැනට (නිදොන් ඇලෙන් එගොඩ තිබූ උයනක්) පැමිණියේ ය. ඔවුන් අඳුරේ පැමිණි බව පෙන්වන ජොහාන්තුමා '' සියලු මනුෂ්‍යයන් ආලෝකවත් කරමින් සත්‍යයේ ආලෝකයාණෝ ලෝකයෙහි සිටි සේක .... එහෙත් ලෝකයා උන්වහන්සේ හඳුනා නොගත් හ. උන්වහන්සේ සිය දේශයට වැඩම කළ සේක. (ජොහාන් 1:9-11) එහෙත් ස්වකීය ජනතාව උන්වහන්සේ නොපිළිගත් හ.'' යන්න ප්‍රකාශ කරයි. ජුදාස් ලෝකයේ අලෝකයාණන් වන ක්‍රිස්තුස් වහන්සේගෙන් වෙන්වී කෘත්‍රිම ආලෝකය තුළ අඳුරේ ක්‍රියා කිරීමට පැමිණෙන ආකාරය ගෙනහැර දක්වයි.

ඔවුන් වහන්සේව අල්ලා ගැනීමට පැමිණි අයට, ජේසුස් වහන්සේ'ඛ ඒ මමය'' යි පවසන සේක. මෙය යාවේ දෙවියන් වහන්සේගේ ප්‍රකාශය ලෙස, (නික්ම 3:6, 14: යෙසායා 44:6) ජේසුස් වහන්සේගේ දේව ස්වභාවය ප්‍රකාශ කරන සේක. ඔවුන් වහන්සේව අල්ලා ගැනීමට පැමිණි අය පසුබට වී පස්සෙන් පස්සට ගොස් බිම ඇද වැටුණාහ.

ජේසුස් වහන්සේ, '' කඩුව කොපුවේ දමන්න, පියාණන් වහන්සේ මා දී තිබෙන කුසලාන මම නොබොව් දැ''යි යන ප්‍රකාශය තුළින් දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමේ අවස්ථාවේ සිටිමින්, එම මොහොතේ මෙලොව අධිකාරී බලයට යටත් වීම පෙන්නුම් කරයි.

**4.3.3.2 උත්තම පූජකයා ඉදිරියේ ජේසුස් වහන්සේ (ජොහාන් 18:12-14----19-24)**

නායක පූජකයෝ ද, පරිසිවරු ද ශ්‍රේෂ්ඨාධිකරණය රැස් කරවා ජේසුස් වහන්ස් පිළිබඳ කථා කරන ආකාරය ජොහාන් 11:17 -50 දක්වා පාඨය තුළ දකින්නෙමු. '' අපි කුමක් කරමු ද? අපි ඔහුට මෙසේ ඉඩ හැරියොත් ..... රොමවරුන් පැමිණ අපේ ශුද්ධස්ථානයත්, අපේ ජාතියත් වනසනු ඇතැ''යි සිතූහ. එබැවින් ජේසුස් වහන්සේව අල්ලා පිලාත් වෙතට බාරදීමට නායක පූජකයා වූ කායාපස් හා ශ්‍රේෂ්ඨාධිකරණ සාමාජිකයින් තීරණය කළ හ.

හට කණ්ඩායමට ඔවුන්ගේ මහා සේනාධිපතියා ද ජුදෙව්වරුන්ගේ මුර සේවකයෝ ද ජේසුස් වහන්සේව අල්ලා බැඳ නායක පූජකවරුන්ගේ නායකයා හා පෙර සිටි නායක පූජකයා වන අස්නාස් වෙතට ප්‍රථමයෙන් රැගෙන ගියෝ ය. නායක පූජකයා ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් පිළිබඳවත්, උන්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳවත් ඔහුගෙන් ඇසූ සේක. ජේසුස් වහන්සේ නිර්භීත ව ප්‍රශ්නවලට කෙළින්ම, ප්‍රශ්නයකට ප්‍රශ්නයක් නඟමින් පිළිතුරු දුන් සේක. මුර සේවකයාගෙන් කෙනෙකු කෝපයට පත් වී ඔවුන් වහන්සේට ඇතුල් පහරක් ගසන තරමට නිර්භීතව පිළිතුරු දුන් සේක.

මෙම අවස්ථාවේ සත්‍යයට සාක්ෂි දැරීමට ධෛර්යයක් නොමැති ශ්‍රවකයාගේ තත්ත්වය පේදුරුතුමගේ ප්‍රතික්ෂේපය තුළින් (10 : 15-18-- 25-27) ජොහාන්තුමා පෙන්වයි.

**4.3.3.3 රෝම ආණ්ඩුකාරවරයා වන පිලාත් ඉදිරියේ ජේසුස් වහන්සේ )(18:28-38)**

රෝම ආණ්ඩුකාරවරු, කවුරුන්ව හෝ ජනතාව විසින් දිවැසිවරයකු යැයි හැඳින්වුවහොත්, ඔවුන් පිළිබඳ ව සැලකිලිමත් වූහ. විශේෂයෙන් තවත් ගැලවීමේ වීරයන් යැයි ද මෙසියස් යැයි ද පවසන අයව, රෝම ආණ්ඩුකාරවරු විනාශ කළ හ. ඔවුන් අතරින් පිලාත් කිසිවෙකුටත් හිස නොනැවීය. ස්වාධීන ව ක්‍රියා කළ කෙනෙක් කෲර පුද්ගලයෙකි.

පිලිත් ඉදිරියේ කරන ලද විනිශ්චයේ සිදුවීම, ජොහාන් තුමා නාට්‍යයක් සේ ගෙනහැර දක්වා ඇත. මේ මගින් ජේසුස් වහන්සේගේ අධිකාරී බලය, නිර්දෝශී බව, ජුදා නායකයින්ගේ අවංක නැතිකම, කපටිකම හා පිලාවන්ගේ ආත්මාර්ථකාමී දේශපාලන හැඟීම පෙන්නුම් කරයි.

පිලාත් ජේසුස් වහන්සේ පිළිබඳ දැන සිටියේ ය. ජේසුස් වහන්සේ තමන් වහන්සේට එල්ල කරන ලද චෝදනාවලට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම දුටු ආණ්ඩුකාරතුමා වන පිලාත් '' බොහෝ විශ්මයට පත් විය'' ජේසුස් වහන්සේගෙන් ඔවුන් වහන්සේගේ රාජ්‍ය බලය ගැන පිලාත් ප්‍රශ්න කළේය. ජේසුස් වහන්සේ තමන් වහන්සේ මේ ලෝකයට පැමිණියේ සත්‍යයට සාක්ෂි දැරීමට යැයි පැවසූ සේක. ජේසුස් වහන්සේ නිර්දෝෂී බව පිලාත් ප්‍රකාශ කළේ ය. පිලාත් සත්‍යය පිළිබඳ සැලකිලිමත් නොවන බව ජොහාන් පැහැදිලි ව සඳහන් කරයි. (ජොහන් 18:37-38). පිලාත් ජුදයින්ගෙන් ඔවුන් ජේසුස් වහන්සේට කුරුසියේ ඇණ ගසා මැරීමට වගකිව යුත්තන් යන නම කැමැත්ත තහවුරු කළේ ය. (ජොහාන් 18:38-19:6)

#### 4.3.3.4 ජේසුස් වහන්සේගේ මරණය

ජේසුස් වහන්සේව කුරුසියේ ඇණ ගැසීම (19:17-27)
මෙහිදී ජොහාන්තුමා කරුණු 3ක් සඳහන් කරයි. ඒවා නම්,

(අ) පිලාත්ගේ ප්‍රකාශය
(ආ) ජේසුස් වහන්සේගේ වස්ත්‍ර කඩා දැමීම
(ඉ) කුරුසිය පාමුල මරියතුමිය හා කාන්තාවන් කිහිපදෙනෙකුත්, ප්‍රේමවන්ත ගෝලයාත් සිටීම

වැනි කරුණු තුන සඳහන් කරයි. මේවා මගින් විශේෂිත දේවධාර්මික පණිවිඩයක් ලබා දෙයි.

**(අ) පිලාත්ගේ ප්‍රකාශය**

ජේසුස් වහන්සේ තමන් වහන්සේම කුරුසිය උසුලාගෙන ගොල්ගොතා නම් කපාලපිටියට පැමිණෙනු සේක. ජේසුස් වහන්ස්ව ඇණ ගසන ලද කුරුසියේ, '' ජුදෙව්වරුන්ගේ රජ වූ නාසරෙත්හි ජේසුස් '' යැයි ලියන ලද පුවරුවක් සවිකිරීමට පිලාත් නියෝග කළේය. මෙම ප්‍රකාශය හෙබ්‍රෙව්, ග්‍රීක හා ලතින් යන භාෂා තුනෙන් ම ලියැවී තිබුණි. නායක පූජකයෝ එම ප්‍රකාශය තම ජාතියට අපකීර්තියක් ඇති කරතැයි සිතූහ. එබැවින් එම ප්‍රකාශය ''ජුදයින්ගේ රජ මම''යැයි ඔහු පැවසූ බව ලියන ලෙස පිලාත්ගෙන් ඉල්ලූහ. නමුත් '' මම ලියන ලද එසේම ය'' යැයි පවසා, ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. පිලාත්ගේ හිතුක්කාරකම මින් ප්‍රකාශ වේ. ඔහුගේ ප්‍රකාශය මගින් අන්‍ය ජාතිකයින් ජේසුස් වහන්සේව පිළිගනියි යන්න ව්‍යංගයෙන් පවසන බව ජොහාන්තුමා පවසයි. (ජොහාන් 19:17-22)

**(ආ) ජේසුස් වහන්සේගේ වස්ත්‍රය බෙදා ගැනීම**

ජේසුස් වහන්සේට කුරුසියේ ඇණ ගැසූ පසු, එතුමන්ගේ වස්ත්‍රය කොටස් 4 කට බෙදා අර ගත්හ. ජේසුස් වහන්සේගේ වස්ත්‍රය ඉහළ සිට පහළට කිසිදු වැස්මක් නොමැතිව වියන ලද්දකි. එය ජුදා පූජකයින්ගේ වස්ත්‍රවලට සමාන විය. ජේසුස් වහන්සේව රජ කෙනෙකු වශයෙන් පමණක් නොව, පූජකවරයෙකු වශයෙන් ද ජොහාන්තුමා පෙන්වයි. (ජොහාන් 19:23-25)

**(ඉ) කුරුසිය පාමුල දේවමෑණියන්, කාන්තාවන් කිහිපදෙනෙකු හා ප්‍රේමවන්ත ගෝලයා සිටීම**

කුරුසියේ ඇණ ගසන ලද ජේසුස් වහන්සේ තනියම නොසිටි සේක. ජේසුස් වහන්සේගේ කුරුසිය පාමුල ඔවුන් වහන්සේගේ මෑණියන්, කාන්තාවන් කිහිපදෙනෙකු හා ජේසුස් වහන්සේගෙන් ප්‍රේමවන්ත ගෝලයා ද සිටියේ ය. මෙහිදී ශ්‍රාවක පවුලක් ගොඩනැගීම පිළිබඳ ව ජොහාන් තුමා සංකේතවත් කරයි. (ජොහාන් 18:25-24)

ජේසුස් වහන්සේ උකුත්වීම හා තැන්පත් කිරීම (ජොහාන් 19:28-42) මෙහිදී තවදුරටත් කරුණු 3ක් පිළිබඳ ව ශුද්ධ වූ ජොහාන්තුමා පවසයි. ඒවා නම්,

(අ) ජේසුස් වහන්සේ බීමට විනාකිරි දීම

(ආ) ජේසුස් වහන්සේගේ ඇලයට හෙල්ලයකින් ඇනීම

(ඉ) ජේසුගේ භූමිදානය

**(අ) ජේසුස් වහන්සේ බීමට විනාකිරි දීම**

සියල්ල නිමාවට පත් වූ බව දැනගත් ජේසු, ''මට පිපාස ය'' යි වදාළ සේක. එවිට ඔවුහු එතුමන්ට විනාකිරි දුන් හ යැයි සඳහන් කර ඇත.''

'' පිපාසයේ දී ඔව'හු මට තිත්ත කසාය බොන්න දුන්නෝ ය.'' යැයි ගීතාවලිය 69:21 ගීතයේ කියැවෙන ආකාරයට සියල්ල දෙවියන් වහන්සේ යැයි ජීවත් වී -- දේව කැමැත්ත නමැති පාත්‍රය පාලය කර අවසන් යන්න සියල්ල නිමාවිය යන්නෙන් සංකේතවත් වේ. ජේසුස් වහන්සේ හිස නමා ස්වකීය ප්‍රාණයට භාරදීම තුළින් ස්ව කැමත්තෙන් එය සිදු කළ බව ජොහාන් තුමා සඳහන් කරයි. (19:28-30)

**(ආ) ජේසුස් වහන්සේගේ ඇලයට හෙල්ලයකින් ඇණීම**

භේවායෙක් ජේසුස් වහන්සේගේ ඇලයට ඇනී ය. එකෙණෙහිම ලේත් වතුරත් ගලා ආවේය යන්න ජොහාන් තුමා වැදගත් කරුණක් ලෙස සඳහන් කරයි. රුධිරය තුළින් ජීවිතයත් වතුර තුළින් ශුද්ධවන්ත කිරීමේ වරප්‍රසාදයත්, ශුද්ධාත්ම ජීවිතයත් පෙන්නුම් කරයි. ජේසුස් වහන්සේ මෙම සංකේතයන් දෙක මගින් (6:53-54-- 7:37-39;3:5) තමන් ලබාදෙන සදාතන ජීවිතයේ ස්වභාවය පිළිබඳ ඉගැන්වූ සේක. මෙම සිදුවීම ඇසින් දුටු ජේසුස් වහන්සේගේ ප්‍රේමවන්ත ගෝලයෝ මෙය පැවසූ බව ජොහාන්තුමා පවසයි. මෙය ආසන්නයේ ජේසුස් වහන්සේව විශ්වාස කළ යුතු ය යන අරමුණින් ප්‍රකාශ කරයි. තව ද ජේසුස් වහන්සේගේ ඇලයට ඇණීමේ සිදුවීම තුළින් පැරණි ගිවිසුමේ දිවැසි වැකි 2 ක් (නික්ම 12:46;සෙකරියස් 12:10) පූර්ණත්වයට පත් වූ බව පවසයි. (19:31-35)

**(ඉ) ජේසුස් වහන්සේගේ භූමදාන**

ජේසුස් වහන්සේගේ භූමදානය සඳහා අරිමිතියේ ජොසෙප් හා නිකදෙවුස්ගේ දායකත්වය ජොහාන් තුමා සඳහන් කරයි. එතුමා ගන්ධරස හා අගිල් මිශ්‍රණයක් ගෙනැවිත් ජුදා සිරිතට අනුව ජේසුස් වහන්සේගේ ශරීරය භූමිදාන කළ හ. ගන්ධ රස හා අගිල් මිශ්‍රණයෙන් ජේසුස් වහන්සේට දිය යුතු රජ කෙනෙකුට අදාළ ගෞරවය දුන් බව සඳහන් වේ. '' ශාස්ත්‍රවන්තයින් රන් ද, තුවරලා ද ගන්ධරස ද පඬුරු ලෙස පිසූහ. '' (මතෙව් 2:1) යන්න සිහිපත් කළ හැක.

### 4.3.4 උත්ථානය (ජොහාන් 20)

උත්ථානය යන්න මරණින් මතු ජීවිතයක් පිළිබඳ ජුදා සමාජයේ පැවති ප්‍රධාන ආගමික අදහසක් විය. එදා ජුදා සමාජයේ උත්ථානය යනු මරණින් මතු ශරීරයත් ආත්මයත් සමග පූර්ණ මිනිසෙකු ලෙස ජීවත් වන බව පිළිගැණුනි.

නව ගිවිසුමේ ජේසුස් වහන්සේගේ උත්ථානය ජුදා සමාජයේ අදහසට අනුව වර්ණනා නොකළ හ. ජේසුස් වහන්සේ උත්ථානය මගින් ස්වර්ගීය ජීවිතය ලබාගත් සේක. ඔවුන් වහන්සේ සදාතන ජීවිතය හා පූර්ණත්වය ලැබූ සේක. උත්ථානයෙන් පසු එතුමන් ගත කළේ පෙරවූ ඓතිහාසික ජීවිතය නොවන බව ඒවායේ සඳහන් වේ.

උදාහරණයක් ලෙස ගතහොත්. එම්මාවුස් ගමනේ දී ඔවුන් වහන්සේ සමග සැතපුම් ගණනාවක් ගමන් කළ වාසුළි, සංවාදයේ යෙදුණු පසු ද ශ්‍රාවකයින් දෙදෙනා ඔවුන් වහන්සේට පහසුවෙන් හඳුනා නොගත් හ. අවසානයේ දී ඔවුන් වහන්සේ පූපය කැඩූ විට. ඔවුන් වහන්සේ කවුරුන් දැයි හඳුනා ගත් හ. (ලුක් 24 ඃ 13 - 32) අනෙකුත් ශ්‍රාවකයින් ද ඔවුන් වහන්සේව අවතාරයක් යැයි සිතූහ. (ලුක් 24:37) මන්දලාහි මරියා ඔවුන් වහන්සේව හඳුනා නොගත් අතර, උයන් ගොවියෙකු යැයි සිතුවා ය. (ජොහාන් 20:14-15) මසුන් ඇල්ලීමට ගිය ධීවරයින් ද වෙරළෙහි සිටි ඔවුන් වහන්සේව හැඳින නොගත් හ. (ජොහාන් 21:4), තව ද ඔවුන් වහන්සේ පෙර මෙන් නොව, හදිසියේ ම දර්ශනය වන සේක. හදිසියේම නොපනී යන සේක, දොරවල් වසා තිබිය දී ඇතුළට පැමිණෙන සේක. පිටත් වී යන සේක.

තවමත් උත්ථාන වූ ජේසුස් වහන්සේව දුටුවේ ඔවුන් වහන්සේගේ ගෝලයන් පමණි. එනම් විශ්වාස කළ අය පමණකි. ඔවුහු ජේසුස් වහන්සේගේ උත්ථානයේ වැඩ සිටීම අත්දුට හ. උත්ථානයෙන් පසු විශ්වාසකයින් තුළ ඔවුන් වහන්සේ වැඩ සිටින සේක.

මරණයට පත් වූ ජේසුස් වහන්සේ උත්ථාන වූ සේක. අදත් අප සමග ජීවත් වන බව කිතු දහමේ මූලික විශ්වාසය වේ. මේ නිසා ශුද්ධ වූ පාවුල්තුමා මෙසේ පවසයි. ''ක්‍රිස්තුස් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම්, අපගේ දේශනා කිරීම නිරර්ථක ය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය'' (1 කොරින්ති 15:14)

**හිස් වූ සොහොන (ජොහාන් 20:1:10)**

සතියේ පළමු දින අළුයම ජේසුස් වහන්සේව භූමදාන කරන ලද ගල්ලෙනට මන්දලාහි මරියා ගියා ය. හිස් වූ සොහොන දැක, ජේසුස් වහන්සේගේ මෘත ශරීරය සොරා ගෙන ඇතැයි සිතා, හීමොස් පේදුරුට හා ප්‍රේමවන්ත ගෝලයාට දැක්වූ ජොහාන් තුමා පවසයි. ඔවුහු ගල්ලෙනෙහි ජේසුස් වහන්සේව ඔතා තිබූ සළුව හා හිස වසා තිබූ රෙදි කැබැල්ල දුටුවෝ ය. මොවුන් අතරින් ජොහාන්, '' දක්නේ ය ; විශ්වාස කළේ ය. ජේසුස් වහන්සේගේ උත්ථානය විශ්වාස කිරීමට ඔවුන්

දුටු දේ පෙළඹවීමක් විය. ජේසුස් වහන්ස්ගේ මෘත දේහය කිසිවෙකුත් සොරා නොගත් බව තහවුරු කිරීමට මෙම දර්ශන ඉදිරිපත් කෙරේ.

**ජේසුස් වහන්සේ මන්දලාසේ මරියාට දර්ශනය වීම (ජොහාන් 20:11-18)**

සොහොන් ගෙය ළඟ පිටත හඬමින් සිටි මන්දලාහී මරියාට ජේසුස් වහන්සේ දර්ශනය වූ සේක. නමුත් ඇය ජේසුස් වහන්සේව හඳුනා නොගත්තාය. උයන් ගොව්වා යැයි සිතා ඔවුන් වහන්සේ සමග කතා කළා ය. එතුමා ඇයට, ''මරියා යැයි කථා කළ විට '' රබ්බෝනි'' යැයි පිළිතුරු දුන්නා ය. එහි අර්ථය ''ගුරු සේවයෙනි'' යනුයි. ඇය ඔවුන් වහන්සේව අල්ලන්නට තැත් කළා ය. නමුත් තමන් වහන්සේව අල්ලන්ට එපා යැයි ද තමන් වහන්සේ පියාණන් වෙතට යාමට සිටින බව තම සහෝදරියන්ට දක්වන ලෙස ද ජේසුස් වහන්සේ වදාළ සේක. කාන්තාවන්ට ජේසුන් වහන්සේ ලබා දුන් නිදහස මේ මගින් පැහැදිලි වේ.

මෙහිදී පණිවුඩ දෙකක් දෙනු ලැබේ. ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය ඔවුන් වහන්සේ දෙවිපියාණන් වෙතට යන එකම සිද්ධිය වේ. ඊළඟ පණිවිඩය වන්නේ. ජේසුස් වහන්සේගේ උත්ථානමය වැඩ සිටීම දුටු අය, එය අනෙක් අයට දැක්විය යුතු ය. ඒවා ජීවත් කරවිය යුතු ය යන්නැයි. මරිය ජේසුස් වහන්සේ උත්ථාන වූ පණිවුඩය ප්‍රථමයෙන් අන් අයට දන්වන්නීය. උත්ථාන වූ ජේසුස් වහන්සේ තුළ ඒකත්වය අත්දැකීමේ සදාතන ජීවිතයකට කැඳවනු ලබති.

'' ඒ දවසේ දී, මා පියාණන් වහන්සේ තුළ ද ඔබ මා තුළ ද සිටින බව ඔබ දැන ගත්තාහු ය. '' (ජොහාන් 14:20)

**ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වීම (20:19-23)**

ජුදයින්ට බිය වී ශ්‍රාවකයින් ජෙරුසලමේ එක් ස්ථානයකට රැස් වී සිටිය හ. ඔවුන් ජේසුස් වහන්සේගේ උත්ථානය දැන නොසිටිය හ. නැතහොත් විශ්වාස නොකළ හ. දොරවල් වසා තිබිය දී ඔවුන් වහන්සේ ගෝලයන් වැද දර්ශනය වී ඔබට ශාන්තිය වේවා -- '' වදාරා ඔවුන්ට සුභ පැතූ සේක.'' ජේසුස් වහන්සේ ඔබට සියලු ම යහපත් දේ ලබා දෙන සේක'' යන අදහස ගෙනහැර දක්වයි. මෙය ජුදයින් එකිනෙකා හමුවන විට පවසන, අස්ලාම් මලේක්කුම් යන ලාභ පැතීමේ පණිවිඩය වේ. ජේසුස් වහන්සේගේ මෙම පණිවුඩය බිය වී සිටි ශ්‍රාවකයනට ශක්තියක් හා විශ්වාසයක් ලබා දුනි. ජේසු ඔවුන්ට ලබාදුන් සාමය, ලෝකය ලබාදෙන සාමය මෙන් නොව, (ජොහාන් 14:27), සාමය දෙවිඳුන්ගේ වරප්‍රසාදයකි.

ජේසුස් වහන්සේ ඔවුනට ''ශාන්තිය වේවා'' පතා පසුව, '' ඔවුන් පිට හුස්ම හෙළා, '' ශුද්ධාත්මයාණන් පිළිගන්න'' යැයි වදාළ සේක. මැවීමේ ආරම්භයේ දී දෙවියන් වහන්සේ මනුෂ්‍යයා පිට තම ජීවන හුස්ම හෙළූ (උත්පත්ති 2:27) ආකාරයට ජේසුස් වහන්සේ ද තම හුස්ම ඔවුන් පිට හෙලා ඔවුන්ව ශක්තිමත් කළ සේක.

**ජේසුස් වහන්සේ තෝමස්ට දර්ශනය වීම (20:24-29)**

ජේසුස් වහන්සේගේ ගෝලයකු වන තෝමස්, ඔවුන් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වන අවස්ථාවේ ඔවුන් සමග නොසිටියේ ය. ඔහු ජේසුස් වහන්සේ සමග ජෙරුසලමට ගොස්, මරණයට පත්වීමට ද සූදානම් ව සිටි කෙනෙකි.

ඔහු කිසිවක් ඉක්මණින් පිළිගන්නා කෙනෙක් නොවීය. අනෙකුත් ශ්‍රාවකයෝ, අපි ස්වාමීන් වහන්සේ දුටිමු'' යි කී විට, ඔහු එය පිළි නොගත්තේ ය.

ශ්‍රාවකයින් දොරවල් වසාගෙන කාමරයේ සිටි අවස්ථාවේ දී ඔවුන් වැද ජේසුස් වහන්සේ දර්ශනය වූ සේක. තෝමස්ගේ කැමැත්ත පරිදි තමන් වහන්සේව ස්පර්ශ හෝ බලන ලෙස තෝමස්ට පැවසූ සේක. ''අවිශ්වාස නොකර විශ්වාස කරන්නැ''යි පැවසූ සේක. එවෙලෙහිම තෝමස් ''මගේ ස්වාමීනි, මාගේ දෙවියෙනි'' යැයි පවසමින්, උන්වහන්සේ කෙරෙහි වූ විශ්වාසය ප්‍රකාශ කළේ ය. මෙහිදී තෝමස් ජේසුස් වහන්සේව දෙවියන් ස්වාමීන් යැයි ආමන්ත්‍රණය කරයි. එවිට ජේසුස් වහන්සේ, '' ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහි ය. නුදුටු නමුත් අදහස් හෝ භාග්‍යවන්තයෝ ය'' යැයි වදාළ සේක.

මෙම සිදුවීම තුළ කරුණු තැනක් ගෙනහැර දක්වයි. ඒවානම්,

(අ) ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට කැඳවීම

(ආ) තෝමස්ගේ විශ්වාසයේ ප්‍රකාශය

(ඉ) නොදැක විශ්වාස කරන්නෝ භාග්‍යවන්තයෝ ය.

ජොහාන් තුමාගේ අදහස අනුව '' දැකීම'' යන්න විශ්වාසය යන අදහස යි. මන්දලායේ මරියා ජේසුස් වහන්සේව දුටු බව පැවසූ විට ශ්‍රාවකයෝ එය පිළි නොගත් හ. විශ්වාස නොකළ හ. උත්ථාන වූ ජේසුස් වහනිසේ ඔවුන් මැද දර්ශනය වූ පසු ඔවුන් විශ්වාස කළ හ. ප්‍රථම ශ්‍රාවකයින්ට පසුව පැමිණි අය ශ්‍රාවකයින් පැවසූ දේ අසා විශ්වාස කළ හ.

ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ පණිවිඩය ප්‍රථමයෙන් ලියුවේ, ශුද්ධ වූ පාවුලුතුමා ය. (කොරි 15:3-7) ජේසුස් වහන්සේගේ උත්ථානයේ දර්ශනයන් දැක, විශ්වාසය ප්‍රකාශ කළ ශ්‍රාවකයින්ගේ අත්දැකීම් ජේසුස් වහන්සේගේ උත්ථානයට සාක්ෂි වේ.

උත්ථානය වූ ජේසුස් වහන්සේ බියෙන් හා සැකෙන් සිටි ශ්‍රාවකයින්ට දර්ශනය වි, ධෛර්යය හා විශ්වාසය ලබාදුන් සේක. ඔවුන්ට නව ජීවිතයක් ලබාදුන් සේක. කුරුසියේ මරණින් පසු විසිරී ගොස් සිටි ශ්‍රාවකයින්ව ධර්මදූත කාර්යය සඳහා සූදානම් කළ සේක. '' මේවා ලියන ලද්දේ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍ර වන ක්‍රිස්තුවරයාණන් බව ඔබ අදහසා ගන්නා පිණිසත් ය'' (ජොහාන් 20:31) යැයි ජොහාන් තුමා පවසයි.

ජේසුස් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය නිසා ශ්‍රාවකයින් හා තමන් කෙරෙහි විශ්වාස කළ අයත් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව, ජීවත් විය යුතුය යන්න අරමුණු කොට ගත්තේ ය. ඔවුන් ජේසුස් වහන්සේගේ නව දහම අදහා ගත්තෝ ය. (ගීය 9:2) ඔවුන් අල්ලා ගනු ලැබූහ. වදහිංසාවලට ලක් කරනු ලැබූහ. නමුත් ඔවුන් ජුදා සම්ප්‍රදාය තුළ නව ජීවන ක්‍රමයක් ආරම්භය කර ජීවත් වූහ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ජේසුස් වහන්සේගේ සමයෙහි දුක්විඳීම්, මිනිමැරුම් සිදුවූ හේතු කාරක පසුබිම් කොට ගනිමින්, ඔවුන් වහන්සේ අල්ලා ගැනීම, දුක්විඳීම හා මරණය මගින් ලැබූ දැනුම ප්‍රකාශ කරයි.
2. ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය වර්තමාන සමාජය තුළින් ක්‍රිස්තියානි විශ්වාසය අභියෝගයක් වන බව පිළිගෙන, එය සාක්ෂි සහිත ව පැහැදිලි කරයි.
3. උත්ථානය පිළිබඳ ජුදයින්ගේ පොදු විශ්වාසයත්, ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ සුවිශේෂකවරුන් අතරින් ඇති වෙනස පහදා, ජේසුස් වහන්සේගේ උත්ථානය විශ්වාස කළ අයගේ ජීවිතවල ඇති වූ නව සමාජ, ආගමික පිබිදීම පිළිගෙන, වර්තමාන සමාජයේ කිතුනු විශ්වාසකයින්ට අවශ්‍ය සමාජ, ආගමික පිබිදීම පිළිබඳ ප්‍රකාශ කරයි.
4. පාස්කු අභිරහස කිතුණු විශ්වාසයේ ජීවිතයට බීජයක් වන ආකාරය නිර්මාණයක් ඉදිරිපත් කරයි

**නිපුණතාව 5.0 :** ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලුතුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධවූ සභාවේ වර්ධනයට සහය දක්වයි.

**නිපුනතා මට්ටම 5.1 :** මුල් ක්‍රිස්තියානීන්ගේ ජීවන ක්‍රමය දැනගෙන ඒ අනුව ජීවත්වීමට උත්සාහ කරයි.

**කාලච්ඡේද :** 14

**ඉගෙනුම් පල :**

- කිතුනු දහමේ ආරම්භක ඉතිහාසය පිළිබඳ කරුණු රැස්කරයි.
- ශුද්ධාත්මාගමනය සමග නව කිතුණු ජීවිත පැවැත්ම ආරම්භ වූ බව පිළිගනියි.
- ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධවූ සභාවේ උන්නතියට දායක වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට උනන්දුවෙන් සහභාගි වෙයි.

**විෂය අන්තර්ගතය :**

**5.1.1 ශුද්ධාත්ම ආගමනය හා ශුද්ධ වූ සභාවේ ආරම්භය**

**5.1.1.1 ශුද්ධාත්ම ආගමනය (පෙන්තකොස්ත මංගල්‍යය) (ක්‍රියා 2/1-21)**

- ජුදෙව්වන්ගේ මංගල්‍යයක් වන පෙන්තකොස්ත දින ශුද්ධ වූ සභාවේ ආරම්භක දිනය වේ.
- ජුදෙව්වන් පෙන්තකොස්ත මංගල්‍යයට ප්‍රමුඛත්වයක් දී එය සැමරූහ. (ක්‍රියා 2/5)
- එදින ගෝලයන් සියලු දෙනා එක්තැනක මරියතුමී සමග 120 දෙනෙකු එක්ව යාච්ඤා කරමින් සිටිය හ.
- ක්‍රිස්තුස් වහන්සේ වදාළ සහනදායකයාණන් පැමිණෙතැයි යන පොරොන්දුව ඉටුවීම පිණිස බලා සිටිය හ.
- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින්, කටයුතු කරන සමූහයක් ලෙස, ශුද්ධ වූ සභාව පෙන්තකොස්ත දින ආරම්භ විය.
- පුරාණ ගිවිසුමේ සීනයි කන්දේ දේව මහිමය ප්‍රකාශ කිරීමට උපයෝගී කරගත් වචන, ''සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬ .................. ගිනිදළු වැනි දිව් ........................'' කතුතුමා මෙහිදී උපයෝගී කර ගනිමින්, ශුද්ධාත්මයාණන් දෙවියන් වහන්සේ බවත්, උන්වහන්සේ ඉහළ සිට බැස ආ බවත්, උන්වහන්සේගේ වැඩ සිටීමත් දේව නීතියත් පෙන්වා දෙයි. ගින්න අවසාන කාලයේ පවිත්‍රත්වයේ සංකේතයකි. සුළං හැමීම, ශුද්ධාත්මයාණන්වත් නව ශක්තියක් දෙන බවත් සංකේතවත් කරයි.
- ශුද්ධාත්මයාණන්, ගිනිදළු වැනි දිව් ආකාරයෙන් බෙදීගොස් ඔවුන් එකිනෙකා මත වැඩසිටි බව තහවුරු කරයි. එනම් ශුද්ධාත්මයාණන් සියලුදෙනාටත්, මුළු ශුද්ධ වූ සභාවටත් දානය කරනු ලබයි.
- දිවැසිවර ජෝවෙල්ගේ දිවැසිවැකිය ''ඉන්පසු සකල මනුෂ්‍යයන් කෙරෙහි මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි.'' (ජෝවෙල් 2/28-32) සම්පූර්ණ විය.

- ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම, සිනයි කන්දේ දෙවියන් වහන්සේ මොසෙස්ට දර්ශනය වූ ආකාරය අපට මතක් කරයි. මෙය නව යුගයක ආරම්භය, නව ජීවිතයක් දානය කිරීම, නව ඊශ්‍රායෙල් වංශයක් බිහිවීම, ශුද්ධ වූ සභාවේ උපත ආදිය සංකේතවත් කරයි.
- ජේසුස් වහන්සේගේ ගෝලයන් ශුද්ධාත්මයාණන් ලබාගත් බවට බාහිර සංකේතයක් ලෙස ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය ප්‍රාතිහාර්යයක් ලෙස දෙනු ලැබීය. උගත්කමක් නොමැති වූ ගලීලයන් අන්‍ය භාෂාවලින් කථා කිරීමට පටන් ගත් හ. මෙලෙස ආන්‍ය භාෂාවලින් කතා කිරීම අන්අය තම තමන්ගේ බසින් ඇසූහ.
- මේ සිදුවීම අපට බාබෙල් කොතේ සිදුවීම (භාෂා වියවුල, ජනයා විසිරියාම) මතක් කර දෙයි. නමුත්, මෙහි විවිධ භාෂා කථා කරන අය එක්වූහ. ගෝලයන් අන්‍ය භාෂාවලින් කථා කිරීම, ඔවුන්ගේ සේවය, ලොවපුරා අවශ්‍ය බව පෙන්වයි. ශුද්ධාත්ම ආගමනයෙන් විවිධත්වයක් තුළ ඒකත්වයක් පෙනේ.
- ශුද්ධාත්මයාණන්ගේ වැඩම කිරීමෙන් අපෝස්තුළුවරුන් තුළ ඇති වූ වෙනස (විවිධ භාෂා කථා කිරීම, ප්‍රඥාව ලැබීම, ධෛර්යයෙන් සාක්ෂි දැරීම, ප්‍රබල කථා ශක්තියක් ලැබීම, ප්‍රාතිහාර්යයන් සිදු කිරීම) ඔවුන් ශුද්ධාත්මවරම් පූර්ණ ලෙස ලැබූ බව පෙන්වයි.
- නව ගිවිසුමේ වර්තමාන කිතුණුවන් පෙන්තකොස්ත මංගල්‍යය ශුද්ධාත්මයාණන්ගේ වැඩම කිරීමේ මංගල්‍යය ලෙසත්, ශුද්ධ වූ සභාවේ උපත් මංගල්‍යය ලෙසත්, ශුද්ධ වූ සභාව ක්‍රියාකාරීවීම සිහිකිරීමේ මංගල්‍යයක් ලෙසත් සමරති.
- පෙන්තකොස්ත මංගල්‍යයේ දී, ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කුව උච්චස්ථානයට පත්වේ. ජේසුස් වහන්සේ උකුත්වී, උත්ථාන වී, දෙවිපියාණන්ගේ දකුණුපස වැඩසිට, අපෝස්තුවරුන් වෙත තම ආත්මයාණන් එවීමෙන් තම ගැලවීමේ කාර්යය සම්පූර්ණ කළ සේක.

### 5.1.1.2 ශුද්ධ වූ සභාවේ ආරම්භය හා සේවය

- මෝසස්තුමාට ගින්නක ආකාරයෙන් දෙවියන් වහන්සේ එළිදරව් වී වගකීමක් භාර දුන්නාක් මෙන්, පෙන්තකොස්ත දින ඒ ආකාරයෙන් ම, දෙවියන් වහන්සේගේ එළිදරව්වත්, දූතකාර්ය සඳහා කැඳවීමත් අපොස්තුළුවරුන්ට ලැබුණි.
- ශුද්ධ වූ සභාවේ නායකත්වයට කැඳවනු ලැබූ අපෙස්තුළුවර පේදුරුතුමා තම මංගල දේශනය ජනතාවට ඉදිරිපත් කරමින් තම සේවය ආරම්භ කළේ ය. එතුමාගේ දේශනයේ සාරාංශය
  - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වන මෙසියස්තුමා ය.
  - ජුදෙයින් උන්වහන්සේව කුරුසයේ ඇණ ගසා මරා දැමූහ
  - උන්වහන්සේ තුන්වැනිදා මළවුන්ගෙන් උත්ථාන වූ සේක
  - එයට අපි සාක්ෂිකාරයෝ වම් හ

- එතුමාගේ මංගල දේශනය අසා තුන්දාහක් පමණ ජනයා ශුද්ධ වූ සභාවට එක් වූහ.
- අශුද්ධාත්ම බලයෙන් පේදුරුතුමා උපන්දා සිට කොරව සිටි මිනිසකු සුව කිරීමේ සිද්ධිය, ජනතාව අපොස්කතුළුවරුන්ගේ ඉගැන්වීම්වලට සවන්දීමට යොමු කළේ ය.
- ශුද්ධාත්මයාණන් ලබාගත් අපොස්තුළුවරුන්ගේ විශ්වාසයේ ජීවිතයත්, ශුභාරංචිය දේශනා කිරීමත්, යාච්ඤාවත්, ශුද්ධ වූ සභාව වර්ධනය කළේ ය.

- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම තම ජීවිතයේ ආධාරකය බව තම ජීවිතයෙන් පෙන්නුම් කළ හ. දුක් වේදනාත්, කස පහරවලුත් ඉවසාගෙන ශුද්ධ වූ සභාව මුළු ලොව පතල කිරීමට සාක්ෂිකරුවන් වූහ.
- මුල් කිතුනු සභාව ජෙරුසලම පුරා සීඝ්‍රවත්, ප්‍රබලවත් පැතිර ශක්තිමත්, ආකර්ශනීය සමූහයක් ලෙස දිස්විය. මෙය එහි වැඩි වශයෙන් ජිවත් වූ ජුදෙව්වන්ගේ සිත්තුළ ක්‍රෝධයත්, වෛරයත් අමනාපයත් වර්ධනය කළේ ය.

### 5.1.2 මුල් කිතුණුවන්ගේ සාමූහික ජීවිතය

- මුල් කිතුණු සභාවේ අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් පිළිගෙන දෙවියන් ද මෙසියස්තුමා වන ජේසුස් වහන්සේව විශ්වාසය කළ අය ඉක්මනින් ම බෞතීස්මය ලැබ ශුද්ධ වූ සභාවට එක්කර ගන්නා ලදි.
- අපේස්තුළුවරු 12 දෙනෙකු මේ කුඩා කණ්ඩායමේ අඛණ්ඩ වූ උත්සාහයත්, ඉගැන්වීමත්, ඔවුන් කළ ප්‍රාතිහාර්යනුත් නිසා මේ වර්ධනය සිදු වූ බව අපි අවධාරණය කරමු.
- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කර උන්වහන්සේගේ නාමයෙන් බෞතීස්මය ලැබ, ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් වූ සියලු දෙනා එක්වී එක්ව සමූහයක් ලෙස ජිවත් වූහ. මේ මුල් කිතුණු සභාවේ මොවුන්ව අන් ජනතාවගෙන් වෙන්කර පෙන්වූ සමහර උසස් ගුණාංගයන් අපි දකිමු.
- ඔවුහු අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද පූප කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරත ව කල්ගත කළ හ.

#### 5.1.2.1 අපොස්තුළුවරුන්ගේ ඉගැන්වීමට සවන්දීම

- මුල් කිතුනුවන්, ජේදුරුතුමාගේ දහම් දේශනය මගින්, තමන් ලබාගත් පළමු විශ්වාසය, නිරන්තරයෙන් අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීමට සවන්දීම මගින් වර්ධනය කර තහවුරු කර ගත් හ.
- ශුභාරංචිය පතළ කිරීමේ සේවයට තමන්ව සුදානම් කිරීමට, දෙවියන් වහන්සේ ගැනත් ක්‍රිස්තුස් වහන්සේ ගැනත් දැන ගැනීමට ඉතා උනන්දුවෙන් සිටිය හ.
- ආගමික සත්‍යතාවයන් ද, වේද ග්‍රන්ථයන් ද ගැන තව තවත් ඉගෙන ගැනීමට ආශාවත්, උනන්දුවත් ඇති අය ලෙස දැකිය හැකි විය.
- අපොස්තුළුවරුන් මගින් විවිධ ප්‍රාතිහාර්යන් ද, අරුම පුදුම ක්‍රියා ද සිදුවිය. මේ නිසා මුල් කිතුනුවන් දෙවියන් වහන්සේ කෙරෙහි තම විශ්වාසය තහවුරු කර ගත් හ.

### 5.1.2.2 එක්සත්ව එක්සිත්ව සිටීම

- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කළ අය, තමන් තුළ නව සබඳතාවයක් ඇති වූ බව හඳුනාගෙන, සැවොම එක්සත්ව එක්සිත්ව සිටිය හ.
- ඔවුන් සැවොම අපෝස්තුළුවරුන්ගේ නායකත්වය යටතේ, සාමූහික සහජීවනයේ වංගුකාරයන් ලෙස, එකිනෙකා සමග අන්‍යෝන්‍ය, සුහදශීලී, සහභාගිකමේ හා වගකීමෙන් යුතු ජීවිතයක් ගත කළ හ.
- සැබෑ කිතුනුවකුගේ ලක්ෂණයක් ලෙස, ක්‍රිස්තුස් වහන්සේ වදාළ ප්‍රේමයේ හා එකමුතුකමේ ජීවිතයක් ගත කළ හ.
- තමන් සතු සියල්ල පොදුවේ තබාගෙන, පරිහරණය කරමින්, කිසිම වෙනසක් නැතිව, එකමුතුව ජීවත් වූහ.
- මොවනුන්ගේ සාමූහික ජීවිතය, ප්‍රේමයෙන් පිරුණු එකමුතුකමේ ජීවිතය අන්අයට ආදර්ශයක් විය.
- මොවුන් අතර හීබෲ බස කථා කළ ජුදෙව්වරුන් ද, ග්‍රීක බස කථා කළ ජුදෙව්වන්ද සිටියත්, බෞතීස්මයේ දී ඔවුන් තුළට වැඩම කළ ශුද්ධාත්මයාණන්, ඔවුන් සියලුදෙනාවම එකට එක් කළ සේක.

### 5.1.2.3 පූප කැඩීම, බෙදාහදාගෙන ජීවත්වීම

- මුල් කිතුනු සභාවේ ප්‍රේමයේ භෝජන සංග්‍රහ පැවැත්විණි. එය ''අගපේ'' යනුවෙන් ග්‍රීක බසින් හැඳින්වේ. මේ ප්‍රේමයේ භෝජන සංග්‍රහය සමඟ පූප කැඩීමේ පිළිවෙත සිදු කෙරුණි
- මුල් කිතුනුවන් පෙරුසලමේ දේව මාළිගාවලට, ධර්මශාලාවලට ගොස් එහි සිදු කළ ජුදා යාගයන්ට හා වත්පිළිවෙත්වලටත්, යාච්ඤාවලටත් සහභාගිවූවත්, දිනපතාම ගෙයින්ගෙට ගොස් කිතුනුවන්ටම නියම වූ පූපකඩමින් ද, තමතමන් අතරේ ප්‍රීතියෙනුත් ත්‍යාගවන්ත සිතිනුත් ආහාර බෙදා ගනිමින් ද ජීවත් වූහ.
- සියල්ලෝම එක්ව භෝජන සංග්‍රහය අනුභව කරමින් සතුටු වූහ.
- ''පූප කැඩීම'' යනු දිව්‍ය සත්ප්‍රසාදය හඟවන වදනකි.
- ඔවුහු තමන්ගේ ඉඩකඩම් හා දේපල විකුණා එකිනෙකාගේ උවමනාවේ හැටියට සියලුදෙනා අතරේ බෙදා ගත්හ.
- අන්අයගේ යහපත් ජීවිතය කෙරෙහි උනන්දුවක් ඇති, ඔවුන්ගේ උවමනාවන් සපුරාලන අය ලෙස ජීවත් වූහ.
- ඔවුන් සැමදෙනා මෙලෝ වස්තූන් කෙරෙහි කිසිම ආශාවක් නැති අය ලෙස සිටියහ.
- තමන් සන්තක වස්තූන් තමන්ට අයත් යයි නොසිතා පොදු වස්තූන් සේ සලකා ජීවත් වූහ.
- මෙසේ කළ යුතු යයි නියමයක් නොවූවත් ඔවුන්ම කැමැත්තෙන් ඉදිරිපත් වී, ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන්, උන් වහන්සේගේ ඉගැන්වීමට අනුව සියල්ල පරිත්‍යාග කළ හ.
- අගහිඟ ඇති කිසිවෙක් ඔවුන් අතර නොවූහ. මන්දයත් ඔවුන්ගේ අවශ්‍යතා, අන්අය විසින් විගසින් සපුරා දෙන ලදි.

- වතුපිටි හෝ ගෙවල් හෝ අයිතිකරුවන් ඒවා විකුණා එයින් ලත් මුදල් ගෙනවිත් අපෝස්තුළුවරුන්ගේ පාමුල තැබූහ. මෙය දෙවියන් වහන්සේට පුදන පඬුරක් ලෙස සැලකේ.
- අපෝස්තුළුවරු මේ මුදල් එකිනෙකාගේ උවමනාවේ හැටියට බෙදා දුන්හ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අතර කිසිම භේදයක් හෝ වෙනසක් හෝ දැකිය නොහැකි විය.
- එනමුත් අනනියස් හා සපිරා දෙදෙනාගේ අයහපත් සිතිවිලිවලින් යුතු ක්‍රියාත් එයට ඔවුන් ලැබූ දඬුවමුත් සියල්ලන්ට පාඩමක් විය. (ක්‍රියා 5/1-11 දක්වා)

### 5.1.2.4 යාච්ඤාවේ නිරතවීම

- මුල් කිතුනුවන් ජෙරුසලමේ දේව මාළිගාවට, ධර්මශාලාවලට ගොස් එහි සිදු කළ ජුදා යාගයන්ටත්, මෙහෙයන්ටත්, යාච්ඤාවන්ටත් සහභාගිවූවන් දිනපතාම ගෙයින් ගෙට ගොස් කිතුනුවන්ටම නියම වූ පූපකඩමින් ද තම තමන් අතරේ ප්‍රීතියෙනුත් ත්‍යාගවන්ත සිතිනුත් සහභාගි වූහ.
- සබත් දින ද නියමාකාරයෙන් අනුසාර කළහ.
- තනිතනිව පමණක් නොව, ඔවුන් සැම එක පවුලක් ලෙස, එකම සමූහයක් ලෙස එක්ව දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරමින්, තම අවශ්‍යතා වෙනුවෙන් දෙවිඳුන්ගේ සහය පැතූහ.
- තව ද ඔවුන් දෙවිඳුන් තමන් සමග, තමන් මධ්‍යයෙහි වැඩ සිටින සේක යන හැඟීමෙන් යුතුව දේව භය හා භක්තියෙන් ජීවත් වූහ.
- එම නිසා ඔවුන් ජනතාවගේ ගෞරවය දිනා සිටිය හ. දෙවිඳුන්ගේ ආනුභාවයත් ආශිර්වාදයත් ඔවුන්ට නොඅඩුව ලැබුණි. දිනෙන් දින නව සාමාජිකයන් ඔවුන්ගේ සමූහයට එක්වූහ.
- මුල් කිතුනුවන්ගේ ප්‍රේමයෙන් පිරුණු, බෙදාහදා ගනිමින් ජීවත් වන, ආදර්ශමත් ජීවිතය නිසා අන්අය ඔවුන් කෙරෙහි පැහැදීමකින් යුතුව ඔවුන්ට ගෞරව කළ හ.
- සමහරු ඔවුන්ගේ ජිවිතාදර්ය ලැබ ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කර, බෞතීස්මය ලබා, ශුද්ධ වූ සභාවට එක්වූහ. ශුද්ධ වූ සභාව ද දිනෙන් දින වර්ධනය විය.

### 5.1.3 උපස්ථායකයින් පත් කිරිම (ක්‍රියා 6 පරිච්ඡේදය)

- ශුද්ධ වූ සභාව වර්ධනය වී, ක්‍රිස්තු භක්තිකයන්ගේ ගණන වැඩිවන විට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සම්බන්ධයෙන්, ඔවුන්ගේ සාමූහික ජීවිතය තුළ ගැටළු ඇති විය.
- ග්‍රීක බස කථා කරන ජුදා කිතුනුවන් තමන්ගේ වැන්දඹු කාන්තාවන්ට දිනපතා සහනාධාර දීමේ දී නොසලකා හැරිය බවට, හීබෲ බස කථා කරන ජුදෙව්වරුන්ට විරුද්ධව අපොස්තුළුවරුන්ට පැමිණිලි කළ හ.
- විශ්වාසිකයන් තමන් අතරින් යහපත් යයි පිළිගත් එසේම ශුද්ධාත්මයාණන්ගෙන් ද, ප්‍රඥාවෙන් ද පූර්ණ සත්දෙනෙකු තෝරා ගත් හ. අපෝස්තුළුවරු ඔවුන් මත අත්තබා යාච්ඤා කර ඔවුන්ව කැප කර ඔවුන්ට වගකීම් පැවරූහ. ඔවුන් ශුද්ධ වූ සභාවේ වගකීම්ලත් ප්‍රථම සේවකයන් වේ. (ක්‍රියා 6/1-6)

- මෙලෙස ශුද්ධ වූ සභාව ජේසුස් වහන්සේගේ අණපණත් ඉටු කිරීමට දියුණු මඟක ගමන් කළේ ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භක වර්ධනය පිළිබඳ ගවේෂණය කරයි.
2. නව ක්‍රිස්තියානි ජීවිත ගුණාංග ගෙනහැර දක්වයි.
3. ධර්මදූත සේවාව පතල කිරීම සඳහා දේව සේවකයින්ගේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරයි.

**නිපුණතාව** **5.0** : ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලුතුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධවූ සභාවේ වර්ධනයට සහය දක්වයි.

**නිපුනතා මට්ටම** **5.2** : කිතුදහම සියල්ලන් වෙතට ගෙනයාමට පාවුලුතුමා යොදාගත් උපක්‍රම හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**කාලච්ඡේද** : 36

**ඉගෙනුම් පල** :

- ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත කාර්යය පිළිබඳ තොරතුරු රැස්කරයි.
- ශුද්ධවූ පාවුලු තුමා විජාතීන්ගේ අපෝස්තුලුවරයා බව පිළිගනියි.
- පාවුලුතුමාගේ ඉගැන්වීම් ලැයිස්තුගත කර පෙන්වයි.
- පාවුලුතුමා ධර්මදූත කාර්යය සඳහා යොදාගත් උපක්‍රම, අනුගමනය කරයි.
- සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවේ නියැලෙන අය හා එක්ව ක්‍රියාකරයි.

**විෂය අන්තර්ගතය** :

**5.2.1 ශු. පාවුළුතුමා**

- මුල්කාලීන ශුද්ධ සභාවේ වර්ධනයට වැඩි දායකත්වයක් දැරුවේ ශු. පාවුළුතුමා ය.
- ජුදා ජාතිය තුළින් බිහිවූ ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය අන්‍ය ජාතීන් වෙත ගෙනයාමට නම් දෙපාර්ශවයට ම පොදුවූ කෙනෙකු මගින් එය ඉටුවිය යුතුයි යන දේව සැලැස්ම ශු. පාවුළුතුමා මගින් සම්පූර්ණ විය.
- එබැවින් ශු. සභාවේ වර්ධනය ගැන දැන ගැනීමට කැමති අය ශු.පාවුළුතුමාගේ ජීවිතයත්, ඔහු ඉටු කළ සේවයත් දැන ගැනීම අවශ්‍ය වේ.

**ශු.පාවුළුතුමාගේ ජීවිත පසුබිම**

- ශු. පාවුළුතුමා සුළු ආසියාවේ ඇති සිලීසියේ අගනුවර වන තාර්සස් නම් ග්‍රීක නගරයේ උපත ලැබීය. තාර්සස් නගරයේ භූගෝලීය පසුබිම මනහරව පිහිටියේ ය.
- තාර්සස් වාණිජ නගරයක් පමණක් නොව එය ග්‍රීක රෝම අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ද විය. එකල ඇතැන්ස් හා ඇලෙක්සැන්ඩ්‍රියා නගරවලට වඩා අධ්‍යාපනයේ අධික කීර්තියට පත්ව තිබුණි.
- ග්‍රීක කලා සංස්කෘතියේ මූලස්ථානයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබූ මේ නගරය, බොහෝ චින්තකයින් ද, දාර්ශනිකයන් ද බිහි කළේ ය.
- ග්‍රීක නගරයේ රෝම පුරවැසියකු ලෙස උපතලත් ශු. පාවුළුතුමා ජුදා ජාතියට අයත් කෙනෙකි. රෝම පුරවැසිභාවය ඔහුට පියාගෙන් ලැබුණු උරුමයකි. ඔහුගේ ජුදානාමය සාවුල් ය. ග්‍රීක රෝම නාමය පාවුළු ය.

- මෙවන් ග්‍රීක චින්තන වාතාවරණයක් තුළ පාවුළුතුමා තම ළමාවිය ගත කළේ ය. මේ නිසා අන්‍යජාතික කිතුනුවන් අතර විශේෂයෙන් ග්‍රීකයන් අතර ශුභාරංචිය පතල කිරීමට සුදුසුම තැනැත්තා මොහු විය.
- පාවුළුතුමා ළමාවියේ දී ග්‍රීකයන්ගෙන් පීඩාවට පත් වූ ජුදෙයාවේ තම නිවසින් මූලික අධ්‍යාපනය ලැබීය.
- එතුමා තරුණ වියේ දී ඉතා ප්‍රසිද්ධියට පත්ව සිටි ජුදා විනයධරයකු වූ ගමාලියල් පඬිවරයාගෙන් ජුදා නීති ග්‍රන්ථ මනාව හැදෑරුවේ ය. පලස්තීනයේ ජුදා සම්ප්‍රදායන්, ජුදා දහම, නීතිය හා ව්‍යවස්ථාව පිළිබඳ ව ගැඹුරින් හැදෑරුවා පමණක් නොව ඒවා නිවැරදිව පිළිපැද්දා වූ පරිසිවරයකු ද, ශ්‍රේෂ්ඨ ගුරුවරයකු ලෙස ද (රබ්බි) කටයුතු කළේ ය.
- ජුදා දහමට තිබූ ඇල්ම නිසාත් ජුදා නීතිය කෙරෙහි තිබූ උනන්දුව නිසාත්, කිතු දහමත්, කිතුනුවන්වත් විනාශ කිරීමට ආවේගශීලීව කටයුතු කළේ ය.

### 5.2.1.1 පාවුළුතුමාගේ කැඳවීම හා සිත්හැරීම (ක්‍රියා 9/1-19, 22/3-21,26/12-18)

- පාවුළුතුමා කිතුනුවන් අත්අඩංගුවට ගැනීමේ අරමුණින් දමස්කය කරා ගමන් කරන විට හදිසියේ ම ස්වාමීන් වහන්සේව මුණ ගැසුනේය.
- දමස්ක ගමනේ දී පාවුළුතුමාත්, උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේත් අතර ඇති වූ මෙම හමුවීම පාවුළුතුමාගේ ජීවිතයේ වෙනසක් ඇති කළේය.
- මේ අත්දැකීම ක්‍රිස්තු විරෝධියකු වූ පාවුළුතුමාව, ශ්‍රාවකයකු ලෙස වෙනස් කළේ ය. කිතුදහම විනාශ කිරීමට පිටත් වූ පාවුළුතුමාව, කිතුදහම සැම තැන දේශනා කර, පතල කරන ශ්‍රාවකයකු ලෙස වෙනස් විය.
- උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ මේ හමුවීම පාවුළුතුමාගේ අනන්‍යතාව වෙනස් කළේ ය. තමා ජුදෙව්වකු, බෙන්ජමින් ගෝත්‍රිකයකු, ජුදා නීතිය හැදෑරුවකු පරිසිවරයකු යන හැඟීම් සියල්ල ම පාවුළුතුමාගෙන් තුරන් විය. ජේසුස් වහන්සේව පමණක් හිමිකර ගැනීමට අන් සියල්ල ම ප්‍රතික්ෂේප කළේ ය.
- යෙසායා (යෙසායා 49/1-6) ජෙරමියා (ජේරමියා 1/5) ආදී අන්‍යජාතීන්ගේ දිවැසිවරුන් මෙන් පාවුළුතුමා ද අන්‍යජාතීන්ගේ අපොස්තුළුවරයා යන විරුදාවලිය ලද්දේ ය. මේ දිවැසිවරුන් දෙදෙනා මෙන් දෙවියන් වහන්සේ තමන්වත්, මවුකුසේ බිහිවූ අවධියේම කැඳවූ බව සිතූ පාවුළුතුමා මේ දෙදෙනා ලෙස අන්‍යජාතීන්ට ජේසුස් වහන්සේගේ ශුභාරංචිය පතල කිරීමට තමන්වත් මුළුමනින් ම කැප කළේ ය.
- පාවුළුතුමාගේ සිත් හැරීමත්, බෞතීස්මය ලැබීමත් සමග දමස්කයේ ධර්මශාලාවල දී ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව එතුමා (ඔහු) ප්‍රකාශ කළේ ය. නමුත් සියල්ලෝ දෙස ඔහු සැකයෙන් බැලූහ.
- මේ අවස්ථාවේ දී බරණබස් පාවුළුතුමා අන්තියෝකයට කැඳවා ගෙනවිත්, එහි ක්‍රිස්තියානි සභාව ආරම්භ කළේ ය.

- දිනක් අන්තියෝකයේ සභාවේ සිටි දිවැසිවරුන් ද ගුරුවරුන් ද දෙවියන් වහන්සේට සේවය කරමින් උපවාසයේ යෙදී සිටිය දී ශුද්ධාත්මයාණන් වහන්සේ පාවුළුතුමාව සහ බරණබස්ව විශේෂිත සේවයක් සඳහා වෙන් කර තබන්නයි පැවසූ විට, ඔවුහු උපවාසයේ යෙදී ඔවුන් පිට අත්තබා යාච්ඤා කොට, අන්‍යජාතීන්ට ශුභාරංචිය දේශනා කිරීමට පිටත් කර හැරිය හ. මෙසේ ඔවුන් තම සේවය ආරම්භ කළ හ. (ක්‍රියා 13/1-3)

**5.2.2 පාවුළුතුමා දහම පතල කිරීමට ගත් ක්‍රියාමාර්ග**

1. ධර්මදූත චාරිකා
2. සන්දේශ

**5.2.2.1 ධර්මදූ.ත චාරිකා**

- පාවුළුතුමාගේ ධර්මදූත සේවය පිළිබඳ ව ලූක්තුමා ක්‍රියාපොතේ කරන විස්තරය පදනම් කරගෙන එය පාවුළුතුමාගේ ධර්මදූත චාරිකා තුනක් ලෙස වෙන්කර ඇත.

**5.2.2.2 පාවුළුතුමාගේ පළමුවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 13/4-ක්‍රියා 14:28)**

| | | |
|---|---|---|
| සිදුවූ කාලය | - | ක්‍රි.ව. 46-49 දක්වා වසර තුනක පමණ කාලයක් |
| චාරිකාවට සහභාගි වූ අය | - | බර්ණබස්තුමා ජොහාන් මාක් තුමා |
| අරමුණ | - | මෙතෙක් ශුභාරංචිය දැන නොගත් අයට ශුභාරංචිය දේශනා කිරීම. |
| ගියා වූ ස්ථාන හා සිදුවීම් | - | සිරියාවේ අන්තියෝකයේ සිට පාවුළුතුමා තම සේවය ආරම්භ කර සිලූතියේ වරායෙන් නැව් නැග සයිප්‍රස් දිවයිනට ගියේ ය. |

**සයිප්‍රස් දූපත**

**සලමිසය**

සිනගෝගවල දේව වචනය ප්‍රකාශ කළේ ය.

- පාවුළුතුමා ජොහාන් මාක්තුමාව කැඳවාගෙන ගියේ ය.

**පාපස්**

- එලිමස් මැගෝස් (බාර් ජේසුස්) යන බොරු දිවැසිවර විජ්ජාකාරයාගේ විරුද්ධත්වයට පාවුළුතුමා ධෛර්යයෙන් මුහුණදීම මෙම දූපතේදේශාධිපති සර්ගියස් පාවුලස් ශුභාරංචිය අදහා ගැනීම මෙහිදී පාවුළුතුමා මගින් අන්‍යජාතීන් වෙත කිතුදහම පතලවීම දැකිය හැකි ය.

**පර්ගා**

- ජොහාන් මාක්තුමා ධර්මදූත කණ්ඩායමෙන් වෙන්ව ගියේ ය.

**පිසිදියේ අන්තියෝකය**

- මෙහිදී පාවුළුතුමා ජුදා ධර්මහාලාවේ දේශනා කළේ ය. ජුදෙව්වන් ශුභාරංචිය ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුහු අන්‍යජාතීන් වෙත ගොස් දේශනා කළ හ. මේ චාරිකාවේ දී මේ නගරය තුළ දැඩි විරුද්ධත්වයකට මුහුණපෑමට සිදුවීම විශේෂත්වයකි.

**ඉකෝනිය**

- මේ නගරයේ දී පාවුළුතුමාගේ දේශනය අසා සිත් හරුණු සහ නොහැරුණු යයි ජනයා දෙකොටසකට බෙදුන හ.

**ලුස්ත්‍රා**

- පාවුළුතුමා කොරකු සුව කළේ ය. මෙය දුටු ජන සමූහයා ''දෙවිවරු මිනිස් වෙසින් අප වෙතට බැස සිටිති'' යි පවසා බර්ණබස්ට ''සියුස්'' (ජුපිටර්) කියා ද, පාවුළුතුමාට හෙර්මිස්'' (මෙර්කුරි) කියා ද ඇමතුහ.

**දර්බය**

- ශුභාරංචිය දේශනා කර බොහෝ දෙනෙකු ගෝලයන් කළේ ය.
- නැවත හැරී එන ගමනේ දී ලුස්ත්‍රා, ඉකෝනිය අන්තියෝකය ආදී නගරවලට නැවතත් ගොස් ගෝලයන් ධෛර්යමත් කර, සභා මූලිකයන් පත් කළේ ය.

පාවුළුතුමාගේ පළමු ධර්මදූත චාරිකාව කෙටි එකක් වුවත් සාර්ථක එකක් බව කිව හැක. ජුදෙව්වන් බොහෝ දෙනෙකුගේ සිත් හරවා ගත නොහැකිවුවත් බොහෝ අන්‍ය ජාතීන් තුළ විශ්වාසය ගොඩනැගීමට හැකි විය.

**5.2.2.3 ජෙරුසලම් මන්ත්‍රණ සභාව**

**ජෙරුසලම් මන්ත්‍රණ සභාව කැඳවීමට හේතු වූ පසුබිම**

- පාවුළුතුමාගේ පළමු ධර්මදූත චාරිකාවට පසු අන්‍යජාතින් බහුල ලෙස සභාවට එක්වූහ. එම නිසා සභාව ක්‍රමක්‍රමයෙන් අන්‍යජාතීන්ගේ එකක් බවට පත්විය.
- මේ නව වාතාවරණය මුල් සභාව තුළ විශාල ප්‍රශ්නයක් ඇති කළේය. මෙතෙක් කල් කිතුදහම ජුදා ආගමේ එක් කොටසක් යයි පැවසූ ජුදෙව්වන් අන්‍යජාතීන් කිතුදහම වැළඳ ගැනීමේ දී පළමුව චර්මඡේදනය කළ යුතු බවත්, මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව පිළිපැදිය යුතු බවත්, අවධාරණය කළ හ. එය ප්‍රතික්ෂේප කරමින් පාවුළුතුමා හා බර්ණබස්තුමා වාද කළ හ. මෙය අන්තියෝකයේ ජුදා හා අන්‍ය මිශ්‍ර සභාවේ ගැටුමකුත් බෙදීමකුත් ඇති කළේ ය. මේ ප්‍රශ්නයට විසඳුමක් දීම පිණිස රැස්වූවකි ජෙරුසලම් මන්ත්‍රණ සභාව

- මෙය ශුද්ධ වූ සභාවේ ප්‍රථම ජගත් සමුළුව විය. මෙය ක්‍රි.ව. 49 දී රැස්වූ බව කියැවේ.
- මේ මන්ත්‍රණ සභාවට නායකත්වය දැරූ පේදුරු තුමා කොරනේලියස්ගේ බෞතීස්මය පිළිබඳව තම අත්දැකීම ගෙනහැර පෑවේ ය. පේදුරු තුමාගේ මේ දේශනය සියලු ප්‍රශ්නවලට ස්ථිර විසඳුමක් ගෙනදුන් එකක් විය.
- අවසානයේ දී ජෙරුසලම් සභා නායකයා වූ ජාකොබ් තුමා තම දේශනයේ දි දිවැසිවර ආමොස් මුලින් ජුදෙව්වනුත් පසුව අන්‍යජාතිනුත් ගැලවීම ලබන්නේ ය. (ආමෝස් 9/11-12) යනුවෙන් පැවසූ බව සිහිකර, අත්‍යවශ්‍ය දේ මිස වෙනත් කිසි බරක් ජනතාව මත නොපැටවිය යුතු ය. නමුත් ජුදෙව්වරුන්ට අප්‍රසන්න වන දේවල් වැළැක්වීම සඳහා පසු සඳහන් කරන තීරණ ගන්නා ලදි.
    1. දේව පිළිමවලට පිදූ දේ අනුභව නොකළ යුතුයි.
    2. සත්ව ලෙය අනුභව කිරීමෙන් වැළකිය යුතුයි.
    3. බොටුව මිරිකා මැරූ සතුන් අනුභව නොකළ යුතුයි.
    4. කාමමිථ්‍යාචාරයෙන් හෙවත් ලෙවී 18 පරිච්ඡේදයේ සඳහන් කාමයේ වරදවා හැසිරීමෙන් වැළකිය යුතුයි.

- මේ තීරණ සභාවන් වෙත ගෙනයාමට ජුදස් සහ සීලස් තෝරා ගන්නා ලදි.
- මේ තීරණ ශුද්ධ වූ සභාව තුළ නවතාවයක් ඇති කළේ ය. අපව පවිත්‍ර කරන්නෙ චර්මඡේදනය නොව ඇදහිල්ලයි. අපට ගැලවීම දෙන්නේ ජුදා ව්‍යවස්ථාව නොව ජේසුස් වහන්සේගේ වරප්‍රසාදයයි. කිතුදහම ජුදාදහමේ කොටසක් නොව තනි දහමකි. එය විශ්වීය දහමකි.
- චර්මඡේදනය නොකළත් ජුදා ව්‍යවස්ථාව අනුගමනය නොකළත්, ජුදෙව්වකු නොවූවත් කිතුනුවකු විය හැකියි. කිසිවකුත්, තම සංස්කෘතිය චාරිත්‍ර, බස, ජාතිය, අන්‍යන්‍යතාව අත්නොහැර ශුද්ධ වූ සභාවේ සාමාජිකයකු විය හැක. ශුද්ධ වූ සභාව කිසිම ජාතියකටවත් භාෂාවකටවත් සීමා නොවේ.

**5.2.2.4 පාවුළුතුමාගේ දෙවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 15/36 - 18/23)**

- ජොහාන් මාක් කැඳවාගෙන යාම සම්බන්ධයෙන් පාවුළු තුමාටත්, බරණබස් තුමාටත් විවාදයක් ඇති විය.

| | | |
|---|---|---|
| **සිදුවූ කාලය** | - | ක්‍රි.ව. 50-52 දක්වා වසර තුනක පමණ කාලයක් |
| **චාරිකාවට සහභාගි වූ අය** | - | සීලස්, තිමෝතියස්, ලූක්තුමා |
| **අරමුණ** | - | ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණ දන්වා, දිරිමත් කර, ස්ථිර කිරීම |
| **බැහැදුටු ස්ථාන හා සිදුවීම්** | - | |

- පාවුළුතුමාත්, සීලසුය පළමුව සිරියාව, සිලීසියේ සභා බැහැදක මන්ත්‍රණ සභාවේ තීරණ දන්වා තහවුරු කළ හ.

**ලුස්ත්‍රාව**

- මෙහිදී ජනතාවගේ ප්‍රසාදය දිනා සිටි තිමෝතියස් නව ගෝලයකු වී පාවුළුතුමා සමග එක් විය. චර්මඡේදනය කිරීම අවශ්‍ය නොවූවත් ශුභාරංචිය දේශනා කිරීමට එය බාධාවක් නොවීමට පාවුළුතුමා තිමෝතියස් චර්මඡේදනය කළේ ය.

**ත්‍රෝවසය**

- පාවුළුතුමා මෙහි නරත වී සිටිය දී දර්ශනයක් දැක්කේ ය. ධර්මදූත චරිකාවල දී පාවුළුතුමා දුටු දර්ශන පහෙන් ප්‍රථම දර්ශනය මෙයයි. (ක්‍රියා 16:6-10, 18/9-10, 22/17-21, 23/11, 27/32-24) මේ දර්ශනය එතුමාව යුරෝපීය රටවලට ශුභාරංචිට පතල කිරීමට පෙළඹවීය.

**පිලිප්පිය**

- පිලිප්පිය රෝම ජනපදයකි. මෙය පෞරාණික වූද, වැදගත් වූද නගරයකි. ජුදෙව්වන් සුළු පිරිසක් ජීවත් වූ බැවින් ධර්මශාලාවක් නොතිබුණි. එබැවින් ජනතාව එක්රැස්වූ තැනක් වන ගංතෙරට ගොස් එහි රැස්ව සිටි කාන්තාවන්ට දේශනා කළේ ය. යුරෝපයේ ප්‍රථමවරට ශුභාරංචිය දේශනා කළේ පිලිප්පියේ බව සඳහන් වේ. එහිදී සිදුවූ වැදගත් සිද්ධීන්
  1. ලිදියාගේ සිත් හැරීම (ක්‍රියා 16/11-15)
  2. පේන කියු වහල් තරුණිය අශුද්ධාත්මයන්ගෙන් මුදවා ගැනීම. (ක්‍රියා 16/16-18)
  3. පාවුළු තුමා හා සීලස් සිර කරනු ලැබීම. (ක්‍රියා 16/19-34)
  4. පාවුළුතුමා හා සීලස් නිදහස් කරනු ලැබීම (ක්‍රියා 16/35-40)

**තෙසලෝනිකය**

- ජුදෙව්වන්ගෙන් සමහරු ද, ජුදා දහම වැළඳගත් අන්‍යජාතීන් විශේෂයෙන් ධනවත් ග්‍රීක ස්ත්‍රීන් බොහෝ දෙනෙක් ද සභාවට එක්වූහ.

**බෙරියාව**

- ජුදෙව්වන්, ධනවත් ග්‍රීක ස්ත්‍රීන්, පුරුෂයන් ආදී බොහෝ දෙනෙක් අදහා ගත්හ.

**ඇතැන්ස්**

- පුරාණයේ පටන් ඇතැන්ස් නගරය ග්‍රීක දර්ශනිකයන්ගේ බලකොටුවක් විය.
- මේ නගරයේ ජීවත් වූ සියලු වැසියන් චින්තන හැකියාවෙන් ප්‍රමුඛව සිටිය හ. පාවුළුතුමා අරියෝපග ශාලාවේ රැස්ව සිටි ග්‍රීක දාර්ශනිකයන්ට දේශනා කළේ ය.

- මෙය අන්‍යජාතීන්ට කළ එකම දේශනය විය. මෙය ජුදෙව්වන්ට කළ දේශනයට වඩා වෙනස් එකක් විය.
- මෙහිදී ග්‍රීක කවීන් ද, විශාරදයන් ද උදාහරණයට ගනිමින් දේශනා කළේ ය. තව ද ඔහුගේ දේශනයේ ග්‍රීක දාර්ශනික අදහස් දක්නට ඇත.

**කොරින්තිය**

- මෙහිදී පාවුළු තුමාට අකිලා හා ප්‍රිස්කිලා යුවලගේ ඇසුර ලැබුණේ ය. අන්‍යජාතීන් බොහෝ දෙනෙක් ශුභාරංචිය අදහා ගත් හ.
- ජුදෙව්වන් පාවුළු තුමාව ගල්ලියෝ ඉදිරියට ගෙනආවිට ගල්ලියෝ ජුදෙව් දහමට ද ව්‍යවස්ථාවට පටහැනි ප්‍රශ්නවලට තමන් මැදිහත්වීමට අකමැතිව ඔවුන් නඩු ශාලාවෙන් නෙරපා දැමුවේය.
- ස්වාමීන් වහන්සේ රාත්‍රියේ දී දර්ශනයකින් පාවුළුතුමාට කතා කොට ''ඔබ බිය නොවී නිශ්ශබ්දව නොසිට කතා කරන්න. මන්ද මම ඔබ සමග සිටිමි...'' කියා ඔහු දිරිමත් කළ සේක. පාවුළුතුමා ඔවුන්ට උගන්වමින් වසර 1 1/2ක් එහි නතරව සිටියේ ය. මෙහි සිට තෙසලෝනික වැසියන්ට ලිපි දෙකක් ලීවේ ය. මේවා පාවුළුතුමා ලියූ ප්‍රථම ලිපිවේ.

**කෙන්ක්‍රෙයා**

- පාවුළුතුමා බාරයක් වී සිටි බැවින් මෙහිදී හිස මුඩු කර ගත්තේ ය.

**එපීසය**

- ජනයා පාවුළුතුමාගෙන් නතරවන ලෙස ඉල්ලා සිටියත් ''දෙවියන් වහන්සේ කැමතිසේක් නම් ඔබ වෙතට නැවත එන්නම්'' යි පවසා එපීසයෙන් කයිසාරියට ගියේය. පසුව එහි සිට ජෙරුසලමට ගොස් සභාවේ සියල්ලන් මුණගැසී තම සේවාව පිළිබඳ වාර්තාව ඉදිරිපත් කොට අන්තියෝකයට ගියේ ය.

**5.2.2.5 පාවුළුතුමාගේ තෙවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 18/23 - 21/20)**

| | | |
|---|---|---|
| **සිදුවූ කාලය** | - | ක්‍රි.ව. 54-58 දක්වා වසර තුනක පමණ කාලයක් |
| **චාරිකාවට සහභාගි වූ අය** | - | තිමෝතියස්, තීතස් ලූක්තුමා |
| **අරමුණ** | - | පාවුළුතුමාට සිදුවීමට යන ඉරණම ගැන ශුද්ධාත්මයාණන් මුලදීම දැනුම් දුන් බැවින්, අවසාන වතාවට සභාවත් මුණගැසී, කිතුනුවන් දිරිමත් කර ස්ථිර කිරීම |

**ගියා වූ ස්ථාන හා සිදුවීම්** -

**එපීසය**

- එපීසය ආසියාවේ ප්‍රධාන නගරයකි. සැප සම්පතින් පිරුණු අලංකාර නගරයකි. ඉතා ප්‍රසිද්ධියට පත්වූ උත්තරිතර දේවතාවියක් වූ අර්තෙමිස්ගේ දේවාලයක් මෙහි තිබුණි. මේ නගරය අර්තෙමිස්ගේ දේවාලයෙන් ද, පුදපූජාවලින් ද, මායා විජ්ජාවලින්ද, යක්ෂ කාර්යයන්වලින් ද ප්‍රසිද්ධියට පත් වූවකි. මේ නගරයේ පැවති විශේෂ සිද්ධීන්
    1. පාවුළුතුමා අපොල්ලොස් මගින් ස්නාවක ජුවාම් තුමාගේ බෞතීස්ම ස්නාපනය ලබා තිබූ ගෝලයන් 12 දෙනෙකුට ශුද්ධාත්මයාණන් මගින් බෞතීස්මය දානය කළේ ය.
    2. තුරානස්ගේ ශිල්පශාලාවෙහි දේශනා කළේ ය.
    3. ස්කේවගේ පුත්‍රයන් ජේසුස් වහන්සේගේ නාමයෙන් යකුන් දුරු කිරීමට උත්සාහ කළ හ.
    4. රිදී රූපසාදන කලාකරුවන් කලහයක් ඇති කිරීම.

- කොරින්තිය, පිලිප්පිය, තෙසලෝනිකය හරහා ගමන් කොට කොරින්තියට ගිය හ. නැවතත් පිලිප්පියට පැමිණ පාස්කු මංගල්‍යය සමරා ත්‍රෝවසයට ගියහ.

**ත්‍රෝවසය**

- යුතිකස් නම් තරුණයා මරණින් උත්ථාන කිරීම

**මිලේතසය**

- එපීසයට පණිවිඩ යවා, සභාවේ මූලිකයන් කැඳවා සමුගැනීමේ කථාව පැවැත්වීය. මේ කථාව ඉතා හැඟීම්බර එකක් විය. මෙය අවසන් සමුගැනීමේ ස්වරූපයෙන් කරන ලද්දකි. මෙය පාවුළුතුමා කිතුණුවන්ට පමණක් කළ කථාවක් විය.

**කායිසාරිය**

- පිලිප්ගේ නිවසේ දී දිවැසිවර අගබස් පාවුළුතුමාට සිදුවීමට යන දුක් විඳීම ගැන පෙර දැනුම් දුන්නේ ය.
- මෙය ඇසූ සියල්ලෝ ජෙරුසලමට නොයන ලෙස පාවුළු තුමා වැළැක්වූහ.
- පාවුළු තුමා මේ ගමෙනේ දී 1,2 කොරින්ති, ගලාති, පිලිප්පි ආදී ලිපි ලියූ බව සඳහන් වේ.
- පාවුළු තුමා තෙවන ධර්මදූත චාරිකාව නිමකර ජෙරුසලමට ගිය විට සිරභාරයට ගන්නා ලදි. මෙහිදී ශතාධිපති, මන්ත්‍රණ සභාව, ආණ්ඩුකාර ෆීලික්ස්, ආණ්ඩුකාර ෆෙස්තුස්, අග්‍රිපා රජ ඉදිරියේ නඩු විභාග කිරීම.
- පාවුළු තුමා නඩු විභාගය සඳහා රෝමයට සිරකරුවකු ලෙස ගෙනයනු ලැබූවත්, මේ ගමන දහම ප්‍රචාරය සඳහා උපයෝගී කරගත් බව සඳහන් වේ. මෝල්ටා දූපතේ දී කළ සේවය ද අගය කළ යුත්තකි.

### 5.2.3 දේවධර්මික ලිපි (සන්දේශ)

- පාවුළු තුමා අන්‍යජාතීන්ගේ අපෝස්තුළුවරයා පමණක් නොව එතුමා පළමු දේවධර්මාචාර්යවරයා ද විය. එතුමා ශ්‍රේෂ්ඨ ලේඛකයකු ද වෙයි.
- එතුමා ලියූ ලිපිවල එතුමාගේ දේවධර්මික චින්තනයත් අදහසුත් දැකිය හැක. මෙමගින් පාවුළුතුමා කිතුණු දේවධර්ම විකාශනයට බෙහෙවින් පංගුකාර වී ඇත. ලිපිවල අඩංගු වැදගත් ඉගැන්වීම් සමහරක් පහත දැක්වේ.

#### 5.2.3.1 දේව වරප්‍රසාද (රෝම 2/12-19, 7/7-20, ගලාති 3/15-29)

- ''දේව වරප්‍රසාද' යන්නට පාවුළුතුමා යොදා ගන්නා ග්‍රීක වචනය ''කාරිස්'' එයට ''කරුණාව හෝ සදාතනික ප්‍රේමය'' යන අරුත දෙයි.
- පාපයේ විපාක ලෙස දෙවිඳුන්ගෙන් වෙන් වී, උන්වහන්සේ සමග තිබූ සබඳතාව නැති කරගෙන, නපුරාට යටත් ව ජීවත්වන මිනිසා, මෝසස්තුමාගේ ව්‍යවස්ථාව මනාව පිළිපැද තම යහපත් ක්‍රියා මගින්, තමන්ව, දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු කර ගනී. යන්න ජුදා දහමේ මූලික අදහස වේ. පාවුළුතුමා මෙය ප්‍රතික්ෂේප කර අපට ගැලවීම ලබා දෙන්නේ ව්‍යවස්ථාව නොව දේව වරප්‍රසාදයයි යනුවෙන් පවසයි.
- දෙවිඳුන්ට ප්‍රසන්නවීම යනු දෙවිඳුන් ඉදිරියේ නීතිගරුක ලෙස පෙනී සිටීම. දෙවියන් වහන්සේවම ව්‍යවස්ථාව ලෙස පිළිගැනීම, දෙවියන් වහන්සේ සමඟ ඍජුවම සබඳතාව ඇති කර ගැනීම, විමුක්තිය ලැබීම, නිදහස ලැබීම, ගැලවීම, ලැබීම යන්න අදහස් වේ.

**රෝම 2/12-19**

- ජුදා දහම ගැනත් ජුදා ව්‍යවස්ථාව ගැනත් අධික ඇල්මක් දැක්වූ ජුදා පරිසිවරයකු වූ පාවුළුතුමා එම පදනම මතම ජීවත් වූයේ ය. ''මිනිසා ව්‍යවස්ථාව පිළිබඳ තම යහපත් ක්‍රියා මගින් දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු වේ.'' ඒ නිසා පාවුළු කිතුණු විරෝධියකු ලෙස කිතුණුවන්ට පීඩා කළේ ය. නමුත් දමස්ක ගමනේ අත්දැකීම ව්‍යවස්ථා සම්බන්ධ ඔහුගේ පදනම ගැන නැවත සිතන්නට යොමු කළේ ය.
- තමන්ව දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු කිරීම ව්‍යවස්ථාව නොවේ. ජේසුස් වහන්සේගේ ප්‍රේමයත්, අනුකම්පාවත් තමන්ට ගැලවීම ලබාදුනි. ව්‍යවස්ථාව පිළිපදින යහපත් ක්‍රියා නොව දෙවියන් වහන්සේගේ වරප්‍රසාද යයි නිගමනය කර, දෙවිඳුන් මිනිසාව ප්‍රසන්න කෙනෙකු කරවන ක්‍රියාවලටත් ව්‍යවස්ථාවටත් අතර සම්බන්ධයක් නැතැයි පාවුළුතුමා මේ පරිච්ඡේදයෙන් පහත සඳහන් පරිදි විස්තර කරයි.
- පාවුලුතුමාට අනුව ව්‍යවස්ථාව පිළිපැදීම නිසා නොව ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් පමණක් දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු වේ. ව්‍යවස්ථාව පිළිපැදීම, චර්මඡේදනය කිරීම, කාලහෝරාවකට අනුව කටයුතු කිරීම ඵලක් නැත. දෙවිඳුන් මිනිසාව තමන්ට ප්‍රසන්න කෙනෙකු කරවන ක්‍රියාවලටත්, ව්‍යවස්ථාවටත් සම්බන්ධයක් නැත.

- අන්‍යජාතීන් ව්‍යවස්ථාවක් නැතිවම හෘදසාක්ෂියට සවන් දී යහපත කරන විට දෙවිඳුන්ට ප්‍රසන්න වේ.
- ප්‍රසන්නභාවය දෙවියන් වහන්සේගේ කාරුණික බවයි. දෙවියන්වහන්සේගේ ආදරයේ වරප්‍රසාදයකි. එය දේව වරමකි යන්න පාවුළුතුමාගේ ඉගැන්වීමයි.

**රෝම 7/7-20**

- ව්‍යවස්ථාව, දෙවිඳුන්ගෙන් පැමිණෙන්නකි. පවිත්‍ර වූවකි. යහපත් ය. සත්‍යයය. ශුද්ධ ය. එය ඉශ්රායෙල්වරුන්ට දෙවිඳුන් දුන් විශේෂ දීමනාවකි. නමුත් ව්‍යවස්ථාව නිසා පාපය පැමිනුණි. මිනිසාව පාපයට ඇද දමන්නේ ව්‍යවස්ථාවයි. පාපයට යටත් කරයි. විනය තුළ එය යහපත අයහපත දැනුම් දෙනවා මිස, යහපත කිරීමට අනුබලයක් නොදෙයි. (රෝම 7/16) යන්න පාවුළුතුමාගේ තීරණයයි.
- එම නිසා පාවුළුතුමා ව්‍යවස්ථාවෙන් නොව දෙවියන් කෙරෙහි ඇති අදහිල්ල මිනිසාව දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු කරයි. එය නොමිලයේ ලැබෙන දීමනාවකි. දේව වරප්‍රසාදයකි. පාවුළුතුමා මෙහිදී ව්‍යවස්ථාවට වඩා දේව වරප්‍රසාද උසස් බව පෙන්වයි.

**ගලාති 3/15-19**

- කිසිවක් ව්‍යවස්ථාව සම්බන්ධ ක්‍රියා නිසා දෙවිඳුන්ට ප්‍රසන්න කෙනෙකු වන්නේ නැත. දෙවියන් වහන්සේට අප ප්‍රසන්න වන්නේ ඇදහිල්ල නිසාමයි යන අදහස පාවුළුතුමා මෙහිදී විස්තර කරයි. මෙයට ආබ්‍රහම්තුමාව උදාහරණයට ගනියි.
- අපට ව්‍යවස්ථාව ලැබීමට වසර හාරසිය තිහකට පෙර ආබ්‍රහම් තුමා ඇදහිල්ල නිසා දෙවිඳුන්ට ප්‍රසන්න විය. ''ආබ්‍රහම් ද ස්වාමීන් වහන්සේ අදහා ගත්තේ ය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් උන්වහන්සේ පිළිගත් සේක. (උත්පත්ති 15/6) ආබ්‍රහම් තම ඇදහිල්ල නිසා දෙවියන් වහන්සේ ප්‍රසන්න වූවාසේ අපිත් දෙවියන් වහන්සේ ඒවා වදාළ ක්‍රිස්තුස් වහන්සේ අදහා ගැනීමෙන් දෙවියන් වහන්සේට ප්‍රසන්න වෙමු.
- මුල් කාලයේ දී ව්‍යවසථාව දේව ජනතාවට මගපෙන්වන්නක් ලෙස ද සහය වන ගුරුවරයකු ලෙස ද තිබුණි. ගැලවුම්කරුවකුගේ අවශ්‍යතාවය අවධාරණය කළේ ය. එහෙත් දැන් ගැලවුම්කරු පැමිණි නිසා ව්‍යවස්ථාව නිරර්ථක විය. ජේසුස් වහන්සේ ව්‍යවස්ථාවේ පූර්ණත්වයයි.
- ජේසුස් වහන්සේගේ වරප්‍රසාද උන්වහන්සේගේ කුරුසියේ මරණය තුළින් ලැබේ. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරි යාගය අපගේ විමුක්තියෙත් ගැලවීමේත්, දෙවියන්ට ප්‍රසන්නවීමේත්, දෙවියන් වහන්සේ විසින් යුක්ත ගරුක යයි කියනු ලැබීමටත් සාධකයක් වේ. ඒ වෙනුවෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අප තබන ඇදහිල්ල මගින් දෙවිඳුන්ට ප්‍රසන්න අය වෙමු.
- එබැවින් ගැලවීම යනු නොමිලයේ ලැබෙන වරමකි. දේව වරප්‍රසාදයකි. ජුදයින් හෝ වේවා අන්‍යජාතීන් හෝ වේවා දෙවිඳුන්ට ප්‍රසන්න වන්නේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල නිසා බව පාවුළුතුමාගේ අදහසයි.

**5.2.3.2 ක්‍රිස්තුස් වහනසේගේ ශ්‍රේෂ්ඨත්වය හා බැගෑපත්කම**
**(කොලොස්සි 1/115-20 එපීස 1/3-10 පිලිපපි 2/5-1-11)**

**5.2.3.2.1 ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය (කොලොස්සි 1/15-20)**

- ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය පිළිබඳ ව පාවුළුතුමාගේ ඉගැන්වීම නොස්ටික්වාදීන්ගේ ඉගැන්වීමේ පසුබිමෙන් පැහැදිලි කර ගත යුතුයි. නොස්ටික්වාදීන්ගේ ඉගැන්වීමට අනුව දෙවියන් වහන්සේගෙන් පැමිණි විවිධ ශක්තීන්ගෙන් එකකි, ජේසුස් වහන්සේ එම නිසා උන්වහන්සේ අසමසම අද්විතීය කෙනෙකු නොවේ. තව ද ජේසුස් ක්‍රිස්තුස් දෙවියන් වහන්සේගේ පුර්ණ අනාවරණය බව ඔවුහු පිළිනොගත් හ.
- මෙයට විරුද්ධව පාවුළුතුමා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අසමසම බව, අද්විතීය බව, ශ්‍රේෂ්ඨ බව ගැන කතා කරයි. ''ක්‍රිස්තුස් වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ දෘශ්‍යමාන ස්වරූපයම මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේක''. (කොලෙස්සි 1/15) මෙය උන්වහන්සේගේ ස්වභාවයයි.
- ස්වරූපය යන්නට පාවුළුතුමා යොදා ගන්නා ග්‍රීක වදන නම් ''අයිකෝන්'' යනුයි. මෙහි අරුත '' ජීවමාන එකම ස්වරූපයයි'' (ප්‍රතිබිම්භනය වීම) යන්නයි. එබැවින් පාවුළුතුමා ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පූර්ණ එළිදරව්ව බව කියයි.
- තව ද පාවුළුතුමා ජේසුස් වහන්සේත් මැවිල්ලත් අතර සබඳතාවය ගැන කථා කරයි.
- ''ජේසුස් වහන්සේ මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේක'' සියල්ල උන්වහන්සේ වෙනුවෙන් මවන ලදි. ආරම්භයේ දී ජේසුස් වහන්සේ සියලු මැවිලිවල මැවුම්කාරයාණන් පමණක් නොව, උන්වහන්සේම අවසානයේ දී මැවිල්ලේ අරමුණ ද, ඉලක්කය ද අවසානය ද වන සේක. උන්වහන්සේ මුළු මැවිල්ලම ආරම්භයත්, අවසානයත් අතර කාලය තුළ ආරක්ෂා කරන සේක.
- පාපයේ විපාකය ලෙස මිනිසා හා දෙවියන් වහන්සේ අතර තිබූ සබැදියාව බිඳ වැටී, මිනිසා දෙවියන් වහන්සේගෙන් වෙන්ව ජීවත් විය . නමුත් දෙවියන් වහන්සේ මිනිසාට නිතර ම ආදරය කළ සේක. ජේසුස් වහන්සේ මෙම ගිවිසුම පූර්ණත්වයට පත් කිරීමට මෙලොවට වැඩිය සේක.
- ජේසුස් වහන්සේටත් ශුද්ධ වූ සභාවටත් අතර ඇති සබඳතාවය පැහැදිලි කිරීමේ දී උන්වහන් සේ සභාව නමැති ශරීරයේ හිසය. එහි මූලාරම්භය (කොලොස්සි 1/18-19) ශුද්ධ වූ සභාව, හිසවන උන්වහන්සේ මගින් ක්‍රියා කරන සිරුරයි. එම නිසා ජේසුස් වහන්සේම ශුද්ධ වූ සභාවට ජීවය දෙන හුස්මයි.
- සග ලොවෙත්, මෙලොවෙත් ඇති සියලු දේ සමගි කිරිමට දෙවියන් වහන්සේ කැමති වූ සේක යැයි පාවුළුතුමා පවසයි. දෙවියන් වහන්සේ මිනිසා සමග පමණක් නොව ජීවය ඇති නැති සියලු මැවිලි සමග සමගිවීමට කැමති වූ සේක. ජේසුස් වහන්සේගේ කුරුසයේ මරණය මගින් සියලු මැවිලි දෙවියන් වහන්සේ සමග සමගි කරනු ලැබීය.

- ශුද්ධ වූ සභාව නමැති ශරිරයේ හිස උන්වහන්සේ ය. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම දෘශ්‍යමාන ශරීරයේ නායකයාව සිටින බැවින් එම සිරුරේ අවයවවල වර්ධනයට උන්වහන්සේම හේතුව වී ඇත.
- මැව්ලිවල දැකිය හැකි පිළිවෙල එකමුතුකම, සාමය ආදිය ක්‍රිස්තුස් වහන්සේ මගින් ද ක්‍රිස්තුස් වහන්සේ තුළ ද ක්‍රියාත්මක වේ.

**5.2.3.2.2 එපීස 1/3-10**

- දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම මෙහි ප්‍රධාන කරුණයි.
- ගැලවීමේ කාර්යය මුළුමණින් ම ක්‍රිස්තුස් වහන්සේව මුල්කරගෙන ඇත. තම ගැලවීමේ කාර්යය ඉටු කිරීමට දෙවියන් වහන්සේ සමහරුන් තෝරා ගත් සේක. කාලයටත් පෙර දෙවියන් වහන්සේ අප තෝරාගත් සේක.
- ශුද්ධවන්තවත්, නොකැලැල්වත් ජිවත්වීමට අපව උන්වහන්සේ තෝරාගත් සේක. දේව දරුවන් ලෙස ජීවත්වීමට අපව ප්‍රේමයෙන් පෙරදීම නියම කළ සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ තෝරාගත් සේක. මන්දයත් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් නව සබඳතාවයක් ඇති විය. ක්‍රිස්තුස් වහන්සේගේ මරණය අපට ගැලවීම තිළිණ කළේ ය.
- ක්‍රිස්තුස් වහන්සේ ලබාදුන් නව සබඳතාවයෙන් අපි දේව දරුවෝ වෙමු. ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරයෙන් අපි සමාව ලබමු. නව දිවිය නිසා වරප්‍රසාදයෙන් පූර්ණ වෙමු.
- මෙලෙස පාවුළුතුමා, සියලු මැව්ලි ක්‍රිස්තුස් වහන්සේට සම කළ නොහැකි වන සේක. අති උතුම් වන සේක'' යයි ගෙනහැර දක්වයි.
- ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය අපි සියලු දෙනාම පිළිගත යුතුයි. අප ජීවිතයේත්, අපේ පවුල් ජීවිතයේත් ක්‍රිස්තුස් වහන්සේම නායකයා විය යුතුයි.

**ක්‍රිස්තුස් වහන්සේගේ බැගෑපත්කම (පිලිප්පි 2/5-11)**

- සියලු කිතුනුවන් ක්‍රිස්තුස් වහන්සේව ආදර්ශයට ගෙන ජීවත් විය යුතු බව පාවුළුතුමා මෙම ලිපියෙන් පෙන්වයි. පිලිප්පි සභාව පාවුළුතුමාගේ ආදරයටත් පැසසුමටත් ලක්වූවකි. කල්යාමේ දී මේ සභාවේත් සමහරුන්ගේ සිත් කැළඹීමට පත්විය. අසමගියත්, ඊර්ෂ්‍යාවත් හිස එසවීය. එම නිසා පාවුළුතුමා ''ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජිවිත ආකල්පය ඔබ තුළත් පවතීවා '' (පිලිප්පි 2/5) යයි ක්‍රිස්තුස් වහන්සේගේ ජිවිතයේත් ක්‍රියාවේත් දක්නට ලැබුණු ජිවිත ආකල්ප එළිදරව් කර පෙන්වා සෑම කිතුනුවකුම එම ආකල්පත් බැගෑපත්කමත් ඇති කර ගත යුතු යයි පවසයි.
- උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, එය ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක.'' ස්වරූපය'' යන්නට පාවුළුතුමා යොදන ග්‍රීක වචනය මෝර්පේ යන්නයි. මේ වචනය කිසිවිටකත් වෙනස් නොවන යන අරුත දෙයි. එනම් එය කෙනෙකුට ආවේනික වූ තත්ත්වය පෙන්වයි. ජේසුස් වහන්සේ වෙනස් කළ නොහැකි උසස් දේවත්වය ඇති කෙනෙකි.

- එනමුත් උන්වහන්සේ, දෙවියන්ට හිමි, මහිමය, බලය හැකියාව ප්‍රඥාව යන කිසිවක් බදාගෙන නොසිටියේ ය. ඒවා තම ආත්මාර්ථය සඳහා යොදා නොගත් සේක.
- උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දරූ නමුත්, එය ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිස් කෙනෙක් වු සේක.'' එය ඉවතලා යන්නට පාවුළුතුමා යොදන ග්‍රීක වචනය කිසිවක් නැතිව සියල්ලම මුළුමණින් ම ඉවත් කිරීම, නැති කිරීම හඟවයි.
- තව ද සැබවින්ම සේවකයකු බවට පත්විය. කුරුසයේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. දෙව්පියා කෙරෙහි තිබූ ඇතුලාන්ත භක්තියේ බාහිර සළකුණයි. මේ කුරුසියේ මරණය මේ නින්දා සහගත කුරුසියේ මරණය ක්‍රිස්තුස් වහන්සේ කැමැත්තෙන්ම භාරගත් සේක.
- මෙලෙස තමන්ව පහත් කරගත් නිසා ජෙසුස් වහන්සේ සියල්ලන්ටම වඩා උසස් කරුනු ලැබූ සේක. උන්වහන්සේගේ පරිත්‍යාගය, සියල්ල අත්හැරීම, බැගෑපත්කම, කිසිම මනුෂ්‍යයකුට නොලැබෙන මහිමයක් උන්වහන්සේට ලබා දුනි. මරණය ජයගෙන නව ජීවිතයක් නව ස්වභාවයක් ඇතිව ජයග්‍රාහී ලෙස උත්ථාන වූ සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේව උත්ථාන කරනු ලැබූ සේක.
- ස්වර්ගයෙහි ද පොළොවෙහිද පාතාල ලෝකයෙහි ද සියල්ලන් උන්වහන්සේට නමස්කාර කරන තරමට උන්වහන්සේ උසස් කරනු ලැබූ සේක.
- ''එබැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා සියලු නාමයකට වඩා අග්‍රනාමය උන්වහන්සේට දුන් සේක.''අලුත් නාමයක් දීම මනුෂ්‍යයකුගේ ජීවිතයේ නව තත්ත්වයක් ආරම්භ වීම හඟවයි. දෙවියන් වහන්සේ දුන් නාමය ''ස්වාමීන් වහන්සේ'' යනුයි. මෙලෙස ජේසුස් වහන්සේ සියලු අධිකාරී බලයත්, පාලනයත්, බැගෑපත්කමින් දිනා ගත් සේක.
- දෙවියන් වහන්සේ යනු සියලු අධිකාරී බලය පමණක් නොව, '' යාවේ'' යන දෙවියන් වහන්සේගේ නම වෙනුවට, පුරාණ ගිවිසුමේ ඇමතු නම මෙහිදී ක්‍රිස්තුස් වහන්සේට කියන ලදි. මෙය බැගෑපත්කමින් ක්‍රිස්තුස් වහන්සේ දිනාගත් මහිමය වේ.

**5.2.3.3 උත්ථානය හා නැවත පැමිණීම (1 කොරින්ති 15/35-57 1 තෙසලෝනි 5/1-11)**

**5.2.3.3.1 උත්ථානය (1 කොරින්ති 15:35:57)**

- ශුද්ධ වූ සභාවේ ආරම්භයේ දී මළවුන්ගේ උත්ථානය ගැන පැහැදිලි අදහස් නොතිබුණි. කොරින්තියේ වැසියන්ගෙන් සමහරු ශරීරයේ පුනර්ජීවනය ගැන නොපිළිගත් හ. (1 කොරින්ති 15/12) භූමදානය කරනු ලැබ නැතිවී ගිය ශරීරය උත්ථාන කරනු ලබන්නේ කෙසේ ද? යන්න ඔවුන්ගේ ප්‍රශ්නය විය. ඔවුහු ග්‍රීකවරුන්ගේ විනාශ නොවන ආත්මය (ගැන) පිළිගත් හ. ශරීරයේ උත්ථානය නොපිළිගත් හ. එහි උත්ථාන වූ ශරීර ස්වභාවය පිළිබඳ ව වෙනස් අදහස් තිබුණි. මේ තත්ත්වය තුළ පාවුළුතුමා සියලුම මිනිසුන්ට නැවත ජීවිතයක් ඇත. ආත්මය පමණක් නොව ශරීරය ද උත්ථාන කරනු ලැබේ. උත්ථාන වූ ශරීරයේ ස්වභාවය වෙනස් වේ. යන්න උදාහරණ මගින් පෙන්වයි.

- උත්ථාන කරනු ලබන ශරීර ස්වභාවය පැහැදිලි කිරීමට පාවුළුතුමා වපුරනු ලබන බීජය උදාහරණයක් ලෙස ගනියි. තිරිගු බීජය වපුරමු. එය භූමියේ, වැටී මැරී නව කඳක් සහිත පැළයක් බවට පත්වේ. දෙවියන් වහන්සේ තම කැමැත්ත පරිදි එක් එක් බීජයට රූපයක් දෙන සේක. එලෙසම උත්ථානයෙන් මහිමයට පත්වූ මිනිසාට ඔහුගේ මහිමයට අනුව ශරීරයක් දෙවියන් වහන්සේ දෙන සේක.
- මිනිසා හා සත්ත්ව ශරීර මාංශයෙන් නිර්මාණ වූවත් එක් එක් සත්ත්වයාගේ හැටියට මාංශය වෙනස් වේ. ඉර හඳ තරු ආලෝකය විහිදුවූවත් ඒවායේ පරිසරයට අනුව ස්වභාවය විවිධ වේ. එසේම උත්ථාන වූ ශරීරයත් තම මහිමයට අනුව ආලෝකවත් වේ.
- උත්ථානය යනු මැරුණු එම ශරීරයම ජීවය ලැබ නැවත පෙර තත්ත්වය ලැබීම නොවේ. මරණ මොහොතේ දී තිබූ ශරීරයේ ස්වභාවය උත්ථාන වන විට තිබෙන ශරීරය හා සමකර උත්ථාන වූ ශරීරය පසු කියැවෙන වෙනස්කම් 4කින් යුක්තය යනුවෙන් පාවුළුතුමා ගෙනහැර දක්වයි.

| **මැරෙන විට** | **උත්ථාන වන විට** |
|---|---|
| දිරායන සිරුරකි | නොදිරන සිරුරකි |
| අගෞරවාන්විත සිරුරකි | ගෞරවාන්විත සිරුරකි |
| දුබල සිරුරකි | ප්‍රබල සිරුරකි |
| ස්වභාවික සිරුරකි | ආධ්‍යාත්මික සිරුරකි |

- ආදි මිනිසා වන ආදම් මිනිස් ස්වභාවය ඇති සිරුරක් ලැබ සිටියේ ය. දෙවන ආදාම් වන ජේසුස් වහන්සේ මරණය ජයගෙන නව මිනිසෙක් විය. පළමු මිනිසා භූමියෙන් ය. ඔහු භෞමික ය. දෙවන මිනිසා ස්වර්ගයෙන් ය. ඔහු ස්වර්ගිකය. එබැවින් අපි භෞමික තැනැත්තාගේ ස්වරූපය දරන්නා සේම ස්වර්ගීය තැනැත්තාගේ ස්වරූපය ද දරන්නෙමු.

**5.2.3.3.2 ක්‍රිස්තුස්වහන්සේගේ (දෙවන) නැවත පැමිණීම (1 තෙසලෝනි 5/1-11)**

- මුල් කාලීන ශුද්ධ වූ සභාවේ දෙවන පැමිණීම ගැන බලාපොරොත්තුව අධික ලෙස තිබූ බව පෙනේ. එයිනුත් තෙසලෝනික සභාවේ මේ පැමිණීම කවදා සිදුවේ ද? බලාපොරොත්තු නැති අවස්ථාවක දී පැමිණියත් ඒ දිනය වෙනුවෙන් සූදානම් වූහ. ඔවුහු නැවත පැමිණීම බලාපොරොත්තුවෙන්, යාච්ඤාවෙන් ද, නිරාහාර ශීලයෙන් ද, විවාහ සබඳතාවලින් තොරව ද සිටිය හ. නමුත් එම පැමිණීම විගස ඉටු නොවූ නිසා එම ජනතාව අතර කැළඹීමක් ඇති විය. එබැවින් පාවුළුතුමා මේ පැමිණීම කවදා සිදුවේ ද? කෙසේ සූදානම් ව සිටිය යුතු දැයි පැහැදිලි කරයි.
- පාවුළුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම ගැන දරණ අදහස පුරාණ ගිවිසුමේ අන්තිම කාලය ගැන කියැවෙන කරුණුවල පසුබිම එනම් එහි දැකිය හැකි දෙවියන් වහන්සේගේ දවසේ පසුබිමෙන් දැන ගත යුතුයි. එය මේ කාලයේ දී අවසාන සමයේ එනම් පැමිණෙන්නට යන කාලයේ දී විමුක්තියේ දී සිදුවේ. එය නපුරු දිනකි. භයංකාර දිනකි. එම දිනයේ දී මේ කාලය නිම වී පැමිණෙන්ට යන කාලය උදාවේ. එම දිනය දෙවියන් වහන්සේ මෙසියස්තුමා

ඒවා සාතන් සමඟ අන්තිම සටන කර උෟ පරදවා ලෝකය මුදා ගන්නා දිනයයි. එම දිනයේ දී භූමිකම්පා, භූ චලන ඇති වී මුළු ලෝකයම සෙලවීමට පත්වේ.

- පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේගේ දිනය නැතහොත් යාවේගේ දිනය යනුවෙන් හඳුන්වනු ලැබේ. එම දිනය අළුත් ගිවිසුමේ ''දෙවන පැමිණීමේ'' දිනය ලෙස හැඳින්වේ. දෙවන පැමිණීම හඟවන ග්‍රීක වචනය ''පරූසියා'' යන්නයි.
- ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම, රාත්‍රියේ පැමිණෙන සොරකුමෙන් ද ගැබිණියකට විලිරුදා පැමිණෙන්නාක් මෙන් ද නොසිතූ මොහොතක නොදන්නා වේලාවක සිදුවේ යයි පවසයි.
- එනමුත් කිතුනුවන් බිය විය යුතු නැත. මන්ද ඔවුන් ආලෝකයේ දරුවන් ය. දිවා කාලයේ දරුවන් රාත්‍රි කාලයේවත් අන්ධකාරයේවත් දරුවෝ නොවෙති.
- එබැවින් කිතුණුවන් සිහිකල්පනාවෙන් ද, අවධියෙන් ද සිටිය යුතුයි. ඇදහිල්ලත්, ප්‍රේමයත් නැමැති ළය වැස්ම ද ගැලවීමේ බලාපොරොත්තුව නමැති යුධ තොප්පිය ද පැළඳගෙන ජීවත් විය යුතු බව පවසයි.

**5.2.3.4 කිතුණු පවුල් ජීවිතය (1 කොරින්ති 7/1-16, එපීස 5/22-31-6/1-4,ගලාති 3/28)**

- කිතුණු පවුල ශුද්ධ වූ සභාවේ ජීවයයි. බොහෝ කිතුනු පවුල්වලින් ගොඩනැගුණු දෙවියන් වහන්සේගේ විශාල පවුල ශුද්ධ වූ සභාවයි. කිතුනු පවුල කුඩා ශුද්ධ වූ සභාවේ මූල් ඒකකයයි. එම නිසා කිතුනු පවුල් ජීවිතයටත් ශුද්ධ වූ සභා ජීවිතයටත් අතර සමීප සබඳතාවයක් හා නෑකමක් ඇත.
- පාවුළු තුමා කිතුණු පවුල් ජීවිතය පිළිබඳ දරා සිටි මතයේ එක්තරා දියුණුවක් දැකිය හැක. මුලින් ලියූ ලිපිවල (1 කොරින්ති) විවාහය පිළිබඳ වැඩි ප්‍රසන්නතාවයක් දක්වා නැතත් පසුව ලියූ ලිපිවල (එපීස) ගැඹුරු අදහස් දක්වා ඇත.

**(1 කොරින්ති 7/1-16)**

- කොරින්තිවරුන්ට ලියූ පළමු ලිපියේ පාවුළුතුමා විවාහය හා පවුල් ජීවිතය පිළිබඳ ව පවසන දේ අප හරිහැටි තේරුම් ගැනීමට කොරින්තියේ වැසියන් ජීවත් වූ පරිසරයත්, ඔවුන් මුහුණදුන් ප්‍රශ්නත් මනාව දැන ගත යුතුයි. එම කාලයේ වාණිජ නගරයක් වූ කොරින්තිය ගණිකා වෘත්තිය, අනාචාරය, කාම මිථ්‍යාචාරය ආදියට ප්‍රසිද්ධ වූවකි. තව ද පාවුළුතුමා මෙසියස්තුමාගේ කාලය විගස පැමිණේ යයි බලාපොරොත්තුව සිටි බව අප තේරුම් ගත යුතුයි.
- තව ද කොරින්තිවරුන්ගේ තවත් සමහර අදහස් පරිදි සිරුර පාපිෂ්ඨය. එබැවින් අපි එය දමනය කර ගත යුතුයි. නොහැකි නම් එයට සම්බන්ධ වන සියලු ආශා ඇල්ම ආදිය හැඟීම් අප යටපත් කළ යුතුයි. එම නිසා කෙනෙකු මුළුමනින් ම කිතුනුවකු ලෙස ජීවත්වීමට කැමති නම් ඔහු සිරුර සම්බන්ධ ක්‍රියාවලින් මුළුමණින්ම ඈත් වී අවිවාහකව සිටිය යුතුයි.
- පාවුලුතුමාගේ පිළිතුර ක්‍රියාවේ යෙදවිය හැකි එකක් බව පෙනේ. විවාහය ස්වාමිපුරුෂයා හා භාර්යාව දෙවියන් වහන්සේ කෙරෙහි ඇතිකර ගත යුතු ඇල්ම අඩු කරයි. එබැවින් සැවොම අවිවාහක ව සිටීම හොඳ යයි පවසයි. නමුත් එයට දෙවියන් වහන්සේගේ විශේෂ වරප්‍රසාද

අවශ්‍යය යි. සැමටම එම වරප්‍රසාද ලැබෙන්නේ නැත. එනමුත් කොරින්තියේ ස්වභාවයට අනුවත්, මනුෂ්‍ය දුර්වලතාවයට අනුවත්, විවාහවීම ස්වයං හික්මීමක් නැති අයට හොඳ යයි කියයි.

- හැමදෙනාම තම තමන්ගේ තත්ත්වය, කැමැත්ත, දුර්වලතාවයන් හැඳින ක්‍රියා කළ යුතු යයි පවසයි. පාවුළුතුමාගේ මේ කියමන් කාමමිථ්‍යාචාරයෙන් වැළකීම සඳහා විවාහය අනුමත කරන බව පෙනේ.
- පසුව එතුමා අවිවාහක අය හා වැන්දඹුවන්ට වදාරන යෝජනාවල මේ අදහස දැකිය හැක. එම නිසා පාවුළුතුමා විවාහය ගැන ප්‍රකාශ කරන අදහස් අනුව එතුමා විවාහය ගැන වැඩි ප්‍රසන්නතාවක් නැති බව පෙනේ.
- තව ද පාවුළුතුමා විවාහයේ උතුම්කම, යුතුකම්, වගකීම් ගැන කතා කරයි. පුරුෂයා සිය භාර්යාවට විවාහ ජීවිතය් යුතුකම් ඉටුකළ යුතුයි. භාර්යාව ද සිය පුරුෂයාට විවාහ ජීවිතයේ යුතුකම් ඉටු කළ යුතුයි. භාර්යාවගේ ශරීරයට අයිතිය ඇත්තේ ඇයට නොව පුරුෂයාට ය. එලෙසම පුරුෂයාගේ ශරීරයට අයිතිය ඇත්තේ ඔහුට නොව භාර්යාවට ය.
- වෛවාහික සබඳතාවයේ දී කෙනෙකු තව කෙනෙකුගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතුයි. කෙනෙකුට තව කෙනෙකුගේ අයිතිය නොසලකා හැරිය නොහැක. වෛවාහික සබඳතාවයේ දී ස්වාමිපුරුෂයා හා භාර්යාව ශාරීරික වශයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද තම ආශාවන්හි පූර්ණත්වයක්, තෘප්තියක් දැකිය යුතුයි.
- යාච්ඤාවේ යෙදෙන පිණිස ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේම කැමැත්තෙන් කලකට වෙන්වී සිටිය හැක. නමුත් ආත්ම දමනය හීනවීමෙන් සාතන්ගේ පෙළඹීම්වලට අසු නොවන පිණිස නැවත එක්විය යුතුයි.
- විවාහකයනට පාවුළු තුමා දෙන අණ නම් භාර්යාව හා ස්වාමිපුරුෂයා වෙන් නොවිය යුතුයි පවසා එය දෙවියන් වහන්සේගේ අණ යයි පවසයි. වෙන්ව ජීවත්වීමට සිදු වුවහොත් නැවත විවාහයක් නොකළ යුතුයි. නමුත් ඉක්මණින්ම දෙදෙනා නැවත එකතු විය යුතුයි. සමාදාන විය යුතුයි.
- ඊළඟට කිතුනු නොකිතුනු විවාහ සම්බන්ධයෙන් එකල කොරින්තියේ වැරදි මත තිබුණි. විවාහ වූ කිතුනු නොකිතුනු අය එක්ව නොසිටිය යුතුයි. තව ද නොකිතුනු අයව නැවත යැවිය යුතුයි. එමෙන්ම විවාහ වූ නොකිතුණු යුවලින් කෙනෙකු කිතුණු වුවහොත් නොකිතුණු කෙනා නැවත යැවිය යුතුයි යන මත තිබුණි.
- මෙයට විරුද්ධව පාවුළු තුමා කිතුණු නොකිතුනු විවාහයන් ගැන තම අදහස් පවසයි. නොකිතුනු ස්වාමිපුරුෂයා හෝ භාර්යාවක් හෝ කිතුණු ස්වාමිපුරුෂයකු හෝ භාර්යාවක සමඟ ජීවත්වීමට කැමති වුවහොත් කෙනෙකු තව කෙනෙකුව අහක් නොකර දෙදෙනාම එක්ව විය යුතුයි. මන්දයත් කිතුනුවාගේ විශ්වාසය නිසා නොකිතුණුවා පවිත්‍රවේ යනුවෙන් පවසයි.

- නමුත් කිතුනුවා වෙන්වීමට කැමති වුවහොත් එසේ කළ හැක. එවිට කිතුණු ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට හෝ කිසිම කොන්දේසියක් නැතිව වෙනත් විවාහයක් කරගත හැකි ය. මෙය පාවුලු තුමාගේ යෝජනාවකි.
- එනමුත් ඔවුන් එක්ව ජීවත්වීම ගැන පාවුළු තුමා කැමති වේ. මන්දයත් කිතුනුවා නොකිතුනුවාව ගලවාගත හැකි බව පාවුළුතුමාගේ අදහසයි.

**(එපීස 5/22-30, 6/1-4)**

- පාවුළු තුමා එපීසවරුන්ට ලියූ ලිපියේ විවාහය ගැන තවත් වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
- පාවුළු තුමා මේ ප්‍රදේශයේ කිතුණු පවුල්වල ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සබඳතාවය ගැනත් දෙමාපියන් හා දරුවන් අතර තිබිය යුතු සබඳතාවය ගැනත් කථා කරයි.
- අඹුසැමියන් අතර සබඳතාවය අතිඋතුම් ය. ශුද්ධය. පාවුළු තුමා ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර සම්බන්ධතාවය ක්‍රිස්තුස් වහන්සේටත් ශුද්ධ වූ සභාවටත් ඇති සම්බන්ධතාවයට සම කරයි. මේ සම්බන්ධතාවයට පදනම්ව ප්‍රේමය ඇත.
- පාවුළු තුමා ස්වාමිපුරුෂයාගේ වගකීම ගැන කථා කරමින් ක්‍රිස්තුස් වහන්සේ සභාවට හිසවන්නාක් මෙන් ස්වාමිපුරුෂයා ද තම භාර්යාවට හිස විය යුතුයි. මෙය බලයපාන නායකත්වයක් නොවේ. ප්‍රේම කරන නායකත්වයකි.
- ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධ වූ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමිපුරුෂයා ද තම භාර්යාවට ප්‍රේම කළ යුතුයි. මෙය පරිත්‍යාගශීලි ප්‍රේමයකි. එය කිසිවිටෙකත් ආත්මාර්ථකාමී ප්‍රේමයක් නොවිය යුතුයි. ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධ වූ සභාවට දැක්වූ ප්‍රේමය ශුද්ධ වූ සභාව ශුද්ධවත් කර දෙවියන් වහන්සේට අයත් කළේ ය. ස්වාමි පුරුෂයාගේ ප්‍රේමයත්, භාර්යාව ශුද්ධවත් කරන ඇයව යහපත් කරවන ප්‍රේමයක් විය යුතුයි.
- ස්වාමිපුරුෂයා තම ශරීරයට ප්‍රේම කරන්නා සේ තම බිරිඳව, තමාගේම සිරුර යයි සිතා ප්‍රේම කළ යුතුයි. ස්වාමිපුරුෂයා භාර්යාවට ඇති ප්‍රේමය කිසිවිටෙකත් ඇති කළ නොහැකියි.
- මේ ප්‍රේමය වෙනුවෙන් ස්වාමිපුරුෂයා තව දෙමාපියන් අත්හැර තම භාර්යාවට ඇලුම් කරයි. දෙදෙනාම එක් කෙනෙකු වන්නෝය. එකම සිරුරක අවයව මෙන් දෙදෙනාම එක්ව සිටිති.
- **භාර්යාවගේ යුතුකම්** ගැන සඳහන් කරන විට ශුද්ධ වූ සභාව ක්‍රිස්තුස් වහන්සේට යටහත්ව සිටින්නාක් මෙන් භාර්යාව තම ස්වාමිපුරුෂයාට යටහත්ව සිටිය යුතුයි. මේ යටහත්වීම බිය නිසා නොව ප්‍රේමය නිසා ඇතිවන යටහත්වීමක් විය යුතුයි.
- **දෙමාපියන්ගේ යුතුකම්** ගැන සඳහන් කරන විට දෙමාපියන් දරුවන්ව කෝප නොකර, ඔවුන්ව දෙවියන්ට ප්‍රසන්න වන ලෙස අවවාද කර නිවැරදි කර ඇති දැඩි කළ යුතු වේ.
- **දරුවන්ගේ යුතුකම්** ගැන සඳහන් කරන විට, දරුවන් දෙමාපියන්ට කීකරු විය යුතුයි. පියාට ද මවට ද ගරු කිරීමෙන් සෙත සැලසී මිහිපිට බොහෝ කල් ජීවත්වනු ඇත.
- මෙලෙස පාවුළුතුමා ස්වාමිපුරුෂයා, භාර්යාව, දෙමාපියන් දරුවන් ආදීන්ගේ යුතුකම් හා වගකීම් ගැන කථා කරයි.

**(ගලාති 3/28)**

- පාවුළු තුමා කිතුනු පවුලේ කිසිම වෙනසකට ඉඩක් නැත බව කියයි. කිතුනු සබඳතාවයේ සංස්කෘතික, ආගමික, සමාජ තත්ත්වය, ස්ත්‍රී පුරුෂභාවය ආදී වෙනස්කම් ක්‍රිස්තුස් වහන්සේ තුළ නැති වී යයි.

- කිතුනුවන් සැම එක්වී ගොඩනගන, දේව පවුලේ පැරණි වෙනස්කම් කිසිවකට ඉඩ නැත. ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත් වන ඔවුන් අතර ස්ත්‍රී පුරුෂ යයි භේදයක් නොතිබිය යුතුයි. ඔවුන් දෙදෙනාම දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවා ඇත. එම නිසා දෙදෙනාම දෙවිඳුන් ඉදිරියේ සමව සිටිති. පුරුෂයා හා ස්ත්‍රිය එකිනෙකාව සම්පූර්ණ කරන්නාක් මෙන් කිතුනුවන් ක්‍රිස්තුස් වහන්සේ තුළ එකිනෙකාව සම්පූර්ණ කරති.

**කිතුණු එකමුතුකම (1 කොරින්ති 12/12-31, එපීස 2/11-18, 4/1-6)**

- පාවුළු තුමා කුඩා ශුද්ධ වූ සභාවක් වන කිතුණු පවුලේ ස්වාමි පුරුෂයා, භාර්යාව, දෙමාපියන් දරුවන් අතර තිබිය යුතු ප්‍රේමය, සබඳතාව, එකමුතුකම ගැන කථා කළ පසු දෙවියන් වහන්සේගේ ලොකු පවුල වන ශුද්ධ වූ සභාවේ තිබිය යුතු ප්‍රේමය, සහෝදරත්වය, එකමුතුකම ගැන උගන්වයි.

**(1 කොරින්ති 12/12-31)**

- එකල එක් එක් කිතුණු සභාවල විශේෂයෙන් කොරින්ති සභාවේ දක්නට තිබූ වෙනස්වීම්, භේද අවස්ථාවක් ලෙස උපයෝගී කරගෙන පාවුළු තුමා ශුද්ධ වූ සභාවේ එකමුතුකම ගැන කරුණු කොරින්ති පළමු ලිපියේ ඉදිරිපත් කරයි.
- මිනිස් සිරුරක අවයව එකමුතුව කටයුතු කරන ආකාරය දැක අපි පුදුම වෙමු. පාවුළු තුමා ශුද්ධ වූ සභාව එවන් සිරුරක් ලෙස දකී. '' ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය ලෙස සිටින්නාහුය''ග (1 කොරින්ති 12/27) මේ වැකියේ ගැඹුරු අදහස් ඇත. අප එකිනෙකා ජේසුස් වහන්සේගේ ශරීරයේ, එක් අවයවයක් ලෙස සිටිමු. ''ජුදයන් වුවත් ග්‍රීකයන් වුවත් වහලුන් වුවත් අප සියල්ලෝම එකම ආත්මයක් තුළ එකම ශරීරයක් වන ලෙස බෞතීස්ම ස්ථානය ලැබීමු''. 1 කොරින්ති 12/13 මෙයින් ශුද්ධ වූ සභාව ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට ඒ තුළ තිබිය යුතු එකමුතුකමේ අවශ්‍යතාවය පාවුලු තුමා දකියි.
- සිරුරක් නිරෝගිව තිබීමට නම් එක් එක් අවයව තම තමන්ගේ කාර්ය හරිහැටි ඉටු කළ යුතුයි. අවයව වලට ක්‍රෝධය, ඊර්ෂ්‍යාව නොතිබිය යුතුයි. එක් අවයවයක කාර්යය තවත් අවයවයක් නොකරයි. මේ කියමනෙන් පාවුළුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ සිරුර වන ශුද්ධ වූ සභාව තුළ තිබිය යුතු එකමුතුකම තහවුරු කරයි.
- එබැවින් ශුද්ධ වූ සභාවේ එක් එක් අවයවයක් ලෙස සිටින එකිනෙකා තම තමන්ට ලැබී ඇති දීමනාවට අනුව සේවය කර සිරුර වන ශුද්ධ වූ සභාව ගොඩනැගිය යුතුයි.

**එපීස 2/11-18**

- පාවුළුතුමා එපීසවරුන්ට ලියූ ලිපියේ, කෙනෙක් තව කෙනෙකු සමග තරහා වී කොන් කර, නීචකර, වෙන්වී ජීවත් වූ ඊශ්‍රායෙල්වරුන්වත්, අන්‍යජාතීන්වත් ක්‍රිස්තුස් වහන්සේ තම කුරුසයේ මරණය මගින් ඔවුන්ව වෙන් කළ පවුර බිඳ ඔවුන්ව තමන් හා එක්කර එකමුතු කළ සේක යයි සඳහන්ව ඇත.
- ඔවුන්ව එකමුතු කිරීමට ක්‍රිස්තුස් වහන්සේ දුන් මිල වනුයේ මිල කළ නොහැකි තම රුධිරයයි.
- එබැවින් ඒ සබඳතාව එකමුතුකම අප සැමදෙනා රැකිය යුතු බව අවධාරණය කරයි.

**එපීස 4/1-6**

- තවදුරටත් පාවුළුතුමා කිතුණුවන් එකමුතුව ජීවත්වීමටත් එය රැකගෙන වර්ධනය කිරීමටත් කරුණු පෙන්වයි. ජේසුස් වහන්සේ ඇති කළ සභාව එක් කිතුණු සභාවකි. මේ ශුද්ධ වූ සභාවේ සැමදෙනාටම ඇත්තේ එකම දැක්මක්, එකම ශරීරයක්, එකම ආත්මයාණන් වහන්සේත්, එකම ස්වාමීන් වහන්සේත්, එකම ඇදහිල්ලත්, එකම බෞතීස්ම ස්ථාපනයත්, එකම දෙව්පියාණන් වහන්සේත්ය. මේ එකමුතුකමින් ජීවත්වීමට එක් එක් කිතුණුවන්ව කැඳවනු ලැබේ.

**5.2.3.6 කිතුණු සහෝදරත්වය (1 කොරින්ති 8/9-13 13/3-8,2 කොරින්ති 8/9)**

- පාවුළු තුමා කිතුණු ප්‍රේමය ගැන, එහි තත්ත්වය, ස්වභාවය, ශ්‍රේෂ්ඨත්වය ගැන තම ලිපිවල කිහිප තැනකම ලියා ඇත.

**1 කොරින්ති 8/9-13**

- පාවුළුතුමා මෙහිදී ප්‍රේමයේ ශ්‍රේෂ්ඨත්වය ගෙනහැර දක්වයි. ප්‍රේමය යනු කුමක් ද? යහපත කුමක් ද, ප්‍රයෝජනවත් දේ කුමක් ද? අප්‍රයෝජනවත් දේ කුමක් ද? යන්න පෙන්වාදෙයි. ප්‍රේමය පදනම් කරගෙන මෙය තීරණය වේ.
- උදාහරණයක් ලෙස දැනුම යහපත් ය. නමුත් එය උඩඟුකම ඇති කරයි. අන් අයගේ යහපත් ජීවිතයට, බාධාවක් ලෙස, අවහිරයක් ලෙස පිහිටියේ නැත. මා තුළ ඇති දැනුම අන් අයට නැති විට ඔවුන් ගැන කල්පනාවක් නැතිව මා ක්‍රියාකරන විට එය අන් අයට කරදරයක් බාධාවක් වන බව පාවුළු තුමා පවසයි.
- එහෙත් ප්‍රේමය සම්බන්ධතාවය වර්ධනය කරයි. එය අන් අයට කිසිවිටක බාධාවක් නොකරයි. මෙයත් දැනුම පදනම් කරගෙන නොවේ. ප්‍රේමය පාදක කරගෙන තීරණය කරනු ලැබේ.
- මගේ නිදහස අන් අයගේ නිදහසට බාධාවක් හෝ කරදරයක් හෝ නොවිය යුතුයි. මගේ නිදහස මා භාවිතා කරන විට අන් අයටවත්, එමගින් ඇති විය හැකි බාධකත් මා සිතිය යුතුයි. එම නිසා ශක්තිමත් හෘදය සාක්ෂියක් මට තිබුණත් දුර්වල හෘදය සාක්ෂියක් ඇති අයට බාධාවක් නොවීමට වගබලා ගත යුතුයි. එම නිසා ප්‍රේමය විනයානුකූල ජීවිතයකට අත්තිවාරම වේ. එම නිසා පාවුළුතුමා ප්‍රේමයත්, දැනුමත් සසඳමින් ප්‍රේමයට මූලිකත්වය දිය යුතු බව පවසයි.

**(1 කොරින්ති 13/3-8)**

- මෙහිදී පාවුළුතුමා ප්‍රේමයේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි. මේ කොටස කවියක් ලෙස අර්ථාන්විතව බොහෝ ඉගැන්වීම් සහිත එකක් ලෙස ලියා ඇත. නව ගිවිසුමේ ප්‍රේමය ගැන කියන ඉතා අලංකාර ඡේදය මෙය බව කියැවේ.
- පාවුළුතුමා ශුද්ධාත්මයාණන්ගේ සියලු වරප්‍රසාද කෙනෙකු ලබා සිටියත් ප්‍රේමය නැත්නම් ඒ සියල්ල නිරර්ථක බව, අසාර්ථක බව කියයි. අන්‍යභාෂා කථා කිරීමේ හැකියාව දිවැසිවැකි කීමේ වරම, ඥානය, දැනුම, විශ්වාසය මේ සියල්ල මට තිබුණත්, ප්‍රේමය නැත්නම් මම ඝෝෂා නගන සන්ධාරයකට හෝ කටුක රාවය දෙන කයිතාලමකට හෝ සමාන වෙමි.

- ප්‍රේමය නැත්නම් කිසිම දෙයක වටිනාකමක් නැත. මේ සියල්ලටම අර්ථයක්, වැදගත්කමක් වටිනාකමක් දෙන්නේ ප්‍රේමයයි. එය කිතුණු ජීවිතයේ අත්තිවාරම වේ.
- පාවුළුතුමා ප්‍රේමයේ ශ්‍රේෂ්ඨ ගුණාංග ලෙස ඉවසීම, යහපත කිරීම, ඊර්ෂ්‍යාවක් නොමැතිකම, පාරට්ටු කර නොගැනීම, උඩඟු නොවීම, අවිනීත දේ නොකිරීම. කේන්ති නොයාම, නපුර නොසිතීම, අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවීම, හරි දේ ගැන ප්‍රීතිවීම, විශ්වාසය, බලාපාරොත්තු ආදිය සඳහන් කරයි.
- කෙනෙකු තුළ සත්‍ය ප්‍රේමය ඇත්නම් මේ ගුණාංග සියල්ල දැකිය හැක.
- තවදුරටත් පාවුළුතුමා ප්‍රේමයේ සදාතනික බවත්, ශ්‍රේෂ්ඨ බවත් පැහැදිලි කරයි. ඉහත සඳහන් ගුණාංග සියල්ල පහව ගියත් නිෂ්ප්‍රයෝජන වුවත් ප්‍රේමය සදාකාලික ය.
- අවසාන වශයෙන් ඇදහිල්ල බලාපොරොත්තුව හා ප්‍රේමය සදහටම පවතින ධර්මතා තුනක් බවත් මෙයින් ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමය බවත් පාවුළුතුමා පවසයි.

**(කොරින්ති 8/1-15)**

- පාවුළු තුමාගේ මේ ලිපියේ කොරින්තියේ සමූහයාගෙන් යහපත් දේ කිරීමට, හැකිතරම් පරිත්‍යාග කරන ලෙස ඉල්ලමි. මෙයට ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය, පරිත්‍යාගිශීලි සිත උදාහරණ ලෙස පෙන්වයි.
- උන්වහන්සේ ධනවත්ව සිටි නමුත්, තමන් වහන්සේගේ දිළිඳුකම කරණකොටගෙන ඔබ ධනවත් වන පිණිස ඔබ උදෙසා දිළිඳු වූ සේක යනුවෙන් පැවසීම මගින් ක්‍රිස්තුස් වහන්සේගේ පරිත්‍යාගය උන්වහන්සේගේ කුරුසයේ මරණින් නොව, උන්වහන්සේගේ මනුෂ්‍යත්වයෙන් නොව ස්වර්ගයේ සිටිය දී එනම් උන්වහන්සේගේ තම ස්වර්ගීය මහිමය අතහැර මෙලොවට ඒමට අදහස් කළ විටම ආරම්භ විය.
- අන් අයගේ යහපත දැක තමන් සතුටුවීම සැබෑ ප්‍රේමයයි. එවන් පරිත්‍යාගශීලී ප්‍රේමයක් තමන් තුලින් අන්අයට බෙදා දී ජීවත් වේ. ඒ ප්‍රේමය කිතුණුවන් තුළ තිබිය යුතුය යන්න මේ පාඨයෙන් පාවුළුතුමා ඉදිරිපත් කරයි.

**5.2.3.7 ශුද්ධාත්මයාණන් තුළ ජීවිතය (1 කොරින්ති 12/4-16 14/1-18) (1 කොරි 12:4-16)**

- මෙම කොටසින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ලබා දෙන විශේෂ වරප්‍රසාද ගැන කියැවේ. වරප්‍රසාද යන්න ''කරිස්මා'' යන ග්‍රීක වචනයේ පරිවර්තනයකි. මෙයට දෙවියන් වහන්සේ කරුණාවෙන් ලබා දෙන ''නොමිලේ ලැබෙන වරප්‍රසාද'' යන අර්ථය දිය හැක. දෙවියන් වහන්සේ අපට ලබාදෙන වරප්‍රසාද අතුරින් විශිෂ්ටතම වරප්‍රසාදය වන්නේ ශුද්ධාත්මයාණන්ය. එබැවින් පාවුලුතුමා මෙම වරප්‍රසාදයේ ස්වභාවය, ගුණාංග, ඵල ආදිය පිළිබඳ ව පැහැදිලිව කතා කරයි.
- මෙහිදී පාවුළු තුමා ශුද්ධාත්මයාණන් අපට දෙන විශේෂ වරප්‍රසාද ගැන පැහැදිලි කරයි. මුල් කාලයේ දී ශුද්ධ වූ සභාවේ මේ වරප්‍රසාද බහුලව දක්නට ලැබුණි. ඒවා භාවිත කිරීම නිසා සමහර ප්‍රශ්න ද මතුවිය. එම නිසා පාවුළුතුමා මේ වරප්‍රසාදවල ස්වභාවය, ගුණාංග, ප්‍රයෝජන ගැන පැහැදිලිව කතා කරයි.

- මෙම කොටසින් ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාද පිළිබඳ ව පැහැදිලිව කීමට අවශ්‍ය පසුබිම කරා කොරින්ති නගරයේ වර්ධනය වූ ශුද්ධ වූ සභාවේ ශුද්ධාත්ම වරප්‍රසාදවලින් එකක් වූ අන්‍යභාෂා කතා කිරීම මෙහි බහුල ලෙස දැකිය හැකි විය. මේ නිසා අනවශ්‍ය කරදර ඇති විය. මේ අන්‍ය භාෂා කථා කිරීම අන්‍යයන්ගේ වියරු වැටුණු පිළිවෙතට සම නොවූ නිසා එය වැරදි සිතුවිලිවලට මං පැහැදුවේ ය. මේ ගැටළුවලට විසඳුමක් ලෙස පාවුළුතුමා ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාද ගැන පැහැදිලිව කථා කරයි.
- ශුද්ධාත්මයාණන් ද කරණ කොටගෙන මිස ජේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේ යයි කීමට කිසිවෙකුට නොහැකි බව පාවුළු තුමා පවසයි. ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇති කරන්නේ ශුද්ධාත්මයාණන් ය. මෙය ශුද්ධාත්මයාණන් අපට දෙන පළමු වරප්‍රසාදය බව පවසා ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාද එකිනෙක පැහැදිලි කරයි.
- කෙනෙකුට ආත්මයාණන් මගින් උපදෙස් ප්‍රඥාව ද, තවත් කෙනෙකුට එම ආත්මයාණන් මගින් ම ධර්මය පහදා දීමේ ඥානය ද දී ඇත. අන් කෙනෙකුට ආත්මයාණන් තුළ විශ්වාසය ද එම ආත්මයාණන් තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ වරම ද දී ඇත. තවත් කෙනෙකුට හාස්කම් කිරීමේ බලය ද තවත් කෙනෙකුට දිවැසිවැකි කීමේ බලය ද තවත් කෙනෙකුට ආත්ම විසඳීමේ හැකියාව ද තවත් කෙනෙකුට විවිධ ශබ්දවලින් කතා කිරීමේ පුළුවන්කම ද තවත් කෙනෙකුට එම ශබ්ද පහදා දීමේ ශක්තිය ද දී ඇත.
- පාවුළුතුමා මේ දීමනා දෙවිඳුන් පොදු යහපත සඳහා දානය කරන සේකයි ප්‍රකාශ කරයි. මේ සියලු දීමනා අපේ පෞද්ගලික යහපත සඳහා නොව පොදු යහපත උදෙසා, කිතුණු සමූහයා වෙනුවෙන්, ශුද්ධ වූ සභාවේ යහපත වෙනුවෙන් දානය කරනු ලැබේ.
- එකම සිරුරේ යහපත තකා බොහෝ අවයව ක්‍රියා කරන්නාසේ විවිධ වරප්‍රසාද එකම අරමුණකින් ක්‍රිස්තුස් වහන්සේගේ අදෘශ්‍යමාන සිරුර වන ශුද්ධ වූ සභාවේ පොදු යහපත උදෙසා එක්වී ක්‍රියා කරයි. එම නිසා සියල්ලන්ටම සියලු දිමනා දෙනු නොලැබේ. කිතුණු සමාජයේ විවිධ සේවාවන් කරන විවිධ පුද්ගලයනට විවිධ දීමනා බෙදා දෙනු ලැබේ. මේ සියල්ල දෙවිඳුන් වෙතින් පැමිණෙන නිසා දෙවිඳුන්ගේ සේවය උදෙසා යොදගත යුතුයි.

**(1 කොරින්ති 14/1-18)**

- පාවුළු තුමා කොරින්තිවරුන් ලියූ 1 ලිපියේ තවත් තැනක ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාද ගැන සඳහන් කර අරුත් විග්‍රහ කරයි. මේ පරිච්ඡේදයේ අන්‍යභාෂා කතා කිරීමේ වරම ද දිවැසි වැකි කීමේ වරම ද සසඳා අන්‍යභාෂා කතා කිරීමේ දීමනාවට වඩා දිවැසිවැකි කීමේ වරම ශ්‍රේෂ්ඨ යයි පවසයි.
- අන්‍ය භාෂා කතා කරන අය මිනිසුන් සමඟ නොව දෙවිඳුන් සමඟ කතා කරති. ඔවුන් කතා කරන දෙය අන් අයට නොවැටහේ. නමුත් දිවැසිවැකි පවසන අය මිනිසුන්ට කතා කරති. ඒ අය කතා කරන දෙය ඔවුන්ට පමණක් නොව අන් අයටත් ධෛර්යයක් වර්ධනයක් ලබා දෙයි.
- අන්‍ය භාෂා කථා කරන අය තමන්ට පමණක් වර්ධනය වෙති. නමුත් දිවැසිවැකි පවසන අය ශුද්ධ වූ සභාව වර්ධනය කරති.

- අන්‍ය භාෂා කථා කරන අය ශුද්ධ වූ සභාව වර්ධනය කිරීමේ අරමුණින් තමන් කතා කරන දෙය පැහැදිලි කළ යුතුයි. එසේ නැතහොත් අන්‍ය භාෂා කතා කරන අයට වඩා දිවැසිවැකි පවසන අය උසස් වෙති. මොවුන් තමන් පමණක් නොව අන් අයව ද වර්ධනය කරති.
- අප කථා කරන භාෂාව අර්ථවත් විය යුතුයි. මන්දයත් ලොවේ ඇති භාෂා අතුරින් අර්ථයක් නොදෙන කිසිම භාෂාවක් නොමැත. එලෙසම අන්‍ය භාෂා කතා කරන විට එය අර්ථවත් නොවුවහොත් එයින් ඵලක් නැත යනුවෙන් පවසා දිවැසිවැකි කීමේ හැකියාවෙන් ශුද්ධ වූ සභාවට යහපත සිදුවන බැවින් එය උනන්දුවෙන් ලබාගත යුතුයි යනුවෙන් අවවාද කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. මුල් කාලයේ දී ශුද්ධ වූ සභාව පැතිරී ගිය ප්‍රදේශ හඳුනාගෙන, එහි ස්ථාපිත කරනු ලැබූ කිතුණු සභා ගැනත් එම සභාවල තත්ත්වය පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරයි.
2. ධර්මදූත චාරිකාවල දී ශුභාරංචිය, පැතිරවීමට ගත් පියවර ගැන විස්තර කරයි.
3. මුල්කාලීන කිතුණුවන්ගේ මූලික ලක්ෂණ පිළිබඳ තොරතුරු රැස්කර වගුගත කරයි.
4. ශුද්ධ වූ පාවුළුතුමාගේ ජීවිතය, ශුද්ධ වූ සභාව වර්ධනය කිරීම, පාවුළුතුමාගේ වැදගත් ඉගැන්වීම්, විනය පිරිහීම සම්බන්ධව එතුමා දුන් උපදෙස් පිළිබඳ තොරතුරු රැස් කරයි.
5. පාවුළුතුමාගේ ලිපිවල දැකිය හැකි ඉගැන්වීම්, තම ජීවිතයේ දී පිළිපැදීම පිළිබඳ ව ක්‍රියාදාමයන් ඉදිරිපත් කරයි.

**නිපුණතාව** **5.0 :** ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලුතුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධවූ සභාවේ වර්ධනයට සහය දක්වයි.

**නිපුනතා මට්ටම** **5.3 :** ශුද්ධවූ පාවුලුතුමාගේ ජීවිතාදර්ශය අනුගමනය කර තම කිතුනු කැඳවීමට පිළිතුරු දෙයි.

**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් පල** :

- ධර්මදූත කාර්යයන් වලදී ශුද්ධවූ පාවුලුතුමා මුහුණ දුන් අභියෝග පිළිබඳ තොරතුරු රැස් කරයි.
- සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවන්වල නියැලෙන විට අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.
- රැස්කරගත් කරුණු ලැයිස්තු ගත කරයි.
- අභියෝගවලට මුහුණ දී අපෝස්තලික සේවාවන් කිරීමට ඉදිරිපත් වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලදී සහයෝගයෙන් කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය** :

**5.3.1 ශු. පාවුළුතුමා මුහුණදුන් අභියෝග**

**5.3.1.1 කැඳවීම**

- පාවුළු තුමාගේ කැඳවීම ඔහුට අභියෝගයක් විය. නව දහම වැළඳගත් අය විනාශ කිරීමට ගිය පාවුළුතුමා එය වර්ධනය කරන උපකරණයක් බවට පත් විය.
- ජෙරුසලමේ දී පාවුළුතුමාව කිතුණුවකු ලෙස දුටු දමස්කයේ ජීවත් වූ ජුදෙව්වන් කැළඹීමට පත් වූහ. (ක්‍රියා 9/21-22)
- ජුදෙව්වන් පාවුළුතුමාව මැරීමට සෙවූ විට එතුමා නගර පවුරේ විවරයකින් පහළට බැස පලා ගියේ ය. (ක්‍රියා 9/23-25)
- සිත් හැරීමෙන් පසු බර්ණබස් එතුමාව අපෝස්තුළුවරුන් වෙත කැඳවාගෙන ආ කල සියල්ලන් එතුමාව විශ්වාස නොකර එතුමාට බියවූහ.

**5.3.1.2 පළමුවන ධර්මදූත චාරිකාව**

- පාපස්හි දේශාධිපති සර්ගියස් පාවුලස් දේව වචනයට සවන්දීමට කැමතිවූවන් එලිමස් මැගෝස් යන විජ්ජාකාරයා එතුමාව දෙවියන් කෙරෙහි ඇදහිල්ලෙන් වැළැක්වීමට කටයුතු කළේ ය. (ක්‍රියා 13/8) සේවය ආරම්භයේදීම පාවුළුතුමා අභියෝගයන්ට මුහුණ දුන්නේ ය.
- පාර්ගාහිදී ජොහාන් මාක්, පාවුළු තුමා හා බර්ණබස්ගෙන් වෙන්ව නැවත ජෙරුසලමට ගියේ ය. (ක්‍රියා 13/13) මේ නිසා සේවය ඉදිරියට කරගෙන යාමට සහයකයකු නොමැතිව ලත විය.

- පිසිදියේ ඇති අන්තියෝකයේ දී ජුදෙව්වරු ඊර්ෂ්‍යාවෙන් පිරී පාවුළු තුමා කී කාරණාවලට විරුද්ධව කතා කරමින් අපහස කළ හ. ක්‍රියා 13/45 සේවය කිරීමේ දී මිනිසුන් විසින් අපහාසයට ලක් කරන ලදි.
- ජුදෙව්වරු සැදැහැවත් කුල ස්ත්‍රීන් ද, නුවර ප්‍රභූන් ද පොළඹවා පාවුළු සහ බාර්ණබස්ට විරුද්ධව පීඩනයක් ඇතිකර තමන්ගේ පෙදෙස්වලින් ඔවුන් පිටතට නෙරපා දැමූහ. (ක්‍රියා 13/50) මේ නිසා ඔවුන් දෙවියන් වහන්සේගේ වචනය එම ප්‍රදේශයේ දේශනා කිරීමට නොහැකි විය.
- ඉකෝනියේ දී පාවුළු තුමා හා බරණබස්ව ගල්ගසා ලජ්ජාවට පත් කිරීමට ජුදෙව්වන් කුමන්ත්‍රණය කළ නිසා ඔවුන්ට තම ධර්මදූත සේවය එහිදී කළ නොහැකි විය.
- ලුස්ත්‍රාවේ දී පාවුළු තුමා මවුකුස පටන් කොරවූ මිනිසකු සුවකළ නිසා ජනතාව මොවුන්ට දෙවිවරුන් සේ සළකා, හරකුන් යාග කිරීමට සූදානම් වූ සිද්ධිය පාවුළුතුමාවත් බරණබස්වත් මහත් අපහසුතාවයකට පත් කළේ ය.
- ලුස්ත්‍රාවේ දී ජුදෙව්වරු සමූහයක් පොළඹවාගෙන, පාවුළුතුමාට ගල්ගසා ඔහු මළහයි සිතා නුවරින් පිටතට ඇද දැම්මෝ ය. ධර්මදූත සේවය නිසා තමන්වම නැති කර ගන්නා තරමට පාවුළුතුමා දුක් වින්දේ ය.
- අප බොහෝ දුක් විඳිමින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවන්නට ඕනැ'' යයි කියා ගෝලයන් ධෛර්යමත් කර, තමා ශුභාරංචිය දේශනා කළ නගරවලට නැවත ගොස් එහි සිටි ගෝලයන්ව ඇදහිල්ලේ ස්ථිරව පවතින්නට ඔවුන්ට අවවාද කළේ ය.
- ''චර්මඡේදනය කරනු නොලැබුවහොත් ඔබට ගැලවීම ලැබිය නොහැකි යයි ජෙරුසලමෙන් පැමිණි සමහරු පැවසූ බැවින්, ඔවුන් හා පාවුළු බර්ණබස් අතර වේගවත් වාද විවාද ඇති විය.
- මේ නිසා ජෙරුසලමට ගොස් අපෝස්තුළුවරුන්ටත්, සභා මූලිකයන්ටත් මේ ගැටළුව ගැන පැමිණිලි කිරීමට අවශ්‍ය විය.

දෙවන ධර්මදූත චාරිකාව

- පාවුළුතුමා දේව වචනය ප්‍රකාශ කළ ප්‍රදේශවලට නැවතත් යාමට බර්ණබස්ට කථා කළේ ය. බර්ණබස් තමන් සමඟ ජොහාන් මාක් ද කැඳවාගෙන යන්නට කැමති විය. එයට පාවුළු තුමා එකඟ නොවී ය. මේ නිසා ඔවුන් අතර දැඩි විවාදයක් ඇති විය.
- ඔවුහු එකිනෙකාගෙන් වෙන්ව ගිය හ. මුලසිටම එක්ව සේවය කළ මිත්‍රයන් වෙන්වීම දෙදෙනාටම මහත් දුකක් ඇති කළේ ය.
- පාවුළු තුමා ජුදෙව්වරුන් නිසා තිමෝතියස්ට චර්මඡේදනය කිරීම ප්‍රශ්නයකට තුඩුදෙන ක්‍රියාවක් ලෙස විවේචනයට ලක් විය.
- අශුද්ධ ආත්මයක් ආරූඪ වී සිටි වහල් තරුණියගෙන් එය දුරු කළ නිසා ඇගෙන් මුදල් ගරා ගත් අය නඩුකාරයන් ළඟට ගෙන ගොස් පාවුළු සහ ගෝලයන්ට බොරු චෝදනා නැගූ හ. මේ නිසා ඔවුන් දරුණු ලෙස වදහිංසා කරනු ලැබ සිර කරනු ලැබූහ.
- තෙසලෝනිකයේ මැරවරයන් විසින් තර්ජනය කරනු ලැබූහ. මොවුන් නිසා මැරවරයෝ ජාසොන්ගේ නිවසට ප්‍රහාර එල්ල කළ හ.
- ඇතැන්ස් නගරයේ දී පාවුළු තුමා සමච්චලයට ලක් විය.

- කොරින්තියේ දී ජුදෙව්වරුන් විසින් අපහාස කරනු ලැබූ නිසා ඔහු තමාගේ වස්ත්‍රවල ධූලි ගසා දමා විජාතීන් වෙතට ගියේ ය.

### 5.3.1.4 තෙවන ධර්මදූත චාරිකාව

- එපීසයේ රිදී රූප සාදන්නාගේ කුමන්ත්‍රණ නිසා මහත් කෝලාහලයකට මුහුණදීමට සිදුවිය.
- සිරියාවට යන්නට සූදානම්ව සිටිය දී ජුදෙව්වරුන්ගේ කුඨ උපාය දැන වෙනත් මගකින් යන්නට සිදුවිය.
- එපීස සභාවේ මූලිකයන්ගෙන් සමු ගැනීමේ අවස්ථාව පාවුළු තුමා විඳි වේදනා සියල්ල සිහිකර වීය.
- දිවැසිවර අගබස් පාවුළුතුමාට ජෙරුසලමේ දී විඳින්නට සිදුවන වේදනා සියල්ල මුලින්ම දැන ගත් නිසා සියල්ලන්වම කණගාටුවට පත් වූහ.
- ආසියාවේ සිටි ජුදෙව්වරු, ජන සමූහයා පොළඹවා, පාවුළු තුමාට විරුද්ධව බොරු චෝදනා නගා, එතුමා අත්අඩංගුවට ගෙන, දරුණු ලෙස වදහිංසා කළ හ.
- පසුව සේනාධිපති වෙත භාරදෙන ලදි.
- පාවුළු තුමා ආණ්ඩුකාර ෆීලික්ස්ට භාරදෙන ලදි
- වසර දෙකක් සිරගතව සිටිය දී ආණ්ඩුකාර ෆෙස්තුස්ට  භාරදෙන ලදි.
- 2 කොරින්ති 11/22-33 දක්වා පාවුළු තුමා තමා වින්දා වූ දුක් ද මුහුණදුන් අභියෝග ද පිළිවෙළින් දැකිය හැක.

### 5.3.1.5 රෝම ගමන

- පාවුළුතුමා සිරකරුවකු ලෙස නැව් මගින් රෝමයට යවනු ලැබීය.
- කුණාටුවට නැව ගසාගෙන ගියේ ය.
- නැව තුළ බොහෝ දිනක් ආහාර නැතිව දුක් වින්දහ.
- නැව බිඳී මුහදේ දී ජීවිත බේරා ගැනීමේ සටනක යෙදී ගොඩට පැමිණිහ.
- මෝල්ටා දූපතේ දී සර්පයකු දෂ්ඨ කළේ ය.
- රෝමයේ දී පාවුළුතුමා නිවාස අඩස්සියේ පසුවිය.

### 5.3.1.6 අභියෝග ජය ගැනීම

- පාවුළු තුමා තම මුළු ජීවිතයම ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කැපකර සිටියේ ය.
- දේව කැඳවීමත්, ධර්මදූත සේවයත් හොඳින් දැන ගෙන එහි නියැලී ජීවත් විය.
-  ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දුක් විඳීම තමන්ගේ  භාග්‍යයක් සේ සළකා මරණය තම වස්තුවකැයි අවබෝධ කර ගත්තේ ය.
- කුමන අවස්ථාවක දී හෝ වේවා ක්‍රිස්තුස් වහන්සේගේ වැඩ සිටීම තමා තුලින් අත්දැක්කේ ය. (ක්‍රියා 18/9) ''ඔබ බිය නොවී නිශ්ශබ්දව නොසිට කතා කරන්න. මන්ද මම ඔබ සමඟ සිටිමි''.
- කුමන දුකක් පැමිණියත්, සේවය කර ශුද්ධ වූ සභාව තිරසාර කිරීම එතුමාගේ ප්‍රතිපත්තිය විය.
- ශුද්ධාත්ම වරම් ද, දේව සංක්ෂණය ද එතුමාගේ සේවයට ශක්තියක් විය.
- රෝම පුරවැසියෙකු ලෙස නීත්‍යානුකූලව නිලධාරීන් හමුවට යාවේ අවස්ථාව එතුමාට  උදා විය

5.3.2 පාවුළුතුමාගේ ප්‍රාණපරිත්‍යාගී මරණය

- පාවුළුතුමා රෝමයේ දී සිරකරුවකු ලෙස සිටියත් එතුමාට සමහර සැළකිළි ලැබුණි.
- වරදට තීන්දුව ලැබූ සිරකරුවකු දින 18 කට වැඩියෙන් සිරකරුවකු ලෙස තබාගත නොහැකිය යන්න රෝම නීතියකි. මේ නිසා ෆෙස්තුස් හා අග්‍රිපාගේ සහතිකය නිසා පාවුළු තුමා නිදහස් වූ බව කියැවේ.
- රෝමවරු බොහෝ කරුණු ඉදිරිපත් කරමින් කිතුනුවන්ව ප්‍රතික්ෂේප කළ හ.
- නීරොගේ කාලයේ දී රෝමයේ පීඩන ආරම්භ විය. එම පීඩන ඉතා දරුණු විය. බොහෝ කිතුනුවෝ මේ නිසා මරණයට පත් වූහ. බොහෝ දෙනෙක් අධික දුක් ගැහැට වින්ද හ.
- විශ්වාසිකයන්ව සැනසීමටත්, ඔවුන් ඇදහිල්ලේ ස්ථිර කිරීමටත් පේදුරු හා පාවුළු එහි ගිය හ.
- එහිදී ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගන්නා ලදී
- පේදුරුතුමා වතිකානයේ දී හිස පහළට තබා කුරුසයේ ඇණ ගසනු ලැබීය.
- පාවුළුතුමා රෝම පුරවැසියකු බැවින් එයට ඔබින ලෙස මරණ දණ්ඩණයට නියම කරන ලදි. දේවදාර ගසින් පිරුණු වනාන්තරයක් වන සාල්පියන් නම් ස්ථානයේ දී කඩුවෙන් හිස සිඳ, තම 70 වන වියේ දී ප්‍රාණපරිතයාගිවරයකු ලෙස මරණයට පත් විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

1. ධර්මදූත සේවාවේ දී ශු.පාවුලුතුමා මුහුණදුන් අභියෝග ලැයිස්තුගත කරයි.
2. ධර්මදූත සේවාවේදී ද, ක්‍රිස්තියානි ජීවිතයක් ගත කිරීමේදී ද පැමිණෙන අභියෝගවලට මුහුණදෙන ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි.
3. ශු. පාවුලුතුමාගේ ප්‍රාණ පරිත්‍යාගය පිළිබඳ විස්තර කරයි.

**ආශ්‍රිත මූලාශ්‍ර :**


1. දසනායක, ජේ. ප්‍රාග් ඉතිහාසය තුළ දේව අනාවරණය, කතෝලික මුද්‍රණාලය, කොළඹ 08, 2010.

2. කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය අත්පොත, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, කොළඹ 08, 2015.

3. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1997.

4. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 2), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 2002.

5. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 3), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 2002.

6. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 4), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1999.

7. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (නව ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1995.

8. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (නව ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1996.